


# සුළං කැදැල්ලේ

යෞවන සමින්ද්‍ර රත්නායක

www.sinhalaelibrary
WWW.SINHALAELIBRARY.COM

# 1 හුලං කුරුල්ලෝ



පාර පාළුම පාළුයි. කලින් වැහැපු වැස්ස නිසා වෙන්නැති අනික... අද පෝය. මොනව වුනත් ට්‍රැෆික් නැති එක නම් හොඳයි. නැත්තං මට නුගේගොඩ ඉඳලා මීගොඩට යන්න පැය ගානක් යයි. ප්‍රින්ට් කරන්න දාල තිබ්බ ෆොටෝ ටිකක් අරන් "අමර" එකෙන් එළියට බහින ගමන්ම මට එහෙම හිතුනා. ෆොටෝ ටික ජැකට් එක අස්සට දාගෙන, ජැකට් එකේ "සිප්" එක බෙල්ල ගාවටම ඇදගෙන ඉවරවෙලා තමයි මං බයික් එකට නැංගේ.

"මතක ඇතුව ජැකට් එකේ සිප් එක උඩටම ඇදගන්න... හොඳද ? නැත්තං පපුවට හුලං වැදිල ලෙඩ වෙයි..."

අම්මා හැමදාමත් කියන්නේ එහෙම. මටත් දූන් ඒක පුරුද්දකට ගිහින්. කැමරමන් කෙනෙක් වුණාම, විශේෂයෙන් පත්තරේක ෆොටෝ ග්‍රැෆර් කෙනෙක් උණාම අව්වට, වැස්සට, පින්නට හුරුවෙන්නෝන කියනෙක අම්මට තේරෙන්නෙ නෑ. තේරුණත්, මට තියෙන ආදරේ හින්ද තමයි ඕනවට වැඩිය පරිස්සම් කරන්නෙ.

පාරේ වාහන අඩු හින්දා වෙන්නැති කල්පනාවෙන්, කල්පනාවෙන් මගේ ස්පීඩ් එකත් ටිකක් වැඩිවුනේ. කොහොමත් මං ටිකක් ස්පීඩ් පොරක්. කෙල්ලො ඇස් ලොකු කරන් බලන්නෙත්, අජානේය ස්කූටර් තුරඟා පිට නැඟලා පවනට බඳු වේගයෙන් යන අපි වගේ පොරවල් දිහා තමයි.

මහරගම පහුවුණා. පන්නිපිටිය, කොට්ටාව, මාකුඹුර, හෝමාගම... ඊළඟට පනාගොඩ... පනාගොඩ පන්සල පහුවුණා විතරයි ළමා සාරියක් ඇඳගත්තු කෙල්ලෙක් සිග්නල් නොදාම පාර පැන්නා. එක පාරටම බ්‍රේක් කළත්, බයික් එක ලිස්සුවා. කැරකිලා ගිහින් බිම වැටෙනව විතරයි මට මතක. ඊට පස්සෙ ආපහු සිහිය එද්දි මං හිටියෙ ඉස්පිරිතාලෙ ඇඳක් උඩ. මුලින්ම ඇස් අරිද්දි මට පෙනුනෙ බොඳ වෙච්චි, අපැහැදිලි රූප කීපයක්. තත්පර කීපයක් ගියාට පස්සෙයි මං ඒ රූප හරිහැටි අඳුර ගත්තේ. අම්මයි අයියල දෙන්නයි.

"මොකක්ද පුතේ මේ කරගත්තෙ...?"

අම්ම එහෙම අහද්දියි මටත් මතක් වුණේ, මොකක්ද මට වුණේ කියලා. මං බයික් එකට නැගලා පිඹලා ආවා මතකයි. පන්සල ගාවදී කවුදෝ කෙල්ලෙක් පාර පැන්නත් මතකයි. ඊට පස්සෙ මං වැටුනා. කවුරු හරි මාව ඉස්පිරිතාලෙට ගේන්න ඇති.

"ගොඩක් අමාරුද පොඩ්ඩා...?"

මද්දු අයියා ඇඳ උඩින් ඉඳගත්තෙ එහෙම අහන ගමන්.

"එච්චර අමාරු නෑ..."

පුරුදු විදියටම මං මූණ බුම්ම ගත්තා. මද්දු අයියටයි, ලොකු අයියටයි විතරක් නෙමේ. අම්මටත් හිනා. ඒ ගොල්ලන්ට හිනා, මමගෙ දත්තෙ අතපය රිදෙන තරම. ඒ මදිවට බෙත් ගඳ. හපෝ... මේක නම් ඉස්පිරිතාලයක් නෙවේ... අපායක්.

"මේ පිස්සු නොකර මාව ගෙදර එක්ක යනවකො" මං කෙඳිරි ගෑවා.

"රේස් යනකොට මතක් වෙන්නැද්ද වැටුණොත් මෙහෙම වෙයි කියල"

අම්මා ඇහුවා. මන්න මට ආයෙත් තද වුණා. ඇයි යකෝ මං ඕන කමින් වැටුණයැ. අර කොහෙද යන විංචිමානවිකාවක් කලින් නොදන්වා පාර පැන්නනේ.

"ඇත්තටම මොනව වෙලාද පොඩ්ඩො උඹ වැටුණේ...?"

"මං වැඩිය හයියෙන් නෙවේ ආවෙ... පනාගොඩ පන්සල ඉස්සරහදි කවුද කෙල්ලෙක් පාර පැන්නා... එංගුවනෙ... මං දන්නෙ නෑ. එක පාරටම බ්‍රේක් කළා... මං වැටුනා... එච්චරයි..."

මද්දු අයියා හිනාවුණා. මං අම්ම දිහාවෙ බැලුවෙ මද්දුගෙ හිනාවට අම්මට තරහ ගිහින්ද කියල බලන්න. මහු... තරහ වෙලා නං නෑ. ඒත්... ඒත් අම්මගෙ ඇස්වල කඳුළු..

"අම්මා..." මට කියැවුණා. අම්මා ඔසරි පොටින් කඳුළු පිහදාගෙන මගේ ළඟින් ටිකක් ඈත් වුණා. ලොකු අයියත් අම්මගෙ පිටිපස්සෙන් වැටුණා.

"චූටි..." මද්දු අයියා මගේ ඇඳ උඩින් ඉඳගත්තෙ මොකක්දෝ ලොකු ප්‍රශ්නයක් අහන්න හිතාගෙන වගේ. මං ඇස් බැම් නළලට අරගෙන ඌ දිහාවෙ බැලුවෙ... ඒත් ඒ පිස්සු පූසා හිනාවෙනව මිසක් මොනවත් කියන්නෙ නෑ.

"කියනවකො..."

ඉවසල බැරිම තැන මං ටිකක් හයියෙන් කෑ ගැහුවා.



www.sinhalaelibrary.com

මගෙ කැඟැහිල්ලට මද්දුගෙ මයිල් ගහක්වත් සොලවන්න බැරි වුණා. ඌ මට ඕනෙ විදියට කථාකරන්න පටන් ගත්තෙ තවත් විනාඩි ගානක් යනතුරු හිනාවෙවී ඉඳලා.. ඊට පස්සෙයි.

"අර බයික් එකට පැන්නයි කියපු කෑල්ල හොඳද ?"

"මතක නෑ..."

"මතක් කර ගනිං සනීප උනාම යන්න."

"ඕල මොට්ටලයා..."

මං කෑ ගැහුවා. මං මෙච්චර අමාරුවෙන් ඇඳට වැටිලා පොළොවේ ගහපු පෙරේතයෙක් වගේ ඉන්නවා. ඌ හොයන්නෙ මං ගැන නෙවේ. කොහේවත් ඉන්න කාලකන්නි බැල්ලියෙක් ගැන.

"උඹට තද වුණාද පොඩ්ඩා ?"

මද්දු අයිය උරිස්සකට තට්ටුවක් දාලා ඇහුවා. මං මූලුව වහලා නෑ කිව්වා. ඌටත් පිස්සු. මං කොහොමද ඌත් එක්ක තරහ වෙන්නේ. කෙල්ලෙකුට ට්‍රයි කරානම් ඒ ඌත් එක්කම ගිහින්. හැම කෑල්ලකටම බැස්සෙ අපි දෙන්නා එකට.

"ඔච්චර කල්පනා කරන්නෙපා... හොඳ වුණාම අපි දෙන්නම යං පනාගොඩ පන්සල්..."

"ඌරා..." මගේ කට ඇඳ වෙන්නැති. ඌ කින්ඩි හිනාවක් දාගෙන ඇඳ උඩින් නැගිට්ටා. ටික වෙලාවකට පස්සෙ අම්මල ගියා. මගෙ සේලයින් ගලවපු හින්ද කවුරුත් මං ගාව නවතින්න ඕනෙ නෑ කියලා ඩොක්ටර් කිව්වලු. ඕකට ඕකේ... මට සිහිය තියෙන වෙලාවෙනේ. ඌ මං ගාව ඉන්න තිබ්බෙ. එහෙනම් මම හොස්පිටල් එකේ කියල බලන්නෑ. කෙලිනවා හොඳ පිස්සුවක්. පුංචි මිසීලව, මළ පනින ඇටෙන්ඩන්ට්ලව බයිට් කරන්න තිබ්බා එකසිය ගානට...

"විහඟ... විහඟ වික්‍රමසිංහ..."

හීනි කටහඬක් මං වහගෙන ඉඳපු ඇස් දෙක ඇරියා. ව..ඩ... චූටි ලේඩි ඩොක්ටර් කෙනෙක්. තද නිල්පාට සාරිය, ඒකට උඩින් දාගෙන ඉන්න සුදුපාට දිග කෝට් එක, චූටි සුදු මූණ, දිග ඇස්, පිරිසිදු හිනාව, මේවා ඔක්කොම එකකට එකක් ගැලපෙනවා. තවත් ටිකක් හොඳට බලද්දියි මං දක්කෙ වම් අතේ වෙද ඇඟිල්ලේ ලොකු මුද්දක්. ඒ කියන්නෙ එයා කසාද බැඳලා... අයියෝ... ඇයි චූටි ඔයා ඔච්චර ඉක්මනට බැන්දේ... මං ඒක මගෙ හිතෙන්ම අහගත්තා. (එයාගෙන් ඇහුවනං කන්න වෙයි අම්බානකට)

"විහඟ..."

මන්න එයා නව පාරක් මගෙ නම කියනවා. පාඩම් කරනව ඇති. පව්නෙ, මන්න මගේ පාඩම් කරපුවාවෙ.

"කෙල්ලන්ට වැඩ පෙන්නන්න ගිහින් නේද වැටුණෙ ?"

"නෑ ඩොක්ට, හදිසියේම කෙල්ලෙක් පාර හරහා පැන්නා"

"ඇයි ළමයෝ බ්‍රේක් තිබුණෙ නැද්ද ?"

"තිබුණා. හැබැයි දැන් හිතෙනවා බ්‍රේක් නොකළානං හොඳයි කියලා"

"ඇයි ඒ..?"

"එහෙම වුණා නම් එයත් මේ ඉස්පිරිතාලෙම නේ. වා...ව්.."

ඩොක්ටර් අතින් තට වනගෙන හිනාවෙනවා. ඒ අතේ තියෙන මුද්ද දිලිසෙනවා හරියට මට මලොක්කුවට වගේ. අනේ. මං පව් නැද්ද අප්පා.

"විහග..."

"ඩොක්ටර්..."

"ඉන්ජෙක්ෂන් එකක් ගහන්න තියෙනවා"

"අයියෝ..." මං කෙඳිරි ගෑවා. කොහොමටත් මට ඒ වේදනාව උහුලගන්න ටිකක් අමාරුයි. එක දවසක් ඉස්කෝලෙදි මොකක්ද බෙහෙතක් විදින්න ඇවිල්ලා මට කලන්තෙ හැදුනෙ. එදා නං අඹ පරිප්පුව. ඒක මතක් කර කර කොල්ලො මට නාමෙත් වගේ ගහනවා. අදත් කලන්තෙ හැදුණොත් නං වස නෝන්ඩිය. චූටි ඩොක්ටර් මට හිනාවෙයි.

"ඩොක්ටර්..."

මං කතාව පටන් ගත්තා. ඩොක්ටර් මගේ දිහාවට බැලුවේ ඇයි කියල අහන්න වගේ නළල රැළි කරගෙන.

"ඩොක්ටර් බැඳලද ?"

මං ජේප් එකේ ඇහුවා. ඩොක්ටර්ට හිනා ගියා. සිරින්ජරේ ලැස්ති කර ගන්න ගමන් ඩොක්ට මගෙ දිහාවට අමුතු හිනාවක් දැම්මා. ඒ පාර මොකාටද එන්න හදන්නෙ.

"විහගට ගර්ල් කෙනෙක් ඉන්නවද ?"

"නෑනෙ..."

"අනේ... ඩොං... මෙච්චර හැඩ කොල්ලෙකුට කෙල්ලෙක් නෑ... ඒක නෙවේ... මොකද මේ මං බැඳලද කියල ඇහුවෙ ?

"අපේ පොඩි අයියව කතා කරන්න. මිනිහ හොයන්නෙ ඩොක්ට වගේ චූටි කෙල්ලෙක්..."

"දැන් නම් වූ ලේට් විහග... මාසෙකට උඩදි මං බැන්දා..."

ඩොක්ටර් මගෙ උරිස්සෙන් අල්ලලා ඉන්ජෙක්ෂන් එක ගහන



ගමන් කිව්වා. උෆයි යකෝ..." මුන්ට මේවා හෙමින් ගහන්න උගන්නල නැති හැටි. එහෙම හිතෙන කොටම මගේ ඇස් දෙක පියැවෙනව මට දැනුණා.

## 3

හොස්පිට්ල් එකේ දවස් ගානක් ඉඳල ගෙදර ආවා. ඒ ආවම තමයි හිත ටිකක් පිව වුණේ. මොන සැප තිබ්බත් ගෙදර වගේ නෑනෙ. ගෙදර ආවට පස්සෙ මුදු සැලකිලි. අම්මා බත් කවනවා. කොන්ඩෙ පීරනවා. ඇඟ සෝදවනවා.

"මටත් හිතෙනවා එක පාරක් එක්සිඩන්ට් වෙලා බලන්න..."

ඊරිසියා හිතිලද කොහෙද මද්දු කිව්වා. එහෙම නැත්තං උාට අර චූටි ඩොක්ටර් ඉන්න වෝඩ් එකේ ඇඩ්මිට් වෙන්න හිතුනද දන්නෙත් නෑ.

"සිරා කෑල්ලක් හිටියා... සුදුයි, චූටියි. මං දැක්කා දෙතුන් පාරක් උඹ ගාවත් කරකැවෙනවා. මං හිතාන්නෙ ඩොක්ට කෙනෙක්ද කොහෙද..."

විකසිත් මද්දු කියවනවා. මට නං මුදු සුවර්. මේ කියවන්නෙ අර චූටි ඩොක්ටර් ගැන තමයි.

"උඹ දන්නවද පොඩ්ඩො ඒකි ගැන..."

"දන්නවා..."

මං තාලෙට කිව්වා. මද්දුගෙ ඇස් නළලට ගියා. මට හිනා.

"කියපංකෝ..."

"මොනවද...?"

"කොහොම කෙනෙක්ද එයා..."

"හොඳයි... හ..රී... කරුණාවන්තයි... ලෙඩ්ඩුන්ටත් හරි ආදරෙයි..."

"මටත් ආදරේ කරයි ද...?"

"දන් නෑ..."

"අහලා කියපංකෝ... උඹ අනිද්දට කකුල පෙන්නන්න යනවනේ..."

"මං එයාට කියන්නම් කෝ එයාගෙ මහත්තයගෙන් අහල කියන්න කියලා..."

"මහත්තයාගෙන්...?"

"යර්ස්... එයා බැඳලා. හැබැයි ඉතිං උඹ පැණි උාරා වගේ දෙපාරක් තුන්පාරක් වටේ කැරකුණොත්, උඹටත් වැටෙයි..."

"පලයං පෙරේතයා..."

WWW.SINHALAELIBRARY.COM 4

මද්දු කාමරෙන් ගියේ මට හයියෙන් ටොක්කක් ඇනගෙන. උයි... විදින අම්බානකට. ඊට පස්සෙ... මං ඇඳෙන් නැගිටලා කිහිලි කරු දෙකත් අරගෙන කාමරෙන් එළියට ගියා. අම්මා දන්නා නම් බනියි. බැරි මරගාතෙ ඇවිදිනවා කියලා. අම්මලට තේරෙන්නෙ නෑනෙ. කුරුල්ලෙක් වගේ වෙලෙ ඉගිලෙව්වී මං මේ කාමරේට කොටුවෙලා විඳින දුක. පිස්සු හැදෙනව අප්පා.

"ඊයි... පොඩ්ඩා..."

මද්දු කෑ ගහනවා මං ගාණක් නැතුව වගේ මිදුලට ඇවිදගෙන ගියා.

"පොඩ්ඩා... මේ කවුද ඇවිත්..."

එතකොටයි මං හැරිලා බැලුවේ. ඇත්තම තමයි, කවුද කෙල්ලො දෙන්නෙක් අපේ ගේට්ටුව ගාව. මද්දු ගේට්ටුව ඇරියට පස්සෙ උන් දෙන්නම ඇතුළට ආවා. කවුද මේ...?

සුදු පොඩි එකී නම් හොඳට දකල පුරුදුයි වගේ. මං ඒ දෙන්න ළඟට යද්දි ඒ දෙන්නා මද්දුත් එක්ක ගිහින් ඉස්තෝප්පුවෙ තිබුණු පුටු දෙකක වාඩිවුණා.

"මං අම්මව එක්කරං එන්නං..."

මද්දු ගෙට ගියා. මං අමාරුවෙන් ගිහින් එතනින් වාඩිවෙන්න හැදුවා. කව පොඩ්ඩෙන් මං වැටෙනවා. අර සුදු පොඩි එකී ටක් ගාල පැනල මාව අල්ල ගත්තා. කව පොඩ්ඩෙන් විතග වික්‍රමසිංහ බිම. ඒ කෙල්ල මාව පුටුවෙන් වාඩි කරවල ගිහින් මගෙ ඉස්සරහින් වාඩි වුණා. මූණ ටිකක් හුරුයි වගේ. මං බලන් හිටියා ඒකි දිහා.

"මියා කවුද...?"

මං ඇහුවා. ඒකි බිම බලාගෙන ඇඹරෙනවා. පිස්සු කැරැක්ටර් එකක්ද කොහෙද.

"මාව බේරන්න ගිහින් තමයි අයියව වැටුණෙ..."

මළකෙක්... මේ ඒ මුස්පේන්තුවද ? කොදකිත්... අනේ මටමමතෙ වෙන්නෙ.

"සමාවෙන්න අයියා... මං... මං හිතල කරා නෙමේ..."

පව් අප්පා. මූණ දක්කම බඩ පපුව පත්තු වෙනවා. සූ...වි.. නංගි කෙනෙක්නෙ. අඬපිද දන්නෙත් නෑ. ඇඬුවොත් නං කොර. චූටි කඳුළු බිංදු දෙකක් ඇස් දෙකේ තියෙද්දි හොඳ ක්ලෝස් අප් ෂොට් එකක් ගන්න තියෙනවා නං... කෙල්ල ෆොටෝ ජෙනික් ද දන්නෑ.

නොදකිං යකෝ මටත් හිතෙන ඒවා. එක අතකට බැලුවම ඒකෙත් ඇති වැරද්දක් නෑ. මං කැමරමන් කෙනෙක් නෙ.

"කෝ බලන්න අපේ චණ්ඩියව එක්තැන් කරපු චන්ඩියා.." එහෙම කියාගෙනම අපෙ අම්මා දොර කඩින් එබුණා... ඊළඟට..



# 4

අලෙජ් අම්මව දක්කා විතරයි චූටි නංගි ගැස්සුණා. මං හිතුවෙ මෙ පාර නම් ඇඬුවම තමයි කියලා. කොහෙද... ඒකි ඇඬුවෙ නෑ. බිම බලාගෙනම හිටියා මිසක්.

"කොහොමද දරුවෝ ගේ තොයාගත්තේ...?"

"අපි හොස්පිට්ල් ගියා... එහෙදි එඩ්‍රස් එක දුන්නා."

අපෙ අම්මට උත්තර දුන්නෙ අර චූටි නංගිත් එක්ක ආපු අනිත් කෑල්ල...

"යසයි... ඇක්සිඩන්ට් වෙලා මාසෙකට විතර පස්සෙ තමයි මතක් වෙලා තියෙන්නේ..."

මං පොඩි කැපිල්ලක් දැම්මා... ම...න්න චූටි නංගිගෙ මූණ ඇඹුල් වුණා. ඒ පාර නං කඳුළු. එළ... එළ... අඬනවා එකසිය ගාණට...

"මොනවද පොඩ්ඩො උඹ කරන්නේ...? බලපං ඒ දරුවව ඇඬෙව්වා." අම්මා මට සැරවුනා. මං ඔලුව කස කසා හොරෙන් මද්දු දිහාවෙ බැලුවා. ඌ ඇහැක් ගැහුවා. ඒ කියන්නෙ කෑල්ල හොඳයි. ට්‍රයි කරපං කියලා... මං ඔලුව වැනුවා.

"මොකක්ද නංගි මයාගෙ නම...?"

මද්දු ඇහුවා... මළ කෙළියයි. ඒ පාර මට ඉස්සෙල්ල ඌ බහින්නද කොහෙද හදන්නේ. මං ඌට රැව්වා. ඌට හිනා.

"අංජලී..."

ඒකි ඇහෙන නෑහෙන ගානට කෙඳිරුවා. ස්වීට් වොයිස් එක. රතු වෙච්ච මූණ ඉකීන්න හිතෙනව දක්කම.

"ඉන්න... මං බොන්න මොනව හරි හදන් එන්නං..."

අම්මා ගෙට ගියා. මං අංජලී දිහාවෙ බැලුවා. ඒකිත් කන්න වගේ මං දිහාවෙ බලාගෙන. හිත කූල් වෙලා ගියා. විනාඩියක් විතර අපි දෙන්නා, අපි දිහා බලාගෙන ඉන්න ඇති.

"පුතා..."

මං ගැස්සුණේ අම්මා ගේ ඇතුළේ ඉඳන් කතා කරනව ඇහුණම. මද්දු නැගිටල ගෙට දිව්වා. මටත් හිතුණ දුවල ගෙට යන්න. කොහෙද මේ මළ ඉලව් කකුල ලෙඩ දෙනවනේ...

"මයාට ගොඩක් රිදුනද...?"

අංජලීට මං ගැන දුක හිතිලද කොහෙද... ඒකත් හොඳයි එක

අතකට. එන එන අතට ගහ උඩවස්සා කියලා ගොඩාක් අමාරු විදියටම ඉන්නවා.

"අයියා ඔයාට මෙහෙම උනේ මං හින්දනේ... ඔයා තරහද නැත්තෙන්න...?"

ඔය එන්නෙ සීන් එකට. මං උත්තරයක් දෙන්න හදනකොටම අංජලී එක්ක ආපු අනිත් ගර්ල් නැගිටලා අපේ මිදුල පැත්තට ගියා. ඒකත් හොඳයි. හීන් සැරේ සීන් එකට බහින්න පුලුවන්.

"හැංගී... ඉස්කෝලෙ යනවද ?"

"නෑ... කෝස් එකක් කරනවා... කොම්පියුටර්..."

"කොහෙද...?"

"අයි. ඩී. එච්. එකේ..."

කථා කරන්න හම්බවුණේ එච්චරයි... අපේ මද්දුවා බීම වගයක් ට්‍රේ එකක තියාගෙන ආවා. ඉතේ විහඟ මේ තරං අන්ලකීද...? අංජලීටයි මටයි බීම දෙකක් දීලා මද්දු මිදුලට ගියා අර අනිත් ගර්ල්ට බීම එක දෙන්න. ඒ අතරේ... මං ස්ටූල් එක උඩ තිබුණු මගේ පොකට් ඩයරි එක අරගෙන ඒක අස්සෙන් විසිටින් කාඩ් එකක් ඇදල ගත්තා.

"අංජූ..."

හුඟක් කල් ඉදන් දන්න කෙනෙකුට වගේ මං ඒකිගෙ නම ෂෝට් කරල, ජ්විට් කරල කථා කරා. කෙල්ල කොර. ඒ ඇස් අම්මෝ... සත පනහේ විස් බෝල දෙකක් වගේ.

"මේ... මගේ විසිටින් කාඩ් එක... කෝල් කරන්න...

ඒකි වටපිට බලලා ටක් ගාලා කාඩ් එක අරන් පර්ස් එකේ දාගත්තා. ඔය තියෙන්නෙ වැඩ. විහඟ වික්‍රමසිංහට බැරි ඒවා කොහෙද මේ ලංකාවේ...

## 5

ඩොක්ටර්ස්ලා කිව්වෙ මට මාස තුනක් විතර එක තැන ඉන්න වෙයි කියලා... ඒ කිව්වට එහෙම ඉන්නෙ කොහොමද ? මට ඕනෙ මගෙ ට්‍රේලෙ නැගල කුරුල්ලෙක් වගේ ඉගිල්ලෙන්න. ඇහැට කනට ජේන සිරා කෙල්ලන්ගෙ ෆොටෝ අරගෙන පත්තරේට දීලා ඒක පලවෙනකල් බලාගෙන ඉන්න... මේක නං කරුමක්කාර ජීවිතයක්. එක තැනකට වෙලා ඉන්නකොට මගේ නිදහස් ජීවිතේට මොනවද අප්පා වෙන්නෙ...



"අයියා..."

මං උතුර දකුණ හොයාගන්න මාර ට්‍රයි එකක් දුන්නා. එහෙම ට්‍රයි කරලා උතුර දකුණ හොයාගෙන බලද්දි මං ගාව හිටියෙ අංජලී...

"මං ඔයාට බඩුවක් ගෙනාවා..."

ඒකි පාර්සලයක් මගෙ අතට දෙන ගමන් ඇස් ලොකු කරලා කිව්වා.

"බෝම්බද...?"

"ඔව්"

"හරි ඉතිං... ගෙනාවෙත් බෝම්බයක් විසින්මනේ..."

"ඔයා හොඳ නෑ..."

ඒකි මූවෙක් වගේ ලොකු ඇස් බිමට හැරෙව්වා. පව්...

"මං ආයිත් එන්නෑ... අයියව බලන්න."

"ලොකු දෙයක්..."

එහෙම කිව්වා නෙවෙයි. මට එහෙම කියැවුණා. කොහොමටත් කාට හරි කැපිල්ලක් දාන එක මගේ හැටියක්නේ.

"සො...රි... අයියා.. මං යන්නං..."

අංජලී ආපහු හැරුනෙ මාර වේගෙකින්. මං හිතන්නෙ, සුසන්තිකාට, දමයන්ති දර්ශාට විතරක් නෙවෙයි ශ්‍රියානි කුලවංශටත් බැරුව ඇති ඔය තරං හයියෙන් හැරිලා දුවන්න.

"මේ... මේ... අංජලී..."

මං කෑ ගැහුවා. කොහෙද... ඒකි නෙවෙයි ආපහු හැරිලවත් බැලුවෙ. මගෙ කකුල් දෙකට හයිය තිබුණ නම් දුවල ගිහින් අල්ල ගන්නවනේ. මොන කරුමයක් ද යකෝ මේක... මැරෙනව මීට වැඩිය හොඳයි.

"පොඩ්ඩා..."

"මද්දූ කෑ ගහගෙන එළියට ආවෙ, මං අමාරුවෙන් ඇවිදගෙන පාර දිහාවට යනව දැකල වෙන්නැති."

"මොකෝ...?"

"අංජලී ආවා..."

මං ගොඩින් මඩින් සීන් එක වාර්තා කළා.

WWW.SINHALAELIBRARY.COM 6

"යකෝ මීට පස්සෙවත් කථා කරනකොට හතර මායිම බලපං..."

මද්දු අයියත් මගේ ඇසටම ගොඩවුණා. කථාව ඇත්ත. මගෙයි වැරැද්ද...

"කාම වැඩි දුරක් යන්න නැතුව ඇති. ඉදපං මං බලල එන්නං..."

මද්දු සංගාල බයික් එකේ නැගල ඉගිල්ලුනා. ඕකට ඕකේ මට ඉස්සෙල්ල මූ කෙල්ලව බයිසිද දන්නෑ... මිදුලෙ සිමෙන්ති බංකුව උඩ බහං හිලාගෙන ඉන්නකොට මට හිතුනා.

එතකොටමයි මට මතක් වුණේ ඇංජලීගෙ පාර්සලේ. මම ඒකෙ රැ පින් එක ගැලෙව්වා. ඊට පස්සෙ මතුවුණේ පෙට්ටියක්. ඊළඟට මං ඒකත් දිග ඇරියා. මළ කෙලියයි. ලස්සන වෙඩි මෙයාර් කෙනෙක්. ඇංජලී ළඟ හිටියා නම් ඒකිව තව පාරක් අවුස්සන්න තිබ්බා මේ ගැන අහලා. එක අතකට හරි. මනුස්සකමට හරි ඒකි මාව බලන්න ආවනේ.

"පුරේතා... පුරේතා..."

මද්දුවා කෑ ගහගෙන ඇවිත් මිදුල මැද්දෙ බයික් එක නැවැත්තුවා.

"තව ටිකෙන් බස් එකේ නගිනවා. මාව දැක්කම ඒකිට ඇඬුණා නොදවම. පව් යකෝ..."

ඒ පාර මූ මොකාවද එන්න හදන්නේ ? අම්මාරුවෙන් අතට ආපු චාන්ස් එක... ඒකත් මිස් වුණානේ...

"මොකෝ උඹ සැඩ් මූඩ් එකේ. මං හිතුවද කියල හිතුවද සින් එකට... නෑ මල්ලී... උඹේ විස්සින් උඹම හිලපං... මෙන්න කෙල්ලගෙ ෆෝන් නම්බර් එක..."

මද්දුවා අල්ලෙ ලියාගෙන ආපු ඇංජලීගෙ ෆෝන් නම්බර් එක මට පෙන්නන ගමන් සිනිඳියක් දැම්මා. ඔන්න ඔහොම එතැනින් මොනවද අයියා කරන්න බැරි... පුරේ... විතන... ඔහොම යං... ඔහොම යං...

## 6

නිකම්ම ගෙදරට වෙලා ඉන්න එකේ චිත්‍රයක් දෙකක් ඇඳ ගන්නෙත් නොදැයි [illegible] මගෙ සිතේට වැටුණා. මද්දු වැඩට යන්න ඉස්සෙල්ල චිත්‍ර අඳින බෝඩ් එකයි, පාට සායම්, පින්සලුයි මට ඉඳගන්න පුටුවකුයි මිදුලෙන් තියාගත්තා.

"එක එක කෙල්ලො පාරවල් හරහා පැතල කතුල් කවනවා. දාකම් කරන්නොන අයි..."



පින් කැබිල්ලක් දාගෙන මද්දු මාරු. මං ලාට ෂේප් තියාවත් දීලා ෂේප් උනා. පිස්සා... මං කරම්වත් ජීවිතේ ගැන බරක් කතලක් නෑ.

පින්සල චිත්‍ර බෝඩ් එකේ එහෙ මෙහෙ දුවනවා [illegible] මං, මං ගැන හිතුවා. කොහොම ඉඳපු කොල්ලෙක් ද...? අද මේ [illegible] උස්ස ගන්න බැරුව වාටර් වෙන්නේ... මද්දු කියනවා [illegible] මේ [illegible] කරේ අර පින්සු බඩුව. කරන හිතෙන්නෙ මේ වෙලාවට නම්...

"අම්මා..."

මං කෑ ගැහුවා ගෙතෙටයි... එත් අම්මා දුවගෙන ආවා.

"පුටුවක් අල්ලන්න... මට නැගී යන්නෙපා..."

අම්මා එක [illegible] ඇල්ලුවා. මං කිහිලි කරුවක් [illegible] වැටිල ටිකෙ ඒ කොට්ටෙට [illegible] ඇංජලීගෙ ටෙලිෆෝන් නම්බර් එක හොයන්න ගත්තා. ඒ [illegible] කරන ගමනුත් මං කල්පනා කරේ මොනවද කථා කරන්නෙ කියලා.

"හෙ...ලෝ..."

පුංචි වෙලාවක් ෆෝන් එක විං වුනාට පස්සෙ අනික් පැත්තෙන් පිරිමි වොයිස් එකක් ඇහුණා.

"ඇංජලී...?" මං එහෙම ඇහුවෙ සැකෙට වගේ.

"ඔව්..."

ඔය කියන්නෙ බඩු. කැමරාවත් නෙතෙකුට වඩිද්දා විදියක් නෑ කියන්නෙ නිකං නෙමෙයිනේ...

"විතන සියර්..."

"අයියා..."

"හැඳිනුණාද ?"

"ත්... නෑ..."

"නැති වෙන්නෙ කොහොමද ? මෙතෙවත් ඇහෙනවා පපුව ගැහෙන සද්දෙ..."

ඒකි හිමිට හිනාවුණා. පිස්සි... මං එහෙම කිව්වෙ නෑ... හිතුව විතරයි. මය එක එක ඒවා කියලා කෙල්ලට මළ පැන්නොත් මගෙ මලුවට ගහනවා කියලා හිතාගෙන රිසිවර් එක අතාරියි. එහෙම වෙලා ෆෝන් එක කැඩුනොත් පවුනේ එයාගෙ තාත්තගෙ සල්ලි.

"අයියා කථා කළේ...?"

"ඇයි කතා කරන්න එපාද ?"

"මං එහෙම කිව්වද ?"

"මට එහෙම හිතුනා"

"ඔයාට හිතෙන හැමදේම හරියි කියල හිතෙනවද ?"

"ඔව්.."

"පිස්සෙක්..."

"පිස්සෙක්..?"

ඇංජලී හොඳටෝම හිනාවෙනවා. ඔය වෙලාවට තමයි හිතෙන්නෙ ළඟ හිටියනම් කියලා. එහෙමනම් මං ඒකිගෙ නහය මිරිකලා, කන හපලා, තම්මුල ඉඹලා.. තව අම්මෝ එතනින් එහාට ඇඩල්ට්ස් ඔන්ලි.

"අයියා..."

ඒ පාර ඇංජලී.. තේරුණාවත්ද මං හිතපු දේවල්. එහෙම වුණොත් නං වසල කිව්විය.

"අයියෝ... ඇයි අනේ කතා නොකරන්නේ...?"

"ඔයාගෙ කටහඬ ඇහෙනකොට කතා කරන්න අමතක වෙනවා. අනේ..."

"ඇත්තද ?"

"ඇත්තයි..."

ටිකක් වෙලා අපි දෙන්නට හිනාවුණා. ඔන්න පුතේ. මේ පාර නම් විනත වික්‍රමසිංහගෙ ලෝකෙ අම්බානක වෙනස් වෙන්නයි යන්නේ. ඇඩ් යකෝ... මේ හොරිකඩ නාම්බට නිකමටවත් හිතෙන් නෑනේ. ගෙදර ටෙලිෆෝන් බිල ගෙවන්නෙ පොලීසියෙන් නෙමෙයි කියලා.

"ඇංජලී..."

"ම්..."

"ඔයා හරි ලස්සනයි.."

"ත්... තැන්ක්ස්..."

"අපි ඔයාගෙ ෆොටෝ ටිකක් ගම්මු. මං වැඩ කරන පත්තරේට දාන්නත් පුළුවන්..."

ඇංජලී නිශ්ශබ්ද වුණා. තත්පර කීපයක් ගෙවුණා. වෙන කෙල්ලෙකුට මෙ චාන්ස් එක දුන්නනම් මෙලහකට සිය පාරක් හා කියලා...

"ඔයා මට කෝල් කළේ ඔය ටික කියන්න විතරද ?"

ඒකිගෙ කටහඬට මොනවාදෝ වෙලා. මටත් හිතුණා ආයෙත් මළ පන්නන්න.



"ඔව්..." මං කිව්වා.

"ඔයා හරි නරකයි අයියා. පිංතූර ගන්න විතරක් මට කතා කළා. එදත් මගේ හිත රිද්දුවා... අදත් එහෙමයි. කතා කරන්නෙපා මීට පස්සෙ මට..."

ඇංජලී දඩස් ගාලා රිසීවර් එක තිබ්බා. මට කෙළියේ.

මචං විහඟ, මොකක්ද බං ඒ වුණේ ?

3

අනේ මන්දා... මටත් කටක් නෙමේ පිහිටල තියෙන්නෙ, තනිකර වක්කඩයක්. ළඟක හිටිය නම් ඒකි මට ගහාවි ටෙලිෆෝන් එක බට ඇතුළට යන්න. රිසීවරේ බඩ උඩ තියෙන්න. ඇයි දෙයියනේ, මට කියල මොළේ කළදක්වත් නැද්ද? රට පුරාම කෙල්ලන්ගෙ ෆොටෝ ගහල පත්තරවල දම්මට, ඒ වගේ දේවල්වලට අකමැති කෙල්ලොත් ඉන්නව කියල දැනගත්තෙ අංජලීගෙන්නෙ. හිතට හිතේ ඒකි ටෙලිෆෝන් එක දඩාස් ගාල තිබ්බ සද්දෙ තාම ඇහෙනව වගේ. ඉඳල ඉඳල හිත ගියපු කෙල්ලත් චකබිලාස් කරගත්තා මේ වනචර කට හින්ද.

"හල්ලෝ සනා... මේ පාර නම් හොඳටම ඇණගෙන වගේනේ..."

හජ්පෙ ශ්‍රී රාජය. කකුල කැඩිලවත් මුගෙන් නං නිවනක් නෑ වගේ. අපේ මද්දුවා ගාවට මං ළඟින්ම ආශ්‍රය කරපු එකා ශ්‍රීරාජ් තමයි. ඌ මුස්ලිම් එකෙක්...

"ඇයි උඹ ආවෙ...?"

මං හොඳටම දන්නවා ඌ ආවෙ මාව බලන්න. ඒත් ඌව කපන්න හිතාගෙන මං උගෙන් ඇහුවා. ඒත් ඌ කොහෙද තම්බන්නෙ.

"මේ අපේ මද්දුවා කාටදෝ ට්‍රයිලු... අර ඩොකෙකුටද කොහෙද.. නිකං හරි අපේ වාසනාවකටවත් ඌට සෙට් උනොත් බය නැනෙ මචං... ඉස්පිරිතාලෙ අපේ වගෙ තමයි..."

"ඒ... ඒ.... ආයෙ කියපං බලන්න... උඹේ වාසනාවට...?

මද්දු එබුණා කාමරේට. ඌටත් ඇහිල වගේ මුගේ අඳෝනාව.

"න්...නෑ.. මද්දූ... මං මේ කිව්වෙ... මූ කොහේදෝ යන බඩුවක් දිහා බලන් ගිහින් වැටිල බේරුනේ අපේ වාසනාවට කියල"

රාජ්ගෙ කතාවට මට කද වුණා. කොහේදෝ යන බඩුවක් කියල මූ දීපු ගැවෙන්නෙ නැතුව වගේ අංජලී ගැන කියපු තැන.

"බලපංකො... මද්දූ.. මූ ඇඳ උඩින් බලන් හිටිය වගේ කියන හැටි..."

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 8

මගේ කතාවට මද්දුටයි, ශ්‍රී රාජ්ටයි හිනා. කොහොම හරි ශ්‍රී රාජ් මද්දූ අයියගෙන් මට උන ඩීන් කෝන් එක අහගත්තා. ඒත් රාජ් කොහොමද වොකාගෙ ඩීන් එක දන්නෙ. සමහර විට රාජ් ෆෝන් කරද්දි මද්දූගෙ කට්න් පිටවෙන්නැති.

"විහඟ..."

මං රාජ්ගෙ මූණ දිහාවෙ බැලුවා. උෟ ඇස් දෙකත් හීන් කරගෙන මලුව පොඩ්ඩක් ගැස්සුවා. ඒ කියන්නේ මූ දැන් සීරියස් මොනා හරි කමයි කියන්න යන්නෙ.

"මචං... උඹට මතකනෙ, බේරුවල අපේ මාමගෙ දූ..."

මට මොකද අමතක. අර රෝස පාට ජම්බු ගෙඩිය වගේ ඩේලියා මල නෙ. අනේ, ඒකිගෙ ෆොටෝ එකක් අපේ පත්තරේට දාගත්තම්...

"ඔව්... ඉතිං... ඒකි පැනල ගිහින්ද...?"

"පු.. පිස්සුද බං... ලබන මාසෙ අන්තිමට ඒකි බඳිනවා. අපේ පැත්තෙන් ඒකිගෙ ෆොටෝස් ටික උඹ කවර් කරන්නෝන විහඟ..."

පැන්ටාස්ටික්... මූණ තුන්කාලක් විතර වහපු... ලොකුම ලොකු නිල්පාට ඇස් තියෙන මුස්ලිම් කෙල්ලො ටිකක් බලාගන්න අතට ආපු චාන්ස් එකක්... එළ කොර විහඟ මල්ලී... සිකුරා දැන් නළලෙ වගේ...

"යකෝ... මගෙ අංඩ අප්සැට්නෙ..."

මං හතරැස් ප්‍රශ්ණයක් දැම්මා. බොරුවක් තියෙන්නත් එපැයි... යාලුවට උනත් එක පාරටම හා කියනෙක ගතියක් නැනෙ.

"අංඩෙ ප්‍රශ්ණෙ මං බලාගන්නම් රාජ්... මං මූව එවන්නම්, ලබන සතියෙ මූගෙ ප්ලාස්ටර් ගලවනවා. ඊට පස්සෙ අවුලක් නැනෙ..."

මිකේ... මද්දූවා ඒක කියපු කැත. හරියට උගෙ කකුලෙ ප්ලාස්ටරේ ගලවන්නම වගේනෙ කරාව. ඔව්... ඉතිං උෟට අර චූටි ඩොක්ටර් ව බලන්න යන්න පුලුවන්නෙ... තවත් ටිකක් වෙලා ගිහින් ශ්‍රී රාජය යන්න ගියා. උෟ ගියා විතරයි මද්දූ අයියා ඇස් දෙකත් ලොකු කරන් මං දිහා බැලුවා.

"පොඩ්ඩෝ..."

"හ්ම..."

"මොකෝ උඹ අප්සෙට් එකෙන් වගේ..."

මූට දිවැස්ද මංදා. මං මෙච්චර හිනාවෙච් ජොලි මූඩ් එකක් අරන් ඉන්නවා බොරුවට. ඒත් මූට බොරු කරන්න බෑ. අංජලී එක්ක කතා කරල වෙච්ච දේ අකුරක් නෑර මං උෟට කිව්වා. මද්දූ හොඳ එකා. කියන දේ ඉවර වෙනකන්ම අහගෙන ඉන්නවා. ඊට පස්සෙ කමයි උෟ දහඅට සන්නිය නටන්නෙ.



"හනේ... උඹ වගේ මැට්ටෙක්..."

මද්දූ මූණ අඹ ඇටේ වගෙ කරන් කිව්වා.

"ඇයි මද්දූ අයියා...?"

"ඇයි කියන්නෙ...? මං කොයි තරම් කට්ටක් කාලද නම්බර් එක උඹට ගෙනත් දුන්නෙ. දැන් කාපංකො කෑණිකොළ... අනේ උඹ නම්...?"

"දැන් ඉතිං මොකද කරන්නෙ මද්දූ...?"

මද්දූගෙ අදෝනාව අහන් ඉන්න බැරිම තැන මං ඇහුවා.

"පොඩ්ඩක් ඉඳපං... මං අම්මගෙන් අහලම කියන්නම්... අම්මේ..."

මලසෝන වගේ කියාගෙන මද්දූ කුස්සිය පැත්තට ගියා. කකුල හරියකට තිවුන නම පස්සෙන් දුවල ගිහින් උෟව නවත්ත ගන්නවත් තිබුණා. මද්දූ අංජලී ගැන අම්මට කිව්වොත්.., මගේ අනිත් කකුලටත් ප්ලාස්ටර් වල් පැරිස් තමයි. ටිකකින් මද්දූ ආයෙත් කාමරේට ආවා. උෟ අතේ ලොකු කෝලි කුට්ටු ගෙඩි දෙකක්.

"ඉඳා... මේක කාලවත් හැදෙන්න බලපං..."

කෝලි කුට්ටු ගෙඩියක් මට දාන ගමන් උෟ කියනවා. මට හිනා ගියා.

"අම්මට කිව්වද ?"

කෝලි කුට්ටුවෙන් බාගයක් විතර කටට දාන ගමන් මං ඇහුවා. කකුල කැඩුනට කට කැඩිල නැනෙ.

"පිස්සුද පොඩ්ඩෝ...?"

උෟ එහෙම කිව්වහමයි මට ටිකක් ෆිට් වුණේ.

"උඹ දන්.ඇහුවනෙ මොකද කරන්නෙ කියලා. ඒකි ආයෙත් ෆෝන් කරනකං ඉඳපං... ජූවර් එකට තව දවස් තුනක් යන්න කලින් ඒකි ෆෝන් කරාවි. ඉතිරි ටික උඹ කරගනිං..."

මද්දූගෙ කථාවත් ඇත්ත. වැඩිය පැනල දෙන එකත් හොඳ නැනෙ. ඉවසපං පුතුව, ට්‍රයි කරල ඉවසපං...

## 8

දවස් ගානක් එක සීරුවට ගෙවිල ගියා. මං පුදුම තරමෙ කම්මැලි කමෙන් ගෙදරට වෙලා හිටියෙ. අම්මගෙ සාත්තුව හින්ද හිතුවට වැඩිය ඉක්මනට කකුල බිම තියන්නත් පුලුවන් වුණා. ඒවා ඔක්කොම එහෙම වුනත් මගෙ හිත බලාපොරොත්තුවෙන් ඉඳපු දේ සිද්ධ වුණේ නෑ. මද්දූ අයියා බැන්ක් එකේ වැඩ ඇරිල ආපු ගමන් අහන්නෙ අංජලී ෆෝන්

WWW.SINHALAELIBRARY.COM 9

තරුදු කියල. ඒ වෙලාවට තමයි පින්සූ පයින්තියං වෙන්නෙ.

මද්දුවා අද නිවාඩු. උදේ ඉඳලම ගෙදර එක සුද්දෙ. පොර ඉස්පිරිතාලෙ ඇඳන් යන්න සුට් හොයනවා. අදනෙ මගෙ කකුලෙ ප්ලාස්ටර් ගලවන්න තියෙන්නෙ. හුවර් එකට අර චූටි ඩොක්ටර් ගැන මුගේ හිත ගිහින් ඇති.

"රැයිට්... මං රෙඩි පොඩිඩෝ... ඔයා හරිද...?"

සිරා සිටන් ගහගෙන මද්දූ මං ඉස්සරහ.

"මං රෙඩි වෙලා කොච්චර වෙලාද මද්දූ..."

"දෙයියන්ගෙ පිහිටෙන් පරෙස්සමට ගිහින් එන්න..."

මායි මද්දූ අයියයි ගෙදරින් එළියට එනකොටම අම්මා කිව්වා. ස්ටුඩ් එකත් එක්ක මං බොහොම අමාරුවෙන් ඇවිද්දෙ. හන්දියෙන් කුලියකට ත්‍රී වීල් එකක් නැගල මායි මද්දුයි ඉස්පිරිතාලෙ ගාව බැස්සා.

"අර ලේඩි ඩොක්ටර් හිටියනම් හොඳයි නේද පොඩිඩෝ..."

"මොකක්...?"

"මං හොල්මං වෙලා මද්දූ අයියා දිහා බැලුවා."

"ඇයි හලෝ... අනුන්ගෙ වාහන එළවන්න යන්නෙ... හරි නැනෙ. නේද ?"

"මද්දුගෙ මූණ ඇඳුණා. පව්.. හිත ගිය තැන මාලිගාවලුනෙ... එහෙම කියලා අනුන්ගෙ ගෑණු බදාගන්න අපිට බෑනෙ. කන්න වෙයි දෙල්ගහ, කොස් පැලේ වගේ පේන්න. තවත් ටික වෙලාවක් යද්දී මගෙ කකුලෙ ප්ලාස්ටර් එක ගැලෙව්වා. ගලවපු ඩොක්ටා ටිකක් වයසක පොරක්. ඒත් අවුලක් නෑ. දෙයියනේ කියල කකුලට ආබාධයක් නෑ. මං කකුල හතර අතටම කරව කරව බැලුවා. මද්දුව හිනා.

"ඒයි... අන්න...!"

කොරිඩෝරෙ කාලෙට අවිය ගිය කියා යන රූපෙ අඳුනගන්න මට අමාරු වුණේ නෑ. ඒ අර චූටි ඩොක්ටර්. මං මද්දුට එයාව පෙන්නුවට පොරට කානන් වත් නෑ. අම්මෝ චූටි මොනාව වෙලාද ? දැන් ඉස්පිරිතාලෙට එනකං අඳෝනාව කිව්වෙ ඩොක්ටා ගැන. දැන් ඇස් ගෙඩි දෙකට දකලත් චූට් කෙණික වරියාකවත් නෑ. ඉතිං මේ අවතාවුව කාට කියන්නද ? මං ආයෙත් මද්දූ දිහා බැලුවා. මෙන්න පොර හිනාවෙනවා කාත් එක්කදෝ. මං ඉස්සෙනට පොර බලන් ඉන්න පැත්ත බැලුවා. හුටා, අර චූටි ඩොක්ටර් අපි ගාව.

"නෑ, විකට ආයෙත් ඇවිල්ල තියෙන්නෙ. ඒ පාර මොකක්ද තුවාල කරගත්තෙ..."

මගෙ නමත් මතකයි එහෙනම්...! මද්දුගෙ මොකක්දෝ හොරයක් තියෙනව වගේ මට තේරුණා. පොර ඇඹරෙනවා.



"මගේ නම් නෙමේ ඩොක්ටර්..."

"එහෙනම්...?"

කවිම කවි ප්‍රශ්නාර්ථ ලකුණක් ඒ සුදු මූණ පුරාවටම දාගෙන එයා මද්දූ දිහාවෙ බැලුවා.

"අපේ මද්දූ අයියගෙ නම..."

කවදී දිවේ නොදැවී මං කියලා දුන්නා. ඔව් ... මං කදය වගේ මද්දූ දිහායි චූටි ඩොක්ටර් දිහායි බැලුවා. මෙන්න බොලේ දෙන්නට දෙන්න මූණවල් දිහා බලාගෙන. විකක ප්‍රශ්න... එකපොට අන්තිම තැපයි වගේ. ව්‍යලත් විරක වෙන කාලේ ඉස්පිරිතාලේ ගෙදර ගියා නම් හොඳයි වගේ.

"උඹට සුවර්ද පොඩිඩෝ එයා බැඳල කියලා..."

අපි දෙන්නා ගෙදර එන ගමනේ මද්දූ අයියා මගෙන් අහනවා.

"ඕ... ඉයස්... ඒක ඉන්ෂුවරන්ස් එකටත් වැඩිය ෂුවර්... ඇයි හලෝ දක්කෙ නැද්ද අර කවි මුදු පතයක් ඇඟිල්ලෙ ඔතාගෙන හිටියෙ..."

ඒත් මං කිව්ව එක ගණන් ගත් නැතුව වගේ මද්දූ හිනාවෙවී ඉන්නෙ.

"මද්දූ..."

"මොකෝ...?"

"ඔයාගෙ හිතේ මොකක් හරි තියෙනවා..."

මගේ හිතට ආපු සැකේ නින්දෙම මං ඇහුවා. මද්දූ අයියත් ඇවිල්ලා උණු වතුර බීල, කූල් ඩ්‍රින්ක් එක පව්ච් දාන පොරක්නෙ. මූ මටත් හොරා අර ලස්සන, සුදු, චූටි ඩොක්ටර්ව සෙට් කරගෙන වත්ද ? ඇයි මං සැකි ගානත් ගෙදරනෙ.

"ඒ පාර මොකද පොඩිඩා අවුල..."

"මුකුත් නෑ..."

මට හිතුන ඒව මං ඇහුවෙ නෑ. උං කැමති දේනෙ. ගෙදරට ගොඩවෙනකනුත් මං කල්පනා කළේ මද්දූ ගැන. මෙච්චර අහෝන විට කෙල්ලො ඉන්න රටේ මූ බැඳපු එකත් පස්සෙන් යන හැටි.

"චූටි පුතා, අන්න අර එදා ආපු ගෑණු ළමයා ෆෝන් කරා."

අපි එනව ඇහිලද කොහෙද අම්මා කුස්සියෙ ඉඳලම නෑ ගැහුවා. හුරේ... ඔය තියෙන්නෙ. ෆිට් කමයි කියන්න වගේ මද්දූ අයියා මාපටැඟිල්ල උරුක් කරා. මගෙ හිතට ආවෙ සතුටක්. ඇන්ජලීට එහෙනම් මාව අමතක වෙලා නෑ. මගෙත් එක්ක තරහ වෙලත් නෑ.

"මුකුත් විස්තරයක් ගෙම කිව්වද අම්මෙ...?"

කුස්සියටම ගිහින් මං අම්මගෙන් ඇහුවා. ඒත් අම්මා මගේ ප්‍රශ්නෙ ගණන් ගත්තෙවත් නෑ. අම්මා බැලුවෙ කකුල දිහා. අනේ අර හුරතල්

www.sinhalaelibrary.com

පොඩි එකී ෆෝන් එකෙන් මොනා කිව්වද දන්නෙ නෑ. ඕකට ඕකේ... මට ඉන්න බැරි වුණානෙ.

"කිව්ව දෙයක් නෑ... මගෙත් එක්ක කතා කරා මිසක. කාගෙ වුනත් හොඳ සීදේවි කෙලි පැංචියෙක්..."

ඒ පාර ශෙකී අම්මවත් අල්ලගෙන වගේ. දැන් ඉතිං කාපංකො ටකරං... කට්ටකමට මං ගැන වචනයක් වත් අහල නෑ වගේ. එහෙම හිතෙනකොට මට තද වේගෙන ආවා.

"ඒ පාර මොකෝ... අංජලී කියල තියෙන්නෙ...?"

මද්දූ අයියා තුවායක් කරේ දාගෙන. මං සාලෙට එනකොටම වගේ ඇහුවෙ.

"අරකි ෆෝන් කරලත් මං ගැන අහල නෑනෙ ඕයි..." මං කේන්තිය එළියටම දැම්මා.

"උඹත් පොරක්ද බං... උඹ ගැන අහන්න...?"

ඕකේ... කුණු මද්දූවා ඒක කියපු කැත. මං ඌට ගහන්න එළවගෙන ගියා. ඌ තුවායත් වන වනාම පැනල දිව්වා.

## 9

ඉර හැංගිල යන්න ඔන්න මෙන්න. මායි ශ්‍රී රාජුයි කොල්ලො ගෑන්සියත් එක්ක මෙච්චර වෙලා කරේ යූ. සී. ග්‍රවුන්ඩ් එකේ ෆුට් බෝල් ගහපු එක. අර චූටි ඩොක්ටර් කිව්වනෙ කකුලට ටිකක් එක්සසයිසස් දෙන්න කියලා. ඒකත් කිව්වෙ කට උල් කරලා...! අනේ එයාගෙන් මාර කැටයං. ටිකක් එක්සසයිසස් කිව්වට, මං බෝලෙට දුන්නා. බෝලෙ 'වොරි' වෙන්න. මං හිතන්නෙ කකුලත් 'වොරි' වෙන්නැති.

"හප්පා... මාර ටයර්ඩ්..."

රාජ් එහෙම කියන ගමන් ෂෝටෙ තැවරුණු මඩ පිහිදානවා. මං ඌ දිහා බැලුවා. ඌ හිනාවෙනවා. මූගේ මොළේ හොඳ නැද්ද මංදා... මෙතන හිනාවෙන්න දෙයක් වුණේ නෑනෙ.

"මොකෝ බං...?"

"වැඩක් මතක් වුණා..."

පූවර් එකට දෙකේ පන්තියෙ කුණු හරුප කෑල්ලක් මූට මතක් වෙන්නැති. නැත්තං අලුතෙන් කියලා අයිඩියා පාරක් මූගෙ ඔලුවෙන් කවදාවත් ඇවිත් නෑනෙ. මං නෝන්ඩියට වගේ ඌ දිහාවෙ බැලුවා. ඌට ඒක තේරුණා.



"අඩෝ උඹ හිතන්නෙ මං බයිලයක් ගහන්න යනව කියලද? නෑ බං... මං හිතුවෙ, මටත් වැඩිය උඹ කෙල්ලො දූකල ඇති... පත්තරවලට ෆොටෝස් ගහද්දි... තෝ, ඒත් උඹ ඇයි මේ කවදාක්වත් නැතුව පොඩි කෙල්ලෙක් ගැන හිතන්නෙ"

ඕය කෙළියෙ තාප්පෙ ගැලවෙන්නම. මූත් ඉඳල ඉඳල ඇහුවෙ මං හතරැස් වෙන මගුලක්නෙ. ඇත්තටම මං අංජලී ගැන හිතනවද ? මං මගෙන්ම අහගත්තා. චූටි සුදු මූණ... දුඹුරු පාටට හැරිච්ච දිග ඇස් දෙක.... හුරතල් කටහඬ. මගේ හිතින් ඈත් කරන්න අමාරු විත්තිය මට තේරුණා. ඒ ගැන හිතාගෙන යද්දි...

"මට තේරෙන් නෑ රාජ්..."

මං ශ්‍රී රාජ්ට ඇත්තම කිව්වා. එදා මං ඉස්පිරිතාලෙ ගියපු දවසෙ ෆෝන් කරාට පස්සෙ අංජලී ෆෝන් කරල තිබ්බෙ නෑ... ඒ ගැන මගේ හිතේ තිබ්බ අමාරුව මං කාටවත් කිව්වෙ නෑ. මද්දූවට කිව්වොත් ඌ පස්සෙනුත් හිනාවේවි.

"උඹ ඒකිට ෆෝන් කරේ නැද්ද ?"

"මට හිතුන් නෑ රාජ්... අනිත් එක මට බෑනෙ ඒකිට සෙකන්ඩ් වෙන්න..."

"ඔව් ඉතිං... උඹ තර්ඩ් උනා මිසක, කවදාවත් සෙකන්ඩ් උනේ නෑනෙ..."

හීන් සැපිල්ලකුත් දාන ගමන් ශ්‍රී රාජ් හිනාවුණා. මං ඌට ඔරොප්පු මූඩ් එකක් දාන්න හිතුවත් ඒක කරන්න බැරිවුණා. ඒ උගේ හිනාවෙන් පිරුණු මූණ දැක්කහම. කොහොම කොහොම හරි අපි දෙන්නටම බයිල ගගහ තව අඩි දෙකක්වත් යන්න හම්බ වුනෙ නෑ. සුදු පාට වැලි මෝටර් සයිකලයක් අපේ පාර හරස් කරා. තප්පර ගානක් යනකන් මොකද වෙන්න යන්නෙ කියල මට හිතාගන්න බැරිවුණා. රාජුත් හොල්මං වෙලා.

"බයවුණාද...?"

ඒ කටහඬ අඳුනගන්න මට අමාරු වුණේ නෑ. ෆුල් ෆේස් හෙල්මට් ගලවන ගමන් අංජලී හිනාවුනා. එදා අපේ ගෙදර ආපු යාලුවත් එයාත් එක්ක ඇවිත්.

"බය වෙන්නැද්ද මිස්... එල්.ටී.ටී.ඊ. කාරයො වගේ" කඩත් පනිනකොට..."

ශ්‍රී රාජ් වක්කඩේ ඇරියා. මං මුකුත් නොකියා අංජලී දිහාවෙ බැලුවා. කලුපාටට හුරු ස්ලැක් එකයි, පොකට් පන්සියක් විතර අල්ලපු චොක්ලට් පාටට හුරු ටී ෂර්ට් එකකුයි ඇඳන් ඉඳපු අංජලී හුගක් ලස්සනට මං දැක්කා. ඒත් ඒ ලස්සන ගැන කියන්න බැරුව මං ගොලුවෙලා.

"ඉත්තිං..."

www.sinhalaelibrary.com

WWW.SINHALAELIBRARY.COM 11

ආයෙමත් ඒ දුඹුරු පාට ඇස් දෙක මගේ දිහාට හැරිලා. එක්කාවේ ඇවියත්, ශ්‍රී රාජ් තොල්මින් වෙලා කියල මට තේරුණා.

"මේ... මේ... අර උඹට මං කිව්වෙ..."

අංජලීව උංට ඉන්ට්‍රොඩියුස් කරන්න හිතාගෙන මං කථා කරත් උං මැද්දට පැන්නා.

"ම... යර්ස්... අංජලී... නේද ? මං ශ්‍රී රාජ්..."

උං එහෙම කියලා අංජලිත් එක්ක ෂේක් හෑන්ඩ් කරා. අනේ අම්මපා වෙන වෙලාවක නම් මං මූගේ බෙල්ල මිරිකනවා. මං එත් තාම ඒ රෝස පාට අත අල්ලල නෑ. මූ කැත නැතුව අල්ලපු හැටි... යමංකො අද ගෙදර.

"විහග අයියා... ගොලු කසාය බීල වගේ නේද අංජු..."

අංජලී එක්ක ආපු අනිත් කෑල්ල මං දිහා බලල අංජලීගෙන් ඇහුවා. අංජලී ඊකට මොකක්දෝ කියන්න හැදුවත්, අපේ ගල් මූසලයා ආයෙත් එක්කාවේ ඇවියා.

"නෑ... මූට මේ හිතේ අමාරුව... වැඩියක්ම මං දැන් නංගිගෙ අත අල්ලපු හන්ද වෙන්නැති. මේ දෙන්නට ඕනෑ දෙයක්. කතා කරගන්න දීලා එන්න 'ස්වීටි' අපි අර පැත්තට යමු..."

නප්පේ ඇති යංතං.. අවුරුදු ගානකට පස්සෙ මූ මොළේ ඇති වැඩක් කරා...! උං අනිත් කෑල්ලත් එක්ක හීනි කතාවක් දාගෙන පන්සල පාර පැත්තට ගියා. මායි අංජලීයි වැලිය ගාව තනර වුණා.

"කරනද අයියා..?"

මූණ පැත්තකට ඇල කරල අංජලී මගෙන් ඇහුවා. ඒ දිග ඇස් දෙක මගෙන් මොනවාදෝ ඉල්ලනව වගේ.

"නෑ... අංජු... ඒත් ඇයි ඔයා මට ෆෝන් කරේ නැත්තෙ ? අයියා ෆෝන් කරනකං මං බලන් හිටියා..." ඒකි නාලෙට කිව්වා.

"ඇයි... පත්තරේට ෆොටෝ එක දාගන්නද...?"

මගේ කටත් හොඳ නෑනෙ. අංජලීගෙ මූන රතු වුනා. ඒ ලස්සන ඇස්වලට බොහොම ඉක්මනට කඳුලු ආවා. මිකේ... මං වගේ පිං නොහෙත්. කට කැඩිච්ච කථා කියල අංජලී ගියොත් හෙම හූල්ලන්න තමයි වෙන්නෙ... බලන් යනකොට මං මේ තරං අන්ලකීද...?

## 10

ඒ කඳුළු පිරුණු ඇස් ගාව මං විනාඩි ගානක් ගොලුවුනා. මූනත් රතු කරන් වැලියෙ ඕට එක නියපොත්තෙන් හූරන අංජලීගේ මූණ දිහාවෙ මං බැලුවා විගාවට. එයා අඬන්නයි යන්නෙ.



"ප්ලීස්... අංජලී... අඬන්නෙපා... මං ඒක හිතල නෙමේ කිව්වෙ... රියලි වෙරි සොරි නංගි... මං ගාව ලේන්සුවක් වත් නෑ. අපි මේ සෙල්ලම් කරල එන ගමන්..."

මගේ කටට කොහෙන් වචන ආවද මංදා. ස්ලැක් එකෙන් එළියට ඇදල ගත්තු ලේන්සුවෙන් එයා කඳුළු පිහිදා ගත්තා. මැලිවෙලා වගේ තියෙන ඒ සුදු මූණ දැක්කහම මට පව් කියල හිතුනා...

"අනේ... දැන් දවස් කීයක් ඔයා මගේ හිත රිදෙව්වද අයියා. ඇයි මට මෙහෙම කරන්නේ..."

මගෙ මූණ ගාවටම ඒ පුටි මූණ ළං කරල අංජලී ඇහුවා.

"එහෙනම් ඇයි ඔයා එදා ෆෝන් එක දමෝස් ගාලා තිබ්බෙ. මගේ කන තාම කුං කුං ගානවා..."

අංජලීට හිනා ගියා. අනේ ඒ මූනෙ ලස්සන.

"කුං කුං තමයි. මහම මහ නපුරා... නිකංවත් මට ෆෝන් කරේ නෑ. අදත් මමයි ගෙදරට ෆෝන් කරේ. අම්මා කිව්වා ඔයා ග්‍රවුන්ඩ් අවා කියලා..."

එයා කියාගෙන කියාගෙන ගියා. කතාව නම් හරිම නුරතල්. බදාගෙන ඉඹගෙන ඉඹගෙන යන්න. හිතෙනවා මෙකිව.

"බයිකුත් පදින්න පුළුවන්නේ..."

මං කතාව මාරු කරා. ඇයි මං හිතපු ඒව කරා නම් නවතින්නෙ පොලිසියෙනෙ.

"වැඩිය බෑ අයියා... ඔයා බලන්න ඕන හන්ද පැදන් ආවෙ.. ලයිසනුත් නෑ..."

ඒකි හිනාවෙවී කියවනවා. මගෙ හිතට මොනාට වෙලාද යකෝ... මාර ඈණියක්නෙ... කවදාවත් නැතුව. මේ කෙල්ලෙක් ගැන හිතන්න අරන්...

"ආයෙ ඔයා කවදද ක්ලාස් යන්නෙ අයි.ඩී.එච්. එකේ..."

"සැටඩේ... ඇයි අයියා...?"

"න්....නෑ... නිකං..."

අංජලි අතින් කට වහගෙන හිනාවෙනවා. මං ඇයි කියල අහන්න වගේ එයා දිහා බැලුවා.

"....මේ ලස්සන ෂෝටකුත් ඇඳගෙන ඉන්දෙද්දි නිකං කියන්නෙ."

බලන් ගියාම අංජලීගෙත් මාර කැටයං නෙ.

"ෂෝට විතර ද නංගි ලස්සන...?"

මං ටිකක් බර කරල ඇහුවා. එයාගෙ මූණෙ හිනාව එකපාරටම නැංගිලා ගියා.

WWW.SINHALAELIBRARY.COM 12

"ම... ඔයා කොයිතරම් ලස්සනද කියල ඔයාවත් දන් නෑ. අයියේ... ඔයා හරි ලස්සනයි..."

මගේ හිතට මාරම මාර ෆීට් එකක් ආවා. මං හැන්ඩියා කියල සීප දෙනෙක් කියල තිබුණේ මේ වගේ සිරා විදියට තවුරුවත් කිව්වෙ නෑනෙ. අප්පද බොලේ... මට ගියපු කලක්... හරි... ගරේ ඔහොම යං විහඟ මල්ලි... ඔහොම යං...

"ඒක නෙවි අප්පු..."

මං ඒකිගෙ නම දන් ෂෝර්ට් කරලම කතා කරන්න පුරුදු වෙලා. කටත් උල් කරන ගමන් ඒකි මං දිහා බැලුවා.

"එහෙනම්...?"

"ඇයි එදා ගෙදරට ෆෝන් කරපු වෙලාවෙ මං ගැන ඇහුවෙ නැත්තෙ..."

"මං ඔයා ගැන ඇන්ටිගෙන් ඇහුවා. ඒත් අහපු විත්තියක් කියන්නෙපා කියලා ඇන්ටිට කිව්වා..."

පෙනේද... හෙර... මං ඒකිගෙ කනෙන් ඇද්දා.

"ඌයි...! අන්න මිනිස්සුත් බලනවා..."

"ඉතිං...?"

"කිතුල්..."

මද්දූ හිටිය නම් අහවි, කිතුල් කිව්වෙ කිතුල් රා ගැන වත්ද කියල... මච් ඉතිං ඌට මතක් වෙන්නෙත් ඔය වගේ ඇට්ටකුණා වෙච්ච දේවල්නෙ..

"යන් නැද්ද බං... ගෙවල්වල මිනිස්සු පොලිසිවලටත් කියල්ද දන්නෑ..."

ශ්‍රී රාජයයි අර අනිත් කැල්ලයි මෙන්න අපි ගාව. හිකේ.. විහඟ මේ තරං අන්ලකීද ? තව ඩිංගක් වෙලා අංජලීත් එක්ක ඉන්න හම්බ වුනානම්?

"එහෙනම්... අපි යන්නම් විහඟ අයියේ... පස්සෙ හම්බවෙමු"

"පරෙස්සමට යන්න අංජූ..."

මට කියවුනා. අතකුත් වනාගෙන එයාල දෙන්න ගියා මං ශ්‍රී රාජ් දිහා බැලුවා.

"එහෙනම් මචං දැන් වෙලා නැනෙ. හෙට දවල් වෙනකොට මං උඹලගෙට එන්නම්. මද්දුටත් නිවාඩු දාන්න කියපං."

"මොකටද බං...?" උගෙ කතාවට මං හොල්මං වුනා.

"මොකටද අහන්නෙ... ලව් එක හරි ගියාට පාටියක් ගන්නැද්ද යකෝ...?"



"උඹට පයිත්තියං ද...?" අපි ලව් ගැන තියා ඒ ළඟින් යන දෙයක් ගැනවත් කතා කරේ නෑ..."

රාජ්ගෙ ඇස් දෙක නළලටම ගිහින්. උගේ මූණ දැක්කහම මට හිනා ගියා.

"ඔව්... ඉතිං හිනාවෙයං.. උඹ නම් මොන නැකතකින් ඉපදුන එකෙක්ද මංදා... ඒ කෙල්ල උඹව හොයාගෙනත් ආපු එකේ. තොට තේරුම් ගන්න බැරිද බං... උං නිකං මේ කතාවටද ආවේ... නෑනෙ..."

මල පෙරේතය වගේ ඌ කියෝගෙන යනවා. මූ කියන විදියට ලව් කරන්න ගියොත් කන්න වෙයි අම්බානකට. කමක් නෑ විහඟ මල්ලී.. ඔහොම යං... හෙමින් ගමන ඇඟට ගුණයි කියනවනෙ.

## 11

ගෙදර ඇවිල්ලත් මං කල්පනා කරේ අංජලී ගැන. මගේ හිතටත් මොනව වෙලාද කියල මටවත් හිතාගන්න බෑ. ෆුල් ෆේස් හෙල්මට් එක ගලවල, 'බයවුනාද ?' කියල ලනාවකට අහපු හැටි. ප්ලැක් එකටයි ටී එකටයි තිබ්බ කොලිටිය... මං කණෙනන් ඇද්දහම ඇස් දෙක පුංචි කරල බලපු හැටි.. අනේ මංදා ඒ පාර මොනවද මේ මට වෙන්න යන්නෙ. ඒකි මාව 'කොර' කරල නෙ..

"පොඩී..."

කොච්චර මැන්ටල් කෙලා කෙලා හිටියත් ලොකු අයියගෙ වොයිස් එක අඳුනගන්න මට බැරි වුනේ නෑ. මං හැරිල බැලුවා. හුටා...! ලොකු අයියත් එක්ක අචිනි අක්කත් ඇවිත්. ඒ කියන්නෙ අපේ ලොකු අයියගෙ වයිපරේ. ඩබල ළඟදි තමයි බැන්දෙ.

"ඉතිං කොහොමද විහඟ මල්ලී... අම්මා හෙම කෝ...?"

අචිනි අක්කා මගෙන් එහෙම ඇහුවත් ඒකට උත්තරයක් බලාපොරොත්තු වුණේ නෑ. එයා කෙළින්ම ගේ ඇතුළට ගියා. මං 'ලොකු' දිහා බැලුවා.

"තාත්තා ලියුම් එව්වෙ නැද්ද පොඩී...?"

ගිය සුමානෙත් එවල තිවුනා ලොකු.. දන්නවනේ ඉතිං.. ලියුම පුරුදු විදියටම අම්මගෙ ලොකර් එකේ ඇති..."

තාත්තා වැඩ කරේ පිටරට නැව් සමාගමක. සති දෙකකට වතාවක් වත් ලියුමක් එවන්න බැරි වුණොත් තාත්තා ගෙදරට ෆෝන් කරා.

"පත්තරේ වැඩේ මොකෝ ඒ පාර...?"

WWW.SINHALAELIBRARY.COM 13

"වැඩක් නෑ ලොකූ... මගේ ඇක්සිඩන්ට් එකෙන් පස්සෙ මං ඒ පලාතෙ ගියේ නෑ... දවස් ගානක් බොසා මට ෆෝනුත් කරා. මං ඩෝන්ට් කෙයාර්. මට කෙලවිලා ඉන්දෙද්දි බලන්නවත් ආපු නැති එකා ගාවට මං ආයෙත් යන්නෑ..."

මං කියවගෙන ගියා. ලොකු හොල්මං වෙලා වගේ. මං දිහා බලං හිටියා. ඇත්තටම මද්දූගෙයි, ලොකු ගෙයි සැහෙන්න ලොකු වෙනසක් තිබුනා. මද්දූ නම් මෙලහකට මට කටේ ප්ලාස්ටර් ගහගන්න කථා කරලා.

"ඒ වුණාට ඒ වගේ ජොබක් නැති කරගන්නෙපා... එයාල හොඳට ගෙව්වනෙ මයාට..."

බලන් ගියාම ලොකුගෙත් කතාව ඇත්ත. මං මෝලා වගේ පිස්සු කෙළින්න ගිහං හිටියට, එහෙම කරලත් බෑනෙ. සිරා කෙල්ලන්ගෙ ෆොටෝස් ගහල පත්තරේ දාල. ඒව මද්දූවටයි අම්මටයි පෙන්නල මං මොන තරම් සතුටු උනාද ? බලමුකෝ, තව කල් තියෙනවනේ...

කුස්සිය පැත්තෙන් අචිනි අක්කාගෙ කටකතාවේ ඇහුණා. ෂුවර් එකට අම්මත් එක්ක එකතු වෙලා 'තඩයක්' දාගන්නැති. ටිකකින් ලොකු අයියත් කුස්සිය පැත්තට ගියා. මං ආයෙමත් සැටියෙ තනිවුණා. තත්පර ගානයි ගියේ. පොල්ලකින් ගැහුව වගේ මට මතක් උනේ, එදා මුලින්ම අංජලි අපේ ගෙදර ආපු දවසෙ මට දීපු ටෙඩි බෙයාර්ව. මං අඩියට දෙකට මගේ කාමරේට රිංගුවා. හන්තිලව්වට ගහපු කලාබරේ වගේ මට ඒක එදායින් පස්සෙ අමතකම වුනානෙ. බිත්ති කබඩ් එකේ සර්ට් තොගයකට මුවාවෙලා තිබුණු ටෙඩියව මං අතට ගත්තා. ඌ රෝසපාට එකෙක්. දක්කහම ආස හිතෙනවා. හරියට අංජලීට වගේ. අංජලීව ඉඹිනව කියල හිතාගෙන මං ටෙඩියව ඉඹගෙන ඉඹගෙන ගියා.

* * *

සෙනසුරාදා උදේ පාන්දරම රාජ් කඩං පාත් වුණා. මද්දූත් ගෙදර... ලොකුල එදාම ආපහු ගියා. මද්දූ එනකොටත් එයාල ආපහු ගිහින්නෙ.

"මද්දූ... මාර ඇඟෙන් ලූන එදා උනේ...?"

මං දිහා බල බලාව රාජ් කිව්වා. මූ එදා සීන් එක බ්‍රෝඩ් කාස්ට් කරන්න ලෑස්තිය. 'මොකක්ද ?' කියල අහන්න වගේ මද්දූ ඔලුව ඉස්සුවා.

"අඩෝ... මේ... කොරූ එහෙම කෙළියොත් අම්මප අණ්ඩක් කවනවා... තෝ තව කෙළලෑ යයි. මං තව අවුරුදු ගාණක් මේ ගෙදර ඉන්න ඕන..."

මෙන්... මං කිව්ව එක රාජ් පයිසෙකටවත් ගණන් ගත්තෙ නෑ. ඌ... ටාට තොමෙයි වගේ. එදා ශූ. සී. ග්‍රවුන්ඩ් එක ගාවදි අංජලී හම්බ වුනු සීන් එකේ ප්‍රවෘත්ති අංකයට පණ දුන්නා. මද්දූවා හොල්මං.

"චී... චී... චී...! මූ මගේ මල්ලී කියලවත් කියන්න ලැජ්ජනෙ බං..."



මද්දූ නෝන්ඩියට වගේ කියල හක හක ගාල හිනාවුනා. ශ්‍රී රාජ් උගෙ අර පොල් බූරු වලත්ත හිනාව දාල හුකු හුකු ගෑවා. මට මල පැනපු පාර සාලෙ තිබ්බ වේවැල් ස්ටූල් එකට පයිනුත් ගහගෙන මං මිදුලට ආවා. තත්පරයක් වත් ගියේ නෑ, රාජුයි මද්දූයි මගේ පස්සෙන් එන සද්දෙ ඇහුණා. මිදුලෙ බට් අඹ ගහ යට බංකුවෙ මං වාඩිවුණා.

"මූට කොහිල ටිකක්වත් දෙන්න වෙයි වගේ රාජ්..."

"පිස්සුද... තනිකරම කොහිල කටු දෙන්නෝන..."

"ඇයි...? මූගෙ පස්සෙ කැටයං බලන්නද ?"

මට බකස් ගාල හිනා ගියා. කොහොමටත් මට මල පැන්නට වැඩි වෙලාවක් තියෙන් නෑ. සෝඩා බෝතලේ වගේ තමයි. "පොඩී... උඹ ඇත්තටම අංජලීට කැමති ද ?"

"ඇයි... මං අකමැති නම් මයා මුයි කරන්නද ?"

මං ආපිටට අහපු එකට මද්දූ කොරවුනා.

"මං උඹට එක දවසකුත් කිව්වා. උඹෙ ඩිස්පින් උඹම ගිලපං කියලා... අද කියන්න තියෙන්නෙත් ඒකම තමයි..."

ඒ පාර මද්දූවා කියපු එකට කොරවුනේ මං.

"අ...ඩ...ඩෙ... අද සැටඩේ නේද ?"

මද්දූගෙයි මගෙයි ටෝක ජපන් යෙන් එකක් තරම් වත් ගණන් ගත් නැතුව රාජ් කෑගැහුවා.

"උඹට මතක නැද්ද විහඟයෝ...?"

ඌ තවත් කෑ ගහනවා... ඇඟට කරන්ට් එකක් වැදුනා වගේ මට මතක් වුණා. දෙයියනේ... අද නේද අංජලී ක්ලාස් එනවා කිව්වෙ...? දැන් ඉතිං කාපංකො ටකරං... ඇයි විහඟයෝ... උඹේ 'මෙමරිය' බල්ලො කාලද?"

## 12

"ඔව්... අද සැටඩේ තමයි... ඇයි උඹල දෙන්නටම සන්නිය හැදිල වගේ...?"

මද්දූ, රාජ්ගෙයි මගෙයි මූණු දිහා මාරුවෙන් මාරුවට බලනවා. මද්දූට සීන් එක දිග ඇරියොත් මාර මඩක් කන්න වෙන්නෙ... ඒක හන්දා නෝන්ඩි නැතුව ගෙදරින් මාරු වෙන්න ඕන කියල මට හිතුනා.

"නෑ මද්දූ... හෙට සන්ඩේනෙ... ඒකයි අද සැටඩේ වුනාම ඊයෙ ෆ්‍රයිඩේ නෙ..."

www.sinhalaelibrary.com

රාජුත් ඉදල් ඉදල දෙන්නෙ මාර වෝක්. අම්බානකට ඇට්ටකුණා, වෙලා ඉන්න මද්දූත් කොර වෙලා. කෝම හරි මද්දූට සීන් එක වහල මායි රාජුයි අංජලීව හම්බවෙන්න ඕන තියල හිතාගෙන ගෙදරින් පැන ගත්තා.

"සිරාවටම මට අමතක වුනානෙ රාජ්..."

"එව, ඉසිං උඹට අර කුණුහරුප කැල්ලක් නම් හොඳට මතක තියෙයි.. සිරාවටම මචං මං මේ කියන්නෙ... ඒකි උඹට කැමතියි බං..."

"මට ඒක තේරෙනවා රාජ්... ඒත් මට නොතේරෙන දේකුත් තියෙනවා"

122 බස් එකක සීට් එකකට බරවෙන ගමන් මං කිව්වා.

"උඹ ඕන තරම් තේරෙන් නැති දේවල් කියපං. කවදක්වත් නැතුව ඇයි උඹ මේ කෙල්ල හම්බවෙන්න යන්නෙ ? උඹ මීට කලින් මගෙත් එක්කවත්, මද්දූ එක්කවත් මෙහෙම ගමන් ගිහින් නෑ. උදේ මද්දූ ඇහුවා, අංජලීට කැමතිද කියලා. උඹ ඒකත් මිස් කරා... ඇත්තටම උඹට මොනවද වෙලා තියෙන්නෙ බං..."

රාජ් කියවගෙන යනවා... ඒ වචන ඇහුනට මගේ හිත තිවුනෙ හුගක් ඈතක.. ඇත්තටම මං අංජලීට කැමතිද ? ඔව්... එතෙන්දි නම් මගේ හිත හොලුවුනා.

"අතින්නෙක මං දකින විදියට අංජලී කියන්නෙ අන්තිම අහිංසක කෙල්ලෙක්. උඹ ලවක් පටන් ගන්නව නම් දිගටම කරන්න බලාගෙන පටන් ගනිං. උඹේ හිතේ හැටියට මට පේන්නෙ උඹට ඕන ඒකිගෙ ලස්සන විතරයි. ඒසිව නෙමේ..."

පොල් මුඩ්ඩක් ගහලවත් මුගෙ කට වහන්න තියෙනව නම්! ඒත් මූ කියන ඒවවලත් ගත යුතු දෙයක් නෑ කියල අහක දාන්නත් බැරිකමක් මගේ හිතට තිබුණා.

"නෑ රාජ්... උඹ වැරදියි... කොහොමත් අද ඕක කථා කරපු එක හොඳයි. මොකද අංජලීට ආදරය කරන අදහසක් මං ගාව තාම නෑ..."

"ඒ... ඒ... උඹ කියන්නෙ 'අම්මගෙ' කතාවක්නෙ. එහෙම දෙයක් නාම නැත්තං මේ අපි යන්නෙ උංගෙ ක්ලාස් එකේ කොම්පියුටර් හදන්නද?"

"මං දන්නෑ බං..."

මට ඉන් එහාට කතා කරන්න ඕන වුණේ නෑ. රාජුත් මුකුත් කිව්වෙ නෑ. ඒත් උගේ මූඩ් එක අප්සට් වින්තිය මට තේරුණා. බලන් ගියාම ඌ අහන දේවල්වලට මං දෙන උත්තර කොහොමටවත් මැච් නෑනේ. ඌට මළ පනින එක අහන්නානත් දෙයක් යැ. තවත් ටික වෙලාවක් ගිහින් අපි දෙන්න ක්ලාස් එක ගාවට ආවා. බල්ලෙක් වත් නෑ.

"මොකෝ බං...?"



හතර වටේ බල බල රාජ් අහනවා. මටත් අප්සෙට්. අද ක්ලාසස් නැතුව වත්ද ? ඒත් කාගෙන් කියල අහන්නද ?

"කොහෙද ඉසිං, අපනයෙක් එක්කනෙ ආවෙ..."

කරන්න දෙයක් නැත්තං, මූට හරි අව්ගත් වද කරවන්න ඕනනෙ.

"හා ! මං අපනයා.. උඹ සිරා පොර නෙ... මොකා උනත්, යකෝ මේතන මැස්සෙක් වත් නෑ... තවත් ඇට කන්නද ඉන්නෙ... යමං."

මායි රාජුයි ගාට ගාට ඉස්සරහට ආවා.

"මෙකී බොරුවක් වත් දුම්මද රාජ්...?"

"බොරුවක් කියන්න තරම් උවමනාවක් එදා එයාගෙත් දක්කෙ නෑ... කෝකටත් අපි එයාට ෆෝන් කරමු..."

"ගෙදරටද බං...?"

"මං හොල්මං වෙලා උගෙන් ඇහුවා.

"නැත්තං කක්කුස්සියටද බං...? වගෙන් යන්න අර කොමියුනිකේෂන් එකට"

ෆෝන් එක වෙන කවුරු හරි ගත්තොත් කියන අවුල ඒ වෙන කොටත් මගේ හිතේ වැඩ කරා. පපුව ධක ධක ගාන සද්දෙ එළියටත් ඇහෙනවද මංදා. ශිත් ! හන්දියෙ ෂොප් එකෙන් ගට කිලෝ දෙකක් වත් දාගන්න බැරි වුනානෙ.

"හෙ...ලෝ..."

ටිකක් වෙලා රිං වුනාට පස්සෙ එහා පැත්තෙන් කාගෙද්‍ෝ මරු මුස් වොයිස් එකක් ඇහුණා. ඩිංගක් විතර ගැස්සුනාත් මං කතා කරා...

"හෙ...හෙ...ලෝ... අංජලී... ඉන්නවද...?"

"ඕක්... හෝල්ඩ් ද ලයින් ප්ලිස්.... උංගී...! කෝල් ෆො යූ..."

කඩුපාරවල් දෙක තුනක් සිං සිං ගාලා වැදෙන සද්දෙ මට ඇහුණා. ඒත් කවුද මේ 'උංගී' ? ඒත් අංජලීමද ?

"හෙලෝ..."

අංජලීගේ හුරතල් වොයිස් එක එහා පැත්තෙන් ඇහුනා.

".... මං මේ විහඟ..."

"හා...ත්...තේ... ඔයා...! ඇත්තම ඇත්තයි. මං බලන් හිටියා ඔයා ෆෝන් කරනකන්."

"විශේෂ දේකට නෙමේනේ...?"

"නෑ අයියා... ඔතන සද්දෙ බද්ද හුගක් ඇහෙනවා, ඔයා ගෙදර නොමෙද ඉන්නෙ...?"

"නෑ.... ඔයාගෙ ක්ලාස් එක ගාව. මං අද ආවා ක්ලාස් එක ගාවට...

WWW.SINHALAELIBRARY.COM 15

ක්ලාස් එක නැනේ... ඔයත් නැනේ..."

"අනේ..."

හෙනම හෙන දුක හිතෙන විදියට එයාගෙන් ඒක කියැවුනා.

"අපිට අද ක්ලාසස් නෑ කියලා ගිය සුමානෙ කිව්වනේ. ඒත් මං හිතුවෙ නෑ අයියා ක්ලාස් එක ගාවට එයි කියලා..."

"ඒකට කමක් නෑ අංජු... කවුද ඉස්සෙල්ල ෆෝන් එක ගත්තෙ...?"

"තාත්ති..."

හප්පේ... ඒ මරුමුස් වොයිස් එක මතක් වෙනකොටත් ඇඟ හිරි වැටෙනවා. ඒත් විහග මල්ලී මේ පුංචි කෙල්ලට ඒ විත්තිය කියන්න බැනෙ... මැරෙන්නද නේ...?

## 13

ශ්‍රී රාජ්, මං කතා කර කර හිටපු රූම් එකේ වීදුරුවට දාපු සද්දෙ නිසා මං හැරිල බැලුවා. රිසීවර් එක කනේ. ඒකෙ එහා කොනේ අංජලී. මෙහා කොනේ මං. රාජ් මට අඩ ගහනවා හෝ ගාලා. මූ මල යකෙක් වත් කලද ? මං ඌව ඊවල ආපිට හැරුණා.

"ඉන්නිං... උංගි...?"

මං ටිකක් බර කරල කතා කරා.

"හානේ... ඔයා නම් හරිම හොරෙක්. ඒ ඩිංගට ඒකත් හොයාගෙන."

"හොරූ හොයාගන්නෙ නැනෙ බබා... හොරකං කරනවා මිසක."

"හොඳයි. ඔයා හොරකං කරල තියෙන්නෙ මොනාද අයියා?"

ශීනි හඬින් හිනාවෙන ගමන් අංජලී ඇහුවා. එයා ඒක ඇහුවෙ උත්තරේ මගේ තටට දීලා. 'ඔයාගෙ හිත' කියල මං කියයි කියල එයා හිතන්නැති. ඒත් මං මුකුත් කිව්වෙ නෑ ඒ ගැන.

"තාම නෑ නංගි... ඒත් ඉස්සරහට හෝප්ස් තියෙනවා"

"මාවද...?"

ඇහෙන නෑහෙන හඬින් එයා ඇහුවා. ඇත්තටම මං ගොලුවුනා. ටිකක් වෙලා යනකන්ම.

"බලමුකෝ නේ...?"

අමාරුවෙන් මං කියා ගත්තා. අංජලී මට මේ තරම් ළං වෙන්න හදද්දිත් මං සමහර වෙලාවල්වලට ඈත් වෙන්න ට්‍රයි කරන්නෙ ඇයිද කියල මටම තේරෙන්නෙ නෑ. මගේ හිත හොයන හැම ලස්සනක්ම අංජලී ගාව තියෙනවා. එහෙම තියෙද්දිත් ඇයි මං අප්සට් යන්නෙ...?



"අයියා හුඟ වෙලා ක්ලාස් එක ගාව හිටියද ?"

"නෑ. අංජු විනාඩි 10 විතර..."

ඊට පස්සෙ ටිකක් වෙලා යනකන් අපි දෙන්නම ගොලුවුනා. කතා කරගන්න වචන නෑ වගේ. අපි ඔහේ හිටියා.

"නංගි... මං බදාදා බේරුවල යනවා..."

"හදිසියෙන්ම...?"

"අපේ රාජ්ලගෙ මගුල් ගෙයක ෆොටෝස් ගන්න... දවස් දෙකක් විතර ඉන්න වෙයි..."

ආයෙමත් තත්පර ගානක් අංජලී කතා නැතුව හිටියා.

"ලස්සන මුස්ලිම් ගර්ල් කෙනෙක් සෙට් කරගන්න පුලුවන්නෙ නේද... අයියා...?"

විහිලුවට වුනත් එයා ඒක අහපු තාලෙ පුදුම දුක්බර බවක් රැඳිල තිබුනෙ...

"සිංහල ගර්ල්ස්ලා මෙච්චර ඉන්දෙද්දි එහෙම වෙන එකක් නෑ උංගි..."

"ඔය්...ය... ඉතිං... ආයෙමත් උංගි කියනවා... මට හරි ලැජ්ජයි..."

මේකි ඇඹරෙන විදිය මට මැවිල පේනවා.

"එහෙනම්, මං පුලුවන් උනොත් බේරුවල ගිහින් ඔයාට ෆෝන් කරන්නම් හොඳේ..."

"අපි ආයෙ හම්බවෙන්නැද්ද අයියා...?"

"මං ඉකිත් අද ආවනෙ..."

"මං දන්නැනෙ... ඔයා ගෙදරට ෆෝන් කරල ආවනම් හරිනෙ. ඒත් මොනව කරන්නද නේ...?"

"ඒකනෙ... ඔයා ගෙදර නෑ කියල හිතාගෙන කලින් ෆෝන් කළේ නෑ... කොහොම උනත් අපි ඉක්මනට මීට් වෙමු..."

"ෆෝන් කරාට තෑන්ක්ස් අයියා... බායි..."

"බායි..."

ඒකිට ෆෝන් කරල ඉවර වුනාට පස්සෙ මගෙ හිතට සැහැල්ලුවක් දැනුණා. දැන් ඉතිං අවුලක් නෑ. මං බිල ගෙවල එළියට බැස්සා. මූණ කුන්ඩ හට්ටිය කරං රාජ් බලන් ඉන්නවා.

"නෝ පැල වුනාද යකෝ... මං හිටියෙ තව ටිකකින් ඇවිත් ගෙඩි කඩන්න..."

ඌ බුරාගෙන බුරාගෙන ගියා.

"ගණන් ගන්නෙපා සතා.., කවුරු කනකොට ඔහොම තමයි."

WWW.SINHALAELIBRARY.COM 16

"ඔව් ඉතිං... උඹලට හැමදාම මස්නෙ..."

රාජ් එහෙම කියල මං දිහා නෝන්ඩි විදියට බැලුවා. ඊගාවට අපි කතා බහක් නැතුවම පාර දිගේ ඇවිදගෙන ආවා. දූන්ම ගෙදර යනවද නැතිනම්, තවත් ටිකක් මුන් එක්කම වාටර් කතාවද කියන එක හිතාගන්න බැරුව මං රාජ් දිහා බැලුවා. ඒත් උගේ මූණ ලොකු කල්පනාවකින් වැහිල ගිහින්.

"උඹට සිරාවටම අප්සෙට් ද බං... මං ලේට් වුණාට..."

මං හිතුවෙ, උට කාපු කට්ට දිරව ගන්න බැරුව මූඩ් එක අප්සෙට් කියල. ඒත් වෙලා තිබුණේ වෙන දෙයක්.

"පයිත්තියං ද බං...? මකත් කට්ටක්ද ? මං මේ කල්පනා කළේ වෙන එකක් විහඟ... කොහෙද සීන් එක පෙන්නන්න උඹට කතා කරාට, උඹ ෆෝන් එකේ එල්ලිලානෙ..."

"ඔව්...?"

කොම්යුනිකේෂන් එකේ දොරට මූ තට්ටු කරපු හැටි මට මතක් වුණා උගේ කතාවෙන්."

"මං මද්දුව දක්ක විහඟ."

"වෙන්න බෑ බං. පොර අද ඉන්නෝන ගෙදරනෙ. අනිත්තෙක උඹයි මායි එනකොටත් මද්දූ අයියා රෙදි ගහෝද ගහෝද නෙ හිටියෙ..."

"ඒක තමයි බං මාත් කල්පනා කරේ... නිකං නෙමේ පොර ගියේ තන්සිය එක ඩැෂ් කාර් එකක..."

රාජ්ගෙ කතාවට මං ආයෙමත් අප්සෙට් ගියා. ඒකමයි රාජ්ගෙ මූණ දිහාම බලන් හිටියෙ."

"කාර් එක මට හුරුයි බං, ඒත් මොලේට එන් නෑ කාගෙද කියලා... මොකාක් හරි හොර මඟුලක්...?"

උගෙ කතාව ඇත්ත කියල මට හිතුනා. මේ පහු වෙච්ච දවස් ගානෙ මද්දූ අයියගෙ හැසිරීම් රටාවෙ සෑහෙන්න ලොකු වෙනසක් මං දක්කා. මං ඒ විත්තිය රාජ්ට කිව්වහම ඌ කිව්වෙ වෙනින් කතාවක්.

"කෝකටත් අද ඌව දකපු විත්තියක් උඹ අඟවන්නෙපා. අපි ටිකක් සර්ච් එකේ ඉඳිමු... ඒක නෙමේ අනිද්දට හරිනෙ මචං. මං ගාව රිල්ස් පහක් විතර තියෙනවා"

එතකොටයි මට මතක් වුණේ රාජ්ලගෙ වෙඩිත් එක.. දූන් ඉතිං ඒකටත් ලෑස්ති වෙයන්කො. කමක් නෑ ඕහොම යං විහඟ මල්ලි... එක පාරත් අණ්ඩ කඩා ගත්තා. කල්ප්ස් දාන්න ගිහින්. මේ පාර මොකක් කඩා ගනීද කියල උඩ ඉන්න දෙයියොවත් දන්නෑ වගේ.

www.sinhalaelibrary.com

ඒදා හරිම ලස්සන දවසක්. බේරුවල අහස පුරාම තිබ්බෙ වහින්න වගේ ලෑස්ති වෙච්ච ගතියක්. ඉරත් කොහේදෝ හැංගිලා. උදේ හය වෙද්දි වගේ මායි රාජුයි බේරුවලට ආවා. බෝ ගහ ගාවින් ඇතුලට යන පාරෙ ටිකක් දුර ගියාමයි රාජ්ගෙ මාමගෙ ගෙදර හම්බ වුණේ. මුලින්ම මං කෙරුවෙ මට ගන්න ඕන ෆොටෝස්වලට හරියන විදියට බැක් ග්‍රවුන්ඩ් එක සෙට් කරගන්නෙකයි. මඟුල් ගෙදර ඉඳපු රාජ්ගෙ නෑදෑයො හැමෝගෙන්ම වගෙ මට ඒකට සපෝට් එක හම්බ වුණා. කොහොම කොහොම හරි පැය තුන හතරක් යද්දි මං මගේ වැඩේ කරගෙන ගියා. රාජුත් මං ළඟම ඉඳගෙන මට බැකප් එක දුන්නා.

"හප්පේ... මාරම මාර වයර්ඩ් මචං..."

ෆොටෝ ගැනිල්ල චුට්ටක් නතර කරල මං රාජ්ට කිව්වා. ඒ වෙනකොට කපල් එක පෝරුව උඩ. ඒ පෝරුවේම එයාල දෙන්නට වාඩිවෙන්න සිරාවට සැටියක් හදල තිබුණා.

"මේ පිස්සු කෙලින්නෙපා බං.. දූන් කපල් එකට ප්‍රසන්ට් දෙන වෙලාව..."

මං 'වයර්ඩ්' කිව්වෙ බොරුවට. මූට ඒක සිරාවට වැදිලා. අනිත් එක වයර්ඩ් වෙන්නැතුව තියේවියැ, මෙතන ඉන්න ජම්බු පාට කෙල්ලො ටික දක්කහම.

"මොකද යකෝ, හොරෙන් හොරෙන් බලන්නෙ...? කෙලින්ම බලපං... මෙතන අවුලක් නෑ."

මගෙත් තියෙන්නෙ දෙකයි පනහෙ වැඩනෙ. ෆොටෝ ගහද්දිත් වටේට පිටේට ඇහැ යන එක නවත්න ගන්න බෑනෙ. සිරා සල්වාර් එකක් ගහල ඉඳපු මුස්ලිම් ගර්ල් කෙනෙක් දිහා බලද්දියි, මං රාජ්ට මාට්ටු වුනේ.

"රාජ්... බයිල නවත්තල මට බොන්න මොනා හරි ගෙනෙන්. කොළඹට වැඩිය මෙහෙ රස්නෙයි වගේ බං...

ඇහෙපන් බේරෙන්න මං ඌට කිව්වා. තත්පර ගානක් ගියේ නෑ ඌ ගියා. ඌ එනකං මං කපල් එකට ප්‍රසන්ට් දෙන අයගෙ ෆොටෝස් ටික ගත්තා. ඊගාවට තිබුනෙ ලන්ච් එක. ඒකට ටයිම් තිබුණු හන්ද මං කැමරාවත් අරන් රාජ්ව හොයන්න ගියා. ඌ ගියා ගියාමයි මැරිලද දන්නෙත් නැනෙ.

"ආ.... පුතා මොනවද හොයන්නෙ ?"

මං ඌරු පැටියා වගේ රාජ්ව හොය හොයා යද්දි, රාජ්ගෙ මාමා, පෝල් අංකල් මගෙන් ඇහුවා.

"මෙ...මේ... රාජ් කොහේ ගිහින්ද මංදා අංකල්... තව වීල්ස් දෙකක් රාජ් ගාව."

දඩාං බඩාං ගාලා මං කෙප්පයක් අනැරියා. නැත්නං විලි ලැජ්ජ නැතුව කියනැහැකිද මේ බීම එකක් බොන්න නැරකෙන්නෙ කියලා.

"රාජ් ස්ටෝ රූම් එකේ පොඩි වැඩක්. ඔය ඔතනින් යන්නකො..."

එහෙම කියල ෆවුස් අංකල් මට කොරිඩෝර් එක පෙන්නුවා. මෙච්චර වෙලා බෙල්ල වටේට දාගෙන ඉඳපු කැමරා එක ගලවල පැත්තකින් තියල මං ස්ටෝ රූම් එක දිහාට ගියා. ඒකට කර්ටන් එකක් දාලයි තිබුණෙ. ඒ වුණත් එතැන තිබුණෙ කලබලකාරී පරිසරයක්. බීම බන්දේසිද, ට්‍රොලිද අරවද මේවද අරන් ගර්ස්ලා යනවා, එනවා. කෝකටත් කියලා පරිස්සමින් මං කාමරේට එබුනා. මොන පරිස්සමක්ද ? මගේ වෙලාව අන්තිම නරකයි. ලොකු බීම ට්‍රේ එකක් උස්සගෙන ආපු කෙල්ලෙක් මගේ ඇඟේ හැප්පුනෙ මට ඇඩ්‍රස් නැතිවෙන්නම.

"ඕ... ඔහ්... සොරී..."

මොන සොරියක්ද... මගෙන් තුන්කාලක් බීමවලින් නැවිල ඉවරයි. වීදුරු කටු බිම හැම තැනම. කරන්න ඕන කිසිම දෙයක් මගෙ හිතට ආවෙ නෑ. දන් ඉතිං මොන වෙඩින්ද ?

"හප්පේ... මොකද බං මේ...?"

කොහෙදෝ මුල්ලක ඉඳල ශ්‍රී රාජ් දුවගෙන ආවා. මට වැඩියම ශේන්ති ඌ එක්ක. ස්ටෝ රූම් එකේ ඉඳපු මුස්ලිම් කොල්ලො ටිකක් වීදුරු කටු අහුලන්න ගත්තා. අර බීම ට්‍රේ එක අල්ලන් ආපු ගර්ල්, මගේ ඔරොප්පු මූණ බලන්න බැරිකමටද කොහෙද ට්‍රේ එකෙන් මූණ වහ ගත්තා.

"දන් බලපං... මෙහෙම ඉඳන් ෆොටෝස් ගන්න හැකිද ?"

කාමරෙන් එළියට ආව ගමන් මං රාජ්ට බර ඩරේ දැම්මා. ඌ මං දිහා බල බල හිනාවෙනවා.

"මොකද ඒ පාර උඹ හිකි හිකි ගාන්නෙ..."

"නෑ... බං... බීම් බොන්න ආපු එකා. බීම නාලනෙ"

ඌ තවත් හිනාවෙනව. ඒකත් ඇත්ත. මං නෑවනෙ. කොරිඩෝරෙ තිබ්බ මිටි කාප්පෙට යන්නු වෙන ගමන් මං රාජ් දිහා බැලුවා. ඌ කල්පනා කරනවා.

"උඹ දුර්වත් ඉන්නවද මං ටවුන් එකට ගිහිල්ල එනකං"

"මොකටද ?" තිබ්බ ඔරොප්පුවටම මං කතා කරා.

"උඹට ෂර්ට් එකක් අරන් එන්න.. බලපං ඕකෙ කහ පාට හැම තැනම ගැවිලනෙ."

"ඕන් නෑ බං. අපි වතුර ටිකක් අරන් පිහිද ගමු."



මායි ඌයි බාත් රූම් එකට රිංගලා උඩින් පල්ලෙන් වගේ බීම ටික යන්න ෂර්ට් එක හෝද ගත්තා. දන් වතුර පැල්ලම් හැමතැනම.

ඊගාවට තිබුණෙ ලන්ච් එක. එතනට ඕනෙ කරන ෆොටෝස් ටික කවර් කර ගන්න මං ට්‍රයි කරා මිසක, වෙන දේවල් මං දක්කෙ නෑ.

"අ.... අයියෙ... ඔයාට ෂබී... අක්කි කතා කරනවා"

"මොකා...?"

ලස්සන පොඩි එකෙක්, ගෙට ඇතුල්වෙන හරියෙ රූම් එකක් දිහාට ඇඟිල්ල දික්කරා. ඒ පාර තවත් පරිප්පුවක් දැ කියල හිත හිතාම මං ඒ කාමරේට ගියා. හුටා, මෙන්න අර 'බීම කෙල්ල' ඒක ඇතුලෙ ෆෙයාරිදාවක් වගේ ලස්සන දිග ගාවොමක් ඒකි ඇඳල හිටියෙ. ඒකිගෙ අතේ බ්‍රවුන් පේපර් කවරයක්.

"වෙච්ච දේට සොරි අයියා. ඔයාගෙ ෂර්ට් එක තෙමුණනෙ. තරහ නැතුව මේක අරගෙන ඇඳගන්නකො..."

ඒකි බ්‍රවුන් පේපර් කවරෙ දික් කරා.

"ඕන් නෑ... දන් තව ඩිංගෙන් මේක වේලේවිනෙ."

"ප්ලීස්..."

මූණ ඇල කරල, කටත් උල් කරල ඒකි කිව්වා. ඉතිං එහෙම කියනකොට කොහොමද නොගෙන ඉන්නෙ. මං කවරෙ අතට ගත්තා. ඒකිට ලස්සන හිනාවක් ගියා මං කවරෙ ගන්නහම. විතහ මල්ලී... ඒ පාර මොකද මේ වෙන්න යන්නෙ...?

15

වෙඩින් එකත් ඉවර වෙන්න ළඟයි. දන් මේ අලුත් ෂර්ට් එකත් ඇඳගෙන මොන මඟුලෙ යන්නද ?

"ඔයා කාමින් තරහෙන් නේද ඉන්නෙ ?"

මේකි එන්නෙම රෝන් වගේ කියල මට හිතුනා. මිද්දුවා එහෙම අද හිටියනම් බඩ කපන් මැරෙන්නෙ.

"අලුත් ෂර්ට් එකක් හම්බවෙලා තියෙද්දි, මං මොකටද ඔයත් එක්ක තරහ වෙන්නෙ...?"

මං එහෙම කිව්වට හිත ඇතුලෙ ඔරොප්පුව ඩබල් එකේ වැඩ කරා.

"ඒකත් ඇත්ත. එහෙනම් මං යනවා"

ඒකිට තේරුණා. මගෙ අප්සට් එක. ඒකයි, එහෙම්මම මාරුවෙන්න හැදුවෙ. ඒත් මගේ හිත ඒකට ඉඩ දුන්නෙ නෑ."

WWW.SINHALAELIBRARY.COM 18

"මිස්... ෂර්ට් එකට තැන්ක්ස්... ගොඩේ..."

මං එහෙම කිව්වහම ඒකට ලස්සන හිනාවක් ගියා. ඒ සුදු මූණෙ තිබ්බ සංතෝසෙ මං හොඳටම දැක්කා. ඒත් අපි දෙන්නම නොහිතුව දේවල් ඒ වෙනකොට සිද්ධ වෙවී තිබුණා. අපි දෙන්න ඉඳපු කාමරේ කර්ටන් එක 'සරස්' ගාල පැත්තකට විසි වෙලා ගියා. ඊළඟ තත්පරේදී මං අඳුනන්නෙ නැති මූණක් කාමරේට එබුනා.

"සහනාස්... ඔයාට මෙතනද වැඩ තියෙන්නෙ... ආ ?"

කාමරේට එබුන එකා කොල්ලෙක්. මං හිතන්නෙ මගේ වයසෙ විතර. උගේ ඇස්වල දිලිසි දිලිසී තියෙන ඉරිසියාව, මං හොඳටම දැක්කා.

"මට කොහේ වැඩ තිබුණත් ඔයාට තියෙන අමාරුව මොකක්ද නියාස්...? ඔයා මැනර්ස් කියල දෙයක් දන්නැද්ද ?"

ලස්සනට හුරතලේට හිටියට මේ මුස්ලිම් කෙල්ලගෙ කට නම් අක්කරයක් විතර දිගට තියෙනව කියල මං දැක්කා. 'සහනාස්' සිරා නමක්නෙ.

"ඒකද මේ අඳුනන්නෙ නැති ඇයොත් එක්ක කාමර අස්සෙ ලගින්නෙ...?"

පොරත් අතෑරියෙ නෑ. මාත් ඩිංගෙන් ඩිංග හොල්මන් වෙන්න ගත්තා. මෙහෙ කැත කේස් එකක් යන්න වගේ හදන්නෙ.

"නියාස්... මං ආයෙ කියන් නෑ. මේ අයියා මගේ යාලුවෙක් අපේ කතාවට ඔයා එන්න ඕන් නෑ."

කෙල්ල දෙන්නෙ අඹ ටෝක්. මෙහෙම සිරා. මං නිකං ප්‍රේක්ෂකයා වගේ බලන් හිටියා. නියාස්ගෙ මූණ, රතිඤ්ඤයක් අතේ පත්තු වෙච්ච පොඩි එකෙක්ගෙ මූණ වගේ වුණා.

"සහනාස්... ක.. කරුණාකරල කාමරෙන් එළියට එන්න මගේ යකා අවුස්සන්නෙ නැතුව..."

නියාස් ඒ පාර සද්දෙට, සහනාස්ට කෑගැහුවා. එකා දෙන්න ඇවිත් කාමරේට එබෙන්න ගත්තා. දැන් නම් මඟුල් ගෙදර, අවමඟුල් ගෙදරක් වෙච්ච වගේ.

"ඔයාගෙ යකාට මං බය නෑ නියාස්. ඔයාගෙ හිතේ තියෙන ඒවට ටිකක් කරදර වෙයි."

එහෙම කියල සහනාස් ගස්සගෙන කාමරෙන් එළියට ගියා. ඊගාවට නියාස් බැලුවෙ මගෙ මූණ දිහා. දැන් අපි හිටපු කාමරේට දහයක් දොළහක් විතර ඇවිත්.

"තමුසෙ ෆොටෝ ගහන්න ආවා නම් ඒ ටික කරනවා හලෝ. අපේ කෙල්ලන්ට සෙම හලන්නෙ නැතුව."



මගේ මූණ ඉස්සරහට ඇඟිල්ල දික්කරල නියාස් කිව්වා. මට ඒක ඇහුණෙ හීනෙන් වගේ. ඉවසනව කියල තවත් ඉවසන එකේ තේරුමක් නෑ කියල මට හිතුනා. මොකද ඒ වෙනකොට කාමරේ කට්ටියත් පිරිල හිටිය. අනිත් එක මට ඩිංගෙන් ඩිංග මළ පැනගෙන ඇවිත් තිබුණා.

"මල්ලි මේ...?"

මං ඒ වචන දෙක කියල උගේ කොලර් එකෙන් අල්ල ගත්තා. මගේ ඒ ගැම්මට උෟ ඩිම් වුණා.

"...උඹ හිතුවද යකෝ මං මේ පක්කලි වැඩට ආව කියලා... උඹලගෙ කෙල්ලොත් බඩුද යකෝ සෙම හලන්න තරම් ? කතා කරනකොට ටිකක් පරිස්සම් වෙයන්. නැත්තං දොස්තර කියාවි උඹේ දත් දෙක තුනක් අඩුයි කියලා."

මගේ ටෝකට උෟ කොර උනත්, උෟ මගේ අත ගසල දැම්මා.

"වෙඩින් එක හින්ද මං ඉවසනවා. නැත්තං උඹ අද බේරුවලින් යවන් නෑ. ඒක දැනගනිං..."

නියාස් කියපු දේට, මොනාවත් කියන්න තරම් වෙලාවක් මට හම්බ වුනේ නෑ. හෙණ ගහන්න වගේ ශ්‍රී රාජ් කාමරේට කඩන් පැන්නා.

"නියාස්..., මෙතනින් පලයං...!"

මං දැක්කෙ, වෙනද මං ගාව ඉඳපු ශ්‍රී රාජ් නෙමේ. උගේ මූණෙ කේන්තියෙන් රතු වෙලා තිබුණා.

"න්... නෑ... රාජ් අයියා... මෙ.. මෙකයි.."

"කතාව ඕන් නෑ... මෙතනින් පලයං මගෙන් කන පලාගන් නැතුව.. උඹ දන්නවද...? උඹ දන්නවද යකෝ මේ කවුද කියලා...?"

රාජ් එහෙම කියන ගමන් මගේ කරට අතක් දැම්මා.

"මූ මගේ අඹයා... මූ ෆොටෝ ගහන්න ආවෙ මං හින්දා"

ටිකකින් වලිය රස්නෙ නිවුනා. රාජ්ගෙ මාමා ෆවුස් අංකල්ත් ඕන් ඒක දැනගත්තා. ඒ වුනත් ඒකෙ අවුලක් තිබුනෙ නෑ. මගුල් ගේ ඉවර වෙලා මායි රාජුයි ගෙදරින් එළියට බහිද්දිවත් මං නියාස්ව දැක්කෙ නෑ. කැමරාවයි, රීල්ස් ටිකයි බෑග් එකට දාගන්න ගමන්. මං රාජ් දිහා බැලුවා. උගේ මූණේ හිනාවක්. මේ දැන් මළ පැනල හිටපු එකා මෙන්න හිනාවෙනවා. ඇයි කියල අහන්න වගේ මං උෟ දිහා බැලුවා. ඒත් ඒකට උත්තරේ අපි ළඟම තිබුණා.

"සහනාස්..."

යනව කියල හැමෝටම වගේ කිව්වත් මං ඒකිට කිව්වෙ නෑ. ඒ කිව්වෙ නැති මෝඩකමේ ප්‍රතිඵලේ අන ඉස්සරහටම ඇවිත් තිබුණා. ඩිංගකට කලින් නැව් ගානට කන්න ගිහින් බේරුණේ. අනේ දෙයියනේ මගෙ අපලෙ නම් තාම ඉවර නෑ වගේ..

WWW.SINHALAELIBRARY.COM 19

## 16

අපි ඉස්සරහ ඉඳපු සහනාස්ව දකල ශ්‍රී රාජ්පුයි මායි එතැනම නතර වුණා.

"ෂයි... ඇයි ?"

සහනාස් ගෙ මූණ දිහා බලාගෙනම රාජ් කිව්වා. ඒකි ඇඹරෙනවා මගේ නම් මේ දවස් අන්තිම නරකයි වගේ.

"බා...යි...!"

හුගක් දේ කියන්න එයාගෙ හිතේ තිබුණත් ඒ අකුරු දෙක මගෙ මූණ දිහා බලාගෙන එයා කිව්වා. ඊට පස්සෙ හෙමි හෙමින් අඩි තිය තියා ආපහු ගේ දිහාට ගියා. මායි රාජ්පුයි අකරෙ බේරුවල වවුමට එනකන්ම කතා බහක් තිබුණෙ නෑ. බේරුවලින් කොළඹ ඉන්ටර්සිටියකට නැගල ඉඳගෙන, ලොකුම ලොකු හුස්මක් රාජ් පා කරල යැව්වා.

"පිස්සු හැදෙනවා...?"

මං හිතන්නෙ ඌ ඒක හිතල කිව්ව නෙමෙයි ඌට කියවුණා.

"ඇයි...?"

"ඇයි අහන්නෙ බං... 'ෂයි' කවදාවත් ඔහොම හැසිරිල නෑ. ඒකිට මොකද මංදා වුණේ...?"

සහනාස්ගෙ පෙට් නේම් එක වුණේ 'ෂයි'

"නියාස්ට බැන්න එක ගැනද උඹ කියන්නෙ...?"

"නෑ බං ඒකි ඌට ඉස්සර ඉඳලම කැමති නෑ. ඌ ඉරාගෙන ට්‍රයි."

ඉරාගෙන ට්‍රයි කරන්න තරම් ලස්සනක් ඇත්තටම සහනාස්ගෙ තිබුණා. ඒත් ඒකිගෙ ලස්සන ගැන මොනම විදියෙවත් හැඟීමක් මගෙ හිතට ආවෙ නෑ.

"...මට තියෙන ප්‍රශ්නෙ ඒකි උඹට හුඟක් කැමති වගේ පෙනුණ හන්ද. උඹව අඳමයි දක්කෙ. ඒකි පුදුම තරම් කූල් කැරැක්ටර් එකක්. ඒත් අද මංදා විහඟ... මගේ මලුවක් නරක් වෙලා."

ශ්‍රී රාජ් කියාපු ගියපු ඒව ඔක්කෝම ඇත්ත. කොහොම උනත් ඒකිගෙ ෆොටෝස් එකක් දෙකක් ගන්න බැරිවෙච්චි එක ගැන නම් මගේ හිතේ පුංචිවක් විතර දුකක් තිබුණා. මොකද ඒකි ඇත්තටම හුඟක් ලස්සන නිසා.

• • •

www.sinhalaelibrary.com



රාජ් නුගේගොඩින් බැහැ ගත්තා. මං ඔහේ අපතයා වගේ බස් එකේ කොනේ සීට් එකකට ගුලි වුණා. මේ ට්‍රිප් එකේ අද සිද්ධ වුණු දේවල් ගැන හිතෙන කොටත් මට පුදුම හිතුණා. කෙල්ලොත් ඇවිල්ලා මහාම මහ පුදුම ජාතියක්. මාර සත්ව කොට්ඨාශයක්. ඒ ගැන හිතන්න හිතන්න මලුවත්තෙක්ක හිරි වැටෙනවා.

මං ගෙදර එනකොට අම්මා විතරයි ගෙදර. මද්දූ අයියා නෑ.

"පොඩී... කොහොමද වෙඩින් එක...? ෆොටෝස් ටික හොඳට ගත්තද ?"

මට කිරි එකක් හෙම හදල දීල අම්මා ප්‍රශ්න පත්තරේ දිගෑරියා.

"මොනාද කියන්නෙ අම්මා... එළ කොර..."

"මොකක්...?"

මටත් පිස්සුනේ. අම්මටත් හොල්මන්.

"න් නෑ... මෙ... මේ.... සිරාවට තිබුණා අම්මා..."

"කෑම හෙම කොහොමද...?"

"ඒකත් අප්සට් එකක් නෑ. අපි හය දෙනා හය දෙනා මේට්‍රස් උඩ වාඩිවෙලා තමයි කෑවෙ. ගෑණු පිරිමි වෙන වෙනම. ෆොටෝ ටික සුද්ධ කරාම මං පෙන්වන්නම්කො අම්මා."

තවත් ප්‍රශ්න දෙක තුනක් මඟුල් ගේ ගැන අහපු අම්මා කුස්සියට ගියා. මං කාමරේට රිංග ගත්තා.

"පොඩී...?"

අම්මගෙ කටහඬ ආයෙමත් කුස්සියෙන් ඇහුණා.

"ඇයි අම්මා...?"

"ඔන්න, මද්දූගෙ ටවුසර් වගයක් රැක් එකේ ඇති. වොෂින් මැෂින් එකට දාල දාන්න. මට අමතක වුනානෙ."

ඒ පාර මං මද්දූගෙ කාමරේට ගියා. පොර නම් සිරාවටම කාමරේ තියන් ඉන්නවා. මගේ කාමරේයි මද්දූගෙ කාමරෙයි, අපායයි දිව්‍ය ලෝකෙයි වගේ. රැක් එක උඩ තිබ්බ මද්දූගෙ ටවුසර් ටික මං අතට ගත්තා. පිළිවෙලකට තිබුණු පොත් මේසෙ උඩ ඉංග්‍රීසි නවල් එකක්. අප්පද බොල... යකඩෝ... මූ කවද ඉඳන්ද මේ ඉංග්‍රීසි නවල් කියවන්න පටන් ගත්තෙ ? මූනෙ යකෝ පොර. කොහොම වුණත් මූ ගැන පුලුවන් තරම් ඉක්මනට පරීක්ෂණයක් කරන්න වේවී වගේ...

වොෂින් මැෂින් එකට මද්දූවගෙ ටවුසර් ටික ඔබල ස්විච් එකත් දාල මං ආයෙමත් මද්දූගෙ කාමරේට එබුනා. මද්දූ අයියගෙ පොත් මේසේ ගාවට ගිහින් මං අර නවල් එක අතට අරන් පෙරලලා බැලුවා. හුටා ! මෙන්න යකෝ පොත ඇතුලෙ මොකක් දෝ කාඩ් එකක්. මගේ පපුව දන්

WWW.SINHALAELIBRARY.COM 20

විනස් විතර විං විං ගාන්න පටන් ගත්තා. ඒක හන්ද පොත පැත්තකින් තියල මං කාඩ් එක අතට අරන් දිගෑරියා. ඉර බැහැල යන වෙලාවක අඳුරට වෙලා ඉන්න පොඩි එකෙක්ගෙ ෆොටෝ එකත් ඒ කාඩ් එකේ තිබුණෙ. මැද්දෙ පිටුවෙ වැල් අකුරෙන් ලියල තිබුණු දේ කියෙව්වහම මගේ හිත හීතල වෙලා ගියා.

"Dear Bhathiya....,

භාතිය කියල කිව්වෙ මද්දූ අයියගෙ නම. ඊගාවට මුලු ජීවිතයේදිම මා ලැබූ මහඟු වස්තුව ඔබයි. කියන තේරුම ඉංග්‍රීසි වලින් ලියල තිබුණා. අන්තිමට,

From Poojani...' කියලා ඉවර කරලා තිබුණා. මද්දූ අයියා කවදාවත් මට පූජනී කෙනෙක් ගැන කියල තිබුණෙ නෑ. මූ මටත් හොරා ලවක් පටන් අරන් තියෙනෙ විතරක් මගෙ මීටරේට වැටුණා. ඒත් ඒක මගෙ හිතට සංතෝෂයක් ගෙනාවෙ නෑ. හිතට එක් කළේ අසංතෝෂයක් විතරයි. මොකද කෙල්ලෙකුට ට්‍රයි කරා නම්, පිස්සු කෙළින වැඩක් කරා නම් ඒ අපි දෙන්නම එකට. මගේ හැම දෙයක්ම මද්දූට කියද්දිත් මෙ කියන පූජනී ගැන මද්දූ මට හැංගුවෙ ඇයිද කියල මට හිතාගන්න බැරිවුනා... කොහොම උනත් මද්දූම මෙ ගැන කියනකන් පොරගෙන් පූජනී ගැන අහන් නෑ කියල මං අන්තිමට හිතා ගත්තා.

## 17

මද්දූ ගැනයි, පූජනී ගැනයි හිත හිතා ඉඳපු මගේ ඇස් යාන්තමට වගේ පියවෙන්න ගත්තා. ඒ කියන්නෙ සිරාවටම නිදිමත ඇඳන් ඉඳපු වෙනිම පිටින්ම මං ඇලවුනා. හිතේ කොටන් එක්ක අමතකට නිදා ගන්නව කියල හිතා ගත්ත විතරයි ෆෝන් එකේ සද්දෙද ඇහුණා. තොදෝසින්. අපේ ගෙදර ෆෝන් එක ජාති ජාතිය නොනවතං.

"පොඩී... ඔයාට කෝල්..."

අම්මගෙ සද්දෙ ඇහුනා. මෙ වෙලාවෙ මොකාද මට ෆෝන් කරන්නෙ.. අනිත් එක සිරාවටම නිදිමත තියෙන වෙලාවෙ. කෝල් එක ගත්තු එකාගෙ පවුලෙ කට්ටියවයි. දාවයි හොඳට මතක් කර කර මං රිසීවරේ අතට ගත්තා.

"හෙලෝ..."

"මට ෆෝන් කරාට තැන්ක්ස්...! මං ෆෝන් එක තියන්නයි යන්නෙ."

"පුතා... අංජලී.. මට අමතකම උනානෙ, මේ වෙච්ච මල ඉලව් සීන්



හින්ද ඒකටවත් වෙලාවක් තිබුණෙ නෑ. මගේ නිදිමත කොහෙන් ගියාද දන් නෑ.

"හෝව්... හෝව්... ප්ලීස් ඩෝන්ට් ෆෝන් එක තියන්නෙපා. එතකොට මට ආයෙත් ඔයාට ෆෝන් කරන්න වෙනවා. එතකොට මගේ ෆෝන් බිල නගිනවා. මං පව්නේ..."

මං අංජලීව ෂේප් කරන්න හිතාගෙන කියවන් ගියා. ඒත් ඒකි ඩයිනමයිට් ගිලල වගේ කතා කරේ.

"විහිලු ඇති අයියා.. ඔයාට මොන දේකවත් තේරුමක් තියෙනවද කියලා මං දන්නෙ නෑ. මං පෙරෙන් දවස් ගණන් බලන් ඉන්නවා, ඔයා ෆෝන් කරනකන්. ඔයාම භාෂාවත් නෑ. මං හිතුවා අඩුම ගානෙ එදා ෆෝන් කරනව කියල කිව්වටවත්, ඔයා ෆෝන් කරාවි කියලා. ඒත් බලන් ඉඳපු මමමයි අන්තිමට මෝඩ වෙලා තියෙන්නෙ. ඉහි... හ්... ග්..."

අන්තිම හරිය කියවන් යනකොට අංජලීගෙ කටහඬ බිඳිල ගියා. ඒකි අඬන විත්තිය මට තේරුණා. ඒත් ඉතිං මගේ ශෝකය ටෙලිෆෝන් කම්බි දිගේ යවනව මිසක වෙන කරන්න දෙයක් මට තිබුණෙ නෑ.

"ඔයාගෙ හිත රිදුනනම් සොරි නංගි.. ඔයා දන්නෙ නෑ මට වුණ දේවල්.. ඒකයි ඔයා මාව මිස් අන්ඩස්ටෑන්ඩ් කරන්නෙ..."

ඒත් ෆෝන් එකේ එහා පැත්තෙන් ආවෙ ඉකිගහන අඬන සද්දෙ විතරයි. මොනව කරන්නද මොනව කියන්නද කියල මගේ හිතට කිසිම අදහසක් ආවෙ නෑ. හිත ඇතුලෙ මොකක්දෝ කියල තේරෙන්නැති දුකකින් පනුරු ගානව කියල විතරක් මට දැනුණා.

"...ඉහි... ග්.... හ්.... ම... මං ඔයාව මිස් අන්ඩස්ටෑන්ඩ් කරේ නෑ විහඟ අයියා. ජීවිතේ කවදාවත් නැති විදියට ඔයා මගේ හිතට විංගෙන් විංග ළං වෙලා තිබුණා. කිසිම දෙයක් හොයල බලන් නැතුව මං ඔයාව මගේ හිතට ළං කරගත්තා. ඔයාට ඒ ගැන තේරුමක් නෑ අයියේ... මගේ හිතයි වැ... වැරදි... ඉ...ඉහ්...ග්..."

"අ... අංජලී...?"

ඒත් ඒ වෙනකොට එයා ෆෝන් එක තියල තිබුණා. හිත, තත්පරෙන් තත්පරේ නොසංසුන් වෙද්දි මං ආයෙමත් අංජලීට ඩයල් කරා... ඒත් එහා පැත්තෙන් ආවෙ එන්ගේජ් ටෝන් එක. ඒ කියන්නේ එයා රිසීවරේ පැත්තකින් තියලා ආයෙමත් තව විංගකින් අංජලීට ෆෝන් කරලා එයාව කුල් කරන්න ඕනි කියල හිතාගෙන මං කුස්සියට ගියා. අම්මා තේ ගාල උයනවා.

"කවුද පොඩී ෆෝන් කරේ...?"

මේ වෙලාවට මං කුස්සියට එබෙන්නෑ කියල අම්මා දන්නවා. ඒකයි පුදුම වෙලා වගේ මං දිහා බලාගෙන අරහෙම ඇහුවෙ.

WWW.SINHALAELIBRARY.COM 21

"නෑ... කවුරුවත් නෑ අම්මා..." හිතේ අප්සට් එකටම මට කියැවුණා.

"එහෙනම්, තනියමද කතා කරේ ෆෝන් එකත් එක්ක...?"

අම්මා හිනාවෙවී අහනවා. මටත් හිනා ගියා. මං හිතුවෙ අම්මා තවත් ඒ ගැන අහවි කියලා. ඒත් අම්මට ලොකුයි, මද්දු අයියයි, මමයි ගැන හොඳ ඉවක් තිබුණා. අනවශ්‍ය වෙලාවට කිසිම දෙයක් අම්මා අපෙන් ඇහුවෙ නෑ. නියම වෙලාව එනකන් ඉවසන් හිටියා. ඇත්තටම අම්මා ඒ ගැන මොකුත් අහපු නැති එක ගැන මගේ හිතට හෙන හිටි එකක් ආවා. මං ආයෙමත් සාලෙට ඇවිත් අංජලීගෙ නම්බර් එක ඩයල් කරා. ඒත් එන්ගේජ් ටෝන් එක විතරයි ආවෙ. හතර පස් පාරක්ම ට්‍රයි කරල බැරිම තැන මං ෆෝන් එක තියලා කාමරේට රිංග ගත්තා. මගේ නිදිමත කොහේ ගිහින්ද දන්නෑ.

කොහොම වුණත්, අංජලීගෙ හිත හොඳටම රිදිල කියල මට තේරුණා. සුදු ළමා සාරියක් ඇඳගෙන පනාගොඩ පන්සල ගාවදි පාර පැනපු හැටි, මං අපතය වගේ වැටුන හැටි, මාව බලන්න ගෙදර ආපු හැටි, මද්දු අයියා පිඹගෙන ගිහින් ෆෝන් නම්බර් එක ඉල්ලන් ආපු හැටි, සුදු පාට වැලියෙන් යූ. සී. ග්‍රවුන්ඩ් එක ගාවට මාව බලන්න ආපු හැටි... මේ හැම දෙයක්ම මගේ හිතේ විදුලි කෙටුවා වගේ ඇඳිල ගියා. හුරතල් හිනාව, පුංචි එකෙක් වගේ කතා කරන හැටි... හිත පාරවන අහිංසකකම, හැමදේම මට මතක් වුණා. ඒ පුංචි හිත නොදැනුවත් කමින් හරි මං රිද්දුවා කියන චෝදනාව මගේ හිත මට ගෙනාවා. ඒක හන්දම අංජලීව බලන්න ඕන කියන සිතුවිල්ල මගේ ඔලුවට ආවෙ තත්පර ගානක් යද්දි. ඒත් අංජලීගෙ ගෙදරට යන්න ඕන හැටි කොහොමද කියල මං දන්නැති විත්තිය මට මතක් වුණා. අංජලී ගැන මං දන්නෙ කොයි තරම් චුට්ටක් ද කියන එකත් මට මතක් කරල දුන්නා මගේ හිත. කොයිකටත් රාජ්වත් ඇඳගෙන යන්නොන කියල හිතාගෙන මං ටී ෂර්ට් එකක් දාගත්තා. අම්මට වවුමට යනව කියල මං ගෙයින් එළියට බැස්සා. සුදු වැලි පාරෙ ටික දුරයි මට තොල්මං වුණා.

ශ්‍රී රාජ් !

"මං මේ උඹව හම්බවෙන්න යන ගමන්..."

ඌට දැක්ක හැටියෙ මං කිව්වා.

"මාර ට්‍රබල් එකක්නෙ විහඟ..."

මං කියපු එක ඇහුනෙ නෑ වගේ රාජ් කියවන් ගියේ. ඒ පාර මොකක්ද වැවෙන්න යන මරාලෙ... එහෙත් අංජලී මරොප්පු වෙලා. දැන් තවත් අවුලක් ද ?



# 18

රාජ්ගෙ මූණ දිහා බැලුවහම ඌ හෙන අප්සට් එකේ ඉන්නෙ කියල මට තේරුණා.

"මොකක්ද බං අවුල...?"

"සිරාවටම අවුලක් තමයි විහඟ... ඊයෙ හවස ෂහනාස් ආවා අපේ ගෙදර..."

මගේ හිත ඩිංගෙන් ඩිංග ගැහෙන්න ගත්තා. මූගේ කටින් මොනව පිටවෙනවද කියල අහන්න ලෑස්ති වෙනව වගේ මං කන් දෙකත් හොඳට දිගෑර ගත්තා.

"හදිසියෙම...?"

"කුණු කේස් එකක් මචං.... ගෙදර ඇයොත් එක්ක 'ශට්' කොක්කක් දාගෙන..."

මගෙත්තෙක්ක කාමරේ ඉඳපු හන්දවත්ද කියල මට නිකමම හිතුණා. රාජ් එහෙම කියද්දි මං හිතුව හරියට හරි.

"නියාස් ගේම අම්බානකට දීලා... ගෙදර ඇයොත් කරකවල ඇතැරිල වගේ... උඹ දන්නවනෙ මචං... කොහොම වුණත් උඹත්තෙක්ක කාමරේ ඉඳපු එකට තමයි කොක්ක වැඩියෙන් ගිහින් තියෙන්නෙ."

"දැන් කෝ ඒකී...?"

"නාම අපේ ගෙදර..."

ඌ එහෙම කිව්වහම මං හීතල වෙලා ගියා. මගේ වෙලාව නම් අන්තිම නරකයි.

"ඒකි මොනාද කියන්නෙ රාජ්...?"

"අනේ මංදා බං. මී හරකි වගේ අඩනවා. උංගෙ තාත්තා අද හවස එනවයි කියන්නෙ..."

ඒක ප්‍රශ්නෙකට උත්තර හොයද්දි දැන් තවත් ප්‍රශ්නයක්. ප්‍රශ්නයප් කිව්වදා මේක නම් ප්‍රශ්න පත්තරයක් වගේ. ඒගාවට හැමදේම තියෙද්දි මං රාජ්ට අංජලීගෙ අවුල ගැන කිව්වා. ඌට තදවුණා.

"උඹත් අර පූකට පැට්‍රෝල් ගහපු බල්ලා වගේනෙ බං... යන යන තැන කචල්... මොකක්ද බං.... හරි හමන් තීරණයක් ගනිංකො කොන්ද කෙලින් කරන්."

උගෙ කතාවට මට නප්පියටයි, ඒට චුට්ටක් වැඩියෙනුයි තද වුනා.

"මොකක්ද බං ඒ කතාවෙ තේරුම...?"

WWW.SINHALAELIBRARY.COM 22

"තේරුම...? උඹ හිතන්නෙ ෂබී අපේ ගෙදර ආවෙ කොස්ස හන්දම කියල ද ? නෑ...! මොළේ කලඳක්වත් තියෙනව නම් මං කියන්න යන දේ තේරුම් ගනිං..."

"හරි... උඹට ඉස්සර ඉඳන්ම මොළේ තිබුණු එකානෙ... කියපං බලන්න..."

මරොප්පුව ටිංගක් අඩු කරන් මං කතා කරා...

"මට තේරෙන විදියට ඒකි උඹට ලව්..."

"මො... මොකක්...?"

උගෙ කතාව මට හිනාගන්නවත් බැරි වුණා. බලන් ගියාම ඌට කදවෙන එකක් ඇත්තනේ.

"ඒකි මගෙත්තෙක්ක කියපු දේවලුයි, උඹ ගැන හිතන් ඉන්න විදයෙනුයි ඒක පේනවා බං."

"ප්.. පිස්සු නම් කෙළින් නෙපා රාජ්... මං මේ උඹත්තෙක්ක අංජලීව මීට් වෙන්න ප්ලෑනක් ගහන්න ආවෙ..."

මං එහෙම කිව්වහම රාජ් ටිංගක් වෙලා කල්පනා කරා.

"හරි, ඔක්කොම ලෙඩ අතෑරලා ඒ වැඩේ කරමු. උඹ දන්නවද අංජලීගෙ ගෙදරට යන විදිය..?"

"නෑ..."

"ෂික්... උඹ නම් මොන නැකතක ඉපදුන එකෙක්ද මංදා. ඒ දන්නෙත් නැත්නං කොහොමද යකෝ හම්බ වෙන්නෙ...?"

"අනේ මංදා බං..."

මායි, රාජුයි කතාවෙන් කතාවෙන් පාර පාරටත් ආවා. එතැන ඉඳන් කතා බහක් නැතුවම හයිලෙවල් රෝඩ් එකටත් ආවා. සං ගාලා පිඹගෙන ආපු 122 බස් එකකට ඌ අත දම්මෙ මට මුකුත් කියන්න නොදීම.

"මේ කොහේද යන්නෙ...?" සීට් එකේකට බර වෙන ගමන් මං රාජ්ගෙන් ඇහුවා.

"අපේ ගෙදර..."

මෙන්න මේ වෙලාවට තමයි මූව මරාගෙන කන්න හිතෙන්නෙ. ඇයි යකෝ දන් ආවෙ අංජලීව හම්බවෙන්න අයිඩියාවක් දාන්නනේ."

"උඹලගෙ ගෙදර ගිහින්...?"

"විහඟ... සීරියස් කියන්නෙ මචං... උඹ දන්නවනෙ ෂහනාස්ලට අපිට තියෙන නීති. දනටමත් ගින්නක් ඇවිලිලා ද දන් නෑ. මං කියන දේ ඒකි අහන්නෑ. රිලේෂන් වෙන හන්ද බනින්නත් බෑ. ගෙදර ඇයොත් තොල්මං බං..."



මං මුකුත් නොකියා කන්න වගේ උගේ මූණ දිහා බලං හිටියා.

"ඔක්කොටම කලින් ගෙදර ගිහින් ඒකි සෙට් කරමු. ඒ අස්සෙ මං අංජලීට ෆෝන් කරල කෝම හරි උඹව මීට් කරවන්නම්. අවුලක් නැනෙ බං..."

දැන් තියෙන තත්වෙ උඩ රාජ්ම, අංජලීට ෆෝන් කරනවා හොඳයි කියල මට හිතුනා. මොකද මං ආයෙ ෆෝන් කරොත් ඒකි දෙවෝස් ගාල ෆෝන් එක පොලවේ ගහාවි.

"දැන් කවුද උඹලගෙ ගෙදර ඉන්නෙ...?"

බස්සෙකෙන් බැහැල එගොඩවත්ත පාරට හැරෙන කොටම මං රාජ්ගෙන් ඇහුවා.

"අම්මයි අක්කයි විතරයි..."

ඌ එහෙම කිව්වහම මගේ හිතට ටිකක් රිදී වුණා. මොකද ඌගෙ ජාත්‍යාභිමානයෙන් එක විදියක පොරක්නෙ. මායි රාජුයි ගෙට ඇතුල් වුණා. නිල්පාට සල්වාර් එකක් ඇඳල. ඇස් දෙකත් හොඳටම රතු කරන්, සාලෙ සැටියට බරවෙලා ඉන්න ෂහනාස්වයි මං ඊගාවට දැක්කෙ.

"ආ ! විහඟ මල්ලී... යාලුවො බලන්න ආවද...?"

ෂහනාස්ට ටිංගක් එහායින් වාඩිවෙලා ඉඳපු රාජ්ගෙ අක්කා අහපු ප්‍රශ්නෙන් මං කොරවෙලා ගියා. මෙතන යන්නෙ අමුතුම ගේම්ක් කියල විතරක් මට තේරුණා. තවත් ටිංග වෙලාවක් යද්දි.

## 19

රාජ්ලගෙ ගෙදර, මට අපේම ගෙදර වගේ හුරු වෙලයි තිබුණෙ. ඒත් ෂහනාස් හිටපු හන්දද කොහෙද මොකක්දෝ නොසන්සුන්කමක් හිතට එබිලා තිබුණා.

"ඉන්න මං ඔයාලට බොන්න මොනා හරි ගේන්නම්."

රාජ්ගෙ අක්කා එහෙම කියල අපි ගාවින් නැගිට්ටෙ 'ධාවනි' එකෙක් කොණ්ඩෙ ඔක්කොම වගේ වහගෙන. ඒත් එච්චර වෙලා ඔලුව වහන් ඉඳපු ෂහනාස් 'ධාවනි' එක අරන් බෙල්ල වටේ ඔතාගත්තා. ෂහනාසුත් ඇවිල්ලා මාර කේස් එකක් කියල මට හිතුනෙ ඒ වෙලාවෙ.

"මා... මාව මතකයි නේද...?"

ඒ නිල්පාට ඇස් දිහා බලගෙනම මං ඇහුවා. ඒකින් මං දිහාම බලාගෙන. ඒත් ඒකි කතා කරේ නෑ.

"මං හිතන්නෙ මතක නැතුව ඇති...?"

www.sinhalaelibrary.com

හීන් නූලට කැපිල්ලක් දාන ගමන්, මං ටීපෝල් එක උඩ තිබ්බ ඉංග්‍රීසි පත්තරේ අතට ගත්තා.

"එතක නැතුව නෙමේ... අමතක කරන්න බැරුව ඇති."

එහෙම කියාගෙනම රාජ් අපි ගාවට ආවා.

"ජෝක්ස් එපා රාජ් අයියා... මං හොඳටම අපසට් එකේ ඉන්නේ."

අඬන වොයිස් එකෙන් ඒකි කිව්වහම මට මාර දුකක් දැනුණේ. ඒකමයි මං කතාව පටන් ගත්තෙ.

"ෂබී..., මේ බලන්න කෝ..."

මං එහෙම කිව්වහම, ඒකි ගැස්සිල වගේ මං දිහා බැලුවෙ.

"ඔයා දන් මෙහෙම ආවහම, ගෙදර අයට තවත් තරහ යනවනෙ නංගි.... ප්‍රශ්න විසඳන්න මෙහෙම බෑ නේද ? අපි ප්‍රශ්නවලට මූණ දෙන්නෝන... එහෙම නේද...?"

මං ටිකක් සිරා විදියට කතා කරා. ශ්‍රී රාජ් දඩස් ගාල මං දිහා බැලුවා. ඌ බලන්නැති මේ කතා කරන්නෙ විහඟ වික්‍රමසිංහමද කියලා.

"ඔයා කියනෙක හරි අයියා. ඒත් ඇයි අපට මේ තරම් ගාඩ් දාලා තියෙන්නෙ...? ඇයි මං අකමැති කෙනෙක්ව මට බඳින්න කියල ගෙදරින් බල කරන්නෙ... අපිට කියල නිදහසක් නැද්ද අයියා...?"

ඒකි අහපු ඒවට මං හිරවුනා. සියට සීයක් ඇත්ත ඒකි අහපු ඒවා. ඒත් මං වත් රාජ්වත් ඒවට උත්තර දෙන්න ගියේ නෑ. මය අතරෙ තමයි බීම ට්‍රේ එකකුත් අරන් රාජ්ගෙ අක්කා ආවෙ. "කෝම වුනත්, මං කැමැත්තෙන් හරි, අකමැත්තෙන් හරි බඳින දාට මගේ වෙඩින් ෆොටෝස් ගන්න රාජ් අයියගෙ යාලුවව ඕනෙ."

ඒ ටික කිව්වෙ ෂහනාස්මද කියල බලාගන්න, බීම එක බොන ගමන් මං ඒකි දිහා බැලුවා. ඒකි ටක් ගාල බිම බලා ගත්තා. කෝම කෝම හරි තවත් පැය බාගයක් විතර යද්දි ඒකිව කූල් කරන්න රාජ්ටයි මටයි පුලුවන් වුනා. ඒ හන්දම උදේට රාජ්ගෙ තාත්තට කියල ෂබීව බේරුවලට ඇරලවන්නත් රාජ් සෙට්ල් කරගත්තා.

"ම... මට මෙහෙ එන්න හිතුනෙ ඇයිද කියල මට නම් තාම තේරුම් ගන්න බැරි වුණා. ඒත් හිත අප්සෙට් ගියපු වෙලාවක මං ඇවිත් තියෙන්නෙ හොඳ තැනකට කියල විතරක් මට තේරුණා. ත්...ත්... තැන්ක්ස් විහඟ... ත්... තැන්ක්ස්..."

අඬන්න එන්න මෙන්න වගේ කටහඬින් ඒ ටික කියාපු ෂබී කාමරේට ගියා. රාජ් ඇහැක් වහල මාවත් ඇදගෙන ගෙයින් එළියට ආවා.

"බුදු හම්මෝ... ඔයින් ගියා ඇති. මං නම් ජීවිතේටවත් හිතුවෙ නෑ ඔකිව කූල් කරන්න පුළුවන් වෙයි කියල... ඈ බං... උඹ කොයින් ද අර වචන සැට් එක හොයාගත්තෙ...?"



ඌ හිනාවෙවී මගෙන් අහනවා. මටත් හිනා ගියා.

"දන් ෂබී... හෙට යනවා. ඒ යන්නෙ හිත මෙහේ දාලා.."

රාජ්ගෙ කතාවට, මගේ හිනාව උපන් ගෙයිම ලොප් වුනා.

"උඹට එකක් කියන්නම් රාජ්... ඒකි මෙහේ හිත දාල ගියාට මට කරන්න දෙයක් නෑ. ඒකිව බඳින්න නියාස් ඉන්නවා. මං ගැන බලාපොරොත්තු තියාගෙන අංජලී ඉන්නවා..."

"ඇති... ඇති... ඇති... වක්කඩේ නවත්තපං. උඹත් බං කතා කරන්න ගියාම අර මුක්කුන්ද වගේ. මයික් එක දෙන්නෙම නෑ. හරි... අංජලී උඹ ගැන හෝප්ස් තියං ඉන්නෙ... උඹ දන් ඒ හෝප්ස් වලට මොනවද කරන්න යන්නෙ ?"

මූ අහන ඒවට උත්තර දෙන්න නම් ඉතිං, ඔක්කොමටම ඉස්සෙල්ල මුගේ හොම්බට හැටික් විතර අනින්නෝන.

"අංජලීගෙ හෝප්ස් වලට කරන්නෝන දේවල් වලට කලින් ඒකිට ෆෝන් කරල ඉඳපං රාජ්..."

"හරි... වරෙන් යන්න... බත් කඩේ ගාවට. එතනින් කෝල් එකක් ගනෑකි... මට නම්බරේ දීපං...

මං ඌට අංජලීගෙ ෆෝන් නම්බරේ දුන්නා. ඒත් මං ඌත්තෙක්ක බත් කඩේ ගාවට ගියේ නෑ. ටිකක් ඈතට වෙලා මං බලන් හිටියා. තුන් පාරක් හතර පාරක් ට්‍රයි කරල රාජ් අතපය දික්කර කර කතා කරනව මං දක්කා. ඌ මොනවාදෝ පහදල දෙන්න ට්‍රයි කරනව වගේ. ටිකකින් ඌ මං ගාවට ආවා.

"මොකද වුණේ ඒකි බැන්නද ?"

"ෆිට් තමයි රත්තරං... හෙට හතරට. ගොල්ෆේස් එකට..."

"ත්...නෑ"

සංතෝසෙ වැඩිකමට මට කතා කරගන්නත් බෑ වගේ.

"නෑ නෙවෙයි යකෝ. ඔව්... දන් හොඳ එකා වගේ ගෙදර පලයං"

රාජ් කිව්වහම තමයි මට ගෙදර මතක් වුණේ. හිතේ සංතෝසෙකුත් අඩුක්කු කරන් රෑ වෙද්දි මං ගෙදර ආවා.

* * *

පහුවදා හවස හතරටත් කලින් මායි රාජුයි ගොල්ෆේස් පිට්ටනියට ගියා. සෙනඟ සූ ගාලා. දන්න අඳුනන අයො ඉන්නවද බලන්න මං වටපිට බැලුවා. බල්ලෙක්වත් නෑ. ඒ එක්කම තමයි රාජ් මගේ අතින් ඇද්දෙ.

"අ... අර බලපං..."

www.sinhalaelibrary.com

ඌ පෙන්නාපු දිහා බැලුවහම මං හිතල වෙලා ගියා. කොණ්ඩෙ දිගට වවපු ලස්සන කෙල්ලෙක්ගෙ අතින් අල්ලගෙන මද්දූ මුහුද දිහාට යනවා. ඒ කෙල්ලව අඳුනගන්න මට ඒ තරම් අමාරු වුණේ නෑ. අර ඉස්පිරිතාලෙ හිටපු සුදු චූටි ඩොක්ටර්... මෙයා බැඳලනෙ යකෝ. එතකොට මද්දූගෙ 'පූජනී' කියල කිව්වෙ මෙයාද...? ප්‍රශ්න කෙල කෝටියක් අතරෙ මාව කරකවල අතෑරියා වගේ වුණා.

## 20

"දැන් මොකෝ කරන්නෙ...?"

රාජ්ගෙ මූණ හොඳටම අප්සට් ගිහින්. මට නම් ඉතිං අවුලක් නෑ... නෑ වගේ. පූජනී කියන්නෙ කවුද කියල බලාගන්න විතරනෙ මට ඕන වෙලා තිබුණෙ.

"මූව මරන් කෑවත් හිතට මදි වගේ විහඟ..."

රාජ්ට මළ පැනලා. බලන් ගියාම ඇත්තනේ. ඒත් සීන් එක කලින්ම මට බාගෙට තෝන්ඩියි කියල මං ඌට කියන්න ගියේ නෑ. එහෙම වුණොත් ඌ මරන් කන්නෙ මාවනෙ.

"වරෙන් යමු..." රාජ් මගේ අතින් ඇද්දා.

"කොහේද...?"

මං එහෙම ඇහුවට, මගේ ඇස් තිබුණෙ මද්දූ ගාවයි, පූජනී ගාවයි. සුලං පාරට විසිරිලා යන පූජනීගෙ දිග කොණ්ඩෙ කෑලි මද්දූ පිළිවෙලකට හදන්න ට්‍රයි කරනවා. ආදරේ හිතෙන ඇස් දෙකෙන් පූජනී මද්දූ දිහා බලාගෙන...

"අරුන් දෙන්න ගාවට... ගිහින් අහමු මද්දූවගෙන්, මේක අපිට කිව්වනම් කොට බඩ යනවද ? කියලා..."

රාජ්ට මළ කියන්නෙ, මලෙන් උපරිමේ... මද්දූවව කෑලිවලට කපල දුන්නොත් මූ පුවර් එකට කනවා.

"පිස්සු කෙලින්නෙපා රාජ්... ඌට හොඳ නිසානෙ ඌ අපි දෙන්නට කිව්වෙ නැත්තෙ... ඉතිං අපිත් ගණන් ගන් නැතුව ඉඳිමු බං."

මං ඌට එහෙම කිව්වට මගේ හිතත් අප්සට් වෙලයි තිබුණෙ. පුංචිම කාලෙ ඉඳල එකට ඉඳපු මද්දූ, උගේ ජීවිතේ වැදගත් දෙයක් මගෙන් හැංගුව එක්ද කියනෙක මට වද දුන්නා.

"උං දෙන්න මැච් නේද බං...?"

ගෙහෙන් ගෙවී එන්න වගේ රාජ් මගෙන් ඇහුවා. උගේ මූණෙ තිබ්බ



ජේන්තිය මහ ලොකු දුකකින් වැහිල ගිහින්. මං බිම බලා ගත්තා. රාජ් මං ගාවම බිම වාඩිවුණා.

"මටත් වැඩිය උඹට දුක ඇති විහඟ... මද්දූයි, අපි දෙන්නයි තෙණ ෆිට් එකේ ඉඳලත් කියපු නැති එකට. කමක් නෑ මචං... උගේ සංතෝසෙට අපි ෆස්ට් ප්ලේස් දෙමු... දැන් ඉතිං අපි ආපු වැඬේ බලමු..."

මං වොච් එක දිහා බැලුවා. හරියට හතරයි.

"වේලාව නම් හරි බං. අපි ටිකක් පාර අයිනට වෙලා ඉඳිමු. නැත්නං අංජලීට අපිව හොයාගන්න බැරි වේවි. අද සෙට්ටියත් වැඩියි."

මං එහෙම කියල රාජ් දිහා බැලුවා. උගේ මූඩ් එක ආයෙමත් අප්සට්.

"මොකෝ බං...?"

"නැත කේස් එකක් යන්න වගේ හදන්නෙ...?"

මද්දූල ඒ වෙනකොට වෙරළ දිගේ අපෙන් ටිකක් ඈතට ගිහින්. මද්දූයි පූජනීයි පස්සෙන්ම වගේ, අඳුරන්නෙ නැති ගැන්සියක් ගාටන හැටි මං දැක්කා. උං විත මද්දූවයි, පූජනීවයි පෙන්න පෙන්න මොනවාදෝ කියන හැටිත් මං දැක්කා.

"විහඟ..., වරෙන් ෆලෝ එක දෙමු..."

ගාලු පාර කිට්ටුවෙන් මායි රාජුයි ඉස්සරහට ඇදුනා. මද්දූයි, චූටි ඩොක්ටරුයි මොනවාදෝ කිය කියා හිනාවෙවී කොල්ලුපිටිය පැත්තට ඇවිදන් ගියා. අර ගැන්සියත් ටිකෙන් ටික මද්දූලාට ළංවෙන හැටි මායි රාජුයි දැක්කා.

"රාජ්.. උඹ කිව්ව හරි... ගේමක් වගේ... වරෙන්, අපි තවත් කිට්ටු වෙමු."

රාජුයි මායි දුරින් දුරින් අඩි තිය තිය මද්දූලගෙ පස්සෙන් යන ගැන්සියට කිට්ටු කරා. ඒ වෙලාවෙ තිබ්බෙ ඒ තරම් හොඳ වාතාවරණයක් නෙවේ. ඉරත් හැංගිලා. මහ මූසල පාටක් හැමතැනම තිබ්බෙ. කොල්ලුපිටියෙන් ගෝල්ෆේස් පිට්ටනිය පටන් ගන්න හරිය වෙනකන්ම අපි තුන් කට්ටුව ඇවිදින් ආවා. ඔන්න එතෙන්දියි රේස් එක ස්ටාර්ට් කළේ. අර ගැන්සියෙ හිටපු තඩි උස මහත පොරක් සං සං ගාල මද්දූයි, චූටි ඩොක්ටරුයි ඉස්සරහට ආවා. මිනිස්සුන්ට මුවා වෙච් වුනත් මායි රාජුයි හිටියෙ මද්දූල ළඟම වගේ.

"උඹ නේද හාතිය කියන්නෙ...?"

මද්දූ දිහාට ඇඟිල්ලක් දික් කරන ගමන් ඌ ඇහුවා. මද්දූ ගැස්සිල වගේ ඒ පොර දිහා බැලුවෙ. චූටි ඩොක්ටර් බයවම මද්දූගෙ අතේ එල්ලිලා..."

"ඔ... ඔව්..."

www.sinhalaelibrary.com

WWW.SINHALAELIBRARY.COM 25

"එහෙනම්... මේ නෝනා මහත්තයත් එක්ක තියෙන ගණුදෙනුව නවත්තපං...!"

අර තඩි හයේ හතරෙ පොර එහෙම කිව්වහම මද්දූගෙ මූණ රතු වෙනව මං දැක්කා. මං රාජ් දිහා බැලුවා. ඌ ඇස්වලින් විතරක් නෙවෙ කටිනුත් සිනා එක හරඹනවා.

"නමුසෙ කියනකං තමයි මං හිටියෙ නවත්තගන්න... අනේ යනව මූයි යන්න..."

මද්දූගෙ ටෝකට ඌ කොර වුණා. ලජ්ජාවටත් එක්ක ඌ අත දිගෑරලා මද්දූගෙ මූණට ගැහුවා. මද්දූ පාර කාගෙනම බිමට පාත් වුණෙත් මායි රාජුයි පිව් එක උඩට බැට් කරන්න ගියෙත් එක පාරටම. ඇස් වටේට තුරු පොකුරු පොකුරු විසි වෙනව තේරුණත් මද්දූට ගහන්න ආපු හතර දෙනාට මායි රාජුයි නෙලුවා. මද්දූත් උංට ගහනවා ඒ අස්සෙ මං දැක්කා. ඇත්තටම උං එක්ක ගේමක් අපිට තිබුණෙ නෑ. වැටි වැටි දුවන උං හතර දෙනාට මායි රාජුයි නූ තිබ්බා. හුඟ කාලෙකින්නෙ බැට් කළේ. ඒකයි ඇඟපත රිදෙන්නෙ.

"සිරාවට ගේම ගියා නේද බං...?"

වටවෙලා ඉඳපු සෙනඟ මැද්දෙන් එළියට ආපු රාජ් මගෙන් ඇහුවා."

"ආයෙ අහලා... දන්...?"

මට එතනින් එහාට මුකුත් කියන්න හම්බවුණේ නෑ. මද්දූ අර චූටි ඩොක්ටරුත් ඇදන් මායි රාජුයි ඉස්සරහට ආවා. මං ඒකි දිහා බැලුවා. ඉස්පිරිතාලෙදි වගේ නෙමෙයි ඒකි දඩස් ගාල බිම බලා ගත්තා.

"පුළුවන් නම් මට සමාවෙයන් පොඩී..."

මද්දූ එහෙම කිව්වහම මං රාජ් දිහා බැලුවා. ඌ මට වොච් එක පෙන්නුවා. හජ්ජෙ... අංජලී... වෙලාවත් පහට ළඟයි. අංජලී ඇවිල්ල ගියාද දන්නෙත් නෑ. මං මද්දූ දිහා නොබලාම රාජ්වත් ඇදගෙන ආයෙමත් අපි මුලින් ඉඳපු පැත්තට දිව්වා. අනේ දෙයියනේ අංජලී ඉඳපං... ඉඳපං... කියල හිත හිතා මං දිව්වෙ. මේ පාරත් මටම කෙළවිලාද කියල දෙයියො තමයි දන්නෙ ?

# 21

"ඇවිල්ලු නෑ වගේ රාජ්...?"

හැම්කැතම බලලත් අංජලී නැති හින්ද මං රාජ්ට කිව්වා.

"නෑ නෙමෙ යකෝ, ඇවිල්ල ගිහින්ද කියල කවුද දන්නෙ...?"



ඌ කියන්නෙත් ඇත්ත. එහෙම වෙලා තිබ්බොත් ඉතිං ඇඹුලුත් නැතෙ. වහ ටිකක් බීල චූ කරන්නයි වෙන්නෙ"

"මොකද කරන්නෙ...?"

කරන්න ඕන කිසිම දෙයක් මලුවට ආපු නැති හින්ද මට කියැවුණා. ඒත් රාජ් ඉඳපු තැනම ඉඳන් කල්පනාව. මමත් හිනන්න පටන් ගත්තා. ටික අතරෙ තමයි අපේ පස්සෙන්ම ආපු මද්දූ මගේ උරහිසෙන් ඇද්දෙ. මං මද්දූ දිහා කෙළින්ම බැලුවා.

"පොඩී... තරහක් තියෙනව නම් මට ගහපං. මාව මිස් කරල යන්නෑතුව...!"

හෙණිම හෙන සිරා විදියට මද්දූ ඒ වචන ටික කිව්වෙ. මං චූටි ඩොක්ටර් දිහායි රාජ් දිහායි මාරුවෙන් මාරුවට බැලුවා. කතා කරන්න වචන මට නෑ. මගේ මලුව තනිකරම අප්සට් ගහලයි තිබුනෙ. එහෙන් අංජලී නෑ. මෙහෙන් මද්දූයි, චූටි ඩොක්ටරුයි මාව කන්න හදනවා.

"ඔයා කියන විදියෙ අවුලක් අපේ නෑ මද්දූ. මායි විහඟයි ආවෙ වෙනම සීන් එකකට. ඔයාගෙ දේවල් අපිට නොකිව්වට අපේ තරහක් නෑ. වලියට මායි මූයි පැන්නෙ ඔයාට ගහනව බලන්න ඉන්න බැරි හන්ද..."

රාජ්ගෙ ටෝකට මද්දූ අයියා බිම බලා ගත්තා, චූටි ඩොක්ටරුත් බිම බලාගෙන. ඒත් මද්දූ ගැන දුකක් මගෙ හිතට ආවෙ නෑ.

"උඹල දෙන්නටම පූජනී ගැන කියන්න මං බලන් හිටියෙ. ඒත් ඉතිං හිතුවෙ නැති විදියට හැමදේම එකපාරටම වුණා."

"අයි ඈම් සොරි විහඟ..."

මද්දූ අයියගෙ කටහඬ අතරින් හීන් කෙඳිරිල්ලක් වගේ චූටි ඩොක්ටර්ගෙ කටහඬ මට ඇහුණා. ඒ සුදු මූණ රතුවෙලා. දාඩියත් දාලා. එදා මං කකුල කඩාගෙන ඉස්පිරිතාලෙ ඉන්දෙද්දි 'ඔයා බැඳලද ?' කියල මං අහපු හැටි, මට ඇඹුලුත් නැති වෙන්න බෙහෙත් විදපු හැටි, බැන්ඩේජ් එක ගලවන්න ගියාම මද්දූත් එක්ක හිනාවුන හැටි හෙම, ෆිල්ම් එකක වගේ මගේ හිත ඉස්සරහ ඇදිල ගියා.

"ම.... මටයි, රාජ්ටයි ප්‍රශ්නයක් නෑ ඩොක්ටර්.. ඒත් අපිට දුයා මද්දූ හැමදේම හංගපු එක..."

පූජනීට මං ඩොක්ටර් කියල කතා කරපු එක සිරාවටම වැදුනා. ඒකි දඩස් ගාලා මං දිහා බැලුවා.

"ම... මට ඕ...ඔහොම කතා කරන්නෙපා විහඟ. ඔයාල මේක අගක් මුලක් දන්නෑ..."

"අගක් මුලක් දැන ගන්න ඔයාල අපිට කියන්න එපාද ?"

මං දුන්නෙම රෝන් ටෝක්.

"පොඩී... අපි ඔක්කොම කතා කරන්නෝන... මෙතන බෑ.. යමු අර හරියට..."

එහෙම කියල මද්දූ අපිට ඉස්සර වුණා. රාජ් මට සයිඩ් එකෙන් හිනාවක් දාල ඇහැක් ගැහුවා. ඒ කියන්නෙ වැඩේ ෆිට්. පස්සෙන් යමං කියන එකනෙ.

"හාකිය... ? අපි සැන්විච් වගයක් ගෙනාවනෙ... මං අරන් එන්නම්..."

අපි තුන්දෙනා ඉස්සරහට යනවත්තෙක්කම එහෙම කියපු චූටි ඩොක්ටර් ගාලු පාර පැත්තට ගියා. ඒ කියන්නෙ අපිට කතා කරගන්න දීලා එයා මාරුව දැම්මා. ඒකත් හොඳයි. ඩිංගක් වෙලා යනකන් මද්දූයි, මායි, රාජුයි අතරෙ කිසිම කතාවක් ඇතිවුණේ නෑ. සෙනඟ අඩු හරියකට ගිහින් මද්දූ බිම වාඩි වුණා. මායි රාජුයිත් මද්දූ ගාවම වාඩිවුණා.

"මේක කොහෙන් පටන් ගන්නද කියල මට තේරෙන්නෙ නෑ පොඩී...?"

මද්දූ මං දිහා බලල ආයෙමත් බිම බලාගත්තා.

"උඹ කොහෙන් පටන් ගත්තත් කමක් නෑ. ඉස්සෙල්ල කියපං ඔය වලියට ආපු ඌං කවුද කියලා...?"

රාජ් ගේම ස්ටාර්ට් කරා.

"පූජනීගෙ හස්බන්ඩ්ගෙ මිනිස්සු වෙන්නැති..."

මද්දූ එහෙම කිව්වහම මායි රාජුයි කොර වුනා. මං දුක්ක ලෝක නතර වෙලා තියෙනව වගේ."

"මිට...!!"

කියාගෙන රාජ් හිටපු තැනින් නැගිට්ටා.

"ලැජ්ජ නැද්ද මද්දූ අයියා..., වෙන එකෙක්ගෙ කෑමක් අරන් කන්න. මං එදත් කිව්වෙනෙ ඔය ඩොක්ටර් බැඳලා කියලා..."

මාත් දැන් දෙන්නෙ පඩි චෝක්. එහෙම නැතුවත් බෑනෙ. මෙතන මිනී මරා ගන්න තරම් කැත කේස් එකක්නෙ ගිහින් තියෙන්නෙ..."

"...දැන් අදම වලපං මද්දූ... මායි විහඟයයි නැත්තං ඌං ගැන්සිය උඹව සම්බල් කරනවා... මෙ ලංකාවෙ මෙච්චර බැඳපු නැති කෙල්ලෝ ලක්ෂ ගානක් ඉන්දෙද්දි, බැඳපු එකක් පස්සෙ යන්න ? මට තේරෙන්නෑ මද්දූ..."

රාජ් කියවාගෙන කියවාගෙන ගියා. ඒත් මද්දූ අතෑරියෙ නෑ.

"... මං තේරුම් කරන්නත් හදන්නෙ ඒකයි රාජ්... පූජනී මැරි කරලා. ඒක ඇත්ත. එයාට හස්බන්ඩ් කෙනෙක් ඉන්නවා. ඒකත් ඇත්ත. ඒත් ඒ ඔක්කොම පොතට විතරයි පොඩී... එයාගෙ ඇඟට ඌ තාම අතක්වත් තියල නෑ..."



"උඹ ඒක දන්නෙ, ජනේලෙන් බලන් ඉඳලද...?"

මං අහන්න හිතපු එකම හෙණ ගහන්න වගේ රාජ් ඇහුවා. මද්දූ මගේ මූණ දිහා බලල ආයෙත් කතාව පටන් ගත්තා.

"නෑ... රාජ්..., බැඳපු එකා හෙණ ජරා යකෙක් කියල දැනගන්න කොට පූජනී පරක්කු වැඩියි. එතකොට මඟුලට ඔක්කොම ලෑස්ති වෙලා ඉවරයි. ගෙදර අය බලෙන්ම පූජනීව තියලා අත්සන් කරලා රෙජිස්ටර් කරලා. එත් දැන් දෙන්නා දෙපැත්තෙ. පූජනී එයාලගෙ ගෙදර... දැන් ඩිවෝස් කේස්... මායි පූජනීයි යාලු වෙලා කියල දැනගත්ත දවසෙ ඉඳන්ම ඌ කොකු...

දවස් තුන්සිය හැට පහක්ම කල්පනා කරන්න තරම් දේවල් මද්දූ කියවගෙන ගියා. මායි රාජුයි මූණෙන් මූණ බලා ගත්තා. ඒ පාර මොකක්ද බොලේ මේ වෙලා තියෙන්නෙ... විහඟ මල්ලී... උඹ හිතන් ඉඳපු විදිය වැරදියි වගේනේ...

## 22

හතාමාර වගේ වෙද්දි පූජනී එයාගෙ කාර් එකෙන් මාවයි මද්දූවයි ගේ ගාවටම දාලා ගියා. රාජ් නම් මගින්ම බැස්සා. සැන්විච් කාල. කාර් එකට නගින කොට මං බැලුවෙ කාර් එකේ නම්බරේ දිහා. රාජ් කිව්ව හරි. එදා මං අංජලීට ෆෝන් කරන වෙලාවෙ මද්දූ ඩ්‍රයිව් කරල තියෙන්නෙ මේ කාර් එක දැන් මිනිහ පූජනීවත් ඩ්‍රයිව් කරනව ඇතිනෙ.

කෝම හරි ගෙදරට එනකන්ම මායි මද්දූ අයියයි අතරෙ කතා බහක් තිබුණෙ නෑ. අපි එනකොට අම්මා සාලෙ ඉඳන් ටී.වී. බලනවා. ෂේප් එකේ අම්මට හිනාවක් දාගෙනම මං කාමරේට රිංග ගත්තා. මද්දූ අයියත් එයාගෙ කාමරේට යනව මං දැක්කා. මං කෙලින්ම ඇඳට දඩෝස් ගාල පැන්නා. මගේ කල්පනා සාගරය ඇඳුනෙ. ඕකෙ ඉන්නකොටනෙ ඔක්කොම රෝයල් අයිඩියාස් එන්නෙ. රාජ් නම් කියන්නෙ, ඌට අයිඩියාස් එන්නෙ ටොයිලට් ගියපු වෙලාවට කියලා. ඔව්, ඉතිං ඕකගෙ ඔලුවට එන්නෙත් දෙකේ පංතියෙ වඳුරු කුණුහරුපනෙ. ඒව ඇඳන් උඩ ඉඳන් කල්පනා කරන්න පුලුවනෑ.

"මද්දූ...? තේ ඕනද...?"

අම්මගෙ කටහඬ සාලෙන් ඇහුනා. ඕකට ඕකේ... අම්මා ඒක මද්දූගෙන්ම අහපු එකනෙ වැඩේ. දැන් ඕකා සුවර් එකට එපා කියනවා. එතකොට මටත් තේ නෑ... ෂිහ් ! නයිට් එකම ඉවරයි...

"එපා... අම්මා..."

"ඔයා...! මං කිව්වෙ නැද්ද... අපේ අම්මටත් කිසි දෙයක්

www.sinhalaelibrary.com

WWW.SINHALAELIBRARY.COM 27

ඉන්රෙන්නෙ නෑ. ඉදපංකො.. මාත් අරින් නෑ. දෙන්නාම ජම්බු.

"අම්මේ... ? මට තේ ඕනෙ..."

මං ටිකක් සද්දෙ වැඩි කරල කතා කරා.

"තව ටිකකින් කෑම කනවනෙ පොඩී.. දැන් ඕන් නෑ..."

හැරෙන තැපෑලෙන් අම්මගෙ උත්තරේ ආවා. දැන් ඉතිං කාපංකො තණකොළ. අනේ ඇත්තට මං මේ තරම් අවාසනාවන්තද ? අසමජ්ජාතිද ? කාලකණ්ණිද ? තවත් ඩිංගක් වෙලා යද්දි මැන්ටල් අයිඩියාස් ඔක්කොම පැත්තකට දාන්න මට උගෙ අත් දෙකම තරගෙට වගේ රිදෙන්න ගත්තු හන්ද. රිදෙන්න නැතුව තියේවිද අර හයේ හතරෙ ඇඟවල් එක්ක හැප්පුනාම. අර ඒ වෙලාවෙ ආපු ගැම්මට ගුටි කෙල ගත්තා මීසක උං හතර දෙනාගෙ මූණු දිහා බලාගෙන නම් ගහගන්න බෑ... කොහොම වුණත් මද්දූව කරපු දේ නම් කැතයි... ඊකට තිබුනාන මෙච්චර මේ අල්ලපු කාමරේ ඉන්න මට ලව් එක ගැන කියන්න. නිකං... නිකං සොමියට වගේ හරි... ඒත් කිව්වෙ නෑ... කමක් නෑ බ්‍රදර්... මං තරහයි උඹත් එක්ක.

"පොඩී..."

මෙන්න යකෝ මද්දූවා, කාමරේ දොර ගාව. මූ නම් මරත් කෑවත් මැරෙන්නෙ නෑ. මං කෙලින්ම මද්දූ දිහා බැලුවා. පොර ඒ පාර කාමරේ ඇතුළට ඇවිත් මගේ මේසෙ ගාව හිටගත්තා.

"උ... උඹ තාම මගෙත් එක්ක තරහින්ද පොඩී...?"

මද්දූ අයියා මගේ උරහිසෙන් අල්ලල තද කරා. මං මද්දූගෙ අත මගේ උරහිසෙන් අයින් කරා.

"ම...ම...මං උ.. උඹට කියන්න හිටියෙ... ඒත් ඒත්... මං කොහොමද උඹේ මූණ දිහා බලන් මෙ වගේ දෙයක් කියන්නෙ උ... උඹ මං ගැන වැරදියට හිතුවොත්..."

මද්දූ අයියගෙ කටහඬ බිඳිල ගියා. මං වක් ගාලා මද්දූගෙ මූණ දිහා බැලුවා. දෙයියනේ මූ අඬනවා. මගේ ඇස්වලටත් කඳුළු ආවෙ මටත් හොරාම.

"ක... කමක් නෑ. උඹ කතා කොරුවෙ නැතුවට. උඹ අහගෙන හරි ඉන්නවනෙ... මං වැරදියි තමයි.. මං කාට නොකිව්වත් උ... උඹට කියන්න තිබුණා. පූජනී ගැන.. ඒත්... ඒත්?

ඇඳේ වාඩිවෙච්ච මද්දූ දණ හිස් දෙක අස්සෙ ඔලුව හංගගෙන අඬනවා. මගේ ඇස්වලිනුත් හෝ ගාල කඳුළු බේරෙන්න අරන්... මං මද්දූව ලංවුණා.

"නෑ... නැගිටපන් මද්දූ... මං.. මං තරහ නෑ..."

මං මද්දූ ගාවට ගිහින් ඌව බදාගත්තා. මද්දූත් ඔලුව උස්සල මාව බදාගත්තා.



"පා... පාට්නර්... උ.... උඹ..., එහෙනම් තරහ නෑ..."

හුඟක්ම ආදරේ හිතුන වෙලාවට මද්දූ මට කතා කෙරුවෙ පාට්නර් කියලා...

"නෑ... මද්දූ නෑ..."

කඳුළු අතරින්ම මං කිව්වා. මද්දූ තාම අඬනවා. අඬන්න ගියාම ඌ පොඩි එකෙක් වගේ.

"ම... මද්දූ... දැන් ඉතිං ඔක්කොම හරිනෙ... මිට පස්සෙ මගෙන් ෆුල් බැකප් හරිද..?"

මං ලාවට හිනාවෙවී කිව්වා. ෂර්ට් එකෙන් මූණ පිහිදගෙන මද්දූත් හිනාවුණා.

"මොකද දෙන්න ඒ පාර...?"

තේ කෝප්පෙකුත් අරන් අම්මා කාමරේට ආවා. හප්පේ තව ඩිංගක් කලින් ආව නම්, ෆුල් ඔෆ් ඇඩොස් නෙ. කෝම වුණත් අම්මා මං ගැනත් හිතලා තියෙනවා. තේ එක මට දීලා අම්මා ආයෙත් සාලෙ පැත්තට ගියා. අම්ම ගියා විතරයි මද්දූ ආයෙත් මං දිහා බලලා හිනාවුණා. ඒ පාර මොකද?

"ම... මං අර ගෑණු ළමය දැක්කනෙ..."

"මොන..."

"ඇයි බං, මං අර නම්බර් එක ඉල්ලල උඹට ගෙනැත් දුන්නෙ. අපේ ගෙදරත් ආවෙ..."

"අ...ං...ජ...ලී..?"

"යර්ස්... එයා තමයි..."

මගේ පපුව මාලිගාවත්තෙ ලී මෝල වගේ සද්දෙ දාන්න ගත්තා. මෙ මොනවද වෙන්න යන්නෙ...?"

"කොහේදිද මද්දූ...?"

අප්සට් වෙච්ච හිත පැත්තකින් තියල මං ඇහුවා.

"අද බං... අද.. ගොල්ෆේස් පිට්ටනියෙදි... කොහෙද ඉතිං අපේ කොට් නැටුමක් තිබුණානෙ... ඒකි ඇවිත් හිටියෙ තව කෙල්ලෙකුත් එක්ක. ඩබල් කැබ් එකක... ඒකිමයි ඩ්‍රයිව් කළේ... හෙනට බර තියෙන භාණ්ඩයක් වගේ පාට්නර්..."

මද්දූ කියවගෙන කියවගෙන ගියා. මගේ හිත නසර වෙලා වගේ... අංජලී ඇවිදින්. දැන් ඉතිං විහඟ මල්ලී... උඹට කන්න වෙන්නෙ රබර්... ඒකි දැන් තිබ්බ කණුවට හත්මුතු පරම්පරාවම මතක් කරනව ඇති. මගේ වෙලාව නම් හොඳම නෑ. වෙලාව නැවතිලා ද කොහෙද ?

WWW.SINHALAELIBRARY.COM 28

## 23

පහුවෙනිදා මං ඇහැරුණේ මද්දූ අයියා මාව අල්ලල හොල්ලගෙන යද්දී... උදේ පාන්දරම මාව නැගිට්ටෙව්වට මූණ ඩබල් එකේ හතරැස් කරන් මං මද්දූ දිහා බැලුවා. උං හිනාවෙනවා.

"මොකෝ...?"

එක්කො මූ කියන මගුලක් කියන්න ඕනි කෙල්ලෙක් වගේ හිකි හිකි ගාන්න ගන්නෙ.. අනේ අම්මප මේ වෙලාවට තමයි මූට පිහියකින් අනින්න හිතෙන්නෙ...

"මද්දූ කියන මගුලක් කියනවකෝ. මට කුණු වෙන්න නිදිමතයි ඕයි..."

බෙඩ්ෂීට් එක අරන් ඔලුවෙ ඉඳන් පොරවගන්න ගමන් මං කෑ ගැහුවා. ඒත් කොහෙද ? මද්දූගෙ මයිලක් වත් හෙල්ලුනේ නෑ.

"මේ පාර නම්, උඹ ඉවරයි පාට්නර්..."

මද්දුව ඒ ටික කියපු තාලෙ මට ඇල්ලුවෙ නෑ. ඉබ්බා කට්ටෙන් එළියට හොම්බ දාම්ම වගේ. මං බෙඩ්ෂීට් එකෙන් එළියට ඔලුව දාම්මා. මද්දූ එතකොට හිටියෙ කාමරේ දොර ගාව. පොර, මට ඇඟිල්ලෙන් සාලෙ දිහාවෙ පෙන්නනවා.

"කවුද මද්දූ...?"

ඔලුව ගානට වැඩ කරගෙන එද්දි මං ඇහුවා. මද්දූ හිනාවෙච්චි දිපු උත්තරෙන්. මං ඇඳෙන් නැගිට්ටෙ කොහොමද කියලවත් මට මතක නෑ.

"අ...ං...ජ...ලී....?"

"ත්... නැත්... අංජලී ආවද ?"

මං ෂෝට පිටින්ම කාමරේ දොර ගාවට දිව්වා.

"මේ... මේ... කරුණාකරල මූණ පොඩ්ඩක් හෝදගෙන පලයං... නැත්තං ඒ ළමයට නූල් බඳින්න වෙයි."

මද්දූගෙ කතාව සත විසිපහකට වත් ගණන් ගන් නැතුව දොර රෙද්ද අස්සෙන් මං සාලෙට එබුනා. ඔලුව බිමට පාත් කරන් අම්මත් එක්ක කතා කර කර ඉන්න අංජලීව මං දැක්කා. හුගාක් දවසකින් දැක්ක හින්දද මන්දා මට අහක බලන්නත් ලෝබ හිතුනා. අම්ම හිටියෙ නැත්තං, මං ඒකිව බදාගෙන ඉඹගෙන ඉඹගෙන යනවා. පොලීසි ගියත් කමක් නෑ. ඉඹල ඉවර වෙලානෙ.

"ආ... ඔය නැඟිටල තියෙන්නෙ..."

මාව දැක්ක ගමන් අම්මට හිනා ගියා. අංජලීටත් හිනා. ඇයි මං



නැගිට්ට ගමන්නෙ. මල පෙරේතය වගේ ඇති. සුවර් එකට.

"එහෙනම් අංජලී..., පොඩ්ඩක් එක්ක කතා කරගන්න. මං තේ එකක් හදන් එන්නම්..."

අම්මා එහෙම කියලා සැටියෙන් නැගිට්ටා.

"ඕනෙ නෑ ආන්ටි... මං උදේ කිරි එක බීපු ගමන්මයි ආවෙ."

ඒකිගෙ හීනි වොයිස් එකෙන් මගෙ කණ හීතල වෙලා ගියා.

"ඔයා බීව්වට අපි තාම බිව්වෙ නැනෙ... මේ උදේ පාන්දර ඇවිත් මගේ තේ එකත් නැති කරන්නද හදන්නෙ...?"

අම්ම යනකන් ඉඳල මං වක්කඩේ ඇරියා. ඒකිගෙ මූණ හතරැස් වෙලා ගියා. කම්මුල් හෙම රතුපාට වෙලා දිලිසෙන්න ගත්තා.

"මං ආපු එක කරදරයක්ද අයියා...?"

සැඩ පුකක් මූණට අරන් අංජලී එකපාරටම මගෙන් ඇහුවා. දැන් නම් ඒකිගෙ මූණ බලන්නත් මට මොකක්දෝ වගේ.

"මං එහෙම දෙයක් කිව්වද ?"

කතාව නෝමල් කරන්න හිතාගෙන මං එහෙම කිව්වත් ඒකිගෙ මූණ ටක් ගාල වෙනස් වුණා.

"උදව්වක් ඉල්ලන්න ඕන වෙලාවක මං ඇවිත් තියෙන්නෙ වැරදි තැනකට නේ...?"

කියල සැටිය උඩ තිබ්බ හෑන්ඩ් බෑග් එකත් අරන් ඒකි නැගිට්ටා. බලන් ගියාම මේකි කොච්චි කරලක්නේ. සීනි බෝල වගේ හිටියට ඩිංග එහාට මෙහාට වෙන්න බැනෙ.

"උංහී.... ප්ලීස්... රණ්ඩු වෙන්න නම් බෑ. අම්මත් බලයි මොකද කියලා.. ඊයෙ ඔයාව රස්තියාදු වුනා නම් සොරි නංගි... හිතල කරපු දෙයක් නෙමේ. හිතුවෙ නැති විදියට කුණු වලියකට මාට්ටු වුණා..."

"ඒ කතාව ඕනෙ නෑ විහඟ අයියා. අපි ආයෙ ඒ ගැන කතා නොකර ඉඳිමු..."

අංජලී එහෙම කිව්වම මං හීතල වෙලා ගියා. මේකිගෙ හිත හොඳටම රිදිල කියනෙක මට හොඳටම තේරුණා. අංජලී එහෙම කියල මගේ මූණ දිහා බැලුවා. මාත් ඒකි දිහාම බලාගෙන හිටියා. හිතාගන්නවත් බැරි විදියට මගේ හිත ගත්තු ඒ ආදරේ හිතෙන පුංචි කෙල්ල දිහා මං ඇහිපිල්ලම්වත් ගහන්නෙ නැතුව බලන් හිටියා.

"මං ආවෙ විහඟ අයියගෙන් උදව්වක් ඉල්ලගන්න.."

"ඔව්...?"

මගේ හිතට මාර ෆීව් එකක් ආවා එකපාරටම වගේ. මාත් හිටියෙ මේකිව කොහොම හරි හම්බවෙන්නනෙ.

WWW.SINHALAELIBRARY.COM 29

"අද මගේ අක්කගෙ පුතාගෙ බර්ත් ඩේ එක. බබාගෙ ෆොටෝස් ගන්න සෙට්ල් කරලයි තිබුණෙ. ඒත් කියපු මනුස්සයට එන්න විදියක් නෑ කියල උදේ ෆෝන් කරා. මට මතක් වුණේ ඔයාව..."

"දැන්ම එන්න ඕනද...?"

"අනේ ඔව්, විහඟ අයියා..."

අම්මා අංජලීට තේ දෙන අතරෙ මං අඩබඩ ගාලා වොෂ් එකක් දාගත්තා. ටී එකකුයි ඩෙනිමකුයි දාගෙන කැමරාවයි ප්ලෑෂර් එකයි අතට අරන් මං වටපිට බැලුවා. එක පාරටම කාමරේ කර්ටන් එක උඩ ගියා. මද්දූ.

"වැඩේ හිට් නේද ?"

"මොකා...?"

මං මද්දූට උඩින් පල්ලෙන් විස්තරේ කිව්වා. ඌ මට බනිනවා දෙක වෙන්න. පන්කලි වැඩ නොකර ලව් කරපං කියල. ඌට තේරෙනවද මේවගෙ ආතල් එක... අනික ඒකිට ලව් කරන්න ඒකි මට කැමති වෙන්න එපායැ. මූට කොහෙද ඕවී තේරෙන්නෙ... උගේ ඇඟෙනුත් දැන් නිකං නිකං බෙහෙත් ගඳ එනව වගේ... මං හිතන්නේ මූ ඉස්පිරිතාලෙ ලියාපදිංචි වෙලා ඇති. අරකිගෙ වෝඩ් එකේම.

## 24

"හොඩ්... උදේට කෑම...?"

මායි අංජලීයි ගෙයින් එළියට බහිනකොටම අම්මා මගෙන් ඇහුවා. මං අංජලී දිහා බැලුවා. ඒකි බිම බලාගත්තා.

"බර්ත් ඩේ එකනෙ අම්මා... ඔය මොනා හරි හම්බවෙන්නෙ නැතුවයැ..."

අම්මගෙ පිටි පස්සෙන් ඇඳපු මද්දූ අයියා මාපටැඟිල්ල උරුක්කු කරලා 'හිට් තමයි' කියලා වින් කරා. මිදුලේ බට අඹ ගහ ගාව නවත්තල තිබුණෙ තවීනකම පන්නයෙ ඩබල් කැබ් එකක්. මටත් නගින්න කියන ගමන් අංජලී කැබ් එකට නැගල ස්ටාර්ට් කරා. ඇත්තටම මට දැනුණේ හරිම නුහුරු බවක්. අංජලීවත් ඒ නුහුරු බව අතරෙ හිරවෙලා තිබුණා. කෝම හරි ගෙදර ඉඳන් හයිලෙවල් පාරට එනකනුත් අපි දෙන්න අතරෙ කිසිම කතා බහක් තිබුණෙ නෑ. ස්ටියරින් වීල් එක දිහා බලන විදියට මං අංජලීගෙ මූණ දිහා හොරෙන් බැලුවා. රෝස පාට වෙලා තිබුණු ඒ පුංචි මූණ දක්කහම ආදරේ හිතට එන්න ගත්තෙ හිතට හොරාම. මං හොරෙන් අංජලී දිහා බලන් ඉන්නකොට ඒකින් එක පාරටම මගේ දිහා බැලුවා. දඩබඩස් ගාලා මං බිම බලා ගත්තා. ආයෙමත් ටිකකින් මං ඒකි දිහා



බැලුවා. ඒ වෙනකොට මගේ දිහාට හැරිල තිබුණු ඒ ඇස් ආයෙමත් පාර දිහාට යොමුවුණා. විනාඩි ගණනාවක් යනකන්ම කතා කරන්න වචන හොයා හොයා අංජලීත්, මමත් අතරමං වෙලා හිටියා.

"අංජලී මගෙත්තෙක්ක තරහද ?"

මං බොහොම අමාරුවෙන් ඒ වචන ටික එළියට දාගත්තෙ. ඇත්තටම වෙනද හිතට දැනෙන සැහැල්ලුව අද තිබුණේ නෑ. හිත ඉබේම අන් හිට් වෙලා.

"මොනාව බෙදා ගන්න බෑරුවද අයියා..."

ඒකි දුන්නෙම රෝන් වෝක්. එලොවවත් නෑ, මෙලොවවත් නෑ වගේ. ඒක හන්දම මං පටන් ගන්න හදපු කතාව උපන් ගෙයිම ලොප් වුණා. ඒත් අංජලී මාව නොසලකා හරිනව, වගේ කියන හැඟීම මගෙ හිතට ආවා. හිත විංගෙප. විංග උණුසුම් වේගෙන ආවත් මං ඉවසන් හිටියා. මං හොඳටම දන්නවා තව ටිකකින් මට මළ පනින වින්නිය. ඒක නිසාම මං කතා නොකර හිටියා. ඒකිත් අනූරියෙ නෑ. තකට තක. ඩ්‍රයිව් කරන ගමන් හොරෙන් හොරෙන් මං දිහා බල බල ඒකිට නොමෙයි වගේ, ස්ටියරිං වීල් එකට ඇඟිලි තුඩුවලින් තට්ටු කරනවා. බලන් ගියාම මේකිත් මාර බුලට් එකක්නෙ... එදා කිව්වා ලයිසන් නෑ කියලා. ඒ වුණාට දැන් එළටම කැබ් එකකුත් ඩ්‍රයිව් කරනවා. මද්දූ ඊයෙ කිව්වෙ මේ කැබ් එක ගැන වෙන්නැති කියලා මට හිතුනා.

කතා කරන්නෑ කියල හිතා ගත්තත් කැබ් එක විජේරාම හන්දියෙන් කැම්පස් එක පැත්තට දම්මහම මගේ කට ඇරුණා.

"මෙ... මෙහේ කවුද.. ඉන්නෙ ?"

මං ඒක අහපු විදිය හන්දම අංජලී මං දිහා බැලුවා.

"අපි ආවෙ ෆොටෝස් ගන්නනෙ. අපේ අක්කලගෙ ගෙදර... ඔන්න බලාගන්නකො..."

කැම්පස් එකත් පහු කරන ගමන් තට්ටු දෙකේ අලුත්ම ගෙයක් ඉස්සරහ කැබ් එක නවත්තන ගමන් අංජලී කිව්වා. තව ටිංගක් එහායින් ශ්‍රී රාජුන් ඉන්නවනෙ. උංගෙ ගෙදරත් මේ ළඟනෙ. ඒත් මං ඒ වින්තිය අංජලීට කිව්වෙ නෑ. ඩබල් කැබ් එකෙන් බැහැල අංජලීයි මායි ගේ ඇතුළට ගියා. ගෙදර ඇතුලෙ දක්කහම මට පුදුමත් හිතුණා. පුංචි මඟුල් ගෙයක් වගේ සරසල තිබුණා. අවුරුදු දෙකක විතර ලස්සන පොඩි එකෙක් බොහොම අපූරුවට නෑ ගගහ හිටියා. ටිකකින් අංජලී, ඒකිගෙ අක්කටයි, අක්කගෙ මහත්තයාටයි මාව අඳුන්වල දීල මාව පිකප් කරා. මාත් පැය භාගයකින් විතර පොඩි එකාගෙ ෆොටෝස් ගත්තා. තවත් පැය භාගයකින් විතර අංජලීයි මායි ආපහු එන්න පිටත් වුණා. ෆොටෝ ගහද්දි වුනත් මගේ හිත අප්සට් වෙලයි තිබුණෙ. මද්දූ විහිලුවට උනාත් කියපු 'පන්කලි' කතාව මගේ හිතේ දෙපාරක් තුන්පාරක් කැරකැවුනා.

WWW.SINHALAELIBRARY.COM 30

කතාබහක් නැතුවම මහරගමත් පහුවුනා. ඒගාවට පන්නිපිටියටත් ආවා. අපි දෙන්නම ගොලු කසාය බීල වගේ. මං අංජලී දිහා බැලුවා. ඒකි ගල් හිල්ල වගේ. පාර දිහා බලාගෙන එළවනවා. කෝම හරි කොට්ටාව පහුවෙලා ඩිංග දුරයි ගියේ... පාර අයිනටම කරල වාහනේ නවත්තල අංජලී මං දිහා බැලුවා. ඒ දිලිසෙන ඇස්වල තිබුණු දේ මං හොඳටම දැනන් උන්නා. අංජලීම ඒ ගැන කියනකන් මං ඉවසන් හිටියා. ඒත්...?

"ෆොටෝස් ටික කවද් වීතර ගන්න පුළුවන්ද විහඟ අයියා..?"

දෙයියම්පා... මට තද වුනා කියන්නෙ, එකසිය ගාණෙනුත් එහාට රතු කට්ට පැන්නා. මං හිතුවෙම මේකි වෙන දෙයක් ගැන කතා කරාවි කියලනෙ. බලන් ගියාම මේකි මටත් හපන්.

"ඕනෙ නම් දැන් උනත් ගන්න පුලුවන්... මෙන්න කැමරා එක. රීල් එකේ තව ෂොට්ස් තුනක් විතර ඇති. ඒකත් ඔය කාගෙ හරි ගහලා, ෆොටෝ ටික සුද්ධ කරගන්න... පුලුවන් වෙලාවක මට කැමරා එක එවන්න... මං බහිනවා..."

ගෙහෙන් ගෙඩි එන්න වගේ ඒ ටික කියපු මං කැබ් එකේ දොර ඇරියා. කේන්තිය වැඩි කමට මාව වෙව්ලන්න ගත්තා.

"මං ඔයාව එක්කන් ආවා වගේම මං ඔයාව ගෙහිහින් බස්සන්නම්... මොකද මං ආන්ටිට කියල ආවෙ ඔයා ගෙදරට ගෙනත් දානවා කියලා. බැරි වෙලාවත් ඊයෙ වගේ ඔයා කිව්ව විදියට කුණු වලියක් සෙට් වුනොත් ආන්ටි මටත් බනීවි.... අනේ ඒක හන්ද හොඳ බබා වගේ දොර වහන්න.... මං ඔයාව ගෙදරට දාන්නම්කො..."

හීන් නූලෙන් අංජලී මාව කපද්දි මගේ ආත්මිය දුකෙන් මිරිකුනා. කරගන්න දෙයක් නැති කමට මං කැබ් එකේ දොර වහගත්තා. ඇත්තටම මට තිබුණෙ එතනින් එන්න. ඒත් මගේ මුරණ්ඩු හිත ඒකටත් ඉඩ දුන්නෙ නෑ. අන්තිමේදි මං සීට් එක පිටිපස්සට දිග ඇරගෙන ඒකෙ හාන්සි වුනා. දහස් ගණන් සිතුවිලි එකට හැපිලා මගේ ඔලුව එකම විකාරයක් වෙලයි තිබුණෙ. අංජලී අද මට කරපු දේ ගැන මගේ හිතේ හුගක්ම තදට වැදුනා. ඇත්තටම ඒකි මට කිසිම චාන්ස් එකක් දුන්නෙ නෑ. කමක් නෑ. ඉවසපං... විහඟ මල්ලී... අද අංජලීගෙ දවස... ඒත් හෙට උඹේ දවස වේවි. ඒක අතාරින්න එපා. මගේ හිත එහෙම කෑ ගහල කියනව මට ඇහුනා.

# 25

ඇංජලීගෙ සුවඳ දවස් ගාණක් යනකන් මගේ හිතේ හැංගිලා තිබුණා. මුලින් මුලින් මට, මගේ හිතට පුළුවන් තරමේ ළංවෙන්න ට්‍රයි කරපු සරංගනාවී, මාව මිස් කරපු විදිය අදහගන්න බැරුවයි මට තිබුණෙ.



ඇත්තටම දවස් ගානක් යනකන් මං හොල්මන් වෙලයි හිටියෙ. ඒදා සිදුවෙච්චි දේවල් අග ඉඳල මුලටත්, මුල ඉඳල අගටත් මං කල්පනා කරන්ට ඕනෙ උනේ සල්ලි අතින්. මට වඩා එයා ඉහළින් ඉන්නව කියනෙකවත්ද කියල අන්තිමට මට හිතුණා.

"හප්පේ.. ඉතිං... ඉතිං...?"

බර්ත් ඩේ එකේ ෆොටෝස් ගහන්න ගිහින් එද්දි වෙච්ච දේවල් රාජ්ට මං කිව්වා. ඌ මාර ඉන්ස්ටරස්ට්... හරියට ඡන්ද ප්‍රතිඵල අහන අපේක්ෂකයෙක් වගේ.

"ඉතිං කියන්නෙ බං... ඒකි මාව ගණන් ගත්තේ නෑ. එච්චරයි..."

"එහෙනම් උඹත් ඒකිව ගණන් ගන්නැතුව ඉඳපං..."

ශ්‍රී රාජ් ගත් කටටම කියල දැම්මා. එහෙම පුළුවන්ද ? කියන ප්‍රශ්නෙ ඉස්සරහ මං දෙතුන් පාරක් කරකැවුණා.

"මොකෝ ඇඹරෙන්නෙ...? උඹ නම් පුතේ ලෝක ලෙඩක් දාගන්න වගේ ට්‍රයි එක දෙන්නෙ....?"

මූත් එක්ක තදවෙන්න මෙන්න මේ වගේ වෙලාවට. මං මෙහෙ ඔලුව අප්සට් කරන්. මූ බිහුබූතයා වගේ කියෝනවා.

"උඹට තේරෙන් නෑ රාජ්...?"

මං එහෙම කිව්වහම උගේ අර පොල් ගෙඩි සයිස් ඇස් දෙක කරකවල මං දිහා බැලුවා.

"ඔව්, ඉතිං උඹටනෙ ඔක්කොම තේරෙන්නෙ... ඒකනෙ මේ පුක කඩපු කඩිය වගේ දඟලන්නෙ ?"

මූත් එක්ක ලව් ගැන කතා කරනවට මං මටම ගහගන්න ඕන... නැතුව වෙන කරන්න දෙයක් නෑ.

"මේ... විහඟ.. මං උඹට එකක් කියන්නම් මචං... මං උඹේ හිත ගැන දන්නවා. අංජලී ගැන උඹට සිරාවටම වැදිල තියෙන්නෙ. ඒකෙ ආපෙ දෙකක් නෑ. ඒකිත් ඔය ගණන් හිලව් දම්මට උඹ ගැන හිතේ තියෙනවා බං... ඉතිං අපි ඒකිගෙන් ඩිරෙක්ට් අහමුකො..."

ඌ කියපු කතාව හන්ඩ්‍රඩ් ප්‍රසන්ට් ඇත්ත වුනාට, මොකා මඟුලටද මංදා මට තද වුණා.

"ඕනෙ නෑ...!!! ඕනෙ නෑ..."

මගේ කටේ සද්දෙට ද මංදා ඌ ගැස්සුනා.

"ඇයි ?"

"හැයි කියන්නෙ, මං මොකටද ඒකිගෙන් අහන්නෙ... මට බෑ ඒකිට සොකන්ඩ් වෙන්න..."

www.sinhalaelibrary.com

"හා... හා.... දැන් මෙ උඹ බලන් ඉන්නෙ, ජැකී ඇවිත් උඹෙන් අහනකන්... උඹල දෙන්නම තකට් තක බං..."

ඊට පස්සෙ හුඟ වෙලා යනකන් රාජුයි මායි අතරෙ කතාවක් බහක් උනේ නෑ. මං ඌ දිහා බැලුවා. ඌ කල්පනා කරනවා සිරාවටම..."

"ංහ්ම්... ඕක දැන් අතෑරමුකො.. උඹට ඕනි ජැකිට එකට එක කරන්නනෙ...? ඇත්ත කියපං..."

"ඔව්..."

මං තනි වචනෙන් උත්තරේ දුන්නා. එතකොටත් මගේ හිතේ ඒ පුංචි සුරංගනාවිගෙ රූපෙ ඇඳිලා හිනාවෙවී තිබුණා. තල දතත් පේන්න හිනාවෙනකොට තියෙන අපූරුව මට මැවීල වගේ පෙනුණා. ජැක්... ජැක් ඔයාගෙ ලස්සන වගේම ඔයා මට නපුරු වුනා. අංජලී...

ආයෙමත් වැඩි කතා බහක් නැතුවම මායි රාජුයි නුගේගොඩ නෙලු එක ගාවටම ආවා. පහුවෙච්ච සතියක ගත්තු වෙඩින් ෆොටෝස් වගයක් ලැමිනේට් කරන්න නෙලු එකට මං දීලයි තිබුණෙ. ඒ ටික ගන්න කියල හිතන් මායි රාජුයි නෙලු එක ඇතුලට ගියා.

ගිනිගහන අව්වෙ පයින්ම ඇවිත් මට පාං කියාගන්නත් බැරි සයිස් එකේ මං හිටියෙ. ඒත් නෙලු එක ඇතුලෙ ඒ.සී. පාරට මාව කොරවෙලා ගියා. රිසෙප්ෂන් එකේ ඉන්න කෙට්ටු කෙල්ලව මං රාජ්ට ඇහෙන් පෙන්නුවා. ඒකි හීනියි රතුයි කුලෑටියි. ඒක හන්ද ඊට එහා ඉඳපු සුදු ෆෝවඩ් කෑල්ලට මං රිසිට් එක දුන්නා. ඒ දීලා වටපිට බලනකොට තමයි හිටගෙන පිස්සු හැදෙන සීන් එක දැක්කෙ. දහයයි දහයෙ මගෙ තඩි ෆොටෝ එකක් කවුන්ටරේට හේත්තු කරලා. 'යෙමිකා' කැමරාවත් අතේ තියන්, ලාවට හිනාවක් දාගෙන ඉන්න මාව දැකලා මටම හොල්මන්.

"මේක කොහොමද බං මෙතෙන්ට ආවෙ...?"

හිතේ තිබ්බ තදියටම මං රාජ්ගෙන් ඇහුවා.

"මමද යකෝ මේක ගැහුවේ... උඹ මගෙන් අහන්නෙ...?"

ඌ මළ පෙරේතය වගේ හැරෙන කැපෑලෙන් ආන්සර් එක දුන්නා. මං ඇස් බෝල දෙකම කරකවල ෆොටෝ එක දිහා බැලුවා. ංමිනු..., මෙලෝ මතකයක් නෑ. කම්පියුටරේට වැටෙන්නෙම නෑ.

"චූට්ටක් ඉඳහං..."

මට මොනාවත් කියන්න නොදීම රාජ් අර හීනි, රතු, කුලෑටි කෑල්ල ගාවට කිට්ටු කරා.

"...මිස්.. මේ... මොඩලර් ගෙ ෆොටෝ එකක් අපිට ගන්න බැරිද ?"

මූ යකෝ හිටගෙන කැවත් මදිනෙ. ඒක අරකිගෙන් අහපු කැත. මට ආපු ප්‍රශ්නෙ මේක මෙතෙන්ට ආවෙ කොහොමද කියලා.

"ම්.... කාගෙද ?"



ඒකි කුලෑටි කම පැත්තකින් තියල, ඇගේ බෝල කරකවල රාජ්ගෙන් ඇහුවා. කවුන්ටරේ උඩ තිබ්බ විහඟ වික්‍රමසිංහගෙ ෆොටෝ එක එතකොටයි ඒකි දැක්කෙ.

"මං හිතන්නෑ එයා මොඩලර් කෙනෙක් කියලා... අා..!"

ඔන්න ඒපාර ඒකි මං දිහා හොඳට බැලුවා. ඒ කියන්නෙ අත දිග ඇරල සිරාවටම බැලුවා. ඒකිට හිනා.

"මේක ඔයාල ප්‍රින්ට් කරන්න දුන්නු එකක්ද ?"

"නෑනෙ මිස්... ඒකයි මේ අපිත් හොල්මං වෙලා ඉන්නෙ..." රාජ් ගත් කටටම කියල දැම්මා.

"ංම්... පොඩ්ඩක් ඉන්නකො බලන්න. මේක ප්‍රින්ට් කරන්න දීපු කෙනාගෙ නම ඇතිනෙ..."

එහෙම කියල ඒකි කම්පියුටරේ ගාව වාඩිවුණා. දැන් මගේ පපුව ඩක්කුව වගේ ඩක ඩක. මගේ ෆොටෝ ගැන මටවත් නැති අමාරුවක් තියෙන එකා කවුද කියල බලාගන්න මට පුදුම ඊනෙ කමක් තිබුණෙ.

26

ඈර් සුදු කුලෑටි කෑල්ල 'කී බෝඩ්' එකේ බටන් ප්‍රෙස් කරන පාරක් ගානෙ මගෙ 'බට්ටා' ගැහුණා. ඇයි යකෝ, මොන මල පෙරේතයා දුන්නද දන්නෑනෙ.

"මිස් ආර්. එස්. මොහොමඩ්..."

මට හීනෙන් වගේ නම ඇහුණේ. කවුද බොලේ මේ..? මගේ මීටරේට වැටුනෙම නෑ. මං රාජ් දිහා බැලුවා. ඌ පටස් ගාල බිම බලා ගත්තා. ඔය අතරෙ තමයි අනිත් සුදු ෆෝවඩ් කෑල්ල මගේ ෆොටෝස් ටික දුන්නෙ. ෆොටෝ ටිකත් අරන් රාජුයි මමයි 'නෙලු' එකෙන් එළියට බැස්සා හිතේ ප්‍රශ්ණ හැටහුටාමාරයි.

"විහඟ...?"

ඩෙනිමෙ ෆෝල්ට එක හරිය නැමිල පිහිදාන ගමන් මං වලුව ඉස්සුවා. රාජ්ගෙ මූණ වෙනස් වෙලා.

"... උඹ හිතන්නෙ මොකවද කියල මං දන්නවා. වෙන කවුරුවත් නෙමෙ මචං... ෆොටෝ එක ප්‍රින්ට් කරන්න දීල තියෙන්නෙ ෂහනාස්..."

උගේ කතාවෙන්, මොකක්දෝ නොතේරෙන ගැස්මක් හිත ඇතුලෙ කරකැවුනා. නුගේගොඩ ගිනිගහන අව්වත් මට ගානක් වුණේ නෑ. ඒ තරමට හිත කලබල වෙලා තිබුණා.

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 32

"උඹ අප්සෙට කරවන්න අකමැති හන්ද මං මුකුත් කිව්වෙ නැ. සහතාස්ල දත් බේරුවල නෑ... කව්ටියම නුගේගොඩ ඇවිත්... ජීන් මං හිතුවෙ නෑ... සහතාස් මෙච්චර හරියක් කරාවි කියලා... ඇත්තටම මචං මං හිතුවෙ අංජලී. ප්‍රින්ට් කරන්න දීලමයි කියලා..

"උඹට කිව්වෙ නැති වුනාට මටත් මුලදී හිතුනෙම එහෙම තමයි. සහතාස්ගෙ සින් එක නොකිව්ව එක ගැන නම් මට රාජ් එක්ක මල පැන්නා.

"සහතාස් මෙහේ ඉන්නව කියල උඹ දන්ද කියන්නෙ... ඔයිට වැඩිය හොඳ නැද්ද මීක නොකියම හිටියනම්...."

මගේ කුනාවට උගේ මූණ ඇද වුණා. ඌ මුකුත් නොකියා කල්පනාවට වැටුණා. බේරිවෙලා තියෙන උගේ මූණ දැක්කහම මට පව් කියලත් හිතුණා. මොනා වුනත් බොක්කෙ යාලුවනේ.

"ඇත්තට, සහතාස්ට පිස්සුද බං...?"

මං රාජ්ගෙන් එහෙම ඇහුවත් මගේ හිතේ පොඩි ෆිට් එකක් තිබුණා. මොන කොල්ලද අකමැති, සිරා කෙල්ලෙක් ගාව තමන්ගෙ ෆොටෝ එක තියෙනව නම්...?

කොහොමින් කොහොම හරි නුගේගොඩ ෆොටෝ කලෙක්ෂන් එක ගාවට විතර අපි පයින් ඇවිත් තිබුණා. ඒ එක්කම තමයි අපි දෙන්නාවම පසු කරන් ඉස්සරහට ගියපු රතු පාට කැබ් එකක් ආයෙමත් හෙමි හෙමිහිට ආපස්සට ආවෙ. ඒක අංජලීගෙ කැබ් එක වින්තිය අඳුනාගන්න මට දෙපාරක් බලන්න ඕන වුණේ නෑ. මේකි මං යන තැන ෆලෝ කරනවද මංදා...

"කවුද බං...?"

කැබ් එක දිහා බලන ගමන් රාජ් මගෙන් ඇහුවා.

"බලාගනිංකෝ.."

මූණ දිගේ බේරෙන දාඩිය අතින් පිහිදාන ගමන් මං කැබ් එකෙන් බහින අංජලී දිහා බැලුවා. නිල් පාට ජීන්ස් එකට මැච්වෙන සිරා ටී ෂර්ට් එකක් ඇඳලා, පෝනි ටේල් එකක් වගේ. කොණ්ඩෙත් අමුතු විදියට හදාගෙන, මං ඉස්සරහට ආපු අංජලීගෙ, අමුතුම ලස්සනක් මං දැක්කා.

"විහඟ, අයියා, මං ඔයාලව දැකල නැවැත්තුවෙ. යං, මං ඩ්‍රොප් කරන්නම්..."

"නෑමේ මූද් නැත්ත් නංගි..."

මූ මරන් කැවත් මදිනෙ. රාජ් ඒ ඩිංගට කැබ් එක ඇතුළට නැගලා. ඌ වාඩිත් වෙලා. මං තාම පාරෙ. ඒත් කැබ් එකට නගින්න, මගෙ හිත ඉඩ දුන්නෙ නෑ.

"අව්වත් සැර වැඩිනෙ අයියා.... එන්න යං..."



අංජලීගෙ කතාබහ සෙහෙම පුදුම තරම් සන්සුන් වෙලා තිබුණා. කොහොමත් ඒකි මං ඉස්සරහ කූල් කැරැක්ටර් එකක්නෙ. අව්වට තද රෝස පාට වෙලා තිබ්බ. ඒ ආදරේ හිතෙන පුංචි මූණ දිහා ඩිංග වෙලාවක් මං බලන් හිටියා.

"ඕනෙ නෑ උංගි... මට කොහොමත් නැවල ගිහිල්ල පුරුදුත් නෑ. ඔයා යන්න..."

මගේ වචන සෙට් එකට ඒකි ගල් වෙලා වගේ මං දිහා බැලුවා. ඊළියෙ අමුතුම ගේමක් යනව කියල තේරුණ හන්දද කොහෙද රාජුත් කැබ් එකේ දොර ඇරන් බැස්සා.

"ඇ.... ඇයි... විහඟ අයියා... ඔ... ඕහොම කතා කරන්නෙ?"

ලස්සන ඇස් දෙකේ කඳුළු පුරෝල එනයි. මේකි අඬන්නද දන්නෑ හදන්නෙ... පාර මැද්දෙ මල ජංජාලෙ තමයි... කමක් නෑ. අඬල අඬල හෙම්බිරිස්සාව හදාගත්තත් කමක් නෑ. කියන්න තියෙන දේ කියනවා. මොකෝ මගෙ කට කන්නයැ.

"වෙන කොහොම කතා කරන්නද උංගී... එදා මං ෆොටෝ ගහන්න ඔයාලගෙ අක්කලගෙ ගෙදර ආවෙ ඇයි කියල දන්නවද? නෑනේ... එක දවසක් හරි මගේ දුක සැප බලලා, මගෙත්තෙක්ක වචනයක් හරි කතා කරල ගියපු හන්ද... නැතුව, ඔයාගෙ සල්ලිවලටවත්, ඔයාගෙ ලස්සනටවත්, ඔයාට බයකටවත් නෙමෙයි උංගි..."

මූහුද ගොඩ ගලන්න වගේ මං හෝ හෝ ගාල කියවන් ගියා. අංජලීගෙ රෝස කම්මුල් දිගේ බේරෙන කඳුළු කැට, මගේ හිත උඩින් බේරුණා කියලයි මට දැනුණෙ. ඒ පුංචි මූණ අත් දෙකින්ම අල්ලගෙන, ආයි ඔයාව අඬවන්නෑ උංගි කියල කියන්න තරම් මට හිතුණා.

"...විහඟ... වට්ස් රෝන් මචං...? මෙතන මහ පාර.. උඹල රංඩු අල්ලන්න තෝරන් තියෙන්නෙ මාර තැනක්නෙ... බලපං... අංජලී අඬනවා.... අර මිනිස්සුත් බල බල යනවා..."

බලන් ඉන්න බැරි තැනමද කොහෙද රාජ් අපේ මැද්දට කඩන් පැන්නා. යකෝ... අපතය වගේ ඉන්න, මූට ආපු ෆිට් එකේ හැටි... මූ කියන විදියට මං වැරදි වගේනේ... ඕකට ඕකේ... ළඟ පාතක 'ට්‍රිපෙක්ස්' බෝතලයක් වත් තිබුන නම් මූව මෙතනම මකවන්න තිබුණා.

WWW.SINHALAELIBRARY.COM 33

## 27

"බ... බලන්නකො රාජ් අයියා... මෙයා හැමදාම... ම.. මගේ හිත රිද්දනවා... ඉන්.. ඉන්... න්... මහම නපුරා.."

කඳුලුත් එක්කම අංජලී කියවන් ගියා.

"න... නපුරා කවුද දන් නෑ... එදා මාව ගනන් ගත්තෙවත් නෑ. දෙපේ කොලේට දාලයි පංඩිත විදියට කතා කරේ...."

මාත් ඇතැරියේ නෑ.

"මේ... මේ... දන් ඕව වැඩක් නෑ. අකැරල දාපං... අංජලී උඹට කතා කරනවනෙ... වරෙන් යමු..."

ආයෙත් රාජ් මැද්දට පැන්නා. මං අංජලී දිහා බැලුවා. ඒකි වූටි ලේන්සුවෙන් කඳුළු පිහිදානවා.

"එහෙම කියන්න උඹ හයි කෝට් ජජ්ද...? මං ආවෙත් බස්සේකේ, දන් යන්නෙත් බස් එකේ... උඹට මගෙත්තෙක්ක එන්න බැරිනම් ඕන මඟුලක් කර ගනිං..."

ඒ එක්කම ආපු 122 බස්සෙකකට අතදාල මං එල්ලුනා. බස්සෙකේ පස්ස විදුරුවෙන් එළිය බැලුවහම, පුදුම වෙලා වගේ බලන් ඉන්න රාජ්වයි, අංජලීවයි මං දැක්කා. අංජලියි උඹයි ඕන ඉලව්වක් කරගනිං. හිතේ තේත්තිය වැඩිකමට මං හිතුවා. දක්කනෙ තිබ්බ ආඩම්බරකම. මං ගැන හොඳට හිතනවා. ඒත් කැමතියි කියල කියන් නෑ.

බස් එක ටිකෙන් ටික නුගේගොඩින් ඇත් වෙද්දි හිත ඩිංගෙන් ඩිංග නිමෙන්න ගත්තා. එතකොට ආපහු බැහැල අංජලිව හොයාගෙන යන්නත් මට හිතුනා. මොනා නැතත් කැබ් එක නවත්තල ගෙදරට හරි ඩ්‍රොප් කරන්න හැදුවනෙ. මගේ මැට්කමට ඉතිං මැරෙන්නයැ.

බස්සෙකට නැංගට යන්න ඕන කොහේද කියල අරමුණක් මට තිබුණෙ නෑ. ගෙදර ගියා කියල කරන්න දේකුත් තිබුණේ නෑ ඒක හන්දම මං මද්දුගෙ බැන්ක් එක ගාවින් හෝමාගමදි බැහැ ගත්තා.

"පාටිනර්... මොකෝ හදිස්සියෙන්ම...?"

මාව දකපු ගමන් මද්දූ ඇහුවා.

"එකවුන්ට් එකක් ඕපන් කරන්න..."

ඌව තද කරවන්න හිතාගෙන මං කිව්වා.

"ඇත්ත කියපං පොඩී... අද ගමකට වැඩ..."

"පොඩි අවුලක් මද්දූ...?"

WWW.SINHALAELIBRARY.COM 34



"අ...ං...ජ...ලී...?!!?"

මද්දූ ජේන කියන්න වගේ ඇහුවා. මං ඔලුව වැනුවා.

"මේ වෙලාවෙ කස්ටමර්ස්ලා වැඩියි. විසිටින් රූම් එකට යමං"

මද්දූ මාවත් ඇදන් විසිටින් රූම් එකට ගියා.

"ඉතිං...?"

එදා ෆොටෝ ගහන්න ගිහින් කිව පුක එකයි, අද වෙච්ච සීන් එකයි දෙකම මං මද්දූට ඉස්පිලි පාපිලි අඩු නැතුව කියල දැම්මා.

"අමු මැට්ටෙක්නෙ යකෝ...?"

ස්ටෝරිය අහන් ඉඳපු මද්දූට කියවුනා.

"ඇයි...?"

"හැයි කියන්නෙ.. අතට ආපු චාන්ස් එක මිස් කරල... දන් නැයි, හූයි ගානවා. ඒකි උඹට සිරාවටම ලව්. පොඩි... උඹ ඩිරෙක්ට් ඒකිගෙන් අහපං... උඹට අහන්න බැරිනම් මං අහන්නම්..."

"ඕන් නෑ..."

"ඇත්තට පොඩි... උඹට මොනවද වෙලා තියෙන්නෙ... උඹට ඒකිත් ඕන. උඹේ රැස්පට් එක තියාගන්නත් ඕන. දන් බලපං... වෙන කෙල්ලෙක් නම් ඔය විදියට පස්සෙන් වැටිගෙන එයිද ? මොන අමාරුවටද...?"

"ඔයාට තේරෙන් නෑ මද්දූ..."

"තේරෙන එකා ඔය කොරං ඇවිත් තියෙන්නෙ.. සබ්බ සකලෙම අනාගෙන... අනිත්තෙක මෙව මෙහෙම කතා කරන්න බෑ. උඹ දන් ගෙදර පලයං... මං හවස ආවහම සිරාවටම කතා කරමු..."

"එතකං ඉවසන්න බෑ ඔයි..."

හිතේ අප්සට් එක වැඩි කමටම මං කෑ ගැහුවා.

"නෑ... නෑ... උඹ ඉවසන්න ඕන... දන් හොඳ එකා වගේ ගෙදර ගිහින් නිදා ගනිං.. ඔය අසනීපෙට බෙහෙත් නෑ බං... තාම හොයාගෙනත් නෑ... ඕක නිකං පිස්සු බලු රෝගෙ වාගෙ..."

ඌත් පුදුම ටෝක දෙන්නෙ... ඒව් ඉතිං ඌට කියන්න බැරියැ. මගේ හිතේනෙ අමාරුව තියෙන්නෙ. මද්දූවට හිතෙන් බැන බැන මං බැන්ක් එකෙන් එළියට ආවා. දන් ඉතිං ආයෙත් බස්සෙකක නැගලා, කට්ට කාගෙන ගෙදර පලයංකෝ... අනේ ඇත්තට මටත් මොලේ කියල අමුඩයක් තරමවත් නෑ. ආපු ගැම්මට කහ ගොනා වගේ, ගෙදරම ඇද්දනම් හරි. මුගේ මලදානෙ අහන්න මෙතෙන්ට ආවෙ... මද්දුව කියන්න ඕනෙද මට ගෙදර යන්න. මට ඌත්තෙක්ක තද වුණා. ස්ටෑන්ඩ් එක හරියට යනකොට මට වතුර තිබහක් ආවා. ක්‍රීම් සෝඩා එකක් ඇදල දාන්න ඕන

කියල හිතාගෙන මං හන්දියෙන් කහකුඩුව පාර පැත්තට හැරුණා.

"මල්ලී... පොඩ්ඩක් නැවතුනා නම්...?"

හද්ද ගොරෝසු කටහඬක් මගේ පිටිපස්සෙන් ඇහුණා. ගෝරිල්ලෙක් වත්ද කියල හිතාගෙන මං පස්ස බැලුවා. ජීවිතේට දැකල නැති දවර් සයිස් පොරවල් දෙකක් මං දිහා කන්න වගේ බලාගෙන... මං හිතල වෙලා ගියා. මොකක්ද යකෝ මේ පරාල ඇමෙණ් ?

"උඹට එක දවසකුත් කිව්වා කියල අපි දන්නවා. එදා එඩ් වැඩකාරයා උනාලුනේ... දොස්තර මහත්තයගෙ නෝනා එක්ක උඹ කාමු හිටිලු නේද ? ලව් එක නවත්තනව කියනකං උඹට අද තෙලනවා..."

එතෙන් ඇවිත් මගේ කොලර් එකෙන් ඇදල ගත්තා. හප්පේ... මද්දුවගෙ ඇඟි තේස්වලට මට නැව් ගානට කන්න වෙයි වගේ. මුන් දෙන්නා මාව මරාගෙන බෙදාගෙන කාල යන්නයි හදන්නෙ... විහඟ විකුමසිංහට අනිවාර්යෙන සංඛාරා... මං මටම කියා ගත්තා.

## 28

මගේ වෙලාව නම් අන්තිම නරක් වෙලාද කොහෙද. නැත්තං ඉතිං මේ වගේ මරාලයක් කඩන් පාත්වෙව්වියැ. මිනිස්සුත් බල බලා යනවා. අර හපේ හහරේ සයිස් එකේ පොර මගේ කොලර් එකෙන් තාම අල්ලගෙන ලැජ්ජාව කියන්නෙ, නිකං රිකන්ඩිෂන් වෙලා වගේ.

"අ.. අයියෙ... මො... මොකක්ද ප්‍රශ්නෙ... කියන්නකො... ම.. මට මේ මුකුත් තේරෙන්නෙ නෑ..."

හෙනම හෙන බබා පාට එකක් දාල මං උං දෙන්නව ජේප් කරගන්න බැලුවා.. නැත්තං මූ දෙන්නගෙන් කෑවොත් හෙම මූකලානට කොටි ගැහුවා වගේ වෙයි.

"අඩෝ... මේ... උඹ අපිට බබාහුකුං දාන්නයි හදන්නෙ... එව්වා හදේ... අරිද...?"

ගෝරිල්ලො ගොරවනකොට එන සද්දෙ වගේ කමයි ඌ කතා කරනකොටත් පන බයේ බෑ... අද නම් මූංට වැදල හරි ගුටි නොකා ඉන්නෙ නෑ."

"කො... කොලර් එක අ... අතාරින්නකො අයියෙ... ම... මං තාම ඉස්කෝලෙත් යනවා... අයියල මොනව කියනවද කියල ම... මට තේරෙන්නෙ නෑ..."

හිතේ තිබ්බ බය පැත්තකින් තියල මං කියවන් ගියා. මගේ ... එක අඳගන්න බැරුව වගේ ඌ. අනික් එකාගෙ මූණ දිහා බැලුවා.



වෙලාව කියන්නෙ මගෙ කොලර් එකෙන් අල්ලන් ඉඳපු උගේ අතත් බුරුල් වුණා. මට නත්තල් වගේ.

"අ... අයියෙ, විනාඩියක් ඉන්නකො... පොල වැඩේ අනාගෙනනෙ..."

කියල උංට දෙපාරක් නෙමෙයි, එකපාරක්වත් හිතන්න දෙන් නැතුව මං වටුම පැත්තට පණ එපා කියල දිව්වා. අතරින් පතර අරුන් දෙන්න කුණු හබ්බෙන් බණින සද්දෙ ටිකට මට ඇහුණා. උංගෙ ඇඟවල් එක්ක මාව අල්ලන්න දුවන් එන්න බැරි විත්තිය මට තේරුණා. ඒ වෙනකොට මං කකුල් දෙකට පිං දීදී හුඟක් දුර දුවලා. මෙහෙම දුවන් නැතුව කොහාට හරි වෙලා හැංගුනොත් කියන රෝයල් අයිඩියාව මට ආවෙ ඒ වෙලාවෙ. ළඟම තිබ්බෙ සැලූන් එකක්. ඒක මඟුලක් කියල මං පිංගුවා සැලූන් එකට. ඒක ඇතුලෙ ඊට වැඩිය මරාලයක්.

"ආ ! මල්ලි... කොන්ඩෙ කපන්නද... රැවුල කපන්නද... දෙකම කපන්නද...?"

බාබර් කාරයා කතුර කරකව කරකව මං ඉස්සරහට ආවා. පුල් ෂේව් කරල තියෙන මූණෙ මොනා කපන්නද ඕයි කියල අහන්න හදලත් මං කට වහ ගත්තා. අරුන් දෙන්නා තාම පස්සෙන්ද දන්නෑනෙ.

"කො... කොණ්ඩෙ කපමු අයියා...!"

"නිකං තියෙන කොණ්ඩෙනෙ. වෙලාව යන්නත් එක්ක කැපුවට අවුලකුත් නැනෙ. එහෙම හිත හිතා මං පුටුවෙ වාඩි වුණා. බාබරයටත් අද දවසට ආපු එකම කොණ්ඩෙ මං වගේ. ඌ පැයක් විතර එහෙත් මෙහෙත් කැරකි කැරකි කොණ්ඩෙ කැපුවා.

කොන්ඩෙ කපල ඉවරවුනාට පස්සෙ හොඳට වටපිට බලලා තමා මං සැලූන් එකෙන් එළියට බැස්සා. මගේ වෙලාව නම් අන්තිම නරකයි. මෙන්න අරුන් දෙන්නා මගේ ඉස්සරහට එනවා. ආයෙමත් මම ඔරේ රන්... වටපිට බැලුවෙ නෑ. පණ එපා කියල දුවල මගේ ඉස්සරහට ආපු බස්සෙකක එල්ලුනා.

"මැරෙන්න හදනවද ඕයි...?"

ඒ පාර කොන්ද මාව කන්න ට්‍රයි එක.

"මරන්න එනකොට වෙන මොනව කරන්නද ඕයි.."

මගේ සද්දෙට කොන්ද කට වහ ගත්තා. මං පස්ස දොරෙන් දෙකට පාතට නැමිලා අරුන් දෙන්නා එනවද කියල බැලුවා. මෙන්න බොලේ උං දෙන්නා මට නෙමෙයි වගේ යනවා. හිතට හිතේ... මං කහ ගොනා වගේ දිව්වට උං මාව අඳුනගන්න නැතුව ඇති. මටත් දැන් තමයි මතක් වුණේ. යකෝ මං කොණ්ඩෙ කැපුවනෙ. දැන් ඉතිං කාපංකො චම්බොටු... අපරාදෙ දිව්වෙ.

WWW.SINHALAELIBRARY.COM 35

"මීගොඩ එකක් දෙන්න..."

මං රුපියල් විස්සක් කොන්දට දික් කරා. ඌ මහ සවුත්තු හිනාවක් මට දැම්මෙ. ඒ පාර මොකද ? මං සිප් එකවත් ඇරගෙනද ? ඒත් නෑනෙ...

"මීගොඩ එකක්...?"

මං ආයෙත් උගෙන් ඇහුවා. ඌට ඒ පාර හිනා. මං හිතන්නෙ ඌට හොඳටම පිස්සු.

"මල්ලී අපි මීගොඩ පාස්කරල ආවෙ. අපි යන්නෙ කොටුවට..."

ඌ හුකු හුකු ගාල හිනාවෙනවා. මට නිකං කරන්ට් වැදුනා වගේ. යකෝ මං නැගල තියෙන්නෙ කොළඹ පැත්තට යන බස්සෙකකනේ. උගේ හිකි හිකිය මැද්දෙන් මං බැහැගත්තා.

හප්පේ අද කාපු වාටර්... මං කල්පනා කරන්න ගත්තා. එහෙන් කොන්ඩෙත් නෑ. තව තුලෙන් නැව් ගානට කනවා. මේව ඔක්කෝටම අර කුණු මද්දුවයි උගේ ඩොක්ටර් කැල්ලයි. මං ආයෙමත් 122 ක නැගල හෝමාගමට ආවා. ඇවිත් මද්දුවව හොයන් ගියා. මාව ආයෙත් දැක්කම ඌ හොල්මං.

"මො... මොකෝ පාට්නර් මේ...?"

"උඹේ වැඩ හින්ද තමයි..."

"කොන්ඩෙ නෝට් එකට ගැවෙ මමද බං...?"

ඌ කතාකරන්නෙ කොන්ඩෙ ගැන. මං ඌව පැත්තකට කතා කරල විස්තරේ සජීවිව දුන්නා.

"මගෙ අම්මේ... උඹ මයින් බේරුණා ඇති..."

"බේරුණා නෙමේ... උඹ දුන් ෂෝට් ලීව් එකක් දාල මාව පරිස්සම් සහිතව ගෙදරට දාපං... මගෙ ජීවිතෙත් අවදානම..."

"මොකක්...? මේ... මේ පිස්සු කෙලින්නැතුව ගෙදර පලයං..."

ඔන්න විහඟ මල්ලී... දැන් තදවුනා.

"උඹේ පරිප්පුත් කනව මදිවට, ගෙදරත් යන්න නේ... ක..රු..ණා..ක..රල මාව ගෙදරට දාපං"

ඩොනාදට මූට මං කියන පරක්කුව විතරයි. අද මූ පස්ස ගහන්නේ මොකාක් හරි කුණු කේස් එකක් තියෙන්න ඕනා... හරි බලමුකෝ... අද මං බැස්සා. මෙන්න යකෝ බැංකුව ඉස්සරහ හොඳට දන්න කියන කෙනෙක්...



# 29

අලෙප් වුටී ඩොක්ටර්...! පූජනී...! මාට දැක්ක ගමන් ඒකිව මාර හිනාවක් ගියා. හරියට නත්තල් සීයා දැක්ක වගේ.

"හායි.. විහඟ..."

මෙකි මිරිස් කාල වගේනෙ හායි හූයි ගාන්නෙ...

"හලෝ කොහොමද ඉතිං... හුඟ දවසකින් දැක්කෙ...."

"ඔයාල ඉතිං අපිව බලන්න එන්නැනෙ..."

මද්දුව හොඳ හැටි ඔයාගෙ බලද්දි මං තවත් මොනා බලන්නද පූජනී. කියල කියන්න හිතුනත් මං සවුන්ඩ් බොක්ස් එක වහගත්තා. මොකද මෙකි මස්සිනා කියල බලන් නැතුව මූණ වහලා දුන්නොත් හෙම කනේ පාරක්.

"ඉතිං මොකෝ මේ හදිස්සියේ..."

"මං මේ භාතියව මීට වෙන්න ආවෙ. ඔයත් බැන්ක් ඇවිත් වගේ..."

එහෙනම් ඒකයි සීන් කෝන් එක. මද්දුව ගෙදර යන්න බෑ කිව්වෙ මෙකි එන හන්ද. මූං දෙන්නා කොහේ හරි මගුලක යන්න වගේ. දෙන්නම ජම්බු. අද දවසෙ අවසාන ජවනිකාව.

"නෑ පූජනී... මාත් මද්දුව මීට වෙන්න ආවෙ. බලන්නකො මූ නෑනෙ..."

ඇඟට දැනෙන් නැති වෙන්න ලෝක පාලුවෙන කෙබරයක් මං අතෑරියා. පූජනීගෙ මූණ අමුතුවෙලා ගියා. ඇයි හිතාගෙන එන්න ඇත්තෙ මද්දුවත් එක්ක පෙම් කෙලින්නනේ.

"ම...මද්දු.. නෑ... ?"

අර දිලිසෙන ඇස් දෙක කරකවල පූජනී මගෙන් ඇහුවා.

"ඒකනෙ... බලන්නකො... ෂෝට් ලීව් දාලා ගෙදර ගිහින්නෙ... මං දැන් ගෙදරට ෆෝන් කරන්නයි හැදුවෙ. ගෙදර ගිහින් ද බලන්න..."

දැන් ඒකිගෙ මූණ කොට් ගහපු ගම්මානෙ වගේ. ලස්සන සුදු මූණ හෙනට අප්සෙට් වෙලා. බලන් ගියාම පව් කියලත් හිතෙනව අප්පා.

"මොකක් හරි හදිස්සියක්ද දන්නෑ නේද විහඟ... ඔමත් හොස්පිටල් ඉඳල ෂෝට් ලීව් එකක් දාල ආවෙ... අමාරු පේෂන්ට්ස්ල වගයකුත් ඉන්නෙද්දි... එහෙනම් මං ආයෙ හොස්පිටල් යනවා. මද්දුට කියන්නම් මට ෆෝන් කරන්න කියලා. මං යනවා... සී යූ විහඟ...!"

සං සං ගාල කාර් එක හරවගෙන ඒකි යන්න ගියා. මට බුදු හිට්. දැන්

WWW.SINHALAELIBRARY.COM 36

ඉතිං මද්දුවෝ. උඹ කාපං ටකරං... මාත් ගෙදර යනවා."

මං ගෙට යද්දි අම්මා සාලෙ සැටියෙ උඩ... මගේ මූණෙ ඉදල කකුල් දෙක ගාවට යනකන් අම්මා බැලුවා. ඒ පාර මොකක්ද අමුල ?

"ඔයා කොහෙද අද ගියේ...?"

මොකක් හමුන් මිස් ෆයර් වෙලා අද නම්. නැත්තං අම්මා ඔහොම දෙතේ පංතියෙ ප්‍රශ්න අහන්නැනෙ.

"කොන්වෙ කපන්නනෙ අම්මා..."

කටට ආවට මාත් කියල දැම්මා. අම්ම දන්නව නම් ගෙම අද මට වෙච්ච දේවල්, මාව ගෙටවත් ගන් නෑ.

"කොන්වෙ කපල තියෙන විත්තිය පේනවා පොඩී... දන් දහ දොළොස් පාරක් විතර ශ්‍රී රාජ් ෆෝන් කරා. උදේ ඒ ළමයත් එක්ක ගිහින්, මොකක් හරි ප්‍රශ්නයක් වත් වුනාද ?"

මූ ඒ ටිකට ෆෝන් කරලා. ශූට්රේකට් මං මළ පැනලා කෙලින්ම ගෙදර එන්නැති කියල ඌ හිතන්න ඇති. සිරාවටම අංජලිත් අප්සට් ගිහින් ඇති.

"මොන ප්‍රශ්නද අම්මා. මං මගේ ෆොටෝස් ටික ඌ ගාව දාලා ආවා..."

කියාගෙන මං කාමරේට පැන ගත්තා. ඇත්තටම 'තෙලූ' එකෙන් ගත්තු ෆොටෝස් ටික රාජ් ගාවනෙ.

"අන්න බත් බෙදල ඇති..."

අම්මගෙ කටහඬ ආයෙත් ඇහුණා. මං ඒ පාර කෙලින්ම ගියේ කෑම කාමරේට මං වට්ටිය ඇරියා. හයියෝ බත් පිඟාන දුන් විදිනවා. බෝංචි තෙල් දාලා, පරිප්පු මැල්ලුමයි, අලයි කරවලයි එකට දාලා බැදලා. හිතේ ෆිට් එකටම කෑම පිඟාන අඹරලා ආයෙත් මං කාමරේට ආවා. නිදිමත කට කපලා එකයි. ඇයි කට්ට අව්වෙ සී පාරක් ඇව්දද ? අරුන් එලවද්දි කොයිතරම් පණ කවන් දිව්වද ? දන් මද්දුව කෙල ගිල ගිල අරකි එනකන් බලන් ඉන්නව ඇති. හම්මේ මගෙ හිතට දනෙන සනීපෙ. ඕකට ඔහොම කරා හොඳ වැඩියි. නැත්තං මං අර යක්කු දෙන්නත් එක්ක දුන්නු ගේම ගැන කියද්දි ඌ අහන් හිටියෙ ඌට නෙමෙයි වගේනෙ. දන් කොහොමවත් මද්දුව වැඩ ඇරිල ආවහම උගේ අඳෝනාව අහන්න වේවි..

මං ඇහැරෙන කොට හවස හයාමාරත් පහුවෙලා. මද්දුව ඇවිත්ද දන් නෑ. මං හොඳට කන්දෙක දිගැරල අහන් හිටියා. ංමීහු මෙලෝ සද්දයක් නෑ. මං හෙමිට ඇඳෙන් නැගිටල මද්දූගෙ කාමරේට එබුනා. මෙන්න යකෝ මූ ඇඳ උඩ... මද්දූ සිරාවටම කල්පනා කරනවා. මාව දක්ක විතරයි උගේ ඇස් ලොකු වුණා.

"උඹ නැගිට්ටනකං මං හිටියෙ. මොකක්ද පොඩී උඹ කරපු පජාති



වැඩේ ? මගේ වැඩ ඔක්කොම අප්සෙට්. උඹ මොහොමද මට සපෝට් කරන්නෙ...?"

මද්දූ කියවගෙන ගියා. පව් අප්පා.

"ගනන් ගන්නෙපා මද්දූ. ඕක අමතක කරල දාපං."

"අමතක කරන්න.. මං බලන් ඉඳල බැරිම තැන හොස්පිටල් එකට ෆෝන් කරාම පූජනී එහේ. එයා මට විස්තරේ කිව්වා. උඹේ ඉණ්ඩුව නම් හොඳයි. ඒක් මතක තියාගනිං. මායි පූජනීයි උඹට දවසක දෙන්නෙ දිරවගන්න බැරි කෝස් එකක්..."

"හරි, හරි ඒක එදාට බලමුකෝ..."

මං ෂේප් උනා. ඒ වුනාට දන් ඉතිං මද්දුවගෙන් පරිස්සම් වෙන්න වෙනවා. මොකද ඌට මට වැඩිය මොළේ... ඌ මොනා කරයිද කියල ඌ විතරයි දන්නෙ... හපොයි දෙයියනේ මාත් දාගන්න ලෙඩ.

## 39

දවස් ගානක්ම ගෙවිල ගියා. හිතට කිසිම ෆිට් එකක් තිබුණෙ නෑ. පහුවෙච්ච දවස්වල. අංජලී ගැනවත්, රාජ් ගැනවත් කිසිම නිවුස් එකක් ආවෙ නෑ මට. රාජ්ට ෆෝන් කරත් ඌ බේරුවල ගිහින් තිබුණා. අංජලීට ෆෝන් කරල සෙකන්ඩ් වෙන්න මගෙ හිතට හිතුනෙ නෑ.

මේ දවස්වල ෆොටෝස් ගන්න කියල ඕඩර් එකක්වත් ආවෙ නෑ. මං හිටියෙ හද්ද කම්මැලිකමේ.

"අඩෝ... ලොක්කා.. මොකෝ නිකං අප්සට් මාජින් එකේ...?"

මං උඩ ගියා. ශ්‍රී රාජ් ළඟට එනකම්ම දක්කෙ නෑ.

"මුකුත් නෑ බං... මං උඹට ෆෝන් කරා. උඹ බේරුවල ගියපු කතාවක් කිව්වා."

"ඒකනෙ බං... බලපංකො ෂහනාස් දාගන්න ලෙඩ හන්ද මාත් අමාරුවෙ..."

ඌ එහෙම කියල මං දිහා බැලුවා. මං මුකුත් කිව්වෙ නෑ.

"උඹට මතකනෙ 'නියාස්ව'. අර වෙඩින් එක දවසෙ උඹත් එක්ක කොක්කක් දාගන්න ආවෙ... මොකද බං උඹට වෙලා තියෙන්නෙ...?"

කතාව කියනෙක මග නවත්තල රාජ් මගෙන් ඇහුවා. ඌට තේරෙන් නැති මගේ මූඩ් එක අප්සට් කියලා.

"මට මුකුත් වෙලා නෑ බං... උඹ කියං ගියපු කතාව කියපං..."

"මේ.. ඒකත් එහෙමද..? ලබන මාසෙ මුල් සතියෙ ෂහනාස්ගෙයි නියාස්ගෙයි එන්ගේජ්මන්ට් එක තියන්න ගෙවල් දෙකේම අය රෙඩි වෙලා.. ෂහනාස් දුන් ඉදලම ශුධ ප්‍රකාශ කරල. හේතුව වෙලා තියෙන්න උඹ.."

රාජ් කෙළින්ම මට ඇඟිල්ල දික් කරා. උගේ කතාවෙන් මගෙ පපුවෙ ගැස්ම දෙස්ය ගානට වැඩිවුණා. මේ මොනවද මේ වෙන්න යන්නෙ..?

"උ... උඹට පිස්සුද බං..."

"ඔව්... ඔව්... මට පිස්සු... උඹ කෙලින් තීරණයක් ගන්නෑ. ඒකයි මට පිස්සු..."

මෙච්චර වෙලා ඇල්මැරිල තිබ්බ මගේ මොළේ ඩිංගෙන් ඩිංග හරියන්න ගත්තා රාජ්ගෙ කතාවෙන්.

"කෙලින් තීරණයක් තියෙන එකෙන් උඹ අදහස් කරන්නෙ මොකක් ගැනද රාජ්...?"

"උඹ පොඩි එකෙක් නෙමෙයි විහඟ.. එදා වුනත් බලපං අංජලීව නුගේගොඩ දාල උඹ ගියා. ප්‍රශ්නෙ වවාගන්න එපා බං."

"නෑ.. නෑ... නෑ... මං අහපු එකට උඹ උත්තරයක් දුන්නෙ නෑ."

මං ආයෙත් මුල් ප්‍රශ්නෙම මතක් කරා.

"උඹ එක්කො අංජලීව ලං කරගනිං. නැත්තං ෂහනාස්ව. ඇයි උඹ උං දෙන්නාවම මග හරින්නෙ...?"

"මං උං දෙන්නටම ආදරේ නැති හන්ද..."

හිත එකඟ වුනේ නැති වුනත්, රාජ්ගෙන් බේරෙන්න මං එහෙම කිව්වා. උගේ ඇස් දෙක නළලටම ගියා.

"ඇයි උඹ ඒක බිම බලං කිව්වෙ...? මගේ මූණ දිහා බලන් උඹට ඒ කියපු ටික ආයි කියන්න බෑ විහඟ.. කාවද උඹ ඔය රවට්ටන්න හදන්නෙ...?"

"මං කවුරුවත් රවට්ටන්න හැදුවෙ නෑ රාජ්... කරන්න ඕන මොකක්ද කියල මට තේරෙන්නෙ නෑ. මද්දුට මේව කියන්න බෑ. උං හිනාවෙන්න ගනියි. අම්මට උනත් මේ හිතෙන දේවල් මට කියාගන්න බෑ බං... වෙලාවකට මට මාවම වදයක් රාජ්..."

"උඹේ හිතේ තියෙන දෙයක් ගෙදර අයට කියන්න බැරිනම්, මට කිව්වහම ගෙවෙනවද බං... ඒක බඩවැල කඩාගෙන ආවෙ නැති වුනත් මට වෙනසක් නෑ විහඟ... මං උඹව ආශ්‍රය කළේ මගේම සහෝදරයෙක් වගේ.."

මාව කොර වෙලා යන වෝකක් රාජ් දීලා පුටුවෙන් නැගිට්ටා. නැගිටලා මේසෙ උඩ තිබ්බ වතුර එක බීගෙන බීගෙන ගියා.



"ඉතිං කියපං..." රාජ් ආයෙත් මාව 'අප්' කරා.

"අංජලීට මං හුඟක් කැමතිය රාජ්... ඒත් ඒක ආදරයකට සමාන වෙන්න තව ටිකක් කල් යයි කියලයි මට හිතෙන්නෙ... ෂහනාස් ගැන නම් ඊට වෙනස්. ඒකිව දක්ක දවසෙම මට ආසා හිතුනා.. ඒත් ෂහනාස් ගැන මට ආදරයක් නම් ඇති වෙන එකක් නෑ..." මං එහෙම කියල රාජ් දිහා බැලුවා. උං සිරාවටම කල්පනා කරනවා.

"අද ෂහනාස් මෙහේ එයි..."

"මෙ.. මෙහේ...?"

මං හොල්මං...! මේ මොකද වෙන්න යන්නෙ...?

"ඒකිට මං දන්න භාෂාවලින් ඔක්කොම කිව්වා විහඟ... මේ මඟුල හරියන එකක් නෙමෙයි කියලා... උඹට වැඩිය ඒකි මුරණ්ඩුයි. කියන මෙලෝ දෙයක් අහන්නෑ. අද උදේම මෙහේ එන්න හැදුවෙ... මං ඒකිව ශේප් කරලා, පස්සෙ එන්න කියලා, ඉස්සෙල්ල මං ආවා.. නැත්තං උඹ අනාථ වෙනවනෙ..."

"ම... මං මොනවද රාජ්... ෂහනාස්ට කියන්නෙ...?"

"උඹ අංජලී එක්ක යාලුයි කියලවත් කියපං..."

"ඉතිං බං මං යාලු නෑනෙ..."

"හනේ, මට තේරෙන් නෑ තොට කොහොම පහදන්නද කියලා.. උඹට ෂහනාස්ව කරදරයක් නම් එහෙම කියපං.. නැත්තං ඒකිට කැමතියි නම් කැමතියි කියපං..."

උංත් මහ මැටි කතා කියන්නෙ... දවස් තුන හතරක් දැකලා කතා කරා. දැන් ආදරෙයි කියන්නද ? අනේ මංදා...

එකකොටමයි ඉස්සරහ දොරට ගහන සද්දෙ ඇහුනෙ. මං හිතුවෙ උදේ දෙහිවලට ගියපු අම්මා ආපහු ආවා කියලා. ඒත් දොර ඇරත් එක් නැතුවම සැරින් සැරේ දොරට ගහන සද්දෙ ඇහුනා. රාජ් මගේ මූණ බලද්දි, මං ඉස්සරහ දොර ළඟට ගිහින් දොර ඇරියා. දොරකඩ හිටියෙ වෙන කවුරුවත් නෙමෙ... ෂහනාස්...! හප්පේ අද නම් මොනා හරි වෙයි වගේ...

## 31

තද නිල්පාට සල්වාර් ඇඳුමක් ඇඳගෙන මං ඉස්සරහ ඉඳපු ෂහනාස්ව දැකල, ඒකිට කියන්න ඕනෙය කියල බාගෙට හිත හිතා ඉඳපු දේවලුත් මට අමතක වුනා.

"එ... එන්න ඇතුළට..."

WWW.SINHALAELIBRARY.COM 38

මගේ කටට ඒ වචන ටික කොහෙන් ආවද මංදා. මං හිතුවෙ මාව මේ වෙලාවෙ ඉදන්ම ගොලුවෙයි කියලා. සුදු පාට ස්කාෆ් එකක් වගේ ලොකු රෙද්දකින් ඒකි අර ලස්සන කොණ්ඩෙ ඔක්කොම කවර් කරගෙන හිටියා. ඒත් මේක ලස්සන බලන වෙලාවක් නෙමේ. අනාගතේ ගැන ප්‍රශ්නයක්. මගේ පිස්සු මොළේට ඒක නොතේරෙන හැටි...

සාලෙට එනකන්ම බිම බලන් ආපු ෂහනාස් මගේ මූණ දිහා කෙළින්ම බැලුවා.

"ඇයි විහඟ අයියා මාව මග හරින්නෙ...?"

ඒකිගෙ කටහඬ ගොරෝසු වෙලා. අඬලද මංදා. මං ඒකි දිහා බැලුවා. ෂහනාසුත් මං දිහා බලන් ඉන්නවා.

"ම... මං.. ඔයාව මග ඇරියෙ නෑ ෂහනාස්. මට... මට තේරෙන්නෙ නෑ ඔයා මොනව කියනවද කියලා..."

මං ප්‍රශ්නෙන් පැන්නා.

"මට රාජ් අයියා ඔක්කොම විස්තරේ කිව්වා. ඔයාල 'නෙලු' එකට ගියපු එක හෙම... මම තමයි ඔයාගෙ ෆොටෝ එක ගත්තෙ. මමයි ප්‍රින්ට් කරන්න දුන්නෙ..."

හිටු කියලා ඒකි කියවගෙන යනවා. මං සද්ද වහන් හිටියා මිසක මෙලෝ දෙයක් කිව්වෙ නෑ. රාජ්ගෙ සද්දයක්වත් නෑ. ඌ සද්ද නැතිව මගේ කාමරේ ඉදන් හැමදේම අහගෙන ඇති.

"ම... මං අද ආවෙ වැරදි ගමනක් කියලත් මට හිතෙනවා. අපේ ගෙදරින් හෙම දන්නව නම් මාව ගෙදරින් එළවාවි. එහෙම තියෙද්දිත් මං ඔයාව හම්බවෙන්න ආවා අයියා..."

එකකට එකක් සම්බන්ධ නැති කතා ටිකක් ෂහනාස් කියෙව්වෙ. කලින් ෆොටෝ එකක කතාවක් කිව්වා. දැන් ආපු ගමන වැරදිලු. මගෙ වගේම ඒකිගෙත් පුවර් එකට වයර් මාරුවෙලා.

"ඇයි ඔයා කතා කරන් නැත්තෙ...?"

එක පාරටම වගේ මට ලංවෙලා මගේ දකුණු අත හයියෙන් මිරික ගත්ත ගමන් ෂහනාස් ඇහුවා. ඒ අතේ තිබ්බ සීතල ගැන හිතුව මිසක ඒකිගෙන් අත අයින් කර ගන්න මං හිතුවෙ නෑ. මට හිතුනෙත් නෑ. මං ආයෙත් ඒ නිල්පාට ඇස් දෙක දිහා බැලුවා. ඇත්තටම ෂහනාස් ගැන මගේ හිතේ ආදරයක් උපදින්න පුලුවන්ද කියලා. ඒත් මගේ හිත උත්තරයක් දුන් නෑ.

"ඔයාට නියාස් ගෙන් කරදරද නංගි...?"

හතර අතේ කල්පනා කරල මගෙ හිතට ආවෙ ඒ ප්‍රශ්නෙ විතරයි. ඒකිගෙ ඇස් දෙක ලොකු වුණා.

"ඇයි ඔයා එහෙම ඇහුවෙ...?"



මං අහපු දේට ඒකිත් ඇහුවෙ ප්‍රශ්නයක්. කාට කියන්නද ඉතිං.

"නෑ... ඔයා අප්සෙට් වගේ ඉන්න හන්දයි මං ඇහුවෙ."

"මට තියෙන අප්සෙට් එක ඔයාවයි විහඟ අයියා."

හෙණ ගහන්න වගේ ඒකි කියල දැම්මා.

"ම... මා...ව...?"

"ඔයා මොනව හිතුවත් කමක් නෑ. කියන්න තියෙන දේ කියල මං යනවා විහඟ අයියා.. කෙල්ලෙක්ගෙ හිතක් මොන වගේද කියලවත් ඔයාට තේරෙනවද මංදා. ඔයා පිංගක්වත් හිතුවෙ නෑ. මං අද මෙහෙ ආවෙ ඇයි කියලවත්. නේද...? මං දන්නෑ. සමහරවිට ඒක ඔයාගෙ ආඩම්බරකම වෙන්නැති... ඔයා ඕන නම් රාජ් අයියගෙන් අහන්න. මගෙ හිතට ලේසියෙන් කවුරුත් ෆිට් වෙන්නෑ. එහෙම ෆිට් වුණ කෙනෙක්ව මං නැති කරගන්නෙත් නෑ."

"එදා බේරුවලදී රාජ් මට කිව්වා, හරි පුදුමයි ඒකි උඹට කැමතියි වගේ පෙනුණා කියලා..."

මං පරණ සිත් එකක් මතක් කරා.

"ඔව්... ඒත් රාජ් අයියට තේරුණ දේ ඔයාට නොතේරුණු එක ගැන නම් මගෙ හිතට දුකයි අයියා. ආයෙ අර රාජ් අයියලගෙ ගෙදර මං ඉන්නකොට ඔයා ආවෙ...? ඇවිදින් ලොක්ක වගේ මට ඇඩ්වයිස් හෙම දීල ගියේ. මගෙ හිතට ඒව හුඟක් වැදිල අයියා..."

ඒකිට දිගටම කතා කරන්න දීල මං සද්දෙ වහ ගත්තා. රාජ් කාමරෙන් එන පාටක් නෑ. මූ මැරිලා වත්ද ?

"මට නියාස්ව බඳින්න බෑ විහඟ අයියා. ප්ලීස් මාව තේරුම් ගන්න. මට මීට වඩා ඔයාට කියන්න බෑ... හ්... ග්..."

ෂහනාස්ගෙ කටහඬ බිඳිලා ගියා. මගේ හිතටත් එකපාරටම මොකක්දෝ වුණා. ඒකිගෙ උරහිස් දෙකෙන් අල්ලල මං ඒකිව මගේ පැත්තට හරව ගත්තා. ඒ නිල් පාට ලස්සන ඇස් දෙක රතුවෙලා. කඳුළු පිරිලා.

"ම... මට මොනව කරන්නද කියන්නෙ ෂහී..."

ජීවිතේ කවදාවත් මං කෙල්ලෙකුට ඒ තරම් ළං වෙලා ඉඳලා තිබුණෙ නෑ. මං අහපු දේට මුකුත්ම කියන් නැතුව ෂහනාස් මට ළංවුනා.

"මාව... මාව බේරගන්න විහඟ අයියා... මාව බේරගන්න."

රතු පාටට හැරිල තිබුණු කම්මුල් දිගේ කඳුළු ගලන්න පටන් ගත්තා. ජීවිතේ හැම දෙයක් ගැනම මට අමතක වෙලා ගියා. ජාති ආගම් බේද හැමෙකක්ම ෂහනාස්ගෙ කඳුළු වලින් සේදුනා. ඒ පුදු මූණ මං තවත් ළං කර ගත්තා. කාන්දමක් ඇදිල එනව වගේ ඒකිත් මගේ දිහාට ඇදිල ආවා.

WWW.SINHALAELIBRARY.COM 39

අපි දෙන්නගෙ දෙතොල් එක්කහු වෙන්න තිබ්බෙ තව අඟල් දෙකක් විතරයි.

එතකොටමයි ඉස්සරහ දොරට ආයෙත් කවුදෝ ගහන සද්දෙ ආවෙ. මායි ෂෂානාසුයි ඈත් වුනේ කරන්ට් වැදුනා වගේ. මේ පාර නම් සුවර් එකටම අම්මා... ෂහනාසුත් ගේ ඇතුලෙ. දොරත් වහගෙන කෙල්ලෙකුත් ගේ ඇතුලෙ දාගෙන... හම්මේ... අද නම් කන්න වෙන්නෙ ඉතිහාසගත කෑමක් තමයි... ෂහනාසුත් බය වෙලා. මගේ පපුවෙ ඉන්ටර්සිටි බස් තුන හතරක් යනවා වගේ... ලෝකෙ ඉන්න හැම දෙයියෙක්ම මතක් කර කර මං දොර ගාවට ගියා.

## 22

පපුව ගැහෙන වේගෙ තවත් වැඩියි. තව ටිකට හිටියොත් අධික රුධිර පීඩනේ තමයි. ඒක හින්ද මං ගට අරන් දොර ඇරියා.

ශ්‍රී රාජ්...!

"තෝ මරන් කැවත් මදිනෙ යකෝ... මං අම්බානකට බය වෙලා හිටියෙ. අම්මා ඇවිත් කියලා... මං හිතුවෙ උඹ මගේ කාමරේ කියලනෙ බං..."

මගෙ පපුව යාංතං නෝමල් වෙන්න ගත්තා.

"කාමරේ...? පයිත්තියංද බං... මං මොකටද උඹලගෙ ප්‍රේම ගීතෙ අහගෙන ඉන්නෙ...? කුස්සියෙ දොරත් ඇරගෙන මං වත්තට වෙලා ඉඳලා බැරිම තැන තමයි තට්ටු කළේ..."

බලක් ගියාම මූත් මාර පොරක් තමයි. මායි රාජුයි සාලෙට යනකොට ෂහනාස් පුටුවෙන් නැගිටලා.

"ෂබී... ප්‍රශ්නෙ බේරගත්තද...?"

රාජ් එකපාරටම ෆෝමට එන්ටර් වුණා.

"උත්තරේ තියෙන්නෙ විහඟ අයියා ගාව..."

මං ඒකි දිහා බැලුවා. අර රතුපාට වෙලා කඳුළු පිරිල තිබ්බ ඇස් දෙක ආයෙත් නිල්පාට වෙලා. නිල්පාට සල්වාර් එකත් ඒකිට සිරාවට මැච් වෙනවා.

"ඇත්තද බං...?"

මගේ උරිස්සට අතක් තියන ගමන් රාජ් ඇහුවා. වැඩිය නොහිතා දෙයක් කියනෙක අවාසියි කියල මට හිතුනා. ඒක හන්ද මුකුත් නොකියම මං හිනාවුණා.

WWW.SINHALAELIBRARY.COM 40



"ෂබී එහෙනම් දැන් ඔයා යන්න. මූංගෙ අම්මා එන වෙලාව."

රාජ්ගෙ කතාවෙන් ඒකි හෑන්ඩ් බෑග් එකත් අතට ගත්තා.

"විහඟ අයියා... ඔයා ආයෙ කවදද මාව බලන්න එන්නෙ?"

යන්න ලෑස්ති වෙලත් ඒකි අහන්නෙ මාර මාර දේවල් තමයි. මං කල්පනා කරන්න ගත්තා.

"බලමුකො ෂබී..."

"ඔන්න ඔයා නාවොත් මං එනවා ආයෙ මෙහෙටම කොහේද... එහෙනම් මං යනවා... බායි..."

ෂහනාස් ළඟ ඉන්නකොට දැනුණෙ නැති වුනත් ඒකි ගියාට පස්සෙ මාර පාළුවක් මගෙ හිතට දැනුනෙ.

"ඈව් බං... හොඳ කෙල්ල..." රාජ් ආයෙත් කිව්වා.

"උඹ හොඳ වෙලාවට ආවෙ බං. තව පොඩ්ඩෙන් මං ඒකිව 'කිස්' කරනවා..."

මගේ කතාවට රාජ් කොරවුනා. උගේ ඇස් දෙක නළලටම ගියා.

"න්... නෑ...හ්.. උඹ මහ පිස්සු කේස් එකක්නෙ බං... උඹ ඒකිව පිස්සු වට්ටන්නද හදන්නෙ...? බලපං ඒකි මොන තරම් සංතෝසෙන්ද ගියේ කියල..."

"අපි දෙන්නම හිතුවෙ නෑ බං... ඒක 'ඔටෝ'ම වෙන්න ගියේ.. ඇස්වල කඳුළු පුරවගෙන ඉන්නකොට මට හැමදේම අමතක වුණා බං..."

"එහෙනම්, දැන් ලව් එක ස්ටාර්ට් ද...?"

"මොන ලව් එකද බං...?"

උගෙ කතාවට මං ආයෙත් හොල්මං වුණා.

"ඇයි යකෝ, දැන් එතකොට පැයක් විතර උඹල දෙන්න පොල් ගෑවද ? ඇඩල්ස් ඔන්ලි සීනුත් යන්න ගිහින්. ඒත් ලව් එකක් නෑ. අනේ මංදා... මේක මාර සීන් එකක් නෙ..."

"ඒක තමයි බං මට හිතාගන්න බැරි... මටත් ඒ වෙලාවෙ මොනව වුනාද මංදා... ඕකෙන් මේකෙන් වෙන්නෙ මගෙ හිතට ඒකිව අමතක කරන්න බැරි වෙන එකයි..."

"දැන් ෂබී හම්බවෙන්න උඹ යනවද...?"

මෙච්චර වෙලා කෙලින් ප්‍රශ්න දම දම ඉඳල ඌ එකපාරටම හරස් ප්‍රශ්නයක් දැම්මා.

"බලමුකො...?"

"මොකක්ද බං කෙලින් උත්තරයක් දීපංකො... දෙකටම නැති වැටෙන ආන්සර් දෙන්නෙ..."

රාජ් අහපු ප්‍රශ්නෙටම දෙන්න තම් ඕනෙ තරම් උත්තර මං ගාව තිබ්බා. ඒත් මං වීගෙන් කල්පනා කරා.

"උඹ මං ගැන මොනව හිතනවද කියල මං දන්නෑ රාජ්... අදටත් මං කැමති අංජලීට... මට ඒකිව හිතෙන් අයින් කරන්න බෑ... මගේ හිත හොයපු හැම ලස්සනක්ම ඒ පුංචි කෙල්ල ගාව තිබුණා..."

මං කියපු එක අදහගන්න බැරුව වගේ රාජ් ඩිංගක් වෙලා බලන් හිටියා.

"යකෝ උඹට හිටෝලා මැට් ගහන්න ඕන... දුන් ඩිංගකට කලින් අරකින් එක්ක පෙම් කෙළල කෙළලා... මෙ විහඟ...! උඹ මටද බබා පාට දාන්න එන්නෙ...?"

මං කියන ඒව මුටත් තේරෙන්නෙ නෑ. ඉතිං වෙන අයොන්ට තේරේවිද ?

"...මං කියන එක අහපං විහඟ... උමේ හිතේ ඔය කක්වෙ උව උඹ සජීව හම්බවෙන්න යන්නෙපා. ඒකිගෙ ජීවිතේ ගැන ඒකිට තනියෙන් තීරණයක් ගන්න දීපං..."

"ඉතිං ඒකිට 'නියාස්ව' බඳින්න බෑ ලුනේ...?"

"නියාස්ව බඳින්න බෑ කියන්නෙ, ඒකිට උඹව ඕන. එහෙමනෙ... මේ ඔක්කොම උනේ අර මඟුල් ගෙදර ගිහිල්ල... තෝව්ත් අඬගහගෙන ඒ මඟුල් අස්සෙ ගිය හන්දනෙ මේ ඔක්කොම. ෂ්...ශ්..."

ඌට ඒ පාර නම් අම්බානකට තද වෙලා. දුන් මූව නිසුවල් කරන්න ගියොත්, මූට තවත් තද වෙනවා කියනෙක මං දන්නවා.

"මට පේන විදියට දුන් කරන්න තියෙන්නෙ එක දෙයයි..."

මගේ මූණ දිහාව බලාගෙන ඌ කිව්වා.

"ඒ මොකක්ද...?"

"මේ ඔක්කොම අතෑරල උඹ අපේ ආගමට වරෙන්..."

"ඇයි...?"

උමේ අප්සෙට් කතාව තේරුම් ගන්න බැරුව මං ඇහුවා.

"ඇයි කියන්නෙ... එතකොට බං උඹට ෂහනාස්වයි, අංජලීවයි දෙන්නවම තියාගන්න පුළුවන්..."

ඌ හිනාවෙනවා. මටත් හිනා ගියා. මූ මාර ඒවනෙ කියන්නෙ.

"ඒව තමයි ලොක්කා... දාපං අත..."

මං ඌට අත දුන්නා. එතකොට තමයි ෆෝන් එක රිං වෙනවා ඇහුනෙ. ඒ පාර කවුද ?



## 33

මං රිසීවර් එක ඉස්සුවා...

"පාට්නර්... ගුඩ් නිව්ස්..."

එහා පැත්තෙන් වර බර ගාල ආව මද්දුවගෙ වොයිස් එක මං අඳුනගත්තා. මට කවදද බං ගුඩ් නිවුස් ආවෙ. බැඩ් ඒවම විසත්.

"ඇයි බැන්ක් ලෝන් එකක් පාස් වුනාද ?"

මද්දු කුලප්පු වෙන්නෙ ඔහොම ඇහුවහම තමයි...

"ලෝන් නෙමෙ යකෝ... මෙන්න මෙතන අංජලී ඉන්නවා...".

"අම්මට හුඩු... මෙතන !! ??"

මගේ මයිල් ඉස්මයිල් උනා. අංජලී මොනව කරනවද මංදා, මද්දුවගෙ බැන්ක් එක අස්සෙ රිංගගෙන.

"මෙතන තමයි බං...!! අඬනව දෙක වෙන්න. මින්... බලපං උඹත් දාන ලෙඩ... උඹ මොනවද පොඩ් ඒකිට කරේ...?"

මද්දු අයියා අහපු එකට දෙන්න උත්තරයක් මට හිතාගන්නත් බැරිවුනා.

"බලපං... ලැජ්ජාවෙ බෑ යකෝ... බැන්ක් එකේ ඔක්කොම බලාගෙන... හරියට මගේ කෙල්ල වගේ. මං ගාව ඉඳන් අඬන්නෙ..."

ඔන්න ඒ පාර නම් මට තද වුණා. තද වුණ පාරට හිර වෙලා තිබ්බ වචන සැට් එක එළියට ආවා.

"මද්දු මෙ... රෝන් වෝක් දාන්නෙපා හරී... මං ඒකිත් එක්ක කතා කරන්නම්... තෝ දීපන් ඒකිට ෆෝන් එක..."

වරොප්පුව පිටමං මං කතා කරා. තද වෙන් නැද්ද අප්පා ඌ මගේ කෙල්ල ගාව ඉන්නකොට. තව ඌ බයිලත් ගහනවා... හතේ... මට එන තේන්තියක්...

"උඹ කියන කියන විදියට ෆෝන් එක දෙන්න බෑ මුද්‍ර්. කරුණාකරල මෙහේ වරෙන් දම්මම... අංජලී කියනවා උඹව බලන්නම ඕනලු... ආ ! තව උඹට මොනවද කියන්නත් තියෙනවලු... ඔය මොකක් හරී බස්සෙකක නැගල වරෙං..."

මද්දු ෆෝන් එක තිබ්බා. මාත් රිසීවර් එක තියල රාජ් දිහා බැලුවා. උමේ මූඩ් එක කලින් විදියමයි.

"අවුලක් නේ...?"

WWW.SINHALAELIBRARY.COM 41

ගිනියට හිනාවක් දාන ගමන් රාජ් ඇහුවා.

"අවුලක් නමයි වගේ පොඩි ගමනක් යන්න ඕන..."

ඇඳගෙන ඉඳපු ෂෝට්ට උඩින් ඩෙනිමක් දාගන්න ගමන් මං රාජ්ට සීන් එක කිව්වා.

"උඹට නම් අන්තිම අපල කාලයක්ද කොහෙද.. ෂබී ගියා විතරයි දැන් අංජලී..."

ඌ කියනකොට ඇත්තක් තියෙනවා. එහෙන් මද්දූවගෙ චූටි ඩොක්ටර් හින්ද නැව් ගානට කන්න ගියා. දැන් දෙපැත්තකින් ෂහනාසුයි අංජලියි මාව හිර කරනවා. බස්සෙකේදි තමයි රාජ්ට මං අර දුවපු කතාව කිව්වෙ. ඌ හිනාවෙනවා.

"මං මේ ජීන් බැලුවා කොන්ඩෙ වවන්න ඕන කියල කියපු එකා හදිස්සියෙ කොන්ඩෙ කැපුවෙ ඇයි කියලා..."

මටත් ඒ සීන් එක මතක වුනාම හිනා යනවා. ජීන් එදා නම් ලේසි පාසු බයකින් නෙමෙනෙ දිව්වෙ.

"මද්දූ උඹට එන්න කිව්වෙ බැන්ක් එකටද ?"

හෝමාගමදි බස් එකෙන් බහින ගමන් රාජ් ඇහුවා. මූත් ඉඳල ඉඳල අහන්නෙ දෙගත් පංගියෙ ප්‍රශ්නනෙ. බැන්ක් එකේ නැතුව ඌ පොලිසියෙ ඉන්නද...?

මායි රාජුයි බැන්ක් එක ඇතුළට ගියා. ෆුවර්රෙකට අංජලී ඇත්තෙ විසිටින් රූම් එකේ. පව් අප්පා... අඬල අඬල හෙම්බිරිස්සාවත් හදාගෙනද දන්නෑ... මට ඒකිගෙ අඬන වොයිස් එකයි, පුංචි ඇස් දෙකයි, දුක්ඛහම ඉඹගෙන ඉඹගෙන යන්න හිතෙන කම්මුල් දෙකයි මතක් වුණා. අද නම් ඒකි නොකිව්වත් මගේ හිතේ තියෙන දේවල් කියනවා. ෂබී ගැනත් කියනවා. මං එක හිතින්ම හිනාගත්තා.

"තෝ බං...?"

රාජ් අහනවා. මද්දූ පේන්නවත් නෑ. ළඟ ඉඳපු සිකියුරිටි පොරට මං කිට්ටු කරලා මද්දූ ගැන ඇහුවා. ඌ දුන්නෙ මාව කොරවෙන ටෝකක්...

මූ... මූ... මැරුවත් මදිනෙ යකෝ.

"හාතිය මහත්තයා උදේම කොල්ලුපිටි බ්‍රාන්ච් එකට ගියානේ... අද උදේ වරුවම එහේ තමයි ඉන්න ඕන..."

රාජ් කලබල අත ගහගත්තා.

"මට හිතෙනවා බං මූව මරාගෙන කන්න..."

කේන්තිය ඉවසගන්න බැරුව මං කිව්වා.

"උඹ එදා ඌට දීපු ලණුවට ඌත් නියම රිටන් එකක් දීලා තියෙනවා. මොනා කරන්නද මිට පස්සෙවත් ඇඳගෙන නාන කොට කමේ හයියද බලපං..."



හිතේ දුකයි කේන්තියයි ඉවසගන්න බෑ මට. ලාවට කඳුළු බිංදු දෙකතුන් ඇහේ කොනට ආවා. මදයි මද්දූවගෙන් පරිස්සම් වෙන්න හිතා ගත්තා. ඌ ඊට කලින් ඉස්සර වුනානෙ. තවත් ඉතිං මෙතන ඉඳල බිත්තර දාන්නයෑ කියල හිතාගෙන 122 ක නැගල මං ගෙදර ආවා. රාජ් එහෙම්මම නුගේගොඩ ගියා. ගෙට ඇතුළු වෙනකොට මට පාන් කියාගන්නත් බෑ. දෙහිවල ගියපු අම්මා ඇවිල්ලා. හෝ ගාලා උයනවා. මං බාත්රූම් එකට රිංගුවා. හිතේ දුක යන්න නාගන්නව කියල හිතාගෙන. මදයි අංජලීව බලන්න අත කට මැදගෙන ගියා. ඕකට ඕකේ... කුණු මද්දූවත් එක්ක මට මාර කේන්තියි. ඕකට නිල් වෙන්න ගේමක් දෙන එක දෙනවා, කියල හිතාගෙන මං සබන් ගාන්න ගත්තා. මුලු ඇඟේම සබන් ගාල, මූණෙත් ගාල ෂවර් එක ඇරියා. මෙන්න බොලේ වතුර එන්නෑ... හප්පේ... ඒ පාර මොකද වුණේ ? එහෙන් ඇස් දෙක දන්න අරගෙන... මෙලෝ දෙයක් පේන්නෑ. මං යාන්තං අතපත ගාලා බාත් රූම් එකේ දොර ඇර ගත්තා.

"අම්මේ.... වතුර ඉවර වුනා. මෝටරේ ගහන්න.."

මං කෑම කාමරේ ඉඳන් කෑ ගැහුවා. දැන් ඇස් දෙක හොඳටම දනවා. වෙන දෙයක් වෙච්චාවෙ කියල පුටුත් පෙරල ගෙන මං සබන් පිවිත්ම කුස්සියට දුවන් ගිහින් අම්මා වතුර පුරවල තිබ්බ බේසමේ මූණ ඔබා ගත්තා. ඇස්වල දැවිල්ල යනකන් ඉඳල මං ඔලුව ඉස්සුවා. අම්මා හිනාවෙනවා. මට තවත් කේන්තියි. ඒ අස්සෙ කුස්සියට හොම්බ දාපු එකා දැකල මං හොල්මං වුනා. මද්දූ....

"හා ! පාට්නර්... හොඳට නාලා වගේ... කරාමෙ වැහුවාම ඕම තමයි..."

යකෝ මූ කරාමෙ වහලා... මූ නම් ගෙදරින් එලවන්නම ඕන.

## 22

මද්දූවත් එක්ක මට කාල ඉන්න බැරි තරම් කේන්තියි. මොන තරම් පජාති වැඩක්ද ඌ කෙරුවෙ තව ඌ මෙතන හුතු හුතු ගගා හිනාවෙනවා. අම්මා ඔක්කොටම හපන්. අත් දෙකෙන්ම මූණ වහන් හිනාවෙන්නෙ. මට වැඩියක්ම ඔරොප්පු උනේ ඒකයි.

"ජරා වැඩ කරන්නෙපා මද්දූ...!"

ගෙහෙණ සද්දෙට ඌට එහෙම කියලා මං ආයෙමත් බාත් රූම් එකට රිංගලා නෑවා. කලින් කාපු ඔරිජිනල් පරිප්පුව හින්ද මං සබන් ගෑවෙ නෑ. කියන්න බෑනෙ. මද්දූව කොහෙන් හරි බලන් ඉඳල කරාමෙ ආයින් වැහුවොත් හෙම.

WWW.SINHALAELIBRARY.COM 42

බාත්රූම් එකෙන් එළියට එද්දිත් මං කල්පනා කළේ මද්දුවට අදින්න ඕන අංචිය මොකක්ද කියලයි. නා ගන්නට මොලේ තෙමිල නැතුවද මංදා මලුවට මෙලෝ අයිඩියාවක් ආවෙ නෑ.

"පොඩී... උඹට කෝල්..."

සාලෙන් මද්දුවගෙ සද්දෙ ඇහුණා. මං කාමරෙන් එළියට ඔලුව දාල සාලෙ දිහා බැලුවා. රිසීවරේ පැත්තකින් තිබ්ල ඇස් බෝල දෙකත් කරකව කරකව මද්දුව මං දිහා බලන් ඉන්නවා. ෂුවර් එකට මූගේ කෙප්පයක් ටෙලිෆෝන් එකේ 'රිංන්ග්ස්' යනවවත් ඇහුණෙ නැතෙ. මං පට ගාල ඔලුව කාමරේ ඇතුළට ගත්තා.

"ඒයි... පිස්සු කෙලින් නැතුව වරෙන්... එහා පැත්තෙ එකාගෙ බිල යනවා..."

මූ අද බැන්ක් නොගිහින් තියෙන මල වදයක හැටි. මට සැනසිල්ලෙ ඉන්න නම් මද්දුව වැඩටම යන්නෝන. මං ෆෝන් එක ළඟට ආවෙ, බොරුවක් උනොත් නම් මද්දුවගෙ අණ්ඩක් හරි කඩනව කියල හිතාගෙන. මූ අද දවසට මට කරපුව මදෑයි... බුදු හාමුදුරුවො වත් මෙච්චර ඉවසන් නෑ. මට ඒක බුදු ෂුවර්. රිසීවරේ මට දික් කරල ඌ කාමරේට ගියා. ඌ ගියපු තාලෙන් නම්, කෝල් එක ඇත්ත එකක් වගේ...!

"...හෙ...ලෝ...!

මං හෙලෝ කියල කිව්වෙ හෙමීට... මද්දුව කොහෙන් අහන් ඉදිවිද දන්නැතෙ. ඒත් ෆෝන් එකේ එහා පැත්තෙන් අංජලීගෙ කටහඬ ඇහුණහම මගේ පපුව ගැහෙන ස්පීඩ් එක වැඩිවුණා.

"...වි...හ....ග... අයියා..."

"....උ...ං...ගි....!!!"

මට එකපාරටම කියැවුණා. කොහොමටත් අංජලී ඉස්සරහදි මං හිත හිරකර ගන්න හැදුවට, හිත මටත් හොරෙන්ම ඒකි ගාවට යනවා.

"ඇයි... ඇයි... විහඟ අයියෙ මට මෙහෙම කරන්නෙ...?"

තත්පර ගානක් සද්ද නැතුව ඉඳල ඒකි අහපු වචන ටික මගේ හිත ඇතුළටම වැදුනා. මොකක්දෝ තේරෙන්නෙ නැති ගැස්මක් හිත ඇතුලෙ දෙපාරක් තුන් පාරක් කරකැවිල ගියා... ඒකි අහපු ප්‍රශ්නෙට දෙන්න තරම් උත්තරයක් මං ගාව තිබුණෙ නෑ. මං පුරුදු විදියටම සද්දෙ වහගත්තා.

"...මං... මං අයියට වැරැද්දක් කළේ නෑ අයියෙ... මගෙ අතින් ඔයාට වැරැද්දක් වුණා කියල හිතෙනව නම්, මං ඔයාගෙන් සමාව ගන්නම් විහඟ අයියෙ... ඔයා මාව එදා නුගේගොඩදි දාල ගියා... මං ගෙදර ඇවිත් කොයිතරම් ඇඬුවද කියල ඔයා දන්නෑ අයියෙ..."

අංජලීගෙ කටහඬට මහා ලොකු දුකක් එකතු වෙලා තිබුණා. මගේ හිතටත් මොකක්දෝ වුණා.



"මං දන්නව... අයිය මට අකමැතියි කියලා. ඒත් ඒ වත්කියක් නොකියා මගේ හිත රිද්දන්නෙ ඇයි අයියෙ...? මං... මං ආයෙ කවදාවත් අයියට කරදරයක් වෙන්නෑ... හ්....ග්... !! ඔයාට... දැන් සංතෝසයි නේද අයියෙ...?"

අංජලීගෙ වචන මගේ හිත කැලිවලට කඩල දමනා වගේ... පව්... ඒකි අදත් අඬනවා.

"...ප්ලීස් උංගි අඬන්නෙපා... මං හිතල ඔයාගෙ හිත රිද්දුවෙ නෑ... නංගි... මං... මං... දවස් කීයක් ඔයාව හම්බවෙන්න ට්‍රයි කළාද ?"

මං කියපුව අංජලී ගණන් ගන්නෙ නෑ කියල මට තේරුණා.

"බොරු කියන්නෙපා විහඟ අයියෙ... ඔයාට ඕනෙකම තිබ්බා නම් අපේ ගෙදරට ෆෝන් කරල මාව හම්බවෙන්න තිබ්බා. හ්...ග්... ඒත් ඔයා ඕන කමින්ම හැමදේම මග ඇරියා. කමක් නෑ. විහඟ අයියා... මං ආයෙ ඔයාට කරදරයක් වෙන්නෙ නෑ..."

"ඔයා හැමදේම පටලවන් කතා කරන්නෙ උංගි. එදා ගෝල් ෆේස් එකේදි වුණ දේවත් ඔයාට කියන්න මට ඉඩක් දුන්නද ? නෑ... එදා ෆොටෝ ගහන්න ගිහින් මාව කෙයාර් කෙරුවෙම නෑ. මාත් කොල්ලෙක් නෙ උංගි... ඇයි ඔයා ඒ ගැන හිතන් නැත්තෙ...?"

ඒකි කියපුවට මං හැරෙන තැපෑලෙන් උත්තර දුන්නා. සද්ද වහල තවත් හිටියොත් දුකයි, පපුව පිච්චෙනව වගේ, එකයි එකට එකතු වෙලා මාව හෙම්බත් කරයි. ඒත් මං අහපු ඒවට එහා පැත්තෙන් උත්තර ආවෙ නෑ. කතා කෙරුවෙ නැති වුණත් අංජලී ෆෝන් එකේ එහා පැත්තෙ තාම ඉන්න විත්තිය මට තේරුණා.

"මේක මෙහෙම කතා කරල විසඳන්න බෑ උංගි.. මට ඔයාව හම්බවෙන්න ඕන... හෙට උදේ නුගේගොඩ ස්ටේෂන් එක ගාවට ඔයා එන්න... අපි මේ අවුල් වෙලා තියෙන හැමදේම විසඳගමු..."

"... දහයට..."

අංජලීගේ හීනි වොයිස් එක ආයෙමත් එහා පැත්තෙන් ඇහුණා. මගෙ හිතට ආවෙ මාර පිට් එකක්.. උදේ ඉඳන්ම අප්සට් වෙලා තිබ්බ හිත යාංතම් හරි ගියා වාගේ මට තේරුණා. එහෙනම් හෙට දහයට මං අංජලීව හම්බවෙන්න යනවා... ගිහින්... ඒක ඉතිං එතනදි බලාගන්නවා... අ...ඩ...ඩෙ... එතකොට ෂහනාස්...?

WWW.SINHALAELIBRARY.COM 43

## 35

පාවු වෙනිදටත් එළිවුනා. අද අංජලීව හම්බවෙන එක ගැන හිතිලමද කොහෙද ඊ කිස්සෙ මට නින්ද ගියෙත් නෑ. එළිවෙන්න කිට්ටුව එකකට එකක් සම්බන්ධ නැති හීනත් මහ හුඟක් මං දැක්කා. ඒත් ඒ එක හීනෙකවත් අංජලී හිටියේ නෑ.

"පාට්නර්... මොකෝ ෆුල් ජොලියෙ...?"

මද්දූට මගේ වෙනස තේරිලා. මූටත් ඇත්තටම මගේ දේවල් හොයන් නැතුව ඉන්න බැරිද මංදා...

"මුකුත් නෑ මද්දූ... අද උදේ පාන්දර ඔයාවනෙ දැක්කෙ..."

මං ලාවට කියල දැම්මා. මූව තද කරවල බෑනෙ උදේම. මගේ දවසනෙ එතකොට බංකොලොත් වෙන්නෙ.

"ඒක මිසක්... කෝකටත් මීට පස්සෙ නැගිට්ට ගමන් මූණ හෝදගනිං.. කුණු කෙල බේරි බේරි ඉන්න උඹව දැක්කහම බත්වත් හම්බෙන් නෑ..."

මහා අපත කතාවක් කියාගෙන කුණු මද්දූවා ගෙයි ඉස්සරහ පැත්තට ගියා. ළඟකදී ඉඳල මූ කියවනාව වැඩියි. මූ මගේ ඇර්ගස් චෙක් කරනවද මංදා...!

මද්දූව වැඩට යන්න ලෑස්ති වෙද්දි මං කාමරේට රිංග ගත්තා. ඉස්සරම දවසක අංජලී මට ගෙනැල්ල දීපු රෝස පාට ටෙඩියව, ඇඳුම් අල්මාරිය ඇරල මං අතට ගත්තා. අල්මාරිය ඇරිය පාරක් පාරක් ගානෙ මට ටෙඩියව පේනවා. එතකොට මට මතක් වෙන්නෙ අංජලීව... ටෙඩි බේයාර්ව අතට ගන්නවත් එක්කම මගේ ෂර්ට් එකක් අල්මාරිය උඩ තට්ටුවෙ තිබිල බිමට වැටුණා. ආපහු කබඩ් එකට දාන්න මං ඒක අතට ගත්තා. එකපාරටම කරන්ට් වැදුන වගේ මට මතක් වුණා. ඒ ෂර්ට් එක බේරුවලදී ෂහනාස් මට දුන්නු එක. ෂහනාස්ගෙ අතින් බීම ට්‍රේ එක මගේ ඇඟේ හැපුනම ඒකී මට ගෙනත් දීපු ෂර්ට් එක...! මගේ ඔලුවත් මොකක්දෝ වුණා. එක අතක අංජලීගෙ ටෙඩියා. අනිත් අතේ ෂහනාස්ගෙ ෂර්ට් එක... තව මෙහෙම හිතන්න ගියොත් මට පිස්සු හැදේවි. මං ඒ දෙකම අල්මාරියට ආල වහල දැම්මා. අද දහයෙ ඉඳන් අංජලීට කියන්නෙ මොනවද කියල මං හිතන්න ගත්තා. හිතන්න හිතන්න හිත අවුල් වෙනව මිසක වෙන දෙයක් වෙන් නෑනෙ. ඉස්සරහට එන දේකට මූණ දෙනවා. මං එක හිතින්ම හිතාගත්තා.

ඔහොම කල්පනා කර කර ඉන්නකොට තමයි මද්දූව උගේ කාමරේ පෙරලනව වගේ මට ඇහුණෙ.





"මොකෝ මද්දූ...?"

මං මද්දූගෙ කාමරේට එබුණා. ඌ ඇඳ උඩ වාඩිවෙලා කල්පනා කරනවා.

"අද වැඩට යන් නැද්ද...?"

ඉස්සෙල්ල ප්‍රශ්නෙට උත්තර නැති හන්ද මං දෙවෙනි එකත් ඇහුවා.

"යන්න ඕන පොඩී... ඒත්..."

මද්දූගෙ මූණ ඒ තරම් හොඳ නෑ. නිතරම හිනාවෙලා ඉන්න මද්දූට මොකද වුණේ...?"

"අවුලක් නම් කියන්න මද්දූ... ඔයා දන්නවනෙ... ඕන කුණු ගොඩකට අත දාන්නම්..."

"පූජනී ගැන අම්මත්තෙක්ක කියන්න තරම් මගෙ හිතට පිවි එකක් නෑ පාට්නර්... තව මේ ගැන අම්මට හංගල වැඩක් නෑ කියල මට හිතෙනවා..."

විතක් විතර කල්පනා කරන්න දේවල්, මද්දූ කියපුව අතරෙ හිරවෙලා තිබුණා. ඒත් ඩිංගක්වත් කල්පනා කරන්නෙ නැතුව මං කට ඇරියා.

"ඔයාට කියන්න බැරිනම් මං අම්මට කියන්නම් මද්දූ..."

මං කියපු එක අදහගන්න බැරුව වගේ මද්දූ මං දිහා බලන් හිටියා.

"ඔය... ඔය ඇත්තමද පොඩී...?"

අර කලින් තිබ්බ හිනාව ආයෙත් මද්දූගෙ මූණට ආවා.

"මද්දූ අයියා අප්සට් ගහන් නැතුව ඉන්නකො. මං සේරම බලා ගන්නම්..."

හෙණ තදය වගේ මං කියල දැම්මා. මද්දූගේ මූණෙ හිනාව ඩබල් වුණා.

"ඒක නෙමේ පොඩී... අර ඊයෙ කතා කරපු කෙල්ල කවුද.. මං මීට කලින් අහපු වොයිස් එකක් නෙමේ..."

ඔන්න මද්දූව ආයෙත් අර පරණ තත්වෙටම වැටුණා. ඒකනෙ පූජනීගෙ කතාව පැත්තකින් කියල ඔය වගේ එකක් ඇහුවෙ...

"...අංජලී..."

මං ඇත්තම කිව්වා, මද්දූට. මොකටද නිකං ඌට හංගන්නෙ... ඒත් අංජලීගෙ නම කිව්වහම මද්දූගෙ මූණ ඇද වුණා.

"... උඹ මොනව හිතන් ඉන්නවද කියල මං දන්නෑ පොඩී... අංජලී කියන්නෙ අන්තිම අහිංසක කෙල්ලෙක්... ඇයි උඹ ඒකිව ලංකර ගන් නැත්තෙ...?"

WWW.SINHALAELIBRARY.COM 44

සාමාන්‍යයෙන් අයිය කෙනෙක් මල්ලිගෙන් අහන් නැති ප්‍රශ්නයක් මිදුළු මගෙන් සිරාවටම ඇහුවා. මං ඒකට උත්තරයක් දෙන්න ගියේ නෑ. මොකද අද දහයට මට උත්තරේ හම්බෙන හන්ද...

* * *

දහයට කාලක් විතර වෙද්දි මට නුගේගොඩ ස්ටේෂන් එක ගාවට යන්න පුලුවන් වුණා. ඇස් බෝල දෙකම කරකවල වටපිට බැලුවත් අංජලි හිටියෙ නෑ. තව වෙලා තියෙනවනෙ කියල හිතාගෙන මං කණුවකට හේත්තු වුණා. ඒත් එක තැනක ඉන්න හිත ඉඩ දුන්නෙ නෑ... මං ඩිංග දුරක් එහෙම මෙහෙට ඇවිද්දා... මං ආයෙත් වෙලාව බැලුවා. දහයයි පහයි... අංජලි නාම නෑ. අංජලී ගැන හිත හිතා මහොම ඉන්නකොට තමයි කවුදෝ මගේ නම කියල කතා කරනව ඇහුනෙ. මං ඇහැරුනා. ඒ හැරුනහම, මං ඉස්සරහට ආපු කෙනාව දකල මගේ හිත හිතල වෙලා ගියා. ෂහනාස් !

"ආ...න්...නේ... හරිම පුදුමයි... ඔයා මෙතන... ඉතිං කියන්නකො... මොකද මෙහේ..?"

එහෙම අහන ගමන ෂහනාස් මගේ අතින් අල්ල ගත්තා. පපුවෙ ලේ අගුරු කෝච්චි දෙක තුනක් යද්දි මං වටපිට බැලුවා. දෙයියනේ...! මගේ ඇස් ඉස්සරහටම රේල් පාර දිගේ එන අංජලීව දක්කෙ මං එතකොට... හප්පේ...!

## 22

හත්තිලව්වට ගහපු කලාබරේ වගේ මගේ මුලු මලුවම අවුල් වුණා. නළලට වැටිච්ච දිග කෙස් රොදක් වම් අතින් හරි ගස්ස ගස්ස ස්ටේෂන් එක දිහාට එන අංජලීට මූණ දෙන්නෙ කොහොමද කියන ප්‍රශ්නෙ මගෙ හිතේ හතර පස් පාරක්ම කරකැවුණා. ෂහනාස් ඒ වෙනකොටත් හිටියෙ මගේ අතින් අල්ල ගෙන... මෙහෙණ ගහන්න වගේ ඒ අත ගසල දාන්නත් බෑ. කරන්න ඕන මොකක්ද කියල එලොවටත් නැතුව මෙලොවටත් නැතුව ඉන්නකොට තමයි දෙයියො මගෙ මූණ දිහා බැලුවෙ... ඈත ඉඳන් පිඹගෙන එන ට්‍රේන් එකේ සද්දෙ මට ඇහුණා. දෙපාරක් හිතා එක පාරක්වත් හිතන්න මට වෙලාවක් තිබුණෙ නෑ. ෂහනාස්වත් ඇදගෙන ටිකට් කවුන්ටරේ ළඟට දුවත් ගිහින් කොටුවට ටිකට් දෙකක් අරගෙනයි මං පස්ස බැලුවෙ. ෂහනාසුත් හොල්මං වෙලා. ඒත් ඒ වෙනකොට මං අංජලීව දක්කෙ නෑ. ඒ ඩිංගට අංජලිට මොකද වුණේ..?

"ඈ... ඇයි විහඟ අයියා කලබලෙන්...?"

WWW.SINHALAELIBRARY.COM 45



ඒ අස්සෙ ෂහනාස් මගෙන් අහනවා. මං මුකුත් නොකියම ඒකිගෙ අතින් ඇදගෙනම ට්‍රේන් එකට නැග ගත්තා.

"කියන්නකො... විහඟ අයියා... ඔයා හොඳටම අප්සට් වෙලා. ඇයි අපි මේ කොටුවට යන්නෙ...?"

ෂහනාස්ගෙ සුදු මූණ රතුපාටට හැරිලා.. ඒකිගෙ සුදු ස්කාෆ් එක දකුණු අතට මිරිකලා. ඇත්තටම මං මේ මොකක්ද කරේ..? මං අද තරන්න ආවෙ මොකක්ද...? ජුවර් එකට ම මට පිස්සු. නැත්නම් අංජලීව දකපු හැටියෙ ෂහනාසුත් ඇදගෙන දුවාවියැ. මං ෂහනාස් දිහා බැලුවා. එතකොටයි මට මතක් වුණේ ඒකි මගෙන් මොනවාදෝ ඇහුව කියලා.

"ම... ම... නියාස් වගේ කෙනෙක්ව දැක්කා ෂබී..."

ඒ වෙලාවේ මගේ කටට ආවෙ ඒ වචන ටික විතරයි. ඒත් ඒක අහපුවහම ෂහනාස්ගෙ ඇස් දෙක උඩ ගියා.

"අ....අනේ... අයියා... ම.... මට බ... බයයි..."

මං බලන් ඉද්දිම ඒකිගෙ ලොකු ඇස්වලට කඳුළු ආවා.

"බයවෙන්නෙපා ෂබී... ඒ වෙලාවට මට වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ." අපි දෙන්න එකට ඉන්නව දැක්කොත් 'නියාස්' රටම ගිනි තියාවි... ඒකයි මං ට්‍රේන් එකට නැංගෙ..."

ට්‍රේන් එකෙන් එළිය බලන ගමන් මං ඔහේ කියවන් ගියා. ඇත්තටම මගෙන් පිටවෙච්ච ඒ වචනවල බැරෑරුම්කම මට ඒ තරම් තේරුණෙත් නෑ. මොකද ඒ වෙනකොට මගෙ හිතේ හිටියෙ අංජලී..! ෂහනාස්ට බොරු කිව්ව එකටත් වැඩිය මගෙ හිතට අංජලි ගැන ආවෙ මහ විශාල දුකක්. පව්.. ඒකි අදත් රස්තියාදු වෙනව මං හිතුවා...

ටිකකින් ට්‍රේන් එක ඩක ඩක ගගා ඉස්සරහට ඇදුණා. නැමදේම අමතක කරන්න හිතාගෙන මං ෂහනාස්ගෙ මූණ දිහා බැලුවා. ඒකි හිතනවද දන්නෑ මට පිස්සු කියලා.

"... ඔයා කොහෙ යන්නද ආවෙ ෂබී...?"

"... මං මේ ෂොපින් ආපු ගමන් අයියා... ඒත් මං හීනෙකින් වත් හිතුවෙ නෑ ඔයාව හම්බ වෙයි කියලා... තැන්ක්ස් ගෝඩ්...!"

ඒකි දෙයියන්ට තැන්ක්ස් කරනවා. මටත් ඉතිං ඒකමයි කියන්න තියෙන්නෙ... ෂබී මගේ අතින් අල්ලන් ඉන්දෙද්දි උංගි දක්කනම් ගෙම අපෙ අනාගතයක් ගැන හිතනවා බොරු..."

"විහඟ අයියා..."

"ඕ.....!"

මං ෂහනාස් දිහා බැලුවා. ඒකින් මං දිහාම බලාගෙන. කෝච්චි පෙට්ටියෙන් කට කපලා එකයි සෙනඟ..."

"එදා ඔයාලගෙ දිහා ඇවිත් ගියාට පස්සෙ... ඒ ආපු ගමන ගැන මං හුඟක් හිතුවා... ඇත්තටමයි මං අයියගෙන් මේ අහන්නෙ... අයියගෙ හිතේ මං ගැන ආදරයක් නෑ නේද ?"

එකපාරටම ෂබී අහපු ඒ ප්‍රශ්නෙන් මට ඉන්න තැනත් අමතක වෙලා ගියා. ඒත් හැමදාමත් මග අරින මේ ප්‍රශ්නෙ බේරගන්න මග පලවෙනි තැන ෂබී ළඟින් කියලා මට තේරුණා. එහෙට මෙහෙට ගැස්සෙන කෝච්චි පෙට්ටිය අස්සෙ මං කතා කරලා.

"ඔයා මාත් එක්ක තරහ වෙන්නෙපා ෂබී මෙහෙම කිව්වට. ඔයා ගැන ඒ වගේ දෙයක් හිතන්න මගෙ හිතට පුලුවන් කමක් නෑ..."

මං එහෙම කිව්වහම ෂහනාස්ගේ ලොකු ඇස් දෙක පුංචි වුනා.

"... ඔයා හරි විහඟ අයියේ... අපි දෙන්න අපි දෙන්නට ළංවුණේ එකපාරටම... ඒක ආදරයක් නෙමෙයි... ඒක අපේ හිත් ඇතුලෙ තිබ්බ ආශාවක්... එදා ගෙදර ගියාමත් මට රාජ් අයිය බැන්නා. මොනවද මේ තේරුමක් නැති වැඩ කියලත්..."

ෂහනාස් කියවගෙන යනවා. ඒකි කියන හැම දෙයක් ම ඇත්ත. මගේ හිතෙත් ෂහනාස්ට තිබ්බෙ ආශාවක්. ඒක ආදරයක් නෙමෙ... කොහොම හරි කොටුවට එනකන්ම ෂහනාසුත් මාත් අතරෙ ඊට පස්සෙ වැඩි කතා බහක් තිබ්බෙ නෑ. කොටුවෙන් 122 බස්සෙකක නැගල තමයි ආපහු අපි දෙන්න කතාව පටන් ගත්තෙ. නුගේගොඩ ඉඳල කොටුවට එනකනුත්, කොටුවෙන් 122 ක නගිනකනුත් මගේ හිතේ හැම තැනකම අංජලී හිටියා. මං එනකන් නුගේගොඩට වෙලා තාම බලන් ඉන්නවද දන්නෑ.

"...ඔයා කියපු දේවල් ඇත්ත ෂබී..! මගෙනුත් ඔයාගෙ හිත ඇවිස්සෙන විදියෙ හැසිරීමක් තියෙන්න ඇති.. මට ඒකට සමාව දෙන්න ෂබී..."

මං ඒ සුදු අත තද කරල අල්ලා ගත්තා. ආයෙ ජීවිත කාලයටම මට මේ අත අල්ලන්න වෙන්නෑ කියල මගේ හිත කිව්වා.

"... මගේ ජීවිතේටම බෝයි කෙනෙකුට කියලා මං ළංවුණේ ඔයාටයි විහඟ අයියේ.. මගේ හිතේ හැමදාටම ඒ මතකය තියේවි... මට ඒක අමතක කරන්න බෑ. මං අමතක කරන්නෙත් නෑ. මං මගේ ජීවිතේ ගැන තීරණයක් අරන් ඉවරයි අයියෙ. එදා ඔයා ළඟට ආපු දවසෙ ඔයා නිකමට හරි මොනා හරි වචනයක් කිව්වනම් මගේ මේ තීරණේ වෙනස් වෙන්නත් තිබුණා. ඒත් පහුවෙච්ච දේවල් අයෙ හදන්න බෑ විහඟ අයියෙ... ගෙදරින් කියන දේකට මං කැමති වෙනවා..."

ෂහනාස් ඒ ටික කිව්වෙ බස් එකේ ජනේලෙන් එළිය බලාගෙන. මං ඒ මූණට එබුණා. ලොකු ඇස්වල ආයෙමත් කඳුළු පිරිලා... අද ෂහනාස් එක්ක මේ වගේ දෙයක් කතා කරන්න වෙයි කියලා මං හිතුවෙම නෑ. ෂහනාස්ට අංජලී ගැන මේ ගමන්ම කිව්වොත්...





# 37

අංජලී ගැන ෂහනාස්ට කියන්න ගිහිල්ලා. මේ වෙලාවේ මෙයින දේවල් මදිවට කවත් බාල්දි පෙරලෙයි. එහෙනොව මේ සංසාර ගමන බව දික් වෙනවා. ඒක මුදු පුවර්. මං කට වහගත්තා.

ෂහනාස් ජනේලයෙන් එළිය දිහා බලාගෙන ලොකු කල්පනාවක. එයාගෙ දිගම දිග කොණ්ඩ කැල්ලත් එළියෙන් ආපු සුළං පාරට නළල උඩට වැටුණා. ඔලුව වහගෙන හිටිය සුදු ස්කාෆ් එක ඇතුලට ඒ කොණ්ඩ කැල්ල ෂහනාස් දාගන්නත් මං දිහා බැලුවෙ නෑ.

"...ෂබී...!"

ෂහනාස් මං දිහාවට හැරුණා. ඒ ලොකු ඇස් දෙකේ කඳුළු...

"ඇයි මේ ඇස්වල කඳුළු පුරවාගෙන ෂබී...? මං කිව්ව දේවල් වලින් ඔයාගෙ හිත රිදුනද...?"

'නෑ' කියල කියන්න වගේ එයා ඔලුව දෙපැත්තට වැනුවා. පව්..! ඒ සුදු මූණ මහා දුකකින් වැහිල ගිහිල්ල.

"තව ටික දවසක් යද්දි ගෙදරින් ගේන "ප්‍රපෝසල්" එකෙකට හරි තියාස්ට හරි ඔයා කැමති වේවි ෂබී..."

මං කිව්ව දේට ෂහනාස් ගැස්සිල වගේ මං දිහා බැලුවා. ඒත් එයා කතා කරේ නෑ.

"ඔයාට මතකද ෂබී... අපි දෙන්න හම්බවුණු ඉස්සෙල්ලම දවසක ඔයා රාජ්ට කිව්වා... ඔයාගෙ වෙඩින් ෆොටෝස් ගන්න මං එන කියලා.. ඔයාගෙ ලස්සන බලන්න මං එදාට එන්නම් ෂබී..?"

මොකක්දෝ මහා දුකක් මගේ හිත ඇතුලෙ පෙරළීගෙන යද්දි මං කියවගෙන ගියා. ෂහනාස් ගෙ සුදු මූණ රතුපාටට හැරෙද්දි එයා මගේ අත තද කරල අල්ල ගත්තා.

"ඔ... ඔහොම කතා කරන්නෙපා අයියෙ. මට දුක හිතෙනවා."

අඬන්න ලංවෙච්ච වොයිස් එකෙන් ෂහනාස් කියවං ගියා. ෂබීගෙ අත සීතල වෙලා. ඒක මගෙ අතට විතරක් නෙමෙ, හිතටත් දැනුණා.

"...ම... මට ඔයා ළඟ ඉන්න ඕන විහඟ අයියෙ...! ඒත්... ඒත් ඒ දේට කවදාවත් මට ඉඩක් හම්බෙන්නෙ නෑ. මං කොයි තරම් මුරණ්ඩු වුනත්, මට ඒ වගේ දරදඬු තීරණයක් ගන්න බෑ... ඇරත් අමාරුවෙන් හරි ඒ වගේ තීරණයක් ගත්ත වුනත්, ඔයා ඒකට කැමති වෙන්නෑ කියල මං දන්නවා..."

"...න්... නෑ... ෂබී... මේකයි..."

WWW.SINHALAELIBRARY.COM 46

මං හැදුවෙ මගේ පැත්ත සාධාරණීකරණය කරන්න. ඒත් ෂහනාස් දිගටම කතා කරා.

"... වුවටස් ඉන්න අයියෙ... අපි දෙන්නට ආයෙ මේ වගේ අවස්ථාවක් එන එකක් නෑ... ඉතිං අහම්බෙන් හම්බවෙච්ච මේ වෙලාවෙදි මගෙ හිතේ තියෙන දේවල් ඔයාට නොකිය ගියොත් මට හැමදාම පසු තැවෙන්න වේවි කියල මට හිතෙනවා. මට තවත් විඳවන්න බෑ විහඟ අයියෙ..."

ඒ ටික කියල ෂහනාස් හති ඇරියා. දැන් බස්සෙක, කිරුලපනවත් ඇවිත්.

"... ඉඳල හිටලවත් මට ෆෝන් කරන්න විහඟ අයියෙ... මං දන්නෙ නෑ ඉස්සරහට මං ජීවිතේට කොහොම මූණ දෙයිද කියලවත්... එක වෙලාවකට මට හිතෙනවා, මං සිංහල කෙල්ලෙක් වුනා නම් කියලා."

"මෙතන ජාතිභේදයක් නෑ ෂබී..!" මං පණ්ඩිතයා වගේ කිව්වා.

"අපි කොච්චර නෑ කිව්වත් ඒක මුලට එනවා විහඟ අයියෙ... අපි අපිට කොයි තරම් කැමති වුනත් ඒක තේරුමක් නැති වෙන්නෙ එකයි..."

කවදාවත් නැති විදියට ෂහනාස් කියවගෙන යනවා. බස්සෙක හිටූ කියල කෙලගෙන යනවා. වෙනදට මග දිගට කොට කොටා යන බස්සෙක, ලෝක විනාසෙ අද වගේ කියල හිතලද කොහෙද කඩන් බිඳන් දුවන්නෙ. මග නවත්තන්නෙම නෑ. මට ඩ්‍රයිවර් එක්කත් අම්බානක ඔරොප්පුවක් ආවා. දැන් නුගේගොඩටත් කිට්ටුයි. ඒත් දැන් නුගේගොඩ බැස්ස කියල වැඩක් නැතෙ. අංජලීගෙ කැල්ලක්වත් නැතුව ඇති. ඒකි දැන් මගේ හත්මුතු පරම්පරාවටම කුණුහරුපෙන් බනිනව ඇති.

"... එහෙනම් මං බහින්නම් විහඟ අයියෙ... ඔයත් එක්ක මෙහෙම යන්න වෙයි කියල මං හිතුවෙම නෑ. ඒත් තෑන්ක්ස් බොහෝදේ... මාව කොටුවට හරි එක්කන් ගිහින් එක්ක ආවට... කොයිතරම් අමාරු වුණත් මං ඔයාව බලන්න එනවා... මොකද මගෙ හිතට බෑ ඔයාව අමතක කරන්න...! වැඩියක්ම ඔයාගෙ හිනාව...!! බා...යි...!!!

ආයෙමත් මට හූස්මක් කටක් ගන්න දෙන් නැතුව ෂහනාස් කියවං ගියා. බස්සෙනෙන් බැහැලක් එයා අත වනනවා මං දැක්කා. ෂහනාස් 'බායි' කියද්දි මට මතක් වුණේ. රාජ්ගෙ මාමලගෙ දූ බැන්ද දවසෙත් ෂබී මං ගාවටම ඇවිල්ල මට 'බායි' කියල ගියපු හැටි... ඒක මගෙ හිතට ආවහම හිත හිරවැටිල යනව වගේ මට තේරුණා. ආපහු ෂබීව හම්බ වෙලා මේ හැමදේම නිවැරදි කර ගන්නනම් කියන සිතුවිල්ලත් හිතට ඇවිත්. ආයෙත් නැතිවෙලා ගියා. කල්පනා කරන්න දාහක් දේ ඔලුවෙ කැරකෙද්දි බස්සෙකේ ජනේල වීදුරුවට ඔලුව ගහගෙන මං ඇස් දෙක පියා ගත්තා.

* * *



මං ගෙදර එනකොට එකොමාර විතර වෙලා. අම්මා විතරයි ගෙදර හිටියෙ. මං කෙලින්ම ගිහින් ඇඳ බදා ගත්තා. ම්න්..! අද දවසේදි වෙච්ච දේවල් නම් කියල වැඩක් නෑ. මං කරන්න ගියේ එකක්, වුනේ වෙන එකක්. මදුයි... අංජලීව හම්බෙන්න යන එක හැමදාම ඔකේ වෙලා යනවා. මොකෙක් හරි හූනියමක් වත් කරලද මංදා.

"පොඩි...! උදේ ඔයාට කෝල් එකක් ආවා. අර ඔයේ එන ගර්ල්ගෙන්..."

අම්මගෙ කටහඬ කුස්සියෙන් ඇහුණා. හිතට ආපු පිටි එකට මං දඩබඩ ගාලා ඇඳෙන් නැගිටල කුස්සියට දිව්වා. ඇඳේ පොලු දෙකක් කොහෙද බිම වැටෙන සද්දෙද ඒ අස්සෙ මට ඇහුණා.

"අංජලී නේද අම්මා...!?!"

මං අහපු එකට අම්මගෙ මූණට ආවෙ සිරාම සිරා හිනාවක්. අම්මා ඔලුව වැනුවා. ඩූවර් එකට මට ඇට්ටි හැලෙන්න බනිනවා කියල හිතාගෙන වෙන්නැති අංජලී ෆෝන් කරන්න ඇත්තෙ. කමක් නෑ, බනිනව නම් බැනපුමදෙත් කියල හිතාගෙන මං ෆෝන් එක ළඟට ඇවිත් අංජලීගෙ නම්බර් එක 'ඩයල්' කරා. ඩිංගක් වෙලා ගියාට පස්සෙ එහා පැත්තෙන් අංජලීගෙ කටහඬ ඇහුණා.

"....හෙ...ලෝ...!!!"

"උංගි....? මං මේ විහඟ..."

"...අ... අනේ විහඟ අයියා... මට.. මට බනින්න නම් එපා... හොඳේ.. අද ආවෙ නැති වුණාට... අපේ ගෙදර හදිසි වැඩක් කරන්න වුණා. ඔයා රස්තියාදු වුණා නම් සොරි අයියා..."

අංජලී කියවගෙන යනවා. මං හොල්මං... මේ මොකක්ද මං මේ..? මං මගෙන්ම අහගත්තා. එතකොට මං අද, නුගේගොඩදි දැක්කෙ අංජලීගෙ ආච්චිද...?

## 38

සම්භර විට අංජලී නුගේගොඩ ඇවිත් කාපු චාටර් එක හන්ද මාව අන්දන්න හදනවද දන්නෙත් නැතෙ. අනිත්තෙක, මට මුදු මූවර්, මං දැක්කෙ අංජලීමයි කියලා. කොහොම වුණත් ප්‍රවේශමෙන් කතා කරන්න ඕනයි කියල මං හිතා ගත්තා.

"... කමක් නෑ උංගි...! මාත් අර දෙපාරක්ද කොහෙද ඔයාට කණු තිබ්බනෙ... ඒක හන්ද අවුලක් නෑ... අපි වෙන දවසක හම්බ වෙමු..."

"... ඔයා මය තරහින් නේද කතා කරන්නෙ...? අනේ සොරි අයියෙ... මට මං ඉස්සෙල්ලත් කිව්වෙ... ලොකු වැඩක් තිබ්බදයි එන්න බැරිවුණේ...

www.sinhalaelibrary.com

නුගේගොඩට එන්න වෙන්නද කියලා මං ඔයාලගට ෆෝන් කළා... ඒත් ඔයා ගෙදරින් පිටවෙලා..."

අංජලීගෙ කතාවට මගේ උතුර දකුණ ආයෙත් මාරු වුණා. අම්මත් කිව්වනෙ අංජලී ෆෝන් කරා කියල. ඒත් ඉතිං මෙකි කියන්නෙම නුගේගොඩ ආවෙ නෑ කියලනෙ. මගේ ඇස් මට බොරු කරන්නෑ කියල මං දන්නවා. ඒත් ඇයි මෙකි බොරු කියන්නෙ...? දැන් නම් කල්පනාව ඩබල් කරලයි කතා කරන්න වෙන්නෙ.

"... හැබැයි, දැන් ටිංගකට කලින් රාජ් මට ෆෝන් කරා උඹේ. ඌ කිව්වනෙ ඔයාව නුගේගොඩදි දැක්කයි කියල... ඒත් කතා කරන්න බැරිවුණා කියලා..."

මං කතාවෙ පිල්ල මාරු කරල අමුතුම පොතක් පෙරළුවා. බලමුකෝ, ඔතනින් වත් පොටක් පාදගන්න පුළුවන්ද කියලා. ඒත් ටිංගක් වෙලා යනකන් අංජලීගෙ පැත්තෙන් සද්දයක් ආවෙ නෑ. මොකක්ද බොලේ ඒ පාර වුණේ...?

"... හෙලෝ.. හෙලෝ... උ...ං...හි...!!!"

ඒත් එහා පැත්තෙන් මෙලෝ සද්දයක් ඇහුණෙ නෑ. මෙකි ලයින් එක කට් කරාවත්ද ? මං ආයෙමත් අංජලීගෙ නම්බර් එක ඩයල් කරා. මිහු..! එහා පැත්තෙන් ඒ පාර ආවෙ එන්ගේජ් ටෝන් එක. මෙතන මොකාක් හරි හුටපටයක් තියෙන විත්තිය මට තේරුණා. මුවර් එකට මෙකි ලයින් එක කට් කරා. ඒ මොනව වුණත් මෙකි නුගේගොඩ ඇවිල්ලත්, ඇයි මට ආවෙ නෑ කියල කිව්වෙ...? මේ පැටලිච්ච හූල් බෝලෙ කොත කොහේද කියල හොයාගන්න මට හම්බ වුණේ නෑ. මං දහ අතේ කල්පනා කරල බැරිම තැන විසි අතෙත් කල්පනා කරා. ඒත් කරුමෙ කියන්නෙ මගෙ ඔලුවට මෙලෝ අයිඩියාවක් වත් ආවෙ නෑ. දවල්ට කාල හෙම කාමරේට යද්දි මගේ හිතේ තිබ්බෙ ශහනාස්ව. ඒකි අද මට කියපු දේවල්වල තේරුම වැඩි වැඩියෙන් හිතට දැනෙන්න ගත්තෙ දැන් තමයි. කෙල්ලෙක් වෙලත් ඒකි මොන තරම් දේවල් කියෙව්වද...? මං අපතය වගේ අහන් හිටියනෙ. සිරාවටම ඒකි හිතන්න ඇති මං කිසි හිතක් පපුවක් නැති එකෙක් කියලා. ශහනාස් මගෙන් ඈත් වෙලා ගියා. ඉන් පස්සෙ ඇයි මං ඒකි ගැන හිතන්නෙ. මං හිටියෙත් ඒකි මං ලඟින් අයින් වෙනකන්නේ. ඒත් ශහනාස් මං ගාවින් ගිහින් තිබුණෙ අතීතෙ හැම මතකයක්ම මංගාව ඉසිරි කරල. මගෙ හිතට මේ තරම් දුක දැනෙන්නෙ ඒකයි.

* * *

දවස් දෙක තුනක්ම ගෙවිල ගියා. ඒත් මං ගෙදරින් එළියට වත් බැස්සෙ නෑ. අම්මත් බලනව ඇති මේ මොකද කියලා. මද්දුත් දෙපාරක් විතර ඇහුවා 'මොකෝ පාට්නර් ජම්බු ගහෙන් වත් වැටුනද ?' කියලා. ඌට ඉතිං මතක් වෙන්නෙ ඔක වගේ දෙයක් පංතියෙ කුණුහරුපනේ.



ඊයෙයි අදයි දවස් දෙකේම මං අංජලීට ෆෝන් කරන්න වුයි කරා. ඒත් දිගටම ආවෙ එන්ගේජ් ටෝන් එක. මෙකි මොන කෙං ගෙඩියක් කරන්න හිතන් ඉන්නවද මංදා. මගෙ හිතට මල පැන්නෙ හින්නල් දාන්නෙ නැතුවම. ඇයි යකෝ, ඔක්කොම කේස් නියුට්‍රල් කරලා ඔලුව යංතං කූල් කරගන්න හැදුව විතරයි, මෙකි මාව දේවදත්තයෙක් කරන්නනෙ හදන්නෙ. ගෙදර ෆෝන් කැඩිල හෙම නම්, වෙන කොහේ හරි තැනකින්වත් අපේ ගෙදෙට්ට ෆෝන් කරා නම් මොකෝද ? ඕන් ! අංජලීගෙ ගෙදරවත් තියෙන තැන දැනන් හිටිය නම්, ගේ ගාවට ගිහින් වහලට ගල් ගෙඩියකින්වත් පත ඩාල හිත සනසගන්න තිබුණා. මං මෙච්චර කල් පුස් ලූරා වගේ මැට් වැඩම කරා මිසක සත පහක වැදගත් දෙයක් කරල නෑ. අද වෙනකං මං ශහනාස් ඉන්නෙ කොහෙද, අංජලී ඉන්නෙ කොහෙද කියල දන්නෙත් නෑ. ඒත් ඌං දෙන්නම දන්නව මං ඉන්න තැන. නොදන්නිං මං. මායි මගෙ මොළෙයි දෙකම තකට තක. අනේ දෙයියන්ටවත් මේව පේන් නැති හැටි.

"... මොකෝ බං... මේ...? පිස්සු බල්ලෙක් කාල වගේ...?"

මං හොඳට ඇස් දෙක පිහිදාල බැලුවා. ශ්‍රී රාජ්‍ය මගේ සෝක ගීතෙ දෙයියන්ට ඇහිල වගේ. ඒකනෙ මූව එවල තියෙන්නෙ.

"... ඈ... බං මද්දුව කිව්වෙ, උඹ ජම්බු ගහෙන් වැටිල කියලා..."

මූ හදන්නෙ මගේ අර්ශස් වැඩි කරන්න. ඕවට අනුවෙයි මං,

"අඩෝ, පිස්සු කෙලින්නෙපා. මං මේ සිරාවටම අප්සට් එකේ ඉන්නෙ බං... උඹ මේ ජම්බුවක් ගැන කතා කරනවා..!

ගෙහණ සිරා මූඩ් එකෙන් මං කතා කරා. නැත්තං ඉතිං බීරි අලියන්ට මෙලෝඩිකා ගහනව වගේ තමයි. රාජ්ගෙ ලොකු ඇස් දෙක හීනි වුණා. ඒ කියන්නෙ දැන් මූ මං කියන දේවල් අහන්නයි සෙට් වෙන්නෙ. අංජලීට නුගේගොඩ එන්න කියපු දවසෙ සිද්ධ වෙච්ච දේවල් මං අකුරක් නෑර රාජ්ට කියල දැම්මා. ඒත් මං හිතුවෙ නැති විදියට රාජ්ගෙ මූඩ් එක අප්සට් ගියා. ටිංගක් වෙලා බර කල්පනාවෙක වගේ ඉඳල රාජ් කතාකරන්න ගත්තා. ඒත් ඌ කතා කරේ අංජලී ගැන නෙමේ, ශහනාස් ගැන.

"...මං ඊයෙ 'ෂබී' ලෑ දිහා ගියා මචං. ඒත් ඒකි කාමරෙන් එළියටවත් ආවෙ නෑ. උඹයි ෂබියි අතරෙ මෙච්චර හරියක් වුණා කියලත් මං දැනන් හිටියෙ නැනෙ... පව් බං..! මට තේරෙන විදියට ෂබී ට ගෙදර හැමෝම බනිනවා, 'නියාස්'ට කැමති වෙන්න කියලා. ඒත් ඒකි ඌව තඹ සතේකට මායිම් කරන් නෑ. ඊයෙ ෂබීලගෙ අම්මත් ටිකක් කියෙව්ව මං එක්ක.. ඌංගෙ අම්ම දන්නෑ උඹයි ෂබියි අතරෙ තියෙන කතන්දරේ..! ඒකි මෙච්චර උඹට කැමති උඹ ඒකිට හුනියමක්වත් කරාද...?"

ඌ එහෙම අහල හිනාවුනත් ඒ හිනාවට යටින් ලොකු කතාවක් තියෙන විත්තිය මට තේරුණා. මං උගෙන් ඒ ගැන අහන්න හැදුවත් ඊට

WWW.SINHALAELIBRARY.COM 48

නලින් ඌ කතා කරා.

"...ඔයි ගැන උඹට පස්සෙ කියන්නම්... ඊත් උඹ කියාපු අංජලීගෙ ස්ටෝරියට, මටත් ඕංගොත් විතර සෙට් වෙන්න පුළුවන්... මචං...! උඹ ඔය කියන දවසෙ මාත් හිටියෙ නුගේගොඩ තමයි... උඹ බොරුවට අංජලීට කිව්වනෙ, මං උඹට ෆෝන් කරා කියලා, නුගේගොඩදී ඒකිව දැක්ක කියලා. ඒත් ඇත්ත ඒකම තමයි... මාත් අංජලීව දැක්කා... හැබැයි තනියම නෙමෙ ඒකි හිටියෙ...!"

ශ්‍රී රාජ්ගෙ කතාවට මගෙ පපුව ගැහෙන ස්පීඩ් එක ඩබල් වුණා. මං රාජ් ළඟට ගිහින් උගේ උරහිස් දෙකෙන් අල්ල ගත්තා. උගේ කටින් පිටවෙන වචන ගිල ගන්න වගේ මං රාජ්ගෙ මූණ දිහා බලන් හිටියා.

## 22

ඒත් ඕංගොත් වෙලා යනකන් රාජ් මං දිහා බලන් හිටිය මිසක මුකුත් කිව්වෙ නෑ.

"... දැන් කියන්න ගියපු එක කියපං රාජ්... මං දන්නවා... මං දන්නවා... උඹ හිතන්නෙ මං අප්සට් වෙයි කියල නේද...? නෑ... ඕන දෙයක් මට දරාගන්න පුළුවන්... උඹ කියපං..."

මං හුඟක් කලබල වෙලා කියල මටම තේරුණා. ඒත් මේ පැටලිච්ච නූල් බෝලෙ කොන කොහේ හරි තියෙන්න ඕනනෙ..!

"...ඕං මං අංජලීට ගරු කරා විහඟ... මොකද ඒකි උඹේ පස්සෙන් ආව විදියට වෙන කිසිම කෙල්ලෙක් එන්නෑ... ඒකි උඹට ආදරෙයි කියලත් මං දැනන් හිටියා... ඒකයි මං...."

"...ඕට මීට එපා රාජ්... එදා වෙච්ච දේ කියපං... උඹ දැකපු දේ කියපං..."

රාජ්ගෙ කතාව මැද්දෙම මං ආයෙත් පැන්නා. මගේ කටහඬ මටම පාලනය කර ගන්න බැරි තරමට වෙව්ලනව කියල මට තේරුණා.

"...නෑ... නෑ... ඕංගොත් ඉඳපං... මේ කතාවට මේ ටිකත් කියල ඉන්න ඕනෑ... නැත්තං කතාවෙ අගයක් නෑ...!"

රාජ් ලොකු හුස්මක් ගත්තා. සුරංගනා කතාවක් අහගෙන ඉන්න පොඩි එකෙක් වගේ මං උගේ මූණ දිහා බලන් හිටියා.

"...ඔයිදි, අංජලියි කියන්නෙ දෙන්නෙක් මචං... ඔයි මගේ ජාතියෙ කෙල්ලෙක් වුණත්, උඹ හොඳටම දන්නවා මං ලකුණු දුන්නෙ අංජලීට කියලා... ඒත්... ඒත් ඔය කියන දවසෙ මං දැකපු අංජලී ගත්ත 'ස්කෝර්' එක බිංදුවයි මචං..."



"...හතර බීරි කතා කියන්නෙපා යකෝ.. සිංහලෙන් කියාගන්න බැරි නම් දෙමළෙන් හරි කියපං... මොකද එදා වුණේ..?"

මට තදවුණා. ඇයි යකෝ..., මං මෙහේ කෙලවෙලා ඉන්නවා. මූ අනුශාසනා කරනවා.

"...අර වෙනද එන රතු කැබ් එකේ අංජලී ජෝඩු දාගෙන ගියා බං හෙන සිරා කොල්ලෙකුත් එක්ක... හරියට ගෑනියි මිනිහයි යනව වගේ ගියේ..."

මගේ හිත පුපුරල ගියා වගේ දැනුණා. පපුව ගැහෙන වේගෙ නෝමල් වුණා. මං මේ වගේ දෙයක් කවදාවත් බලාපොරොත්තු වුණේ නෑ. මගේ හිත මට කිව්වා... හිතාගන්න බැරි තරම් ඉක්මනට මගෙ ඇස්වලට කඳුළු ආවා. මං කවදාවත් ඔයා ගැන හිතපුව මේ විදියට සිද්ධ වෙවි කියල හිතුවෙ නෑ අංජලී...!

"... උඹ... උඹ ඔය ඇත්තටමනේ කියන්නෙ...? මං... මං දන්නවා උඹ මගෙ ආදරෙත් එක්ක සෙල්ලම් කරන්නැති විත්තිය..."

මගේ කටහඬ බිඳිලා ගියා. අංජලී ගැන මතකය හිතේ ගැඹුරුම තැනේ ඉඳල ඇවිත් මාව හෙමින් සැරේ කොනිත්තන්න පටන් ගත්තා.

"අඩෝ... විහඟ... ප්ලීස් මචං... අප්සට් ගහන්න නම් එපා. මං මේ දවස් දෙක තුනේම කල්පනා කරේ මේක උඹට කොහොම කියන්නද කියලා... උඹට නොකියා ඉන්නත් බෑ... ඒත් දැන් කිව්වයි කියල වුණ හොඳකුත් නෑ. උඹේ මූණ දිහා බලපුවහම මං මේ ටික කිව්වෙ අපරාදෙ කියල හිතෙනවා බං..."

ඌ කියවං යනවා. ඒත් මෙලෝ දෙයක් මගෙ මීටරේට වැටුණෙ නෑ. හැමදේම අවුල් වෙලා කියල මට හිතුණා.

".... මට දැන් තේරෙනවා රාජ්... එදා අංජලී ෆෝන් එක තිබ්බෙ ඇයි කියලා...?"

රාජ්ගෙ මූණෙ කිසිම හැඟීමක ලකුණක් තිබ්බෙ නෑ.

"... මං එදා ඒකිට බොරුවට කිව්වනෙ උඹ මට ෆෝන් කරා කියලා. අංජලීව නුගේගොඩදී දැක්ක කියල... ඒකි හිතන්නැති ඉතිං හැමදේම මං දැන් දන්නව කියලා..." රාජ් ඔලුව වැනුවා.

"දැන් මොකෝ කරන්නෙ...?" මං උගෙන් ඇහුවා.

"පරණ දේම තමයි..."

"ඒ කිව්වෙ...?"

"ඒ කිව්වෙද...? ගඟේ ඉන්නෙ එක අලගොඩුවද බං... ඔය වැලි ගොඩවලත් නැත්තං දණ්ඩි පැටියෙක් අල්ල ගනිං..."

මූට හොඳටම පිස්සු. මූ කතා කරන්නෙ මාලු ගැන. හැබැයි ඉතිං කෙල්ලො කියන්නෙත් මාලු වගේ ජාතියක් තමයි බලන් ගියාම. කොහොම

වුණත් රාජ් හදන්නෙ මාව කූල් කරන්න කියනෙක මට තේරුණා. ඒත් හැමදේ දිහාවෙම හැමදාම විහිලුවෙන් බලන්න බෑ රාජ්... උඹට ඒක තේරෙන් නැද්ද ?

"රාජ්...?"

"මොකෝ බං...?"

"... මට තේරෙන් නැති දෙයක් තියෙනවා මචං...! අංජලී මට ළං වෙන්න හදනකොට මට හිතුණා ඒකිට ගණං උස්සන්න ඕන කියලා... මං ඒකිට ළංවෙන්න හදනකොට ඒකි මගෙන් ඈතට ගියා... අපි හිතමු ඒකිට තව කවුරු හරි ඉන්නව කියල...?"

ඒ වචන ටික කියවං යද්දි මට ගොත ගැහුනා. ඒ කියන්නෙ මගේ හිත එහෙම හිතන්නෙ කැමති නෑ...!

"මචි..."

"ඒත් මං එන්න කිව්වහම ඇයි ඒකි හා කිව්වෙ...? ඇයි මට මේ තරං ළං වුණේ...? ඇයි මට බලාපොරොත්තු දුන්නෙ...?"

"ඒක තමයි මටත් හිතාගන්න බැරි මචං... කෝම හරි අංජලියි ඒ පොරයි ඉඳපු කාලෙන් නම් මට සෙත සුවර් එකක් තියෙනවා ළං දෙන්න අතරෙ හුඟක් දුර දිග ගියපු සම්බන්ධයක් තියෙන විත්තිය..."

මොනව හරි දෙයක් ගැන රාජ් කවදාවත් නිකමට කියන්නැති විත්තිය මං දන්නන් හිටියා. ඒත් රාජ් විතරක් නෙමෙ වෙන කවුරු ඇවිල්ල වුනත් අංජලී දිහාට ඇඟිල්ලක් දික් කරන් මගේ හිත පිළිගන්නෙකක් නෑ කියල මට හිතුණා. ඒත් මගේ හිත මගෙන් ඇහුවෙ එක ප්‍රශ්ණයයි. ඒ අංජලී මට බොරු කිව්වෙ ඇයි කියලයි.

"හරි ! උඹ මට මොනවද කරන්න කියන්නෙ...? අංජලී ආයෙ ෆෝන් කරනකන් බලන් ඉඳල මේ හැමදේම අහන්නද...?"

"උඹට පයිත්තියන් ද බං... ඒකි කවද ෆෝන් කරාවිද කියල කවුද දන්නෙ...? අපි ඉස්සෙල්ල හොයාගමු ඒකි ඉන්න තැන... එතකොට ඔය සියලු රෝග නිවාරණයි...!

"අංජලී ඉන්නෙ කොහෙද කියල මං දන්නෑ රාජ්..."

"මෙ ලඟ හරියක පොල්ලක් තිබ්බ නම් අම්මප උඹේ කොන්ද කැඩෙන්න මං ගහනවා.. උඹ මෙච්චර දවසක් මොනවද බං කෙරුවෙ...? මන්න ඔය ටෙලිෆෝන් ඩිරෙක්ටර් එක ගනිං... අපි නම්බරේ දන්නවනෙ... ඔය නම්බර් අයිතිකාරයව හොයමු... එතකොට ගේම ෆිනිෂ්නෙ ලොක්කා..."

යකෝ... බලන් ගියාම මූගේ මොලේ තමයි මොලේ... මෙච්චර දවසක් මගෙ ඔලුවට ආවෙ නැති අයිඩියාස් මූට එන එකනෙ වැඩේ..! බලමු... බලමු... ඉතිං... මේ වැඩේවත් කරලා...



# 49

"මේක හරියන්නෑ බං...!"

එක දිගටම පැයක් විතර පණ දාගෙන හොයල හොයල කිසිම 'සක්සස්' එකක් නැති වුණාම මට කියැවුණා.

"ඔව්... ඉතිං... මට කහනවටනෙ මං මේ හොයන්නෙ...? මං හිතන්නෙ අංජලී ගැන ලවක් තියෙන්නෙ... අනේ මේ කුණුහබ්බ නාහ මට ප්ලේන්ටියක් අරන් වරෙන්... මං මේක තව හොයන්නම්..."

ඌ ඇස් දෙකත් ලොකු කරන් හොයද්දි මං කුස්සියට ඇවිත් තේ දෙකක් හදා ගත්තා. අම්මත් ගෙදර හිටියෙ නැති හින්ද මටයි තේ හදන්න වුණෙත්. තේ එක අරුට බොන්න පුලුවන්ද දන්නෑ...!

"ඈ බං... මේක ප්ලේන්ටියක් ද...? අරිෂ්ට කෝප්පයක්ද...? නැත්තං උඹ හිතේ තිබ්බ කහටත් තේ එකට හැලුවද...?"

තේ උගුරක් කටට අරන් රාජ් මගෙන් ඇහුවා. මට බකස් ගාලා හිනා ගියා. තව පොඩ්ඩෙන් මගෙ අතේ තිබ්බ තේ එකත් හැලෙනවා.

"මේ, සංසාර සාගරේ විගේ පොතක නම්බරයක් හොයනැහැකිද බං...?"

"ආ... ආ... ඩිංගක් ඉඳපං.. ඩිංගක් ඉඳපං... අයිඩියා එකක් ඈත එනවා..."

රාජ් එහෙම කියල තේ කෝප්පෙ මේසේ උඩින් තිබ්බා. සුවර් එකට කහට වැඩි හන්දා මූට තේ එක බොන්න බැරුව ඇති.

"අංජලීගෙ අක්කා ඉන්නෙ නුගේගොඩනේ...? උඹ පට ගාලා ඇඳුමක් දා ගනිං... අපි එහේ යමු..."

"ගිහින්...?"

"ගිහිල්ල කරන දේ එතනදි බලාගමු... යමං..."

මූ මොනව කරන්න හිතන් ඉන්නවද දන්නෑ. තවත් තොම්බරේ එකේ නාන පරිප්පුවක් සුවර් ඇන්ඩ් ෂොට්... කමක් නෑ... කැවොත් ඉතිං මූට බාගයයි මට බාගයයි නේ..."

බස් එකට නගිනකනුත්, තැගල ඉවර වෙලත් රාජ් කරේ අංජලීට බැනපු එකයි.

"බලපං... මං හිතුවෙ මේකි සිරාවටම අහිංසකයි කියලා..! ඇත්තටම මචං, ඔය කෙල්ලොන්ගෙ හැටි අපි කොහොමද බං දැනගන්නෙ...? බොෆ්ස්ක පලල බලන්නද... බැනේ...?"

"ඇංජලීට බනින්නෙපා රාජ්...! ඒකි අහිංසකයි..."

"ඒකද උඹට හෝප්ස් දීලා තව එකෙකුත් එක්ක රවුම් ගහන්නෙ... මගෙන් මුකුත් අහගන් නැතුව ඉඳපං... උඹ තව ඒකිව සුද්ධ කරන්නත් එනවා..."

රාජ්ට ඒ පාර නම් මළ පැන්නා. බලන් ගියාම අංජලි කරන වැඩවලින් මළ පනින්නෙ නැත්තෙ කාටද...?"

"විහඟ, මචං... ලබන මාසෙ වෙඩින්ස් දෙක තුනක්ම තියෙනවා. මේ පිස්සු කෙළිල්ල නවත්තල ඒවට සෙට් වෙමු.. තාත්තට උනන් හැමදාම රට ඉන්න බැනෙ බං. ඒ මනුස්සය මැරීගෙන හම්බ කරන්නෙ කාටද... උඹලටනෙ... ඇයි උඹ ඒ සයිඩ් එක ගැන හිතන් නැත්තෙ...?"

මූ කියන ඒවා සීයට දෙසීයක්ම ඇත්ත. මටය කියලා දෙයක් තියෙන්න ඕන... ඒත් අංජලී...?

"බලපං... මද්දුව කොයි තරම් ඩීසන්ට් විදියට ඉන්නවද කියලා..."

"ඩීසන්ට්... උගෙ ඩීසන්ට එක රෙද්ද පල්ලෙන් බේරෙන්නෙ පූජනී ගැන අම්මට කියන්න ගියාම... බලපංකෝ..."

"ඇයි බං උඹමනෙ කිව්වෙ පූජනී ගැන අම්මට කියනව කියලා මද්දුව 'ප්‍රොමිස්' වුණා කියලා..."

"කිව්ව නම් තමයි... ඒත් කොහොමද බං කටක් ඇරල අම්මට ඔය ගැන කියන්නෙ...?"

කතාවෙන් කතාවෙන් ඌයි මායි නුගේගොඩට ආවා. කලින් දවසක ආපු හන්දා අංජලීලගෙ අක්කගෙ ගෙදර හොයා ගන්න ඒ තරම් අමාරු වුණේ නෑ. ඒත් ඉතිං පණ්ඩිතයා වගේ කතා කරන්නම් කියල රාජ් ආවට මට තමයි කතා කරන්න වෙන්නෙ. මූ අම්පයර් වගේ බලන් ඉඳියි.

"මේකද ගෙදර...?"

"හ්ම්....?"

"මේක ගෙයක්ද බං... මාලිගාවක්ද...?"

ගෙදර දක්කහම රාජ් කොර වුණා. බෙල් එක ඔබල ඩිංග වෙලාවකින් ඉස්සරහ දොර ඇරුණා. අපි දෙන්නගෙ මූණ වල් ඉස්සරහ හිටියෙ අංජලීගෙ අක්කා.

"ඇ...යි...?" අපිව දැක්කහම එයා ඇහුවා.

"මා... මාව මතකද දන්නෙත් නෑ. මං එදා ඔයාගෙ බබාගෙ ෆොටෝස් ගන්න අංජලීත් එක්ක ආවෙ..."

"ම්... ඔව්... ඔව්... මට ටිකක් මතකයි මල්ලි... ඔයාගෙ ෆොටෝ ටික නම් ෂෝක් අනේ... එන්න ඇතුලට වාඩිවෙන්න..."

ගේ ඇතුළට ඇවිල්ල මොනව කරන්නද ? අඩුගානෙ අංජලීවත් ගේ



ඇතුළෙ හිටිය නම් එන්න තිබුණා. අංජලී ගැන කෙලින්ම අහනවද ? රාජුත් ගල් හිලල වගේ බලන් ඉන්නවා. මං ඌ දිහා බැලුවා... උඹට තේරුණා මං හිරවෙලා කියලා. උගුර පාදල මෙම ඌ කතාව පටන් ගත්තා.

"වාඩිවෙන්න නම් වෙලා නෑ අක්කා... අපේ ෆොටෝස් වගයක නෙගටිව්ස් ටිකක් අංජලී ගාව... අපිට එයාගෙ ඇඩ්‍රස් එක දුන්නොත් ඒ ටික අරන් එනෑකී..."

යකෝ බලන් ගියාම මූනෙ මිනිහා... ඇගේ පනේ ගැවෙන්නැති වෙන්න මූ ඒ ටික දෙසා බාපු හැටි.

"එහෙනම්, චුට්ටක් ඉන්නකෝ මල්ලි.. මං ගෙනැත් දෙන්නම්"

අංජලීගෙ අක්කා ගේ ඇතුළට ගියා. රාජ් මට මාපාටැඟිල්ල උරුක් කරා.

"කෝමද මල්ලි ගේම...? ෆිට් තමයි නේ...?"

ඌ හිනාවෙනවා. විකකින් අංජලීගෙ අක්කා ඇඩ්‍රස් එක ලියාගෙන ආවා. මං ඒ කොල කෑල්ල සාක්කුවට දාගත්තා. තේ එකක් බොන්න කියලා එයා සැරදැර කරද්දී මායි රාජුයි එතනින් පැන ගත්තා.

"හප්පේ... ඇති යාන්තං.. දැන්වත් බලපං.. මීකි කොයි කුම්මුල්ලෙද ඉන්නෙ කියලා..."

ඌ එහෙම කිව්වහම මං වටපිට බලලා කොළේ දිග ඇරියා.

"කනතුඩුවෙ බං... පිස්සු හැදිලා හොඳවෙලා ආයෙත් හැදෙනවා බං..."

"මෙ... මේ... හෝමාගමින් යන්න තියෙන..."

රාජ් මගේ මූණ දිහා බලලා අහපු එකට මං මුකුත් කිව්වෙ නෑ. අංජලී ඇයි මට මෙහෙම කළේ කියන ප්‍රශ්නෙ විතරක් මගෙ හිතේ ඉතුරු වෙලා තිබුණා.

"ඔය ආයෙත්... තෝ බුම්ම ගත්තා. දැන් ඉතිං වැඩේ හරිනෙ යකෝ... මේ කරා වගේ ඉතුරු ටිකත් කරමු..."

"ඕන් නෑ කියල හිතෙනව බං... ඒකි මාව ගණන් ගන්නෙ නැත්තං....?"

"මාත් යනවනෙ බං. උඹට එහෙම වෙන්න මං දෙන්නෑ... ඕක ගැන වැඩිපුර නොහිතා යමං... අංජලීලගෙ ගෙදර ගිහින් කතා බහ කරලා හ මෙද්ම විසඳ ගමු... වරෙන්... දැන් ඇඩ්‍රස් එක තියෙනවනෙ..."

ඌ මගේ අතින් ඇද්දා. එතකොට අද මට අංජලීව හම්බ වෙනවා. ඊට පස්සෙ...???

WWW.SINHALAELIBRARY.COM 51

## 41

ඇඩ්‍රස් එකේ හැටියට ගේ හොයාගන්න මටයි රාජ්ටයි ඒ තරම් අමාරු වුණේ නෑ. අමාරුවක් නෑ කියන්නෙ අපි ගියේ ත්‍රී වීල් එකෙනනෙ. ඌ එළවං ගියා. අපිට තිබුණෙ වාඩිවෙලා ඉන්නනෙ. ටිකකින් පුංචි තාප්පෙකින් වටවෙලා තිබ්බ ගේ පොඩ්ඩක් ගාව ත්‍රී වීල් එක නතර වුණා.

"බොසා.... මෙතන තමයි නැන..."

මිනිහ එහෙම කිව්වහම මායි රාජුයි හනි හනිකට ත්‍රී වීල් එකෙන් බැහැගත්තා.

"වැරදුනා වත්ද බං...?"

මං රාජ්ගෙ මූණ දිහා බැලුවා. ත්‍රී වීල් එකට සල්ලි ගෙවල ඉවර වෙලයි රාජ් මං දිහා බැලුවෙ. දුමත් දාගෙන ත්‍රී වීල් එක ගියාට පස්සෙ ඌ මං ළඟට ආවා.

"ඒක තමයි මචං මාත් කල්පනා කළේ... අංජලීගෙ තත්වෙ අනුව මේ වගේ ගෙයක ඉදීවිද බං...? බලපංකො වාහනයක් වත් දාන්න ඉඩක් නැනෙ..!"

ඌ කියවං යන අතරෙ මං වටපිට බැලුවා. අපි හිටියෙ ගේට්ටුව ඉස්සරහම.

"ඊහඟ..?"

මං රාජ් දිහා ආයෙත් බැලුවා. උගේ මූණත් අප්සට ගිහින්.

"වරෙන්කො, අපි ටිංගක් එහාට යමු..."

ඌ මාවත් ඇදගෙන අංජලීලගෙ වත්ත කොනට වෙන්න වගේ ආවා. මූ මොකක්ද මේ කරන්න හදන්නෙ ?

"රාජ්... මේ...? අපි ආවෙ මචං අංජලී හම්බෙන්න... හම්බෙලා ඒකිට ආදරේ කියල යන්න. දැන් මෙතන වත්තෙ මුල්ලට වෙලා ගෙදෙට්ට එන මිනිස්සු ගණන් කරන්න හදනවද බං...?"

සමහරවිට මූට අපි ආපු කාරණේ අමතක ද දන්නෑනෙ. ඒකයි මං එහෙම ඇහුවෙ. ඒත් ඌ කරන්නෙ මට ගැළපෙන උත්තරයක් නෙමෙ.

"මී හරකෙක් වගේ කෑ ගහන්නෙපා බං... මං කියන එක ටිකක් අහපං. අංජලී අපිට පෙන්නුවෙ අමුතුම පොතක්... මට හිතෙන විදියට මෙතන ඉන්න අංජලී වෙනස්...!?"

මූ සමහර වෙලාවට කියන්නෙ මහාම මහ හතර බීරි කතා. ඒව තේරුම් ගන්න ඉතිං මූගෙත් එක්ක තියෙන "ෆ්‍රෙන්ඩ් ෂිප්" එක ලබන් ආත්මෙටත් දික්කර ගන්න වෙයි.



"...ඒ... ඒ කිව්වෙ...?"

මෙලෝ දෙයක් තේරෙන්නෙ නැති හින්ද මං උගෙන් එහෙම ඇහුවා.

"උඹ වගේම මාත් හිතුවෙ අංජලීට සෑහෙන්න සල්ලි තියෙනව කියලනෙ... ඒත් උඹ ටිංගක් හිතපං... මච්චර වාහන හෙම තියෙන මනුස්සයෙක් මේ වගේ පොඩි ගේක ඉදීවිද කියල... ඇයි උංගෙ අක්කගෙ ගෙදර සයිස් එක හෙම උඹට මතක නෙ...?"

බලං ගියාම ඌ කියන ඒව සීයට දෙසීයක්ම ඇත්ත.

"මෙතන මොකක් හරි හුවපටයක් තියෙනව රාජ්...!"

"ඒක තමයි යකෝ... මාත් කියන්න තටමන්නෙ...! ගේට්ටුව ගාව ඉඳල උඹට මෙතෙන්ට ඇදගෙන ආවෙත් ඒකයි... උඹ මොකද කියන්නෙ...? දැන් යමුද ගේ ඇතුළට...?"

රාජ් මගේ මූණ දිහා බලන් ඉන්නවා. මෙන්න මේ වගේ වෙලාවට සමහර ඈයො පණ්ඩිත වාක්‍යය දානවා... බුද්ධියට ඉඩ දෙන්න... හැඟීම්වලට වහල් වෙන්නෙපා කියලා...! ඒත් මේ වෙලාවෙ ඒක කරන්න බෑ... බුද්ධිය බූදු වෙච්චාවෙ. මං අද අංජලීව හම්බ වෙනවා. හම්බවෙලා මගෙ හිතේ තියෙන දේවල් ඔක්කොම අකුරක් නෑර ඒකිට කියනවා...

"මොනවද උඹ කල්පනා කරන්නෙ...? ගෙට යන්න බයයි වගේද ?"

ඌත් අහන්නෙ මැංටල් කතා තමයි... බයක් තිබ්බනම් මෙච්චර පරිප්පු තාගෙන අංජලීව හොයන් එනවද..?

ගේට්ටුවෙ කොක්ක පන්නගෙන මං, රාජ් එක්ක වත්තට ඇතුළ් වුණා. ඉස්සරහට මොනව වෙයිද කියන සැකය මගෙ හිත ඇතුළෙ ඩබල් එකේ රවුම් ගැහුවා.

"මං හිතන්නෑ, මේක අංජලීගෙ ගෙදර කියලා බං...! කෝම වුණත් අද අපිට දෙකෙන් එකක් බේර ගතෑකි..."

එහෙම කියල රාජ්, බිත්තියෙ තිබ්බ බෙල් එක එබුවා. ගේ ඇතුළෙන් දොර අරින්න පරක්කු වෙන තත්පරයක් තත්පරයක් ගානෙ මගෙ පපුව ගැහෙන ස්පීඩ් එක ඩබල් වුණා. තව ටිංගක් වෙලා යද්දි ඒ පුංචි ගෙදර ඉස්සරහ දොර ඇරුණා. මගේ ඇස් දෙක ඉස්සරහ හිටියෙ වෙන කවුරුවත් නෙමෙ...! මගෙ හිත හොරකම් කර ගත්තු පුංචි කෙල්ල. අංජලී...! මාව දැක්ක ගමන් අංජලීගෙ සුදු මූණ රතුපාට වෙලා ගියා. මං මගෙ හිතටත් හොරා ආදරේ කරපු ඒ පිං පාට ඇස් දෙක. අඩලමද කොහෙද රතුපාට වෙලා තිබ්බා.

"අ....අංජලී...!?"



බොහොම අමාරුවෙන් මගේ කටින් ඒ වචනෙ එළියට ආවෙ... ඒත් ඉස්සර දවස්වල මං දැකපු ආදරේ අද ඒ මූණෙ තිබ්බෙ නෑ...! සත්තරයා

ආවත් කියන්න තියෙන දේ කියනව කියල හිතන් ආපු මට ගොත ගැහුණා, ඒ මූණ දකිද්දි...

"...ඕ... ඔයා එදා නුගේගොඩ ඈ... ඇවිදිනුත්, ආවෙ නෑ කියල මට ලොකු බොරුවක් කිව්වෙ ඇයි උංගි...?! ඔයා... ඔයා දන්නවා මං... මං... ඔයාට කොයිතරම් කැමැත්තෙන් හිටියද කියලා. ඒ...ඒත් ඔයාට ෆෝන් කරන්නවත් විදියක් නෑ... ඔයා මට ෆෝන් කෙරුවෙත් නෑ... ඇයි...? ඇයි මට මෙහෙම කරන්නෙ උංගි...? මං ඔයාට කෙරුව වැරැද්ද මොකක්ද...?! මට ඒක විතරක් කියන්න උංගි... ප්ලීස්..."

දොරකඩ ඉඳගෙනම මං කියවං ගියා. ඒත් අංජලීගෙ මූණෙ කිසිම හැඟීමක් තිබුණෙ නෑ.. බිම බලාගෙනම ඉඳපු ඒ ලොකු ඇස්වලට කඳුළු එන්නපු වෙන හැටි මං දැක්කා.

"... මං... මං දන්නෑ උංගි. ඔයාට මං ගැන තියෙන්නෙ මොන විදියෙ හැඟීමක් ද කියලා... ඒත්... ඒත් දෙයියනේ..., මේ, මෙ රාජ් දන්නවා මං ඔයාට කොයිතරම් ආ....."

මගේ කටින් එළියට එන්න හදපු ඒ රත්තරං වචනෙ එළියට ආවෙ නෑ... මායි, අංජලියි, රාජුයි අතරට, හතරවැන්නෙකුත් අපි දන්නෙම නැතුව ඇවිත් තිබුණා.

"කවුද උංගි....?"

## 42

ගේ ඇතුළෙ ඉඳන් එළියට ආපු සිරා පොරක්, මගෙයි, රාජ්ගෙයි මූණ දිහා බල බලාම අංජලීගෙන් ඇහුවා. 'මූ මොකාද' කියල අහන්න වගේ මං අංජලී දිහා බැලුවා. ඒත් එයා හිටියෙ බිම බලාගෙන. මං ඒ පාර රාජ් දිහා බැලුවා. උගේ මූණ හතරැස් වෙලා.

"මූ... තමයි එදා අංජලිත් එක්ක නුගේගොඩදි ජෝඩු දාගෙන හිටියේ..!"

හිතෙන් වගේ රාජ් මගේ කනට කොඳුරනවා, ඊළඟ තත්පරේදි මට ඇහුණා. බිමට වැටුණු වීදුරු බෝලයක් කුඩුවෙලා ගියා වගේ, මගේ හිතත් ඒ තත්පරේදි කුඩු වෙලා ගියා.

ගේ ඇතුළෙ ඉඳන් ආපු පොර, අහපු ප්‍රශ්නෙට අංජලීගෙන් උත්තරයක් හම්බවුණේ නෑ. ඒ පාර මිනිහ, මායි රාජ්වයි දිහා කන්න වගේ බැලුවා. රාජ් මට හෙමින් කියපු වචන සෙට් එක, මගේ හිත පුදුම විදියට අසරණ කරල තිබුණා. ඒත් මේ වෙලාවෙ කතා නොකර හිටියොත් මායි, රාජුයි දෙන්නම අමාරුවෙ කියල මට තේරුණා.



"....අපි... අපි අංජලීගෙ යාලුවො... අපි එයාව හම්බෙන්නයි ආවෙ...!?"

මං කෙලින්ම කියලා දැම්මා. 'මූත් කතා කරන්නෙපා යකෝ' කියල කියන්න වගේ රාජ් මගේ අතින් ඇද්දා. මගේ ටෝක් එකට අර පොරගෙ මූණ කළුවෙලා ගියා.

"...මෙයාල තමුසෙගෙ යාලුවොද උංගි...!?"

කසාද ගෑණිගෙන් අහනව වගේ පොර ඇඟිල්ල දික්කරල අංජලීගෙන් ඇහුවා. මෙතන මේ වෙන්න යන්නෙ මොන වගේ සීන් එකක් ද කියල හිතාගන්න බැරි වෙලයි තිබ්බෙ මට. ඒත් මිනිහ අහපු ප්‍රශ්නෙට උත්තරයක් අංජලීගෙන් හම්බවුණේ නෑ. එයා හිටගෙන ඉඳපු තැන සිමෙන්ති පොලවෙ වතුර බිංදු වගේ වැටිල තියෙන පැල්ලම් දක්කහම මට තේරුණා අංජලී අඬනව කියලා. ඒත් ඇයි එයා කතා නොකරන්නෙ ?

"...මගෙ යකා අවුස්සන්නෙ නැතුව මට කියනව උංගි... මේ දෙන්න කවුද...!? මේ දෙන්නත් එක්ක තියෙන සම්බන්ධෙ මොකක්ද...!?"

ඒ පාර පොර, අංජලී ළඟටම ඇවිල්ලා ඇහුවා. මට ඒ වෙලාවෙ ආවෙ පුදුම කේන්තියක්. පිපිරෙන්න ඇවිල්ල තියෙන කේන්තිය මං ඉවසන් හිටියෙ බොහොම අමාරුවෙන්. මූ මොකා වුණත් කමක් නෑ... අම්බානක දෙනවා මාසයක් විතර හොස්පිටල් ඇඩ්මිට් වෙන්න. මං එක හිතින්ම හිතා ගත්තා. ඒත් මට කලින් රාජ් ඉස්සර වෙනවා මං දැක්කා.

"... මෙ මිස්ටර්... ඔයා කවුරු වුණත් අපිට කමක් නෑ. අපි ඉස්සෙල්ල කිව්වෙ අපි අංජලීගෙ යාලුවො කියලා... ඒක ඇහුනෙ නැද්ද...!?"

රාජ් කිව්ව එකට අරූ කෝර වෙලා ගියා.

"...මං තමුසෙට බූලත් දුන්නෑ හලෝ... තමුසෙ කටපියන් ඉන්නවා. මං මේක අංජලිත් එක්ක බේර ගන්නම්..."

ඌ කෝර වුණාට, උගේ උත්තරේ හැරෙන තැපැලෙන් ආවා. ඇට්ටි හැලෙන්න වයින් වෙලා තිබ්බ මාව වැඩ කරන්න ගත්තෙ ඒ වෙලාවෙ...

"...තමුසෙගෙන් අපි බූලත් ගන්නෙ නෑ හලෝ.... අපි ආවෙ අංජලීව හම්බෙන්න... තමුසෙත් එක්ක අපිට කතාවක් නෑ... හරිද...?"

මං දුන්නු ටෝකට උගේ මූණ අඹුඹු වෙලා ගියා. අපේ සද්දෙද ඇහිලද කොහෙද ගේ ඇතුලෙන් මැදිවියේ ගෑණු කෙනෙක් එළියට ආවා. අංජලීගෙ මූණට හුගක්ම සමානකම් තිබ්බ ඒ මූණ අංජලීගෙ අම්මා වෙන්නැති කියල මට හිතුණා.

"...ඈ... ඇයි... මේ කෑ ගහන්නෙ... මොකද මේ...!?" මොකක්ද මෙතන වෙලා තියෙන්නෙ...?"

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 53

අපේ මූණවල් දිහා මාරුවෙන් මාරුවට බලන ගමන් ඒ ගෑනු කෙනා ඇහුවා.

"....අ... අනේ.... අ... අම්මා....!"

අංජලී ඒ ආපු ගෑණු කෙනාට තුරුල් වෙලා හොඳටම අඬනවා මං දැක්කා. මං මයාව අඬවන්න හිතාගෙන ආවෙ නෑ උංගී...

"...ඇටේ... මං නොකිව්වයි කියන්නෙපා... මං මේක ලේසියෙන් අතාරින්නෙ නෑ... මූං දෙන්න කවුද කියල කියනකන් මං උංගිට ගෙයින් එළියට බහින්න දෙන්නෑ..."

අර පොර කෑ ගහගෙන වගේ එහෙම කියාගෙන මායි රාජුයි ඉස්සරහට ආවා. මූ අතක් හරි ඉස්සුවොත් 'නැව් ගානට' දෙනවා කියල හිතාගෙන මං අත්දෙක ගුලි කරගත්තා. මගේ ඉස්සරහට ඇවිල්ල මගේ මූණට එබිල මිනිහා ආයෙමත් අංජලී දිහා හැරුණා.

"...මෙයාල... මෙයාල.... ම... මගේ කවුරුවත් නෙමේ ක්‍රිෂාන් අයියෙ... මං... මං මේ දෙන්නව අඳුනන්නෙ නෑ..."

ගොත ගගහ වගේ හීන් සද්දෙට අංජලී කියවගෙන යනවා මට හීනෙන් වගේ ඇහුණා. හිත උඩම අකුණු එක පිට එක පිපිරෙද්දී මට 'උංගී' කියල කෑ ගැහුණා.

"...ඔ... ඔයා... මා... මාව වත් අඳුන්නනෙ නැද්ද උ... උංගී...!?"

මං අංජලීගෙන් එහෙම අහද්දී මගේ කටහඬ බිඳිල ගියා... රාජ්ගෙ මූණත් වෙනස් වෙනවා මං දැක්කා.

"නෑ... නෑ... මං... මං ඔයාලව අඳුනන්නෙ නෑ... කරුණාකරල අපිට කරදර කරන්නෙපා..." කිසිම හැඟීමක් නෑ වගේ අංජලී කියවං ගියා.

"ඇහුණනේ... දැන් ඉතිං නම්බු තියාගෙන පලයල්ල... හැබැයි මීට පස්සෙ උංගී පස්සෙන් ඇවිල්ල තිබුණොත්... ඊතත් මං බලාගන්නම්..."

බලු හිනාවක් මූණට දාගෙන අර පොර සිංහය වගේ අපි දෙන්නට කිව්වා.

"... කියපුව නම් හොඳට ඇහුණා ලොක්කා... අපි මේ වැරදි ගේකට වගේ ඇවිත් තියෙන්නෙ... කමක් නෑ... අපි වෙනින් ගෙදරකට ට්‍රයි කරල බලන්නම්."

එහෙම කියල ඉවර වෙලා 'දැන් යමං' කියන්න වගේ රාජ් මං දිහා බැලුවා. 'ඇයි උංගී, මට මෙහෙම කරේ' කියල අහන්න මං අංජලී දිහා බැලුවත්, එයා අම්මට තුරුල් වෙලා හිටියා මිසක මං දිහා බැලුවෙ නෑ. මගේ පුංචි ලෝකෙට එක තත්පරේකදී කඩන් වැටුණ වගේ මහා වේදනාවක් හිත ඇතුලෙ කැකෑරී උඩට ආවා. අංජලීලගෙ ගේට්ටුවෙ යතුර කොක්ක ආපහු තිබ්බ විදියටම දාල මං රාජ් දිහා බැලුවා. ඌ පුහුම වෙලා වගේ මං දිහා බලන් හිටියෙ.



"...ඕ... ගෝඩ... උ... උඹ අඬනවා වි... විහඟ...!?"

හින්දර වගේ කඳුළු කැට කම්මුල දිගේ බේරිල යද්දි, "නෑ" කියල කියන්න වගේ මං ඔලුව වැනුවා.

"...ම... මට ක... කවදාවත් මෙ තරම් දුකක් හිතට දැනිල නෑ රාජ්... ම... මං හිටියෙ... හු... හුගක් සංතෝෂයෙන්. මගේ ඒ සංතෝෂය අංජලී එහෙම පිටින්ම උදුරල ගත්තා රාජ්...!"

"... උ... උඹේ දුක මට තේරෙනවා විහඟ... ඒත් ඒත් උඹ ඉල්ලන්නෙ අංජලීගෙ ආදරේ...? මං ගාව තිබුණ නම් මගේ බොක්ක පලල හරි උඹට ඒ දේ දෙනවා. මං මොනවද කරන්න ඕන කියල මට කියපං විහඟ... ඌං දෙන්නව මරල එන්නද ? උඹ කියනව නම් මට ඒක බැරි කමක් නෑ...!"

මගේ අත තද කරල අල්ලගෙන රාජ් කියවන් ගියා.

"... එහෙම කරා කියල මට උංගිව හම්බෙන්නෑ රාජ්... මං හිතන්නෙ, උංගිට මාව ලස්සන මදි වෙන්නැති...! උංගි හිතන තරම් මට සල්ලි නෑ... එයා ප්‍රාර්ථනා කරන්නෙ ඒ දේවල් වෙන්නැති රාජ්...! ඒත් ඇයි එයා මාව මේ තරම් දු... දුරකට එක්... කන් ආවෙ...!?"

ආයෙත් පාරක් ඇස් වලින් කඳුළු පොදි උතුරද්දී මං මගේ අතිජාත මිත්‍රයාගෙන් ඇහුවා. ඒත් මගේ ප්‍රශ්ණෙට උත්තරේ ඒ රත්තරං මූණෙ තිබුණෙ නෑ...!

## 43

තවත් දවස් ගානක් ගෙවිල ගියා. ඉස්සරහට කරන්න ඕන මොන දේද කියල හිතාගන්න බැරුව මං අතරමං වෙලයි හිටියෙ. ගේ ඉස්සරහ මල් වැට ගාව ඉඳගෙන මං පාර දිහා බලන් හිටියෙ අරමුණක් නැතුව. මං පිටිපස්සෙන්ම මගේ කැමරා එක පිහිද පිහිද රාජුත් වාඩි වෙලා හිටියා.

"....රාජ්...!?!"

කැමරා එකත් අතේ තියාගෙන රාජ් මගේ ඉස්සරහට ආවා.

"... උඹට මතකද උඹ දවසක් කිව්වා. අපේ තාත්තා ගැන...! තාත්තා දුක් මහන්සියෙන් හම්බ කරන්නෙ..., මද්දු ගෙන වීසන්ට විදියට ඉන්නවය..., මං තමයි පිස්සු කෙළින්නෙ කියලා... ආ...!

"මං එහෙම අහපුවහම උගේ ඇස් දෙක ලොකු වුණා.

"....මං ඒක නිකං කිව්වෙ බං... උඹ ඒක සිරාවටම අරගත්තද...?"

මගේ දිහා බලාගෙනම රාජ් ඇහුවා.

"... උඹ කිව්වෙ ලොකු ඇත්තක් රාජ්... මං මේ දවස් ටිකේම

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 54

කල්පනා කරේ ඒ ගැන... මට... මට හිතෙනව බං තාත්තා ගාවට යන්න..."

"මොං... මොකක්...!? උඹ... උඹ රට යන්න...?"

රාජ්ගෙ ඇස් දෙක ඒ පාර තලලටම ගියා.

"...ඒ... ඒ... ආයෙ කියපං බලන්න... මං හිතුවා... මං හිතුවා... උඹ අන්තිමට කැරකිලා කැරකිලා ඔතෙන්ට තමයි එන්නෙ කියලා..."

"... උඹට තේරෙන්නෙ නෑ රාජ්..."

"... ඔව්... ඉතිං මටනෙ තේරෙන්නෙ නැත්තෙ... ඇයි යකෝ... උඹට මතක නැද්ද අංජලී පුද්ධ සිංහලෙන්ම කිව්වා, උඹවවත්, මාවවත් දන්නැ කියලා.... ඉතිං තවත් අහවල් කෙංගෙඩියකටද ඒකි ගැන හිතන්නෙ...?"

"... උඹට ඔහොම කියන්න පුලුවන් රාජ්... ඒත් උඹත් මගේ තත්වෙ හිටියනම් උඹට තේරේවි මගෙ හිතේ තියෙන්නෙ කොයි තරම් ගින්දරක් කියලා... මගේ හිත කැඩිලා රාජ්... මගේ හිත කැඩිලා...!!"

හිත ඇතුලෙ තිබ්බ වේදනාව මං එකපාරටම එළියට දැම්මා. රාජ් ගැස්සිලා ගියා.

"මං දන්නෑ... මට කියන්න තේරෙන්නෙ නෑ රාජ්... උඹවත් මට කියපං ඇයි අංජලී මෙහෙම කරේ කියලා... මං ඒකිට කරපු වැරැද්ද මොකක්ද... ආදරේ කරපු එකද රාජ්...!?"

"උඹ කියන හැමදේම මට තේරෙනවා විහඟ...! ඇත්තටම උඹ ඒකි ගැන හිතුවා වැඩියි බං... ඒකි තවත් එක කෙල්ලෙක් කියල විතරක් ... හිතුව නම්, උඹේ හිතට ඔය තරම් දුක දැනෙන්නැ බං...!?"

"උඹට කියන්න නම් පුලුවන් රාජ්... ඒත් ඒකි මට මෙහෙම කරේ ඇයි...? ආදරේ කියන ලස්සන දේ ළඟටම මාව ඇදගෙන ඇවිත් මාව අතෑරල දම්මෙ ඇයි...?"

"ඔය ප්‍රශ්නෙට උත්තරේ මං ගාව නෑ බං.... මං උඹෙයි ඒකිගෙයි ප්‍රශ්නෙ හිතන්න ගන්නෙ උඹේ පැත්තෙ ඉඳල නෙමේ..."

"එහෙනම්...!?" මූ මොනවද මේ කියන්න යන්නෙ...?"

"උඹල දෙන්න මැද්දට ආපු අර හාල්පාරුවා කවුද කියලයි මං කල්පනා කරන්නෙ...! ඌ ඉන්නෙත් අංජලීලගෙ ගෙදර... ඌ හැසිරෙන විදියත් උඹ දක්කනෙ... ඒකිගෙ අම්මත් ඌ ඉස්සරහ සයිලන්ස් වුණා... අනිත්තෙක ඌ අංජලීගෙ අම්මට කතා කරේ ඇන්ටි කියලා..."

රාජ් කතාව නවත්තල කල්පනා කරන්න ගත්තා. මගේ ඔලුවට නම් මොලෝ දෙයක් එන්නෑ... හිතන්න හිතන්න හැමදේම අගක් මුලක් නැති විදියට පටලැවිල තිබුණා...

"එක්කො... ඌ දැනටමත් අංජලීව මැරි කරලා. එහෙමක් නැත්නම් වෙන මොකාක් හරි ලොකු අවුලක්..."



'අංජලී මැරි කරලා' කියන කතාව රාජ්ගෙ කටින් පිට වුණාට ආයෙමත් මගේ හිත පිච්චිල ගියා... මොන දේ උනත් ඒ වචන ටික අහන්න මගේ හිත සූදානම් නෑ කියල මට හිතුණා.

"අනිත්තෙක බං... මට තේරුණ විදියට ඒකි දුන්නෙ සිරාම සිරා ගරු රඟ පෑමක්... අර ක්‍රියාන් කියන එකා අහපු එකට ඒකිට දෙන්න උත්තරයක් තිබුණෙ නෑ. මොනා වුණත් ඒකි ඩම් වුණා දොර ඇරියනම... ඇයි අපි දෙන්න මූණට මූණ හම්බ වුනානෙ... ඒකිට හිතෙන්නැති පේරම හොර එළි වුණා කියල..."

උගේ කතාවට මං මුකුත්ම කිව්වෙ නෑ. මොකද මං හොඳටම දනන් හිටියා මේ වෙලාවෙ කවුරු මොනව කිව්වත් මගේ හිත හැදෙන්නෑ කියලා. වෙන්න තියෙන දේවල් ඔහේ වුනාවෙ කියල හිත හදාගන්න බැලුවත් මට ඒක බැරි වුණා.

"මද්දුට උඹ ස්ටෝරිය කිව්වෙ නැද්ද...!?"

මං රාජ් දිහා බැලුවා.

"ඌට හොඳටම වැඩ බං... එන්නෙත් රෑ වෙලා. උදේ පාන්දරම ගෙදරින් යනවා. පූජනීගෙත් මොනවාදෝ ප්‍රශ්න වගයක්ලු... පූජනීගෙ හස්බන්ඩ් තාමත් කොතුලු... ඉතිං මං ඌට කරදර කරන්න හිතුවෙ නෑ බං...!"

මං ඒ ටික කියල ඉවර වෙනවත්තෙක්කම වගේ තමයි අම්මා අපි දෙන්නා ඉන්න තැනට ආවෙ. මං අම්මා දිහා බැලුවා. අම්මගෙ මූඩ් එක නම් ඒ තරම් හොඳ නෑ. රාජ්ටත් ඒක තේරුණා වගේ. ඌ උගේ අතේ තිබ්බ කැමරා එක මට දුන්නා.

"දෙන්නම ඩිංගකට ගේ ඇතුළට එන්න..."

එහෙම කියල අම්මා ආපහු ගේ ඇතුළට ගියා.

"මොකෝ බං ඇන්ටි කවදාවත් නැතුව...?"

රාජ් හොල්මං වෙලා ඌට වැඩිය මං හොල්මං... ඒ පාර මොකක්ද මේ බාල්දිය ? නැවතිලා වගේ තිබ්බ හාට් එක තත්පරේට දෙසීය ගානෙ විතර වැඩිවෙන්න ගත්තා.

"ෂුවර් එකටම අවුලක්...! ආයෙ දෙකක් නෑ...! වරෙන් ගිහින් බලමු..."

අංජලී ගැන හිතපු දේවල් හිත පතුලටම දාලා මං රාජ් එක්ක ගෙට ආවා.

"මං ඔයා ගැන තියන් ඉඳපු විශ්වාසෙ ඔයා බින්දා පොඩී... මේ රටේ ලෝකෙ කෙල්ලො නැතුවටද ඔයා බැඳපු ගෑනියෙක් එක්ක යාලු වුනේ...?!"

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 55

සාලෙ සැටියෙන් වාඩිවෙන්න හම්බ වුණේ නෑ... ලෝකෙ පෙරළෙනව වගේ අම්මා කියවන් ගියා. ඒ පාර මොකක්ද යකෝ මේ වෙලා තියෙන්නෙ ?"

"අම්මා... කි... යන දේ... දේවල් මට තේරෙන්නෙ නෑ..." මං යන්තං ඒ ටික කියා ගත්තා. රාජුත් අඹ්බානක බයවෙලා.

"බොරු කියන්න නම් ලෑස්ති වෙන්නෙපා පොඩී.. ඔයා හිතුවෙ මං ගෙදරට වෙලා ඉන්න හන්ද මුකුත් දන්නෑ කියල නේද....? ඒ වුණාට මං හැමදේම දන්නවා... රාජුත් ඉන්නෙක හොඳයි මෙතන...!?" අම්මා කියවගෙන යනවා.

"...න්...නෑ... අම්මා... බැඳපු කෙනෙක් එක්ක මගේ සම්බන්ධයක් නෑ..." මං බොහොම අමාරුවෙන් කියාගත්තා.

"... එහෙනම්... කවුද මේ...!?"

එහෙම කියල අම්මා සැටියෙ කුෂන් එක යට තිබ්බ පිංතූරයක් මායි රාජුයි දිහාට දික්කරා. ෆොටෝ එකේ හිටියෙ වෙන කවුරුවත් නෙමේ පූජනී..!

## 44

අනේ, සබ්බ සකලෙට අධිපති සුද්ද සීවරං දෙයියනේ... මේ මොන ගල්කොප්පියක්ද අප්පේ ඔලුවට පාත් වුණේ...? හැබුකෙටම කෙලවිලා ඉන්න මට තවත් මෝටර් එවන්නෙ ඇයි කියල අහන්න වගේ මං උඩ බිම බැලුවා...

"කතා නොකර ඉඳල ප්‍රශ්නෙ මගාරින්නෙපා පොඩී... මං ඔයාව හැදුවෙ කොයි තරම් ආදරේකින්ද කියල ඔයා දන්නවා. ඒ ආදරේට සයින් ගහල, ඔයා මේ කරපු දේ ගැන මට ඔයාගෙ කටින්ම දැනගන්න ඕන..."

ඕං... දන් දීපංකො උත්තර... මං රාජ් දිහා බැලුවා. පොල් කෝම්බයක් උගුරෙ හිර වෙච්ච එකෙක් වගේ ළා බලං ඉන්නවා. උගේ ඇස් දෙක නලලෙ..! වෙන වෙලාවක නම් මූ දන්න කියන මහප්‍රාණ ඔක්කොම දෙසනවා. දන් හුම් ගාන්නැතුව උගුඩුව වගේ මූ ඉන්න හැටි... අනේ කුණු මද්දුවෝ මාව බේරගනිං...!

"පොඩී...? මාව කේන්ති ගස්සන්නෙපා... ඔයා දන්නවනෙ කේන්ති ගියාම මගේ හැටි..! ගොළුව වගේ ඉන්නැතුව කතා කරනව පොඩී... මේ කවුද කියල මට දැනගන්න ඕන...!"

අම්මා පූජනීගෙ ෆොටෝ එක ස්ටූල් එක උඩට අතෑරියා.

"...එ... එයාගෙ න... නම පූජනී, අ... අම්මා..."



මං චූටි ඩොක්ටර්ගෙ නම කියල අම්මා දිහා බැලුවා. අම්මා හිටියෙ රාජ් දිහා බලාගෙන.

"මං දන්නෑ රාජ් පුතා ඔයා මේව දන්නවද නැද්ද කියලා. ඒත් විහඟ ළඟින්ම ආශ්‍රය කරන්නෙ ඔයයි මද්දුයි විතරයි. ඒක හන්ද ඔයාල දෙන්නම මේ ගැන දනාන් ඉන්න ඇති කියලා මට හිතෙනවා... ඒත්... ඒත් මං හිතුවා විහඟ බයික් එකෙන් වැටිල ඉඳපු වෙලාවෙ බලන්න ආපු අර පුංචි කෙල්ල එක්ක විහඟගෙ සම්බන්ධයක් ඇති කියලා... ඇත්තටම මගෙ හිතෙත් ඒ ගෑණු දරුවා ගැන කැමැත්තක් තිබුණා. ඒත්... ඒත්... ම.. ඔයා... මොනවද පොඩී මේ ක... කරගෙන ති... තියෙන්නෙ...?"

අම්මගෙ කටහඬ බිඳිල ගියා. හිතට අලුතෙන් ආපු දුක හිතේම හිර කරල තියාගන්න මං ලොකු උත්සාහයක් ගත්තා. ඇස්වලට උනපු කඳුළු හංගගන්න අසාර්ථක උත්සාහයක් ගන්න අම්මා දිහා මං බලන් හිටියෙ පපුව පිච්චෙද්දි. අම්මා කවදාවත් මං ඉස්සරහ අඬල නෑ. ඒත් දෙයියනේ, අංජලී ගැන අම්ම කියපුව අහන්න අංජලී ළඟ හිටිය නම්...! අංජලී මගේ වෙලා හිටිය නම්.. අනේ අපි කොයිතරම් වාසනාවන්තද අංජලී...! කුරුල්ලෙක් වගේ නිදහසේ පාවෙලා ගියපු මගේ අත්තටු ඔයා කඩල දැම්මෙ මොන හිතකින්ද රත්තරං උංගි...!

"ඇන්ටී... මටත් තියෙනවා ඇන්ටිට යමක් කියන්න...!"

රාජ් එකපාරටම එහෙම කිව්වහම අම්මා ආයෙත් රාජ් දිහා බැලුවා. දෙයියනේ...! ඒ වෙලාවේ අම්මගෙ මූණෙ තිබ්බ අහිංසකකම, අසරණකම දකිද්දි මගේ හිත දහස් පාරක් මැරි මැරී ඉපදුනා.

"පූජනීත් එක්ක විහඟගෙ සම්බන්ධයක් නෑ ඇන්ටී...! ඇන්ටි කිව්වා හරි. පූජනී බැඳපු කෙනෙක් තමයි... ඒත් ඒක පොතට විතරක් සීමා වෙච්ච කසාදයක්...!!! එයා තාමත් ඉන්නෙ එයාලගෙ ගෙදර..."

සැරින් සැරේ නවත්ත නවත්ත රාජ් කියවං ගියා. මද්දු අයියට මං පොරොන්දු වුණේ පූජනී ගැන අම්මට කියන්නම් කියලා. ඒත් අන්තිමට රාජ්ට තමයි ඒක කියන්න වුණේ.

"එතකොට... එතකොට විහඟත් එක්ක මේ කියන පූජනීගෙ සම්බන්ධයක් නැත්තං කවුද සම්බන්ධ... මෙයාගෙ මේ ෆොටෝ එක විහඟගෙ කාමරේට ආවෙ කොහොමද...?"

අම්මා අහපු දේට උත්තර දෙන්න රාජ් කට හදනව මං දැක්කා. ඒත් අම්මට උත්තරේ හම්බ වුණේ රාජ්ගෙන් නෙමෙයි. හුඩ් එක යට ඉඳල ගෙට ආපු මද්දු අයියගෙන්. දෙයියො එව්ව වගේ මූ කොයි වෙලාවෙද ආවෙ...!"

"ඔය... ඔය ෆොටෝ එක අයිති මටයි අම්මා...!"

මද්දූ එහෙම කිව්වහම, අම්මා මද්දූගෙ ඔලුවෙ ඉඳන් කකුල් දෙක ළඟට යනකන් හොඳට බැලුවා.

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 56

"ම...ම...ද්...ළු... මං හිතුවෙ නෑ ඔ... ඔයා....!?"

ආයෙමත් අම්මගෙ කටහඬ බිඳිල ගියා. තවත් දුරට මේ හැම දේම විද දරාගෙන ඉන්න බෑ කියල මට තේරුණා. සියලු සංසාරගත බැඳීම් මගේ හිත හිර කරල දාද්දි මං අම්මගෙ කකුල් දෙක ළඟ දණින් වැටුණා,

"...අ...අම්මා...! අම්මාට කවදාවත් වැරැද්දක් කෙරුවෙ නෑ අම්මෙ..."

මං කියවගෙන කියවගෙන ගියා. අංජලීගෙන් තුවාල වෙලා තිබ්බ හිත උඩට පිහියකින් ඇන්න වගේ, අම්මගෙ කඳුළු වලින් මගෙ හිත රිදුනෙ. කිසිම සද්දයක් බද්දයක් නැති හින්ද මං ඔලුව ඉස්සුවා. මෙන්න මද්දූ අයියගෙයි, රාජ්ගෙයි දෙන්නගෙම ඇස්වල කඳුළු.

තවත් ටික වේලාවක් යද්දි මද්දූ අයියා පූජනී ගැන ඔක්කොම විස්තර අම්මගෙත්ත කියන හැටී මායි රාජුයි අහගෙන හිටියා. එක හුස්මට ඔක්කොම කියාගෙන කියාගෙන ගියපු මද්දූ හති ඇරියා. ඩිංගෙන් ඩිංග අම්මගෙ මූණ නැත්පත් වෙද්දි මගේ හිතට පුංචි සැනසීමක් දැනුණා. මගේ හිත කුඩු පට්ටම් වුණත් කමක් නෑ, අම්මගෙ හිත හොඳට තිබිලා. මගේ හිත මට කිව්වා.

"ඔය දේවල්... ඔයා මට මීට කලිනුයි කියන්න තිබ්බෙ මද්දූ... බලන්න මං පොඩී ගැන වැරදියට හිතන් හිටියෙ මෙච්චර වෙලා. මං කොහොමද දැන් මගෙන් රිදිච්ච පොඩීගෙ හිත හදන්නෙ...?"

අම්මා මද්දූගෙන් ඇහැව්වා. මද්දූ උත්තරයක් දුන්නෙ නෑ. මද්දූත් අප්සෙට් වෙලා.

"...ඒ.. ඒ ගැන ප්‍රශ්නයක් නෑ අම්මෙ... මං හැමදාම සංතෝසෙන් ඉන්නෙ අම්මෙ...! අම්මා ඒ ගැන හිතන්නෙපා... මට දුකක් නෑ...!"

මං එහෙම කිව්වහම අම්මගෙයි මද්දූගෙයි මූණුවල් එළිය වුණා.

"කොහොම වුණත් මද්දූ මේ ගැන ලොකු පුතයි, තාත්තයි එක්ක කතා කරන්න ඕන. ඔයා ඒ ගැන නොහිත ඔයාගෙ වැඩ ටික කරන් යන්න."

අම්ම එහෙම කිව්වහම මද්දූගෙ මූණ හිනාවෙන් පිරිල ගියා. ටිකකින් හෙට අනිද්ද දිහාට එන්නම් කියල රාජුත් උංගෙ ගෙදර යන්න ගියා.

"මේ කරපු උදව්වට උඹ බුදු වෙන්නෝන පාට්නර්...!"

අම්මා ඩිංගක් එහෙට මෙහෙට වෙනකන් ඉඳල මද්දූ මගේ කනට කරල කිව්වා. හිතේ තිබ්බ පිට එකටද කොහෙද මද්දූ ඇඳුම් පිටින්ම කාමරේ ඇඳට වැටෙනවා මං දැක්කා. හැමෝම සාලෙන් ගියාට පස්සෙ මාත් කාමරේට ආවා. මේසෙ මැද්දෙම තියල තියපු, අංජලී මට දීපු රෝස පාට ටෙඩියව දැකල ආයෙමත් මගෙ ඇස්වලට කඳුළු ආවා. මං වගේම, ඔයා දීපු මේ ටෙඩියත් අද තනිවෙලා උංගි...! ඔයාව මගේම කරගන්නව



කියල හිතන් ගියපු මට, ඔයා ආපිටට දුන්නෙ මොනවද උංගී...? පුංචි එකෙක් වගේ සතුටෙන්, සැහැල්ලුවෙන් හිනාවෙවී ඉඳපු මගේ පුංචි හිත ඔයා නැති කරලා දැම්මා උංගි...!

"ආ... පාට්නර්...!"

හදිස්සියෙන්ම මගේ කාමරේට ආපු මද්දූ මගේ කඳුළු දැකල හොල්මං වෙලා.

"...උ... උඹ අඬනවා පොඩී...!, අම්මටයි මටයි සංතෝසෙන් ඉන්න කියල උඹ අඬනවා... මට කියපං... මට කියපං... කවුද උඹේ රත්තරං හිත රිද්දුවෙ කියලා... මට කියපං... මං ඌව මරනවා...!"

මද්දූ කෑ ගහගෙන ගියා. ඒත් උඹට කරන්න දෙයක් මෙතන නෑ මද්දූ...! උඹේ පාට්නර්ගෙ හිත කෑලි කෑලි වලට කැඩිලා ගිහින් කියල විතරක් හිතාගනිං මද්දූ...!

## 45

උත්තරයක් බලාගෙන මද්දූ තාමත් මං දිහා බලන් ඉන්න විත්තිය මට තේරුණා. ඒත් මද්දූට දෙන්න තරම් උත්තරයක් ඒ වෙලාවෙ මගෙ හිතේ තිබුණෙ නෑ. හිතේ තිබ්බ හැම සුන්දර දෙයක්ම කුඩු පට්ටම් වෙලා ගියාට පස්සෙ මං මොනාව කියන්නද?

"... ක... කතා කරපං මල්ලි කතා කරපං...! උඹට අඬන්න තරම් දේවල් සිද්ද කෙරුවෙ කවුද කියල කියපං...?"

මගේ උරහිසෙන් අල්ල ගෙන හොල්ලල මද්දූ කියවන් ගියා. මට මතක ඇති කාලෙකින් මද්දූ අයියා මට මල්ලි කියල කතා කරල තිබුණෙ නෑ. පොඩී නැත්නම් පාට්නර් කියල තමයි මද්දූ කතා කරේ. මගේ කඳුළු දැකලා මද්දූ කොයිතරම් අප්සට් වෙලාද කියල මං ඒකෙන්ම හිතා ගත්තා.

"...මේ... මේක ඒතරම් දෙයක් නෙමේ මද්දූ අයියා... ම... ඔයා ඒ... ඒ ගැන හිතන්නෙපා. අ... අපි පූජනී ගැන කතා කරමු..."

මං එහෙම කිව්වහම මද්දූ අයියගෙ ඇස් දෙක ලොකු වුණා.

"...පූජනී යකාට ගියාවෙ....! උඹ හිතන්නෙ උඹේ කඳුළුවලට වැඩිය මට පූජනී ලොකුයි කියල ද ? උඹ... උඹ මගේ මල්ලී... උඹ අඬනවා මං දැකල නෑ... උඹ නිතරම හිනාවෙවී ඉඳපු පොඩි එකෙක්...! එහෙයි මට දරාගන්න බැරී..."

මද්දූ අයියා මගේ අතින් තද කරල අල්ලා ගත්තා. මද්දූගෙ ඇස් වලින් බේරෙන කඳුළු දැකල මට මං ගැනම තරහක් ආවා.

www.sinhalaelibrary.com

ආයෙමත් මද්දූ අයියා මගෙන් ඇහුවා. තවත් දුරට මේ හැමදේම හංගන් ඉන්න මට බැරිවුණා.

"...ම... මං ගියා අ... අංජලීව බලන්න..."

මද්දූගෙ රතුපාට වෙච්ච ඇස් දිහා බලාගෙන මං කිව්වා. ඒ ඇස් දෙකේ තිබ්බ දුක දැකල මගෙ හිත හිරිවැටිල ගියා.

"...අංජලී ම... මට අයිති වස්තුවක් නෙමේ මද්දූ... එ... එයා මට අයිති නෑ. මං... මං ඒක දැනගත්තා..."

ඊට එහා කතා කරගන්න බැරුව මං ගොලු වුණා. මගෙ ඇස්වලට ආයෙමත් කඳුළු උනන් ආවා. අනේ උංගි..., මං අද තනිවෙලා...

"...නෑ...!? එහෙම වෙන්න බෑ... ඒක එහෙම වෙන්න දෙන්නෑ පොඩි මං...! අංජලී අයිති උඹට... උඹේ හිතේ අංජලීට තියෙන තැන, මට වැඩිය මේ ලෝකෙ කවුරුවත් දන්නෙ නෑ... ම... මට වෙච්ච දේ කියපං... ඉතිරි හරිය මං බලාගන්නම්...!"

මද්දූගෙන් බේරෙන්න බැරිම තැන මං හැමදේම ඔහේ කියවං ගියා. මං හිතුව විදියටම මද්දූගෙ මූණ කළුපාට වුණා. මං වෙනුවෙන් මද්දූ නොකරන දෙයක් නැති විත්තිය වෙන හැමෝමටත් වැඩිය මං දැනන් හිටියා.

"... ඒකිට බෑ මෙහෙම කරන්න... ඒකිට බෑ...! උඹ අප්සට් නොගහ ඉදපං මි අවුල විසඳන්නම්...!"

එහෙම කියල මද්දූ කාමරෙන් ගියා. මද්දූ මොනව කරන්න හදනවද කියල මට හිතාගන්න බැරිවුණා. මං හින්ද මද්දූ ලෙඩක් වත් දාගනියිද දන්නෑ. අනිත් එකා රාජ්... ගෙදර යනව කියල ගියාට මට නම් බුදු හුවර් රාජ් ගෙදර ගියේ නෑ කියලා. ආයෙත් අංජලීලගෙ ගෙවල් පැත්තෙ ගියාද දන්නෙත් නෑ. පහුවෙච්ච කාලෙ වෙච්ච හැමදේම එක්කහු වෙලා මගෙ ඔලුව පැටලිලයි තිබුණෙ. ඔලුව රිදෙන්න වගේ ගත්තු හින්ද මං ඇඳේ හාන්සි වුණා.

* * *

තවත් දවසක් හීන් සීරුවේම ගෙවුණා. උදේ පටන් අරන් තිබ්බ වැස්ස තාමත් ඉවර නෑ. කුණු වෙන්න වහිනවා. හුළඟට ගහගෙන වගේ එන වැහි බිංදු වලින් මුලු ඇඟම තෙමෙනවා. මං රාජ් දිහා බැලුවා. ඌට ගාණක්වත් නෑ. මිනිස් මූ වගේ පාප මිත්‍රයෙක්.

"තෙමෙනවා බං... ඔය ජනේලෙ වහපං...!"

තවත් බලන් ඉන්න බැරිම තැන. ඇඳේ ඉඳන්ම මං ඌට කෑ ගැහුවා. ඒ පාර ඌ සද්ද නැතුව ගිහින් ජනේලෙත් වහල ලයිට් එකත් දැම්මා. මූ අද උදේ ඉඳන්ම උගුඩුව වගේ ඉන්නෙ කුවර්රෙසාට මොකක් හරි බාල්දියක් දාගෙන ඇති.



"...විහඟ....!"

ආයෙත් ඩිංගක් වෙලා ඉඳල ඌ කතා කරා. මං උගේ මූණ දිහා බැලුවා. රාජ් මොකක් හරි මගෙන් අහන්න තමයි සෙට් වෙන්නෙ කියලා මට ඉවෙන් වගේ තේරුණා. ඒත් ඒකට හිත හදාගන්න බැරුව තමයි මූ නටමන්නෙ...

"... උඹට අංජලීව අමතක කරන්න බැරිද...?"

ඉඳල ඉඳල ඌ ඇහුවෙ මහ හතර බීරි කතාවක්. මූට පිස්සුද මංදා... මං කොහොමද අංජලීව අමතක කරන්නෙ...?

"ඇයි උඹ එහෙම ඇහුවෙ...?"

"නෑ... උඹ තාමත් ඒකි ගැන හිතනවද කියල මට හිතුණා."

හිතනවද නෙමෙයි හැමදාම හිතෙන්නෙ ඒකි ගැන තමයි කියල කියන්න හිතුණත් මං මුකුත් කිව්වෙ නෑ. ඒක හන්දම ඌ ආයෙත් කතා කරන්න ගත්තා.

"එදා අංජලී අපට අරහෙම කිව්වෙ ඇයි කියල මං හුඟක් කල්පනා කරා විහඟ... පැයක් දෙකක් යනකන් මගෙ ඔලුවට කිසිම අයිඩියාවක් ආවෙ නෑ. එහෙම කරේ මොකද කියලා. ඒත්..?"

"ඩිංගක් ඉඳපං... මං ඉතුරු ටික කියන්නම්... මොකද උඹටත් වැඩිය මං ඔය ගැන කල්පනා කරපු හින්ද..., උංගි එහෙම කරේ ඇයි කියනෙක කියන්න එච්චර අමාරු නෑ රාජ්...! අර ක්‍රිශාන් කියන එකා අංජලීගෙ 'කසින්' කෙනෙක් වෙන්න ඇති. උං දෙන්න මැරි කරන්න ලෑස්ති කරල ඇති. මාව දැකල කතා බහ කරල මට ලංවුණාට අංජලීගෙ හිතේ මං ගැන තඹ සතේක ආදරයක් නැතුව ඇති බං..."

රාජ්ව නවත්තල මං කියවන් ගියා.

"... විහඟ... ! ඇයි මචං... උඹ උඹටම බොරු කරගන්න හදන්නෙ...? අංජලියි උඹයි හම්බෙච්ච හැමදාකම වුණ දේවල් අකුරක් නැර උඹ මට කියල තියෙනවා. ඉතිං ඒව ගැන හිතෙද්දි උඹ කියන දේ මට පිළිගන්න බෑ බං...! මෙතන වෙන මොකාක් හරි ලොකු හුටප්පරයක් තියෙනවා..."

"මොන හුටප්පරේ තිබ්බත් උංගි අපිට කතා කරපු හැටි වැරදියි රාජ්..."

"...මේ...! ඩිංගක් ඉඳපං... අන්න අරහෙ ෆෝන් එක රිං වෙනවා... මං බලලා එන්නම්."

රාජ් සාලෙට ගියා. අයෙත් මුල ඉඳල් මේව හිතන්න ගියොත් මං අමු පිස්සෙක් වෙනවා. මොනව කරන්නත් ඔලුව හොඳට තියෙන්න ඕන නෙ.



"විහඟ... කෝල් එක උඹට..."

ආපහු කාමරේට එබිල රාජ් කිව්වා.

"කාගෙන්ද බං... මේ වෙලාවෙ...?"

"... ශහනාස් ගෙන්...!"

ඈ...! ඒ පාර මොකද මේ වෙන්න යන්නෙ ?"

## 46

සාලෙට ගිහින් මං රිසීවරේ අතට ගත්තා.

"...හෙ... ලෝ...!"

"විහඟ අයියා... මං 'ශබී' කතා කරන්නෙ..."

ඒ කටහඬ පිරිල තිබ්බ ආදරේ මගෙ හිතට මහ හුගක් සම්පව දැනුනා. හැමදාම ගොලුවෙනව වගේ ශහනාස් ඉස්සරහ අද නම් ගොලුවෙන්න මගේ හිත කැමති වුණේ නෑ. ඒත් ශහනාස් එක්ක කතා කරන්නෙ මොනවද කියල හිතාගන්න බැරුව මං ඩිංගක් වෙලා සද්ද නැතුව හිටියා.

"...ම... ඔයා සංතෝසෙන්ද විහඟ අයියා...?"

ඒ වචන ටික මගෙන් අහද්දි එයාගෙ කටහඬ වෙව්ලුවා. පව්..! මං ගැන හොයනෙක තාම අතෑරල නෑ...!

"ඔයා අහපු ප්‍රශ්ණෙට උත්තරයක් නම් දෙන්න පුළුවන් ශබී..! ඒත් එකෙන් ඔයාගෙ හිත රිදෙයිද කියලා මට බයයි..."

"ක... කමක් නෑ අයියේ... ඔයා හින්ද හිත රිදුනට කමක් නෑ.. ඔයා හින්ද මං සතුටින් හිටියා... ඒක හන්ද හිත රිදුනට කමක් නෑ..."

ශහනාස්ගෙන් පිටවෙන හැම වචනයක්ම, හැම අකුරක්ම මගේ හිත ඇතුලෙම තැන්පත් වුණා. ඔයා මෙහෙම කතා කරන්නෙ ඇයි ශබී...?

"මං... මං සංතෝසෙන් නෙමේ නංගි ඉන්නෙ..."

ඒ ටික කියන් යද්දි සාලෙන් ආපු සද්දෙ හින්ද මං හැරිල බැලුවා. රාජ්..! ඌ බිම බලාගෙන කල්පනා කරනවා.

"ම... මට තේරුණා අයියෙ මට තේරුණා... රාජ් අයියගෙන් ඇහුවහමත් ඔයා ගැන මුකුත් කියන්නෙ නෑ. මේ ටික දවසක ඉඳල ඔයා දුක් විඳිනව කියල මට දැනුනා අයියෙ.. ම... මට ඔයාව හම්බ වෙන්න ඕන...! මං ඔයාලග එන්නද අයියෙ..? මට ඔයාව දකින්න ඕන...! ඔයාට දුක් විඳින්න දෙන්න බෑ... ඔයා සංතෝසෙන් ඉන්න ඕන...! අර ලස්සන හිනාව ඔයා ගාව තියෙන්න ඕන..."



පුදුම තරමෙ ආවේගයකින් ශහනාස් කියවගෙන ගියා. ඒත් අන්තිමට ඒ කටහඬ බිඳිල ගියා. මගෙ හිතටත් ආවෙ කියාගන්න බැරි තරමෙ ලොකු දුකක්. ඇයි ශබී, ඔයා මං ගැන මේ තරම් හිතන්නෙ ?

"... ම... මං කියන්නම් ශබී..! මෙහෙදී ඔයා මාව හම්බෙන එක ඒ තරම් හරි නෑ නංගි... මං ඔයාව හම්බෙන්න එන්නම්... රාජ් අතේ මං හම්බෙන තැන කියල එවන්නම් හොඳේ..."

මං එහෙම කිව්වහම ශහනාස්ගෙන් ලොකු හුස්මක් පිටවෙනව මට ඇහුනා.

"...ඕ.. ඔයා හරි හොඳයි වි.. විහඟ අයියෙ.."

"එහෙනම් ශබී..., කතාකරල මගේ දුක හෙව්වට හුගක් තෑන්ක්ස් නංගි...! මේ... ඔයත් හරි හොඳයි ශබී...!"

මං එහෙම කියල ඉවර වෙලා ෆෝන් එක තිබ්බා. කියල ඉවර වෙලා මං රාජ් දිහා බැලුවා. ඌ මං දිහා බලන් ඉන්නවා.

"ශබී කියනවා මාව හම්බෙන්න ඕනලු..."

මං කිව්ව එකට මුකුත් නොකිය, රාජ් මං ළඟට ආවා.

"උඹ සංතෝසෙන් නෙමෙ ඉන්නෙ කියල ශබීට කිව්වනෙ.. දැන් ඉතිං ඒකි, උඹව හම්බෙන එක නවත්තන්න සක්කරයටවත් බෑ. අනේ මංදා බං... මං උඹට කිව්වෙ නෑ. ඒකි මේ පහුවුන හැම දවසකම වගේ උඹ ගැන විස්තර ඇහුවා. ඒත් මං වැඩි දෙයක් කිව්වෙ නෑ. දැන් ඉතිං උඹට කියන්න වෙයි ඔක්කොම සීන් ටික..."

"ශබී ගැන මට පුදුම හිතෙනවා රාජ්... බලපං උඹ වගේම ඒකිත් මං ගැන හොයනවා. මං ඒකිට මොනවද දීල තියෙන්නෙ... ඒත්... ඒත්... උංගි මට එක දවසක් වත් ෆෝන් කරාද රාජ්...? උඹ දන්නවා ශබීට වැඩිය මගෙ හිතේ ජීවත් වුණේ උංගි කියලා. ඒත් ඒකි ඇයි මට කිසිම දෙයක් කියන්නෙ නැත්තෙ... අඩුම ගානෙ කෝල් එකක්වත් දෙන්නෙ නැත්තෙ ඇයි...?"

මං අහපු දේට දෙන්න තරම් උත්තරයක් රාජ් ගාව නෑ කියල මං දැනන් හිටියා. ටිකක් වෙලා යනකන් අපි දෙන්නා කතා බහක් නැතුව ඉන්න ඇති. එක පාරටම සාලෙ දොර තල්ලු කරගෙන මද්දු ගෙට ආවා. පොර අම්බානක නාලා.

"..... මොකෝ මද්දු මේ...?"

මං මද්දු දිහා බලලා ඇහුවා. උගේ ඇඳුම් ගන්න දෙයක් නෑ. කුණු වෙන්න තෙමිලා. ඒත් ඌ මුකුත් නොකියා උගේ කාමරේට ගියා. සාලෙ පුරාම වතුර. මායි, රාජුයි මද්දුගෙ පස්සෙන්ම මද්දුගෙ කාමරේට රිංගුවා.

WWW.SINHALAELIBRARY.COM 59

"... ඇඳුම් පිටින්ම නෑවද බං...?"

තෝන්ඩි හිනාවක් දාල රාජ් ඇහුවා.

"මං පොඩි ගමනක් ගියා..."

තුවායෙන් ඔලුව පිහිදාගන්න ගමන් මද්දූ කිව්වා.

"පූජනීන් නෙක්ක...?" ආයෙත් රාජ් පැන්නා.

"...නෑ.. බං...! කහතුඩුව පැත්තෙ ඉඳල එන සෙකියුරිටි කෙනෙක් ඉන්නවා, අපේ බැන්ක් එකේ. පොර මගෙත්තෙක්ක හිටි... පොඩි කියපු 'ඩිටේල්ස්' මං පොරට දීලා අංජලි ගැන විස්තර ටිකක් හොයා ගත්තා..."

"...ත්... නෑහ්... හ්... උඹ නම් දෙයියෙක් බං... මූ විදෝන හැටි බලන් ඉන්න බෑ මද්දූ... ඊට නින්ද යන්නෙත් නෑ. මං හිනෙනුත් බය වෙනවා මූ හන්ද... ඉ.. ඉතිං... ඉතිං... මොකෝ කත්වෙ... ඒකි අරූව බැඳලද...?"

රාජ්ට ඉස්පාසුවක් නෑ. ඒත් මට ඒ තරම් ලොකු උනන්දුවක් ආවෙ නෑ. මද්දූ කියවන් යන ඒව ඔහේ අහන් හිටියා.

"...ඩිංගක් ඉඳපංකො කියනකන්... බලපං පොඩී මූට තියෙන තදියම... හරියට මූ වගේනෙ අංජලීට ට්‍රයි කරන්නෙ...!"

"ඒම තමයි මද්දූ... මගෙ බොක්කයි, විහඟගෙ බොක්කයි දෙකම එකයි... ඌට කරදරයක් වෙනව කියන්නෙ ඒක මගෙත් කරදරයක්..! එච්චරයි...! උඹ කියපං..."

තෙම්ච්ච ඇඳුම් මාරු කරල සරමකට හෙම බැහැල මද්දූ හෙමින් කතාව පටන් ගත්තා.

"සීන් එක මෙහෙමයි පොඩී...! ඔයයි, රාජුයි එදා ගියේ අංජලීලගෙ ගෙදරට තමයි... අර කලින් අංජලී ඩ්‍රයිව් කරන් ආපු කැබ් එක හෙම අංජලීගෙ නෙමෙයි... ඒව අක්කගෙ හස්බන්ඩ්ගෙ... මිනිහගෙ තමයි හැමදේම. නුගේගොඩලු ඉන්නෙ...! මිනිහ තමයි අංජලීලගෙ ෆැමිලි එකට උදව් කරන්නෙ වැඩියක්ම...! අංජලීගෙ තාත්ත නම් ඒ තරම් හොඳ කෙනෙක් නෙමෙලු..."

මද්දූ කියවගෙන කියවගෙන යනවා. ඒත් මට ඔය මොනාවත් වැඩක් නෑ මද්දූ. මට ඕන...,"

"එතකොට අර 'ක්‍රිෂාන්' කියන්නෙ මොකාද...?"

මගේ හිතේ තිබ්බ ප්‍රශ්නෙම රාජ් ඇහුවා. උත්තරේ හම්බ වෙනකන් මං ඉවසන් හිටියෙ අමාරුවෙන්.

"ඒකත් මං හොයා ගත්තා බං... ඌ අංජලීගෙ අක්කගෙ හස්බන්ඩ්ගෙ මල්ලී...! ඌලු අංජලීව බඳින්න ඉන්නෙ..."

මං දිහා බල බලාම මද්දූ කිව්වා. එහෙනම් මං හිතාපු දේවල් ඇත්ත. ඔයාගෙ ලෝකෙ, මට පුංචි ඉඩක්වත් නෑ අංජලී...!



## 47

**මොකක්** හරි දේක වටිනාකම දැනෙන්නෙ ඒ දේ අහිමි වෙන්න යනකොට. මට අංජලී ගැනත් හිතුනෙ ඒ විදියටමයි.

"උඹ නම් මාරයි මද්දූ... පැන්ටාස්ටික්... අපිට උඹ ඔය හොයාගත්තු ටික හොයාගන්න මාසයක් වත් යයි. මතකනෙ අපි අංජලීගෙ ගේ හොයාගන්න දීපු ට්‍රයි එක..."

රාජ් මද්දූ දිහා බලන් කියවන් යනවා. මගේ සද්දයක් බද්දයක් නැති හන්ද මද්දූ මං දිහා හොඳට බැලුවා.

"ඔය බලපං පොඩී... උඹ අප්සට් ගිහින්... ඩිංගක් ඉවසපංකො. මං දුන් මෙච්චර දේවල් හොයා ගත්තනෙ. මං අංජලීව උඹට මීට් කරවන්නම්. එතකොට හරිනෙ..."

"... මට ඒකි එපා මද්දූ අයියෙ... මට ඒකි එපා... ඒකි මට හොඳටම රිද්දුවා. ඒත්... ඒත් මට ඕන ඒකි ළඟට ගිහින් කියන්න, මං උඹට ආදරේ කරා කියල... තාමත් ආදරේ කරනව කියලා... ඒක උඹට තියා උඹේ ක්‍රිෂාන්ට වත් නවත්තන්න බෑ කියලා... හ්..ග්...හග්...!"

පිස්සෙක් වගේ කෑ ගහල ඒ ටික කියල මං මද්දූගෙ කාමරෙන් සාලෙට ආවා. මගේ පස්සෙන්ම වගේ රාජුයි, මද්දූයි දඩ බඩ ගාලා ආවා.

"... විහඟ...! ප්ලීස් මචං... ඩිංගක් කූල් වෙයන්. ඒ තරම් අප්සට් වෙන්නෙපා බං... උඹේ සංතෝසෙ වෙනුවෙන් මායි මද්දූයි ඕනම දෙයක් කරනවා...!"

මගේ කරට අතක් දාන ගමන් රාජ් කිව්වා. දෙයියො මං කැමති කෙල්ල මට නොදුන්නාට, මට බොක්කෙ යාලුවෙකුයි, පණ වුණත් දෙන සහෝදරයෙකුයි දීල තියෙනවා. ඒ ගැන හිතල හිත හදා ගන්න මං ට්‍රයි කරා...

"...රාජ්...!"

ඩිංගක් වෙලා ගියාට පස්සෙ මං රාජ්ට කතා කරා. මගේ හඬේ තිබ්බ තැන්පත් ගතියට ඌ පුදුම වෙලා වගේ මං දිහා බැලුවා.

"...අරුන්දි ගෙ වෙඩින් එක අනිද්ද... අපි ඒකට රෙඩි වෙමු..., මේ හැම දේම දාලා... මං කෙලින් රාජ්..."

"... හම්මේ...! අන්න එහෙම වරෙන් සහා...! මගෙ හිතත් කූල් වෙනවා..., උඹ ඔහොම කතා කරනකොට..."

හෙන ෆිට් එකේ රාජ් කියවන් ගියා. මද්දූටත් පුංචි හිනාවක් ගියා. එක්කෝම දුක පැත්තකින් තියෙද්දි මටත් පුංචි හිනාවක් ආවා.

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 60

"...සංතෝසයි පාට්නර්...! උඹේ පුංචි හිනාවක් දක්කෙ දවස් ගානකට පස්සෙ... කොහොම වුණත් වෙඩින් එකේ ෆොටෝස් ටික හොඳට ගහපං..." හිනාවෙවී මද්දූ කිව්වා.

"...ඒව මූ සිරාවට දෙයි මද්දූ... මොකද අරුන්දිට දෙපාරක් වෙඩින් එක ගන්න බෑනෙ.... ෆොටෝ අප්සට් ගියොත්...! මාත් යනවනෙ මද්දූ... අවුලක් නෑ..."

'අරුන්දි' කියල කිව්වෙ මං ටිකක් දුරින් ආශ්‍රය කරපු කෙල්ලෙක්. ඒකිගෙ වෙඩින් එක අතිද්දි... ඒකිගෙ වෙඩින් එකේ ෆොටෝස් ටික ගන්න ඒකට මතක් වුනේ මාව.

හවස් වෙද්දි වැස්සත් පැයුවා. අම්මත් ගෙදර එනකොට තෙමීගෙන ආවෙ. අම්මටයි මද්දූවටයි මං ලොකු කොත්තමල්ලි මුට්ටියක්ම තම්බල බොන්න දුන්නා. මද්දූව නම් මට දහ අතේ පිං දිදී කොත්තමල්ලි ටික බීලා දුම්මා.

රෑ වෙලා නිදා ගන්න ඇඳට ගියාම, අංජලීව මට වැඩි වැඩියෙන් මතක් වෙන්න ගත්තා. ඉස් ඉස්සෙල්ලම රෝස පාට වෙඩියව අරන් මාව බලන්න ආපු හැටි. ස්ලැක් එක ඇඳල හිනා වෙනකොට තිබ්බ ලස්සන... හැම එකක්ම ෆිල්ම් එහෙක වගේ මට මතක් වුණා. ඒත් ඔයා මට අයිති නැතෙ උංගි...! ඒත් මට ඔයාව අමතක කරන්න බෑ උංගි...! මට ඔයාව අමතක කරන්න බෑ...!

* * *

අරුන්දිගෙ වෙඩින් එක දවසෙ උදේ පාන්දරම අරුන්දිගෙ අයියා වෑන් එකක් අරන් අපේ ගෙදර ආවා. නුගේගොඩින් රාජ් වත් දාගෙන අපි පිළියන්දල ගියා. රාජ් නාම ඇනුම් අරිනවා.

අපි අරුන්දිලහට යනකොට ඒකිට ලස්සනට අන්දල තිබුණා. ඉස්සෙල්ලම මං ඒකිගෙ සිංගල් ෆොටෝස් ටික කවර් කර ගත්තා. පස්සෙ අනිත් අයගෙ ෆොටෝස් ටික ඉවර කර ගත්තා. රාජුත් ළඟම ඉඳගෙන මට පුල් බකප් එක. මූව ඉතින් මේ වගේ වැඩකට අහම්බෙන් තමයි අහුවෙන්නෙ. ඌ ඒත් ඇනුම් අරිනවා.

කොහොම කොහොම හරි වෙඩින් ඇල්බම් එකට ඕන කරන විදියට මං ෆොටෝ ටික හිතේ හැටියට අරගෙනයි තිබුණෙ. ටිකක් දවල් වෙද්දි අමුත්තො එන්න ගත්තා. එකපාරටම හදිසියෙන් රාජ් ඇවිත් මට කතා කරා. ඒ වෙලාවෙ මං හිටියෙ ෆ්ලවර් ගර්ස්ලා දෙන්නගෙ ෆොටෝ එකක් ගන්න ගමන්. තව ටිකෙන් ෂොට් එකක් අප්සට් යනවා. මූණත් හතරැස් කරන් මං ඌ දිහා බැලුවා. රාජ් හිටියෙ හොල්මං වෙලා වගේ.

"...ඇයි බං...?"

"... අ... අප්සට් ගහන්න එපා මචං...! අපි දන්න කියන කෙනෙක් වෙඩින් එකට ඇවිත්...?"



"...ක...ක.... කවුද...? අ... අංජලී...ද...?"

මං උගෙන් ඒක ඇහුවෙ නෑ. මට ඉබේම කියැවුණා. ඌ වලුව වැනුවා.

"...කො...කොහේද ඉ.. ඉන්නෙ...?"

"අර කොණේ 'හෝල්' එකේ වාඩිවෙලා ඉන්නව..."

ඌ එහෙම කිව්වහම කරන්න ඕන මොනවද කියලත් මට අමතක වෙලා ගියා.

"...කාත්තෙක්කද අංජලී ඇවිත් තියෙන්නෙ...?"

"... මං එච්චර බැලුවෙ නෑ විතන... මං හිතන්නෙ තනියම... ඔක්කෝටම කලින් උඹ වෙඩින් එකේ ෆොටෝ ටික ගනිං...!"

රාජ් ඒක ටිකක් සැරට වගේ කිව්වෙ... ඌ බය වුණාද දන්නෑ මං පිස්සු කෙලී කියලා.

"... මෙතන ෆොටෝ ටික හරි බං... තව ටිකකින් ඉතුරු ටික ගමු... මට ඒකිව බලන්න ඕන... රාජ්...!?"

මං එහෙම කිව්වහම රාජ් මාවත් ඇදගෙන මෙන් හෝල් එක ගාවට ගියා. මගේ ඇස් ඉස්සරහ වාඩිවෙලා ඉඳපු රූපෙ දකල මට ඇස් අදහගන්න බැරිවුනා. කැන්ඩියන් ඇඳලා කුමාරියක් වගේ ඉන්න අංජලි ළඟින් ඇස් දෙක අයින් කරගන්න මට හිතුනෙම නෑ... ඔයා කොයි තරම් ලස්සනද අංජලී...!

## 48

කොහේදෝ ලොකු කල්පනාවක ඒ නිල්පාට ඇස් දෙක අතරමං වෙලා තිබුණා. අංජලීගෙ දුඹුරු පාට හෑන්ඩ් බෑග් එක එහාන තිබ්බ පුංචි ස්ටූල් එක උඩ තනිවෙලා. අංජලී වාඩිවෙලා ඉඳපු ඉරියව්වෙ පුදුම තරම් ලස්සනක් මං දැක්කා.

"...උ...උඹ මොකක්ද කරන්න යන්නෙ...?"

මං ගාව තිබ්බ හොඳම ලෙන්ස් එක කැමරා එකට හයි කරද්දි රාජ් රහසින් වගේ ඇහුවා.

"...උංගිගෙ ෆොටෝ එකක් ගමු රාජ්... එයා මට හම්බෙන් නෑ කියල මං දන්නවා. ඒත් එයාගෙ ෆොටෝ එක හරි මට තනි රකීවිනෙ..."

ප්ලෑෂර් එක දාන්නෙ නැතුව මං අංජලීගෙ ෆොටෝස් දෙක තුනක්ම ගත්තා. අංජලි හිටියෙ සෑහෙන්න බර කල්පනාවක... ඒ හින්දද මන්දා ෆොටෝ ගත්තු විත්තිය එයාට තේරුණේ නෑ.

www.sinhalaelibrary.com

"... හප්පේ... දැන්වත් යමං...! තවත් උඹත් එක්ක හිටියොත් මටත් ගුටිකන්න වෙනවා..."

රාජ් මාවත් තල්ලු කරගෙන ආයෙත් පෝරුව ළඟට ආවා.

"...රාජ්...! මං කියන දේ අහපං... මට අංජලීව හම්බෙන්න ඕන බං...

මට ඒකිත් එක්ක කතා කරන්න ඕන... මගේ හිතේ දුක තිබුණාවෙ... මං දුක හඬෙන් කතා කරන්නම්. මචං... ප්ලීස්..."

ඌ දෙපාරක් විතර ඇඟිලි වලින් නළලට තට්ටු කර ගත්තා. ඌ එහෙම කරන්නෙ උගේ මූඩ් එක අප්සට් වුණහම... මං හොඳටම දන්නවා. ඒකයි මං අරහෙම රාජ් මට කියටවත් අංජලී ගාවට යන්න දෙන්නෑ කියලා. ඒකයි මං අරහෙම කිව්වෙ.

"...රා බීල ආපු නාලාගිරි ඇතා නවත්තන්න බුදු හාමුදුරුවො හරි හිටියා... ඒත් උඹව නවත්තන්න මට බෑ... තව මොනවද ෆොටෝස් ගන්න තියෙන්නෙ...?"

ආයෙත් නළලට තට්ටු කර ගන්න ගමන් ඌ ඇහුවා.

"...දැන් තියෙන්නෙ මචං... ලන්ච් එක ගන්නකොට ගහන ඒව විතරයි... ඒකට තව පැයක් විතර තියෙනවනෙ..."

"...එහෙනම් මට පොරොන්දු වෙයන්... අවුලක් දාගන්නෙ නෑ කියලා...! මොන දේ උනත් ෆොටෝ ටික ගහල ඉවර කරනව කියලා..."

රාජ් මගේ අතින් අල්ලගත්තා.

"...හරි... බං...! උඹ බයවෙන්නෙපා... ෆොටෝ නොගහ ඉන්න තරම් මං මැච්වෙක්ද? මට ඕන උංගිත් එක්ක කතා කරන්න... ඉඳා...! මේ කැමරා එක තියාගනිං... ඔය හදිසි කාරයො ඉන්නව නම් උංගෙ ගනිං... මං පට ගාල එන්නම්...!"

කැමරා එකත් රාජ්ට දීලා මං මෙන් හෝල් එක පැත්තට ආවා. කිසිම වෙනසක් නෑ. කලින් හිටපු විදියටම නාමින් බර කල්පනාවක අංජලී ඉන්නවා. අඩුම ගානෙ මං ළඟට එනවවත් එයා දැක්කෙ නෑ. සුදු පාට බෝනික්කෙක් වගේ ඉන්න ඔයාට මේ තරම් නපුරු වෙන්න බෑ උංගි !

"...උ...උ...ං...ගි...?"

මගේ කටින් ඒ වචනෙ පිටුවුණා ද කියලත් මට සැක හිතුණා. ඒ තරමට හෙමින් තමයි මං උංගි කියල කතා කළේ. ඒත් ඒක එයාට ඇහුණා. ගැස්සිලා වගේ අංජලී මං දිහාට හැරුණා. ඒ රෝස පාට මූණෙ තිබ්බෙ ලොකු පුදුමයක්.

"...මං... මං මෙතනින් වාඩිවුණාට ක... කමක් නැද්ද උ...උංගි...??!"

අංජලී වාඩිවෙලා ඉඳපු පුටුව ඉස්සරහ මේසෙට අත්දෙක තියල එයා දිහාට බාගෙට නැමෙන ගමන් මං ඇහුවා.



"...ක... කමක් නෑ..."

ගොත ගහන වගේ අංජලී කිව්වෙ..! එයාගෙ මූණ ඉස්සරහම මං වාඩිවුණා. මගේ ඇස් ඒ නිල් ඇස් දෙකට හම්බ වෙනකොටම එයා බිම බලා ගත්තා.

"...කැන්ඩියන් ඇන්දහම ඔයා හරි ලස්සනයි උංගි... කියාගන්න බැරි තරම් ලස්සනයි...!"

අංජලීගෙ ලස්සන තවත් හිතේ තියන් ඉන්න එකේ තේරුමක් නැති හන්ද මං එහෙම කිව්වා.

"...තෑ... තැන්ක්ස් අ... අයියා...!"

බිම බලාගෙනම යි අංජලී කතා කළේ... සමහර විට එයා හිතනව ඇති. එයාගෙ අතින් මට වැරැද්දක් වුනා කියල.

"...මේ වෙලාවෙ ඔයා මොනව හිතනවද කියල මං දන්නෙ නෑ නංගි...! ඒත් වෙනදා වගේ, අර ඔයාට බය හිතෙන ආදරේ ගැන කතා කරන්න මං හදන් නෑ. එදා ඔයා ළඟට මං ආපු වෙලාවෙත් ඔයා මාව නමෙකටවත් මායිම් කළේ නෑ... ඔයා මාව අඳුනන්නෙ නෑ කියලත් කිව්වා. මේ.. බලන්න ම... මං... දි... දිහා...! ඔ... ඔය්...යා මාව අඳුනන්නෙ වත් නැද්ද උංගි...? අඩුම ගානෙ ම... මං ඔයාගෙ යාලුවෙක් වත් නෙමෙයිද උංගි...?"

හිත ඇතුලෙ තිබ්බ දහරියේ අන්තිම බිංදුවත් දාල මං අංජලීගෙන් ඇහුවා. මං දිහා බලන් ඉඳපු ඒ නිල්පාට ඇස්වලට තත්පර ගානකදි කඳුළු එක්කහු වෙන හැටි මං දැක්කා.

"...අ...අනේ ම... මට සමාවෙන්න අ... අයියෙ...! අනේ... මට ස... සමාව දෙන්න මගෙ රත්තරං අයියෙ..."

අංජලී එයාගෙ දකුණු අතින් මේසෙ උඩ තිබ්බ මගේ අත තද කරල අල්ල ගත්තා. ඒ අතේ තිබ්බ සීතල මගේ හිත හිරිවට්ටල දැම්මා. එකම කැලලක් වත් නැති ඒ සුදු මූණ දිගේ කඳුළු බිංදු ඔහේ නිදහසේ ගලන් ගියා.

"... කියන්න බැරි දෙයක් ඔයා හිතේ හිර කරන් ඉන්නවද කියල මං දන්නෑ නංගි...! ඒත් මං හුඟක් සංතෝසෙන් ඉඳපු පුංචි කොල්ලෙක්... මගේ ඒ සංතෝසෙ, මගේ ඒ හිනාව අද මං ගාව නෑ. උංගි...! කමක් නෑ ! අපිට ඕන හැම දෙයක්ම දෙයියො අපිට දෙන්නෑනෙ...! හිත කොයි තරම් රිදුනත් ඔයාටයි ක්‍රිශාන්ටයි මං විෂ් කරනවා උංගි...!"

මං එහෙම කියාගෙන කියාගෙන යනකොට අංජලීගෙ ඇස් දෙක ලොකු වුණා. එයා පුදුම වෙලා වගේ මං දිහා බැලුවා. ඇත්තටම අංජලීට පුදුම වෙන්න තරම් දෙයක් මං කිව්වෙ නෑ... ඒ පාර මොකද මේ...?

# 49

පුංචි රෝස පාට ලේන්සුවෙන් ඇස් වලට උනපු කඳුළු පිහිදාල අංජලී මං දිහා බැලුවා.

"...ක්‍රිෂාන්ගෙ කතාව ඔයාට කිව්වෙ කවුද අයියා...?"

ඒ පාර නම් අංජලීගෙ කටහඬට විසක් විතර පණ ඇවිත් තිබුණා.

"සවුරු කියන්නද නංගි... මමම හොයාගත්තා මිසක... කොහොම වුණත් කමක් නෑ නංගි... එදා ඔයාලගිහින් ආපු දවසෙ ඉඳල හැමදේම නිතරම මට මතක් වෙනවා. ඒ ඉතිං පහුවෙච්චි දවස්වල වුණ ලස්සන දේවල්... ඒව අමතක කරන්නත් බෑ... මං ඔයාට කොයිතරම් ළං වෙලා හිටියද කියලත් ඔයාගෙ හිත දන්නවා. එදා ඔය හම්බවෙච්ච ක්‍රිෂාන් ගැන වචනයක් හරි කලින් කියන්න බැරි වුණේ ඇයි උංගි.....?"

ආයෙමත් අංජලීගෙ ඇස්වලට කඳුලු පිරෙන හැටි මං දැක්කා.

"... අ... අඩන්නෙපා උ... උංගි...! ම.. මං වැඩිවෙලා මෙතන ඉන්නෙ නෑ... ඔයාට බය හිතෙන, මගේ හිතේ තියෙන හැඟීම් ගැනත් මං කතා කරන්නෙ නෑ. ඔ... ඔයා සංතෝසෙන් ඉන්න නංගි...! ම... මගෙන් ආයෙ ඔයාට කරදරයක් නෑ. මේ වෙච්ච හැම දේම මං තනියෙන් විඳගන්නම්...! සු.. සුභ ගමන් රත්තරං... උ... උංගි...!"

තව හිටියොත් මටත් අඩන්න වෙනවා. ඒක හන්ද පුටුව පස්සට දාලා මං නැගිට්ටා. මගෙත්තෙක්කම අංජලීත් දඩස් ගාල නැගිට්ටා.

"...අ...අනේ, වි.. විහඟ අ... අයියා...! ඔය හැමදේම මට කියලා ඔයා යන්නද හදන්නෙ...?"

ආයෙත් මගේ ළඟට ආපු අංජලී මගේ අතින් තද කරලා අල්ල ගත්තා. ඒ වෙලාවෙදි නම් මට අංජලීව තේරුම් ගන්න බැරිවුණා.

"...ඒයි... විහඟ...! අන්න කපල් එක ලන්ච් වලට යනවා... වරෙන්..."

හෝල් එක මුලම කොරිඩෝ එක ගාව ඉඳල කෑ ගහන රාජ්ගෙ කටහඬ ඊළඟ තත්පරේදි මට ඇහුනා. හ්ම්...! දැන් ඉතිං ඔක්කොම ඉවරයි..! හැමදේම ඉවරයි...! ආයෙත් පාරක් අංජලී දිහා බලල මං රාජ් ළඟට ගියා. ඒ වෙලාවෙ අංජලීගෙ මූනෙ තිබ්බ හැඟීම විස්තර කරන්න වචන ලක්ෂයක් තිබ්බත් මට මදි වගේ.

ඊට පස්සෙ හුඟක් වෙලා යනකන් මට කිසිම නිදහසක් තිබුණෙ නෑ. මට ඩිංගක් විතර එහායින් නිතරම නිතරම වගේ මගේ ඇස් මායිමේ රැඳිල ඉඳපු අංජලීව මං දැක්කා. ඒත් එයත්තෙක්ක ආයෙත් කතා කරන්න තරම් වෙලාවක් මට ආවෙ නෑ. ඒ දේ තේරුම් අරගෙනද කොහෙද රාජ්, අංජලීට කිට්ටු වෙනවා මං දැක්කා. කමක් නෑ... අංජලීට කියන්න හිතන්



ඉඳපු දේවල් වලින් ඩිංගක් හරි මං එයාට කිව්වනෙ..! මං හිත හදා ගත්තා.

හවස් වෙද්දි කපල් එක හනිමූන් යන්න පිටත් වුනාමයි මගේ ඩියුටිය ඉවර වුණේ. ඊට පැයකට කලින් විතර ඉඳල මං අංජලීව දැක්කෙ නෑ. රාජුත් මොනවාදෝ වැඩ වගයකට පැටලිලා හිටියා. එකකින්, කැමරා දෙකයි, ස්ටෑන්ඩ් ටිකයි, අනිත් බඩුයි වෑන් එකට දාලා මං රාජ් දිහා බැලුවා.

"...අංජලී ගියා..."

"...මට කිව්වෙවත් නෑ රාජ්...!"

හිත රිදිච්ච එක හංගන්න මං ට්‍රයි කරේ නෑ.

"පොඩි කතාවක් උඹට කියන්න තියෙනවා. වරෙන් වෑන් එකට නගිමු..! යන ගමන් කතා කරමු..."

රාජ් මාවත් ඇදගෙන වෑන් එකට නැග්ගා. මං ෆොටෝ ගහන වෙලාවෙ රාජ්, අංජලීත්තෙක්ක කතා කර කර හිටියනෙ... බලමුකො මූට මොනවද කියල තියෙන්නෙ කියලා. ඌ ඩිංගක් වෙලා වීදුරුවෙන් එළිය දිහා බලන් ඉඳල කතාව පටන් ගත්තා.

"..මට පව් කියලත් හිතුණා විහඟ... ! ඒකිගෙ හිතේ උඹ තාම ඉන්නවා බං..."

රාජ්ගෙ කතාවෙන් මගේ හිත වෙව්ලුම් කාල ගියා. කැඩිලා සුනු විසුණු වෙලා ගියපු බලාපොරොත්තු මං ගාවට ආයෙත් එක්කහු වෙන්න හදනව කියල මට තේරුණා. ඒත් රාජ්ම ඊගාවට කියපු දෙයින් ඒ හැම දේම ආයෙත් ඈතට පාවෙලා හැංගිලාම ගියා.

"... මද්දුව හොයත් තිබ්බ ස්ටෝරිය අකුරක් නෑරම ඇත්ත බං... ඔය ක්‍රිෂාන් කියන එකාලු අංජලීව බඳින්න ඉන්නෙ... ගෙවල් දෙකෙන්මලු ප්‍රපෝස් කරල තියෙන්නෙ... එදා උඹව හම්බෙන්න අංජලී නුගේගොඩ ආවහම ක්‍රිෂාන්ට මාට්ටු වෙලා. ඒ ගමන තමයි නුගේගොඩ ආවෙ නෑ කියල උඹට බොරු කියල තියෙන්නෙ... ඇයි ඉතිං මාත් දන්නනෙ උං දෙන්න එකට ඉන්නවා. ක්‍රිෂාන් කාරයා එච්චර දවසක් රට ඉඳල තියෙන්නෙ.. ඔන්න ඕකයි සතා ස්ටෝරිය..."

"... ඉතිං...?"

රාජ් කියන හැමදේම ආයෙමත් හිත කඩාගෙන ගිහින් හිත පතුලෙ තැන්පත් වෙද්දි, මං එහෙම ඇහුවා.

"...අංජලීගෙ තාත්තා මොකක්දෝ බිස්නස් වගයකට සල්ලි අරන් තියෙන්නෙ ඔය ක්‍රිෂාන්ගෙ අයියගෙන්... අර අංජලීගෙ අක්කා බැඳල ඉන්නෙ... අන්න උගෙන්... ඉතිං ඔය හුවපට වලින් හිර තියෙන්නෙ අංජලී වගෙයි මචං..."

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 63

"එහෙනම් යාලුවා... මගේ අන්තිම බලාපොරොත්තුවත් ඉවරද...?"

හිතේ තුවාලෙ තවත් පෑරෙද්දි මං රාජ්ගෙන් ඇහුවා.

"මං දුන් දෙන උත්තරෙන් උඹේ හිත රිදෙනව කියල දන්නවා.. ඒත් මං උඹට ඇත්ත කියන්න ඕනා... හැමදේම ඉවරයි... ඒත්...? ඒත්...?"

"ඔව්... ! ඔව්...! කියපං... කියපං..."

මං රාජ්ගෙ මූණ අත් දෙකෙන්ම මගේ දිහාට හරව ගත්තා.

"අංජලී ක්‍රිෂාන්ට ආදරේ නෑ... මට ඒක ඉන්ෂුවරන්ස් එකටත් වැඩිය ෂුවර්...!"

රාජ්ගෙ කතාව මගෙ හිතට ගෙනාවෙ ලොකු හයියක්...! ඉස්සරහට එන දවස් ටික, ජීවත් වෙන්න තරම් ෆිට් එකක් ඒ හින්ද මගෙ හිතට ආවා...

## 50

ආකාසේ දංගෙඩියක් වගෙයි. එළ කිරි. ඒත් ඉතිං රාජ් හිටිය නම් අහයි කිරි පාටක් කොහෙද යකෝ අහසෙ කියලා. ඌට ස්වභාව සෞන්දර්යය ගැන කියල වැඩක් නෑ. ඊට වැඩිය හොඳයි කට බිම උලා ගන්නෙක. එදා ෂහනාස් කතා කරල ටික දවසක් ගෙවිල ගියත් මට ඒකිට කතා කරන්න තරම් හිතට නිදහසක් තිබුණෙ නෑ. ඒක හින්දම ෂහනාස් හම්බෙන දවස මං දවසින් දවස මග ඇරියා. ඒත් දවස් ගානක් යද්දි මට ෂහනාස් ගැන පව් කියලා හිතුණා. ඒ නිසාම මං රාජ් අතේ පණිවිඩයක් ඇරියා අද දෙකට මාව නුගේගොඩ ස්ටේෂන් එකේදි හබ්බෙන්න කියලා.

දෙක වෙන්න වෙලාව තිබ්බ හන්ද මං "අමර" එකට ගියා. අරුන්දිගෙ වෙඩින් එක දවසෙ අංජලීට හොරෙන් ගත්තු අංජලීගෙ ෆොටෝස් ටික මං අරගත්තා. කොහේදෝ ඈතක අතරමං වෙලා වගේ බලන් ඉන්න අංජලීගෙ ඒ ස්නැප් හතරේ මං පුදුම තරමෙ ලස්සනක් දැක්කා. මට ඕයාව අයිති නෑ කියල මං කොහොම හිතන්නද ළංගි...! ඕයා මට කවදාවත් හම්බෙන්නෙ නැද්ද...? මං මගෙන්ම ඇහුවා. ඒත් ඉතිං පුරුදු විදියටම මට උත්තරයක් ලැබුණෙ නෑ.

නුගේගොඩ රේල්වේ ස්ටේෂන් එක ළඟට ඇවිත් මං වටපිට බැලුවා. මිනිස්සු හට්ට කඩිසුලප්පුව හැදිලද කොහෙද... වයින් කරල අතෑරපු සත්තු ජාතියක් වගෙ හතර අතේ ඇවිදිනවා.

"...ව්... විහඟ... අයියා...?"

ෂහනාස්ගෙ කටහඬ අඳුනගන්න මට ඒ තරම අමාරු වුණේ නෑ. තද දුඹුරු පාටට හැරුණු සල්වාර් ඇඳුමක් ඇඳන් ඉඳපු එයාගෙ වෙනදට වැඩිය අමුතු ලස්සනක් මං දැක්කා.

"... ෂබී... වෙලාවටම ආවනේ...?"



ෂහනාස් ළඟට යන ගමන් මං ඇහුවා.

"...ම... ඔව් අයියා... ගෙදරට පුංචි බොරුවක් කියන්නත් වුනා..."

පිපෙන්න හදන රෝස මලක් වගේ හිනාවෙච් ෂහනාස් කිව්වා.

"... එදා වගේම පිටකොටු යං ෂබී...!"

මං කිව්ව දේට මුකුත් නොකියා පුංචි එකෙක් වගේ ෂහනාස් ආයෙත් හිනාවුණා. ඒ හිනාවෙ තිබ්බ අහිංසක කම දැකල මගේ හිත සීතල වෙලා ගියා. අංජලී මට හම්බ වුනේ නැත්නම් ඔයා මගේ කරගන්න මං දෙපාරක් හිතන්නෑ ෂබී...! නුගේගොඩ හන්දිය වෙනකන් මායි ෂහනාසුයි වැඩි කතාවක් නැතුව ඇවිදින් ආවා.

"... එදා වගේම කොටුවට ගිහින් ඊළඟ බස්සෙකෙන් ආයෙ එනවද අයියා...?"

මූණෙ පිරිල තිබ්බ හිනාව බාගෙට තද කරන් ෂහනාස් අහනවා. ඒ ප්‍රශ්නෙට උත්තරයක් නොදී මං ෂබීගෙ අතින් ඇදගෙන බස්සෙකට නැගල වාඩිවුණා.

"... එදා වගේ නම් අද හදිස්සියක් නෑ ෂබී... අපි ගෝල්ෆේස් යං... ඔයාට කතා කරන්නත් දේවල් තියෙනව කිව්වනේ...!?"

ධාවනී. ඒකෙන් එළියට ඇවිල්ල තිබ්බ ෂහනාස්ගෙ දිග කොණ්ඩ කැලි, ජනේලෙන් එන සුළං පාරට නළල දිගේ දුවනවා. මං ජනේලෙ බාගෙට වහල එයා දිහා බැලුවා. අර බාගෙට තද කරන් ඉන්න හිනාව ඒහෙමමයි.

"... බලාගෙන ඔය හිනාව හිරවෙයි..."

මං කිව්ව එකට ෂහනාස්ට බකස් ගාල හිනා ගියා. අපිට ඉස්සරහ සීට් එකේ වාඩිවෙලා ඉඳපු මනුස්සයත් හැරිලා බැලුවා, ෂබීගෙ හිනාවට. ෂබීට කරන්න දෙයක් නෑ. ධාවනි එකෙන් කට වහගත්තා.

"...ඉතිං ෂබී..."

ටිකක් වෙලා ගියහම මං ෂහනාස්ගෙන් ඇහුවා. එයා නිල් පාට ඇස් දෙක ලොකු කරල මං දිහා බැලුවා. කලින් තිබ්බ දඟ හිනාව ඒ පුංචි මූණෙ තිබ්බෙ නෑ.

"... මට ඔයාගෙන් අහන්න හුඟක් දේවල් තියෙනවා අයියේ... ඒත් ඒ දේට මගේ හිත නිදහස් නෑ. ඔයා ගෝල්ෆේස් යං කිවහම මගේ හිතට ලොකු සතුටක් ආවා. ඒව ඔක්කොම උනත් එදා ඔයාට මං ෆෝන් කරපු දවසට වැඩිය සතුටින් ඔයා අද ඉන්නවා..."

ඒ ඔයා හින්ද ෂබී... කියල කියන්න හිතුනත් මං සද්දෙ වහගත්තා. අපනයා වගේ හිතන්නැතුව මගේ කියවල මේ අහිංසක කෙල්ලගෙ හිත ෆොඩි කරන් නැතුව ඉඳපං කියල මගේ හිත මට කිව්වා.

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 64

කොහොමින් කොහොම හරි මායි ෂහනාසුයි ගෝල්ෆේස් එකට එද්දි වෙලාව හතරටත් ළං වෙලා. බීච් එක අයිනට එද්දිම වගේ ෂහනාස් මගේ අතින් අල්ල ගත්තා.

"... කමක් නැද්ද අයියා...?"

අර නිල්පාට ඇස් දෙක ලොකු කරන් ආයෙමත් ෂබී මගෙන් ඇහුවා. අනේ පුංචි කෙල්ලේ... ඇයි මාව මේ තරම් අසරණ කරන්නෙ...? ෂහනාස් අහපු දේට මුකුත් නොකියා මං හිනාවුණා. ටිකකින් බීච් එකෙන් මෙහාට ඇවිත් මං බිම වාඩි වුණා. ඒත් ෂහනාස් හිටගෙන...

"මෙතනින් වාඩි වෙන්න ෂබී..."

අර ලස්සන දිග කොණ්ඩෙ වහන් ඉඳපු 'ධාවනි' එක අතට අරගෙන ෂහනාස් මං ගාවින් වාඩිවුණා. සුළං පාරට විසිරිලා යන ඒ දිග කොණ්ඩ කැලි ෂහනාස්ගෙ මූණ පුරාම දඟ කරන හැටි මං ඔහේ බලන් හිටියා. තවත් විනාඩි ගානක් ගෙවිල ගියත් එයා කතා කරේ නෑ. අර පිපිරෙන්න හදපු හිනාවත් ඒ සුදු මූණෙ තිබ්බෙ නෑ. ඒක හැංගිලා ගිහින්.

"... අයිය බලනව ඇති කතා කරන්න ඕන කියලත් ඇයි කතා නොකරන්නෙ කියල. කතා කරන්න ඕනකමටත් වැඩිය මට ඕනකම තිබ්බෙ අයියව දකින්න... අයියා ළඟට වෙලා ඉන්න...!"

එහෙම කියල ඉවර වෙලා ඒ නිල්පාට ඇස් දෙකෙන් මගෙ මුලු ආත්මෙටම, එබෙන්න හදනව වගේ ෂහනාස් මං දිහා බැලුවා.

"... ඉතිං දැන් ඒ ඔක්කොම හරිනෙ ෂබී... ඔයාගෙ හිතට පිච්චෙනෙ..."

ඒ සුදු මූණ දිහාම බලාගෙන මං කිව්වා. හැමදේම අමතක කරල මේ නිල් ඇස් තියෙන මුස්ලිම් කෙල්ල එක්ක ජීවිතේ පටන් ගනිං කියල මගේ හිත කෙඳිරුවා... ඒත්... ඒත්... ආයෙමත් මගේ හිතේ මැද්දෙම ලොකු පවුරක් වගේ අංජලී හිටගෙන ඉන්න හැටි මං දැක්කා.

"ඕ... ඔයා ලොකු කල්පනාවක අයියා... ංමේ...?"

මගේ දණහිසට පුංචි තට්ටුවක් දාන ගමන් ෂහනාස් ඇහුවා.

"...න්... නෑ... ෂබී...!"

කියාගන්න දෙයක් නැති කමට මං එහෙම කිව්වා.

"...ම...මං අයියා ගැන රාජ් ගෙනුත් ඇහුවා. ඒත් මගේ හිතට හරියන උත්තරයක් මට හම්බ වුනේ නෑ... ගෙදරිනුත් මට හුගක් කරදරයි විහඟ අයියේ..! මං හිතුවෙ, ...මං හිතුවෙ ඔයාව, ඔයා ගැන මතකය අමතක කරල දාන්න පුලුවන් වෙයි කියලා.. ඒත් ඔයාව තව තවත් මගේ හිත ඇතුලෙ හිරවුනා. ඕසක මට ඒ දේ කරන්න බැරි වුනා. අනේ මං මොනවද කරන්නෙ අයියා... මට ඔයාව දකින්නෙ නැතුව ඉන්න බෑ. මට නිතරම ඔයාව මතක් වෙනවා... අ...අනේ අයියා..."



ඒ නිල්පාට ඇස් දෙකේ පුංචි කඳුළු බිංදු දෙකක් හිරවෙලා තිබුණා. ආදරේ හිතෙන ඒ සුදු මූණෙ තිබ්බ දුක, මගේ මුලු හිතම පුච්චල දැම්මා.

"...ම... මට ස... සමාවෙන්න විහඟ අයියා... ම...මං මෙහෙම කියනවට. ඔයා මාව නරක කෙල්ලෙක් කියල හිතන්නෙපා දෙයියනේ... ම... මං ඔයාට ආදරෙයි අයියේ...! මට ඔයාව නැතුව බෑ..."

මගේ උරහිසට හේත්තු වෙන ගමන් ෂහනාස් කියවගෙන ගියා. දෙවියනේ...! මේ මොනවද වෙන්න යන්නෙ... මං මොනවද මේ අහිංසක කෙල්ලට කියන්නෙ...?"

## 51

ෂහනාස්ට කියන්න ඕන මොනවද කියල මං විංග වෙලාවක් කල්පනා කරා. එයාගෙ ඇස්වලින් බේරෙන උණුම උණු කඳුළු බිංදු මගේ ටී ෂර්ට් එකේ පැත්තක්ම තෙමල තිබුණා. රත්තරං ආදරයක් හිතේ පුරවගෙන මේ පුංචි කෙල්ල විඳින දුකට සම්පූර්ණයෙන්ම වග කියන්න ඕන මමයි කියන හිතුවිල්ල හිතට ආවහම මගේ හිත කඩන් වැටුණා.

"...ෂ... ෂබී... ප්ලීස් න... නංගි අඬන්නෙපා... ප්ලීස් ෂබී... මේ මං දිහා බලන්න... ංමේ....?"

මං එහෙම කිව්වහම ෂහනාස් මගේ උරිහිසෙන් ඈත්වෙලා මං දිහා බැලුවා. දියමෙනේරි මල්වල තියෙන තද නිල්පාට ඒ ඇස් දෙකේ මං දැක්කා.

"ම... මට කියන්න විහඟ අයියේ... ඔයාගෙ හිතේ හිර කරන් ඉන්න හැමදේම අදවත් මට කියන්න අයියේ... ඔයාගෙ හිතේ මං ගැන චුට්ටම චුට්ටිත්තක්වත් ආදරයක් නැද්ද...?"

වචන කැඩි කැඩී බිඳිච්ච හඬින් ෂහනාස් මගෙන් අහද්දි මගේ හිත ආයෙමත් කඩන් වැටුණා. මං හැමදේම ඔයාට කියනවා ෂබී...! මගේ අසරණකම ගැන ඔයාට කියනවා. ඔයා මට සමාව දේවි. ඔයාගෙ විහඟ අයියට ඔයා සමාව දේවි.

"...ඈ... ඇයි ෂබී, එහෙම අහන්නෙ...? මගේ හිත ඇතුලෙ තියෙන හැමදේම මං ඔයාට අද කියනවා... එතකොටවත් ඔයා මාව තේරුම් ගනියි ෂබී...! ඔයා එදා මට ෆෝන් කරපු වෙලාවෙ මගෙන් ඇහුවා මං සංතෝසෙන්ද ඉන්නෙ කියලා... ඔයාට මතකද නංගි මං නෑ කියල කිව්වා...! මං එහෙම කිව්වෙ මගේ සංතෝසෙ හොරූ අරන් ගියපු හන්ද... ඒකට හේතුව මෙන්න මෙයා...?

WWW.SINHALAELIBRARY.COM 65

එහෙම කියලා, මෙච්චර වෙලා මගේ ටවුසර් එකේ දණහිස ගාව පොකට් එකේ දාල තිබ්බ අංජලීගෙ ෆොටෝස් හතර ෂහනාස්ට මං දුන්නා. ඒ ටික අතට ගනිද්දි ෂබීගෙ රෝස පාට ඇඟිලි වෙව්ලන හැටි මං හොඳටම දැක්කා. අංජලීගෙ 'ස්නැප්' බලද්දි ඒ ලස්සන නිල් ඇස් පුදුමෙන් වගේ ලොකු වෙනවත් මං දැක්කා.

"...ඕ... ගෝඩ්... ලස්සන ගර්ල් කෙනෙක්... හයි ක්ලාස් කොලිටි අයියෙ... ඔයාගෙ තේරීම නම් එක්සලන්ට්..."

ෂහනාස් එහෙම කියද්දි මං මුකුත් කිව්වෙ නෑ. හිත පුරාම මං ඇදිල ඉන්දෙද්දිත්, එයාට එහෙම අංජලී ගැන කියන්න පුලුවන් වුණා නම්, ෂහනාස් කොයි තරම් ලස්සන හිතක් තියෙන කෙල්ලෙක්ද කියල මට හිතුණා. ෂබීත් එතනින් එහාට මුකුත් කතා කරේ නෑ. මුලු ගෝල්ෆේස් පිට්ටනිය පුරාම අපි දෙන්න විතරක් තනිවෙලා කියල මට හිතුනා.

"...ඒ... ඒ... කියන්නෙ ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් තමයි මේ...ආ..!?"

අංජලීගෙ ෆොටෝස් හතරම මං දිහාට දික්කරල ෂහනාස් මගෙන් ඇහුවා. ඒ මූණෙ තිබ්බෙ පුදුම සංසුන් පෙනුමක්. කලින් තිබ්බ දුක, පසුතැවිල්ලෙ සලකුණු මුකුත්ම තිබ්බෙ නෑ. අවස්ථාවෙ හැටියට මූණ දෙන්න මේ ලස්සන මුස්ලිම් කෙල්ලගෙ තියෙන දහිරිය ගැන මට පුදුම හිතුණා... බලන් ගියාම මම නෙමේ එක්සලන්ට් ෂබී...! ඔයයි එක්සලන්ට්.

"...නෑ... ෂබී... නෑ...!"

ෂහනාස්ගෙ ප්‍රශ්නෙට මං උත්තර දුන්නා. මගේ උත්තරෙන් එයාගෙ මූණ අමුතු වෙලා ගියා.

"...ව... වට...?"

"ඔ... ඔව් ෂබී... ඒ... එයා මගේ ගර්ල් නෙමෙ. ඒත් මේ පුංචි කෙල්ලට මං ආදරේ කරා ෂබී... මං එයාට ආදරේ කරා. ඒත් එයා ආදරේ කරේ මට නෙමෙයි නංගි... මට නෙමෙයි... ඒ විත්තිය මං දැනගත්තෙ හුඟක් පහුවෙලා. දෙයියනේ... ඒ වෙනකොට මගෙ හිත ආයෙමත් හදාගන්න බැරි විදියට ඒ ආදරේ පස්සෙ දුවල තිබුණා. ම... මං මොනවද දන් කරන්නෙ ෂබී... මං මොනවද කරන්නෙ...?"

ඒ නිල් ඇස්වලට ආයෙමත් කඳුළු උනන් එන හැටි මං දැක්කා. ඒත් ෂහනාස්ට අඬන්නෙපා කියල කියන්න පුලුවන් කමක් මට තිබුණෙ නෑ. ඒ මගේ ඇස්වලටත් කඳුළු උනන් ආපු හින්ද.

"... ක... කල්පයක් ගියත් මගේම කියල හිතන් හිටපු ඒ පුංචි කෙල්ල වෙන කෙනෙක්ගෙ කියල දැනගත්තු දවසෙ මං පුදුම විදියට විඳෙව්වා. ෂබී... ඔයා දන්නෑ, මං... මං ඇඬුවා. කොල්ලෙක් ලේසියෙන් අඬන්නෑ ෂබී... ඒත් මට හම්බෙන්නැති ආදරයක් හින්දා මං ඇඬුවා. අදත් මං අඬනවා ෂබී.. අදත් මං අඬනවා..."



ඒ අන්තිම වචන ටිකත් එක්කම මගේ කටහඬ බිඳිල ගියා. හිතේ හිර කරන් ඉඳපු දුක, සීමා බැම් කඩාගෙන ඉරි තලල යනවා මට තේරුණා. ඉඳගෙන ඉඳපු තැනින් නැගිටල මගේ මූණ ඉස්සරහටම ඇවිත් ෂහනාස් දණ ගහ ගත්තා. ඊට පස්සෙ මගේ අත් දෙකම අරන් එයාගෙ උකුලෙ තියාගත්තා. දෙයියනේ... මේ අහිංසක කෙල්ලගෙ මූණෙ තියෙන දුක...

"..අ...අනේ විහඟ අයියෙ... මං දන්නෑ ඔයා මේ තරම් විඳවනවා කියලා... මට තේරෙනවා.. ඔයාට මාව ලංකරගන්න බැරි ඇයි... කියලා... මං ඔයා ගැන අහිතක් හිතන්නෑ අයියේ... ඕ... ඔයාට තමයි මං මේ ලෝකෙ දැකපු ලස්සනම හිත තියෙන්නෙ..."

ගෝල්ෆේස් පිට්ටනියෙ අපි ඉඳන් ඉඳපු තැනින් එහෙට මෙහෙට දුවන පුංචි ඇයොන්ගෙ කෑ ගැහිල්ල විතරක් යන්තම් මට ඊළඟ තත්පරේදි ඇහුණා. මහා සෙනඟ කන්දරාවක් මැද්දෙ මං අඬනවා කියන හැඟීම ඊගාවට මගෙ හිතට ආවා. ඒත් එක්කම තමයි ෂහනාස් එයාගෙ 'ධාවනී' එකෙන් මගේ කඳුලු පිහිදැම්මෙ.

"...ඒ... එයා ඔයාට කවදාවත් ආදරෙයි කියල කිව්වෙ නැද්ද අයියේ...?"

ෂහනාස්ගෙ කටහඬත් බැරෑන්ඩි වෙලා කියල මට හිතුණා.

"...නෑ... ෂබී... කවදාවත් නෑ... හැම දුකක්ම මට ඉතුරු කරලා එයා අන්තිමට මට කිව්වෙ, මට සමාවෙන්න අයියේ" කියල විතරයි... ඒත් එයා මට නැතිවුණා කියල මගේ හිතේ තියෙන ආදරේ නැති කරල දාන්න මට පුලුවන්ද ෂබී... මං එයාට කරදරයක් වෙන්නෑ... පහුගිය කාලෙ වෙච්ච හැමදේම මගෙ හිතේ හැමදාටම තියෙනවා... මට ඒව අමතක කරන්න බෑ..." මං දිගටම කියාගෙන ගියා...

"...අයියට් මතකද... මං අයියව ඉස්සෙල්ලම දැක්කෙ, එදා බේරුවල වෙඩින් එකේදි... මං එදා ඔයාගෙ ෆොටෝ එකක් ගත්තා... ඒ ෆොටෝ එක අදත් මං ගාව තියෙනව විහඟ අයියේ... කැමරා එකත් අතේ තියාගෙන ලස්සනට හිනාවෙලා ඉන්න ඔයාට, මේ තරම් දුකක් හිතේ තියන් ඉන්න වෙලා කියල මං කවදාවත් හිතුවෙ නෑ... ඒත් මේ දේත් ඔයා දැනගන්න ඕන අයියේ... ඔයා ඒ ලස්සන ගර්ල් ගැන හැමදාම හිත හිත ඉන්නව වගේම, මාත් ඔයා ගැන හැමදාකම හිතනව හොඳේ... මේ...?..."

මං දිහාට පාත්වෙන ගමන් ෂහනාස් කිව්වා. ඒත් එතනින් එහාට ෂහනාස්ට මුකුත් කියන්න හම්බවුනේ නෑ. මට හොඳට හුරු පුරුදු රතුපාට කැබ් එකක් ෂබීයි, මායි ඉඳපු තැන හරස් කරල නැවැත්තුවා. ඒකෙ එක පැත්තකින් ක්‍රිශානුත් අනික් පැත්තෙන් නියාසුත් බහිනවා මං දැක්කෙ හීනෙන් වගේ. මං ෂහනාස් දිහා බැලුවා. එයත් හොඳටම බය වෙලා. මුං දෙන්නා කොහොම සෙට් වුණාද කියල දෙයියො තමයි දන්නෙ. නියාස් කියන්නෙ ෂහනාස්ව බඳින්න ඉන්න එකා. ක්‍රිශාන් කියන්නෙ අංජලී

WWW.SINHALAELIBRARY.COM 66

බඳින්න ඉන්න එකා. ඒ කියන්නෙ වලියක් මුදු මුවර්. කෙටියෙන් කියනව නම් විහඟ වික්‍රමසිංහට ඉතිහාසගත කෑමක් කන්න වෙනවා.

## 52

ඒහපොට නම් හොඳම නෑ වගේ තේරුණු හන්ද මං සහනාස්වත් අතින් ඇදගෙන ඉඳපු තැනින් නැගිට්ටා. අද නම් කොහොම කරච් කන්න වෙනවා... කමක් නෑ... ගැහුවොත් ගහනවා කියල මං හිතා ගත්තා. මගේ මූණ ඉස්සරහටම ඇවිත් උං ඩබල හතර වුණා. දැන් ආයෙ හැරෙන්න බෑ. ඒක හන්ද උංම ගේම ස්ටාර්ට් කරනකන් මං බලන් හිටියා. නියාස්ගෙ මූණ තද රතුපාට වෙලා තිබුණා. ඒ වෙනකොටත් මං හිටියෙ සහනාස්ගෙ අතින් අල්ලගෙන මං ඒ අත අතෑරියෙ නෑ.

"...මුද්දර්...? ජාතික සමගිය ඇතිකරන්න වගේ... ආ...!.."

මං හිතුවෙ නියාස් ගේම අදියි කියලා. ඒත් ක්‍රිෂාන් මුලින්ම ගේමට බැස්සා...

"...එහෙම හිතමුනේ...?"

තෝන්ඩි හිනාවක් ක්‍රිෂාන් කරායට දාන ගමන් මං කිව්වා. මෙන්න මේ වගේ වෙලාවට මද්දු හරි රාජ් හරි හිටියනම් කොයි තරම් වටිනවද කියල ගෙවෙන තත්පරෙන් තත්පරේට මට හිතුණා.

"...අ...අපි... ය... යං ෂබී...?"

සහනාසුත් මං ගාව හන්ද මුකුත් කරන්න බෑ. ගේම පස්සට තියල මං යන්නයි හැදුවෙ.

"...යාලුවා... උඹ එදා බේරුවලදී මගේ ෂර්ට් එකෙන් අල්ලලා තදයා වුණානේ. අද ඒවට රිටර්න් එක කියල හිතාගනිං... ෂබී... මෙහෙට වරෙන්..."

නියාස් එහෙම කියන ගමන් සහනාස්ගෙ අතින් ඇද්දා. අර වෙනද වගේ නියාස්ට බනින්න තරම් ගැම්මක් ෂබීගෙ මූණෙ තිබ්බෙ නෑ.

"... නියාස්... මං හොඳින් කියන්නෙ... ? ඔය කෙල්ලගෙ අත අතෑරපං..."

මගෙ කෑ ගැහිල්ලට දහ පහළොස් දෙනෙක් විතර වටවුණා අපි හතර දෙනා ගාවට. ඒත් ඒ කවුරුවත් මගෙ උදව්වට හිටියෙ නෑ.

"...අතෑරියෙ නැත්තං උඹ මොනා කරන්නද ලොක්කා. මෙකි අයිති මට..."

එහෙම කියන ගමන් නියාස් සහනාස්ගෙ අත තවත් ඇඹරුවා. මං



නියාස්ට ගහන්න පැන්නෙත්, ක්‍රිෂාන් ඒක නවත්තන්න මං ඉස්සරහට පැන්නෙත් එක පාරටම වගේ. ඒත් අපි තුන්දෙනාටම හෙල්ලෙන්න විදියක් නැති වෙන්න තද රතුපාට කාර් එකක් 'බග්' ගාල ඇවිත් අපිට හරස් කරා. තව ඩිංගෙන් ඒක ක්‍රිෂාන්ල ආපු කැබ් එකේ වදිනවා. ඉදපියො එච්චර වගේ මොකාද දන්නෑ ආවෙ. යකෝ පොලීසියෙන් වත්ද ? ඒත් ඊළඟ තත්පරේ කාර් එකෙන් බහින දෙන්නා දැකල මං ඩබල් එකේ හොල්මං වුණා. කාර් එකෙන් බැස්සෙ අරුන්දියි, එයාගෙ හස්බන්ඩ් අජයයි...!

"...වි... විහඟ... වට්ස්... රෝන්...?.... ඇයි මේ...?"

මගේ අතකින් පැත්තකට අදින ගමන් අරුන්දි අහනවා. හොඳ වෙලාවට මෙකි හරි ආවෙ. නැත්තං මොනවායින් මොනව වෙයිද මංදා. අජය, ක්‍රිශාන්වයි, නියාසුයි කූල් කරන්න ට්‍රයි කරනවා මං දක්කා. සහනාස් හොඳටම බය වෙලා අඬනවා, මිනිස්සු, හින්දි ෆිල්ම් එකක් බලනවා වගේ වට වෙලා ආතල් ගන්නවා. කලින් දහයයි පහළොවයි හිටියෙ. දැන් පනහක් හැටක් විතර වටවෙලා. මොනව කරන්නද පත්තරේ මූණ ගියා වගේ තමයි.

අජය, අරුන් ඩබල ශේප් කරද්දි, අරහෙන් මෙහෙන් මං අරුන්දිට ස්ටෝරිය කිව්වා. එක් අහල ඉවර වෙලා අරුන්දි ගිහින් සහනාස්ගෙ අතින් අල්ල ගත්තා.

"... ඔයාල මෙතන රණ්ඩු වෙන්න හදන්නෙ මේ ගර්ල් හින්දනෙ... මං මෙයාව එයාගෙ ගෙදරට ඩ්‍රොප් කරනවා. ඔයාල දෙන්න යන්න දැන්... විහඟ... කම් විත් මී...!"

බලන් ගියාම මාර ගටක්නෙ අරුන්දිට තියෙන්නෙ... ක්‍රිශාන්ටයි, නියාස්ටයි කරගන්න දෙයක් නෑ. මිනිස්සුත් වටවෙලානෙ. අර මොනවද කාපු රිලව් වගේ. උං දෙන්නා පිපිරි පිපිරි බලන් හිටියෙ.

"හප්පේ... ඇති යාන්තං... මොනාද විහඟ ඔයා දාගන්න ලෙඩ.. ලැජ්ජ නැද්ද සෙනඟ ඉස්සරහ..."

කාර් එකේ නැගල ටිකක් දුර එද්දි අරුන්දි බර බරේ දුම්මා. මායි සහනාසුයි හිටියෙ පස්ස සීට් එකේ.

"...විහඟට බනින්නෙපා මිස්... එයාලයි රණ්ඩුවට ආවෙ..."

මං මුකුත් කියන්නත් කලින් සහනාස් ඉස්සර වුණා. අරුන්දිට එක පාරටම හිනා ගියා. අජයත් ඩ්‍රයිව් කරන ගමන් අරුන්දි දිහා බැලුවා.

"...මොකෝ බං හිනාවෙන්නෙ...?"

බැරිම තැන මං අරුන්දිගෙන් ඇහුවා.

"...නෑ... ඉතිං උඹ කියනවා නම් මේ මුස්ලිම් බේබි එක්ක මුකුත් නැල්ලු. ඒත් මං උඹට බනිනකොට මෙයා දඬස් ගාල පනිනවා. හැබැයි පුතෝ, මං අම්මට රිපෝට් එක දෙනවා..."

WWW.SINHALAELIBRARY.COM 67

අරුන්දි හිනාවෙන ගමන් කියවන් ගියා. හජ්ජේ... මෙකී කිව්වත් වගේ අම්මට රිපෝට් එක දෙයිය මංදා.

"...ෂබී...?...?"

අරුන්දි කියවල ඉවරවුණාට පස්සෙ මං හෙමීට ෂහනාස්ට කතා කරා. පව්..! ඒ ඇස්වල තාම කඳුළු පිරිලා.

"... ඔයාට අද ගෙදර ගියාම හොඳටම බැනුම් අහන්න වෙයි නේද ෂබී...?"

"...කෝ... කමක් නෑ විහඟ අයියා... ඔයා ගාව හුඟක් වෙලා හිටියනේ... ඒකට ඉතිං දඬුවමකුත් තියෙන්න ඕනනෙ...? ඒත්... ඒත්... ?..."

"...ඇ...ඇයි... ෂබී..?"

"... අර ලස්සන ගර්ල්ව කවද හරි ඔයාටම හම්බෙන්න කියල මං ඔයාට විෂ් කරනවා අයියා..."

හිත් සද්දෙට ෂහනාස් එහෙම කියද්දි මගේ හිත ගොළුවෙලා ගියා. ඒ හිතේ දුක නැති කරන්න නම් මං එක වචනයයි කියන්න ඕන. ඒත් පුරුදු විදියටම අංජලී මගේ හිත හිරකරල තිබුණා. ඊට පස්සෙ නුගේගොඩටම එකකත් වගේ ෂහනාසුයි මායි අතරෙ වැඩි කතා බහක් තිබුණෙ නෑ. අරුන්දියි, අජයයි සැරින් සැරේට එක එක කතා කියල විහිලුවක් දෙකක් කරත් මගේ හිත තිබුණෙ හුඟක් දුර ඈතක. අද ගෙදර ගියාම ෂබීට මොනා වගේ තත්වෙකට මූණ දෙන්න වේවිද මංදා.

නුගේගොඩ හංදියෙන් මාවයි ෂහනාස්වයි බස්සවල අජයයි, අරුන්දියි යන්න ගියා. බෝගහ ගාව යකඩ වැටට අත තියන් අතරමං වෙලා වගේ බලන් ඉන්න ෂහනාස් දිහා මං බැලුවා.

"...මං... මං ආයෙමත් ඔයාට හම්බවෙන්න එනව ෂබී... ඒත්... ඒත්... ඒ ඇයි කියල කියන්න මට තේරෙන්නෙ නෑ. මං හිතනවා ඔයා මාව තේරුම් ගනී කියලා..."

ෂහනාස්ගෙන් වෙන් වෙන් තියෙන්නෙ තව ඩිංග වෙලාවයි. ඒ ඩිංග වෙලාවෙදි හරි හිතේ තියෙන දේ කියල නිදහස් වෙන්න ඕනෙ. මං හිතා ගත්තා.

"...ෂබී..., ගොල්ෆේස් එකේදි අර නියාස් එක්ක ආපු අනිත් එකා තමයි අංජලීව බඳින්න ඉන්නෙ...! මගේ හිතට හොඳටම ළං වුණු ඔයාල දෙන්නාවම මැරී කරන්න දෙන්නෙක් ඉන්නවා. අංජලී කොහොම වුණත්, ඔයා නියාස්ට කැමති නෑ කියල මං දන්නවා... මට කියන්න ෂබී... මට එක දෙයක් කියන්න... ඔයා වෙනුවෙන් කරන්න දෙයක් මට තියෙනවද කියලා..."

මං එහෙම කිව්වහම ඒ නිල් පාට ඇස්වල ඒ වෙලාවෙ තිබ්බ බැල්ම මට ජීවිත කාලයටම අමතක කරන්න බැරි තරමෙ දෙයක් වුණා.



"... ඔයාට කරන්න තියෙන දේ මේ වෙලාවෙ ඔයාට කරන්න බෑ අයියා...! මේ වෙලාවෙ ඔයා අසරණයි කියල මං දන්නවා...! එහෙනම්... හැමදාම සංතෝසෙන් ඉන්න බලන්න අයියේ... ඔයාට සුභ ගමන්..."

එහෙම කියල ෂහනාස් මගෙන් ඈත් වුණා. මුලු ලෝකෙම එකම එක තත්පරයකදි කඩන් වැටුණු වගේ මං එයාගේ කයිලෙවල් පාර දිහා බලන් හිටියා.

# 53

මුලු ලෝකෙම කඩන් වැටෙද්දි හැංගෙන්න ගොලු බෙලි කටුවක්වත් නැති එකෙක් වගේ අතරමං වෙලයි මං හිටියෙ. මුස්ලිම් දාල ෂහනාස් යන්න ගිහින් තිබුණා. ඒ නිල්පාට ලස්සන ඇස් ඉස්සරහ තිබ්බ කඳුළු කැට කන්දරාවයි. "ඔයා වෙනුවෙන් මට කරන්න දෙයක් තියෙනවද ෂබී.." කියල මං අහද්දි එයා මං දිහා බලන් ඉඳපු විදියයි මගේ හිත ඇතුලෙ කෙටුවා වගේ රැඳිල තිබ්බා. ඒත් ඒ අස්සෙන් අංජලීගෙ අසරණ හිනාවයි, හුරතල් කතාවයි මතක් වෙද්දි මං කොයි තරම් අසරණ ද කියල මට හිතුණා.

කියාගන්න බැරිතරමෙ හෙමින් දවස් ගෙවිල යද්දි මං හිටියෙ කිසිම අරමුණක් නැතුව. පහුවුණු දවස්වල වුණ දේවල් හිත ඇතුලෙ හතරවටෙ කැරකෙද්දි, හිත පිච්චුනේ පාරක් දෙපාරක් නම් නෙමෙ.

"....ආ ! බ්‍රදර්... ඒ නම් ජාතික සමගිය ඇති කරා නේ..."

මේසෙට ගහන් ඉඳපු ඔලුව මං ඉස්සුවා. තෙණ සිරා හිනාවක් මූණෙ තියාගෙන ඉන්න රාජ්ව ඊගාවට මගේ ඇස් වලට අහුවුනා. ඇත්තට මූ වගේ යාලුවෙක් ඉන්න එක ගැන නම් මගේ හිතේ තිබුණෙ පුදුම පිට එකක්...! ඕනා අප්සට් වෙලාවකදි මූ ළඟ ඉන්නවනේ.

"...මො... මොකක්ද උඹ ඇහුවෙ...?"

ඌ කියපු එක හොඳටම ඇහුණත් මං එහෙම ඇහුවා. ෂූවර් එකට ෂහනාස් තැත්තන් නියාස් සීන් එක මූගේ කනේ තියල ඇති. මට කියන්න දෙයක් නැතුව ඇති.

"...ඒකත් උඹට ඇහුණෙ නැද්ද...? උඹ කවදහරි පොලිටික්සෙක් වෙයි කිව්වා. මේ බෙදුම්වාදී අරගලය නවත්තල මුස්ලිම්, සිංහල ජනතාවගේ සෞභාග්‍යවරීභාවය හරිගස්සල භෞමික අඛණ්ඩතාවය ඇති කරාට..."

"...මො...ක...ක්..."

WWW.SINHALAELIBRARY.COM 68

මට බසක් ගාල හිතා ගියා. මූ ඇත්තට මේ වචනවල තේරුමවත් දන්නවද දන්නෑ. සෙවරිභාවයක් ගැන කියන්නෙ. මං උෟ දිහා බැලුවා. උෟත් හිනාවෙනවා.

"...ඒයි... උඹ යමුල කපන්නැද්ද...?"

ටිකක් වෙලා ගියාට පස්සෙ මං රාජ්ගෙන් ඇහුවා.

"...නෑ... බං... උඹ අර එක දවසක් හෝමාගමදි කොන්ඩෙයි යවුලයි දෙකම කිවවෙලා කපන් ආවට පස්සෙ මට ඒකත් එපා වුණා බං..."

උෟ ආයෙත් හිනාවෙන්න ගත්තා. එදා නම් කොන්ඩෙ කපන්න වුනේ මද්දුවගෙ කුණු ශෝස් හින්දනේ. මූට මේව මතක තියෙන එකනෙ වැඩේ.

"... ඒක නෙමේ බං... මං සිරාවට අහන්නෙ...? උඹ අද කෙහා ජොලි මූඩ් එකෙ ඉන්න විත්තිය නම් පේනවා..."

රාජ්ගෙ මූණ දිහාම බල බල මං ඇහුවා. මූට මොකක් හරි ආතල් එකක් උඳේ පාන්දරම ගිහින් වගේ.

"... පොඩි සීන් එකක් තියෙනවා උඹට කියන්න..."

උෟ එහෙම කියල ඇස් දෙක පුංචි කරා.. ඒ කියන්නෙ පොඩි සීන් එකක් කියල කිව්වට මේක නැගල යන එකක් ඒක බුද්ධ පුවර්.

"..ෂබිට කරදරයක්ද රාජ්...? ඒ කෙල්ලව ගෙදරින් බැනලද...?" මං එකපාරටම රාජ්ගෙන් ඇහුවා. උෟ පුදුම වෙලා වගේ මං දිහා බලන් ඉන්නවා.

"...නෑ. එහෙම අවුලක් නෑ.. ඒත් මට අවුල කවදාවත් නැතුව උඹ සිරාවට ෂබී ගැන අහපු හින්ද... තියාස්ව මට හම්බ වුණා මචං... උෟ මට සීන් එක මුල ඉඳන් අගටම කිව්වා..."

මගේ හිතේ තිබුණෙම ෂහනාස්ට ගෙදරින් හොඳටම බනින්න ඇති කියලයි... එතකොට නියාස්, ෂහනාස්ලගෙ ගෙදරට මුකුත් කියල නැද්ද ?

"... එදා උඹයි ෂබියි මැද්දට නියාස් පැන්නනේ... වෙච්ච දේවල් ගැන උෟ අවංකවම දුක් වෙනව විතර..! එදා එහෙම හැසිරෙන්න වුණේ, එක පාරටම උඹවයි ෂබීවයි දැක්කහම උෟව ඉන්න තැනත් අමතක වුණාලු. උෟ ෂබිලගෙ ගෙදරටවත් වචනයක් කියල නෑ. ඒකි ගෝල්ෆේස් හිටිය කියල..."

රාජ් කියවන් යනවා. ඒ කියවන් යද්දි මං මැද්දට පැන්නා.

"... ඒ වුණාට උෟ එදා රඟපෑවෙ වෙන චරිතයක්නෙ බං... තනිකරම දුෂ්ඨයෙ චරිතයනෙ... උඹිලගෙ භාෂාවෙන් කියනව නම් උෟ හිනාමූනක් තියන් ඉන්න දුෂ්ඨයෙක් !!! විල්ලන් කෙනෙක්..."

මං එහෙම කිව්වහම රාජ් එක පාරටම මගේ මූණ දිහා බැලුවා.



"... උෟ විල්ලන් කෙනෙක් වුනාවෙ... ක්‍රිශානුත් පැන්නක ඉඳපුවාවෙ... මට නාම ෂබී හම්බවුණේ නෑ. ඔක්කෝටම කලින් මං උඹවයි හම්බෙන්න ආවෙ...., උඹ මොනව කරනවද කියල බලන්න..."

"...උඹ දන්නැති දෙයකුත් තියෙනවා රාජ්... ගෝල්ෆේස් එකේදි ෂබී මට ආදරෙයි කියල කිව්වා...?"

"...ච... චච...!?"

පොල් සයිස් එකට උගේ ඇස් ලොකු වෙන විදිය මං දැක්කා. තේරුම් ගන්න අමාරු හැඟීම් මහ විශාල තොගයක් ඒ මූණෙ ලියවිලා තිබුණා.

"... ඔව්... රාජ්... මට කරන්න දෙයක් තිබුණෙ නෑ.. ඒක හන්ද අංජලි ගැන මං ෂබිට කිව්වා. පව් මචං...! හැම දේම හිතේ තියෙද්දි ඒකි මට විශ් කරා... මට දුක ඒකයි..."

මං කිව්ව දේට රාජ් මුකුත්ම කිව්වෙ නෑ. ඒත් උගේ මූඩ් එක අප්සට ගියා.

"... මය බලපං, මය වෙලාවට තමයි මට උඹත්තෙක්න මළ පනින්නෙ. උඹ මොකටද ෂබිට කියන්න ගියේ අංජලි ගැන... ඒ වෙලාවෙ හිතට ෆිට් එක අරන් ඒකි ඉන්න ඇති.. ඒත් දන් නම් ඒකිගෙ හිත හදන්න නම් සම්මකපේ බැරි වේවි..."

"...කවද හරි මය විත්තිය ෂබිට කියන්න වෙනවනෙ බං... නැත්නං මං හැම පැත්තෙන්ම වැරදි කාරයා වේවි..."

"... උඹ කියන දේවල් වලට මං මුකුත් කියන්නෙ නෑ. මං කිව්වෙ ෂබී ගැන...! ඒත් උඹෙ හිතේ ඉන්න අංජලී උඹට එක දවසක්වත් ෆෝන් කරාද ? නෑ... උඹව හම්බෙන්න ට්‍රයි කරාද...? නෑ...! මොකද ඒකි මේ ගෙදර දන්නැතුව නෙමේනෙ...! අර... අර... මොකෙක්ද එකෙක් කියපු දේ සම්පූර්ණ ඇත්ත බං...! අපි ආදරේ ඇයො, අපිට ආදරේ නෑ... අපිට ආදරේ ඇයොන්ට අපි ආදරේ නෑ..."

රාජ් කියවන් ගියපු දේවල් මගේ හිත පතුලටම වැදුනා. උෟ ඒ කිව්වෙ උංගියි, ෂබියි ගැන. ආයෙ ඒකෙ හෝදන්න දෙයක් නෑ.

"... උඹ කියන දේ ඇත්ත බං... ඒත් උඹම හිතපං... මං අංජලීව හම්බෙන්න ගියා... එදා අරුන්දිගෙ වෙඩින් එකේදිත් මට හම්බ වුණා. ඒත් මං මොනවද ඒකිත් එක්ක කතා කරන්නෙ...? මං ආදරේ ගැන කතා කරන්න යනකොට ඒකි බයවෙනවා බං...! මගෙ හිත ඇතුලෙ ඒකි ගැන තියෙන ආදරේ අංජලී දන්නැතුව ඇති කියලා මට හිතෙනවා..."

"... බයිල නොගහ ඉඳපං බං... ඒකි බබෙක්ද මීක නොතේරෙන්න... ඒත් නම් බලන් හිටියා හොඳටම ඇති... මං කියන්නම් වැඩේ... උඹ අංජලීව

WWW.SINHALAELIBRARY.COM 69

ෆෝන් කරල තියපං කතා කරන්න ඕනය කියලා... හරිගියොත් හරි ගියා. වැරදුනොත් කරන්න දෙයක් නෑ... උඹ කතා කරපං..."

මං රාජ් දිහා බැලුවා. මූ කියන එකත් ඇත්ත. තවත් මේ ගැන හිත හිතා හිටියොත් මගේ හිත රිදෙන එක විතරයි වෙන්නෙ... ආයෙත් සැරයක් හිත වෙනස් වෙන්න කලින් මං සාලෙට ගිහින් අංජලීගෙ ෆෝන් නම්බර් එක ඩයල් කරා. ඩිංග වෙලාවයි ගියේ. එහා පැත්තෙන් අංජලීගෙ හඬ මට ඇහුණා.

"...උංගි... මං මේ විහඟ කතා කරන්නෙ...?"

මං කතා කරපු සද්දෙටද මංදා අංජලී ගොළු වුනා. මෙකී ෆෝන් එක තියයිද මන්දා. හැබැයි උංගියෝ... ඔයා ෆෝන් එක තිබ්බොත් හෙම මං එක හිතින්ම ගෙදර ළඟටම ඇවිත් වහලට තඩි ගලකින් හරි ගහනවා. මං එක හිතින්ම හිතා ගත්තා.

## 54

ෆෝන් එකේ එහා පැත්තෙන් මේ ලෝකෙ සද්දයක් ආවෙ නෑ. ඒත් ඉතිං ඉස්සෙල්ල 'හෙලෝ' කියල කතා කරානෙ. මොන මගුලක් ද ? චාටර් වෙනව කියල මෙච්චර චාටර් වෙන්නත් බෑනෙ. මට මල පැන්නා, දෙසීය ගානට. ඒක හන්ද මං ආයෙත් සැරයක් මහ සද්දෙට 'උංගි' කියල කෑ ගැහුවා. මට ඩිංගක් එහායින් ඉඳපු ශ්‍රී රාජ් තත්පරෙන් දෙකෙන් හොල්මං වෙනව මං දැක්කා.

"... ම... මට ඇ... ඇහෙනවා විහඟ අ... අයියා..."

කෙඳිරිල්ලක් වගේ අංජලීගෙ කටහඬ එහා පැත්තෙන් මට ඇහුණා. ඒත් මගෙ හිතට අනුකම්පාවක් නම් ආවෙ නෑ. මං හිටිං ය කුණු වෙන්න මළ පැනලා.

"..... ඇහෙනව නම් ඇහුණ වගේම කතා කරනවාත් ඕන උංගි... ඔයා මං කවුරු කියල හිතාගෙනද මට ඔහොම කරන්නෙ...? අතීතෙක ඔයා මොන වගේ කෙනෙක්ද කියල මට තේරෙනවා. ඒත් ඒක තේරෙනකොට මං පරක්කු වැඩියි. මං.. මං මෙච්චර ඔයාට ළංවෙන්න හදද්දී ඔයා මගෙන් ඈත් වෙන්නත් හේතුවක් තියෙනව කියල මගේ හිත කිව්වත් මං ඒක පිළිගත්තෙ නෑ... ඒත් ඒ ඇයි කියල ඔයා දන්නවා.. ඒ දන්නෙත් නැත්තන් ඔයාට හිතක් පපුවක් නෑ කියල අන්තිමට මං හිතා ගන්නව නංගි... පහුගිය අතීතෙ අමතක කරන්න තරම් මං පාහරයෙක් නෙමේ උංගි... ඒත්... ඒත් දෙයියනේ ඔයා ඒ දේ කරා... ශූ ඕූ ඉවර උංගි... ශූ වූ ඉවර..."



කොහේ ඉඳල ආපු ගටකින්ද මංදා, මං ෆෝන් ගාල තියවගෙන තියවගෙන ගියා. ඒ අන්තිම තත්පරේදි තමයි හොල්මං වෙලා ඉඳපු රාජ් මා ළඟට දුවන් ආවෙ.

"... විහඟ... මොකක්ද බං උඹට වෙලා තියෙන්නෙ... ඔය කියවන එක නවත්තපං... ඒකි මැරෙයි යකෝ උඹ තව කියෙව්වොත්...?"

රාජ් මගේ අතේ එල්ලුනා.

"....නෑ...?! තව ඩිංගක් ඉඳපං... හැමදේම ඉවරවෙයි රාජ්... මෙච්චර දවසක් මං ඉවසුවා... උඹ කියන්නෙ මට තවත් ඉවසන්නද...? ඇයි මෙයාට කතා කරන්න බැරි... කටේ පිට්ටුද යකෝ...?"

මගේ දෙදරල යන්න මං කෑ ගැහුවා. දැන් ඉතිං මක්කොව ඉවරයි. ආයෙ හදන්නවත් වරදින්නවත් දෙයක් නෑ.

"...වි... හඟ අ... අයියා...?"

ආයෙමත් ෆෝන් එකේ එහා කෙළවරින් අංජලීගෙ කෙඳිරුමක් වගේ සද්දෙ මට ඇහුණා. රාජ්ගෙ මූණෙ ඇස් දෙක රඳවගෙනම මං ආයෙමත් කතා කරන්න පටන් ගත්තා.

"...ඔයාට කි... කියන්න දෙයක් තියෙනව නම්, අඩුම ගානෙ අපි සංතෝසෙන් ඉඳපු පහුගිය කාලෙ ගැනවත් කියන්න දෙයක් තියෙනව නම්. මට කියන්න උංගි...! ඔයාට මාව ආයෙ දකින්න හම්බ වෙන්නෙ නෑ..."

මං කියන වචනයක් වචනයක් පාසා රාජ්ගෙ ඇස් දෙක ලොකු වෙන එකයි, ෆෝන් එකේ එහා පැත්තෙන් අංජලී හුල්ලන හඬයි වැඩිවෙනවා මට දැනුනා.

"ඕ... ඔයා මොනවද කියන්නෙ කියල ම.. මට තේ... තේරෙන්නෙ නෑ අ.. අයියා..."

අංජලීගෙ කටහඬ බිඳිල ගියා කියල මට තේරුණා... ඒ කියන්නෙ එයා අඬනවා.

"...තේරුම් ගන්නත් උත්සාහ කරන්නෙපා නංගි... මොකද ඒකෙන් වෙන්නෙ මගේ හිත රිදෙන එක විතරයි...! මේ හැම දෙයින්ම අන්තිමට මට ඉතුරු වුණේ දුක විතරයි... ඉස්සර දවස්වල මං මොන තරම් සංතෝසයෙන් හිටියද...? අන්න ඒ සංතෝසෙ ආයෙමත් මං ළඟට එන්නැත්තෙ ඇයි කියලයි මං මේ හැටි විඳවන්නෙ...?"

"...ම...මගෙන් ඔයාට වැරැද්දක් වුණා නම් මට සමාවෙන්න විහඟ අයියා... දෙයියනේ මං ඔයාට හිතල නම් මුකුත් කෙරුවෙ නෑ..."

"...ක...කමක් නෑ නංගි ඕ... ඔයා හිතල නම් මුකුත් කෙරුවෙ නෑ.

WWW.SINHALAELIBRARY.COM 70

එත් ඉතිං මං බයිස් එකෙන් වැටිල ඉඳපු දවසෙ ඉඳල මාව බලන්න ඇවිත් ඔයාට වැරැද්දක් කරන්න මටත් බෑ... මගේ හිත ඇතුළටම රිංගගෙන ඉඳපු ඔයාට කිව්වා, මං ආයෙ ඔයාට මං එදා අරුන්දිගෙ වෙඩින් එක දවසෙදිත් ඔයාට කිව්වා, මං ආයෙ ඔයාට කරදරයක් වෙන්නෑ කියල... මං ඒ වචන ටික අකුරටම ඉෂ්ඨ කරනවා නංගි...! ඔයා දන්නෙ නෑ. මං තව ටික දවසකින් මේ පුංචි ලංකාව අතෑරල යනවා... මගේ ළඟ ඉඳපු, මට ආදරේ කරපු..., මට ආදරේ නැති හැමෝම දාල මං යනවා... ඔයාටයි ක්‍රිශාන්ටයි මං ආයෙත් විෂ් කරනවා නංගි... ඔයාල දෙන්න අතරට මං තුන්වැන්නෙක් වෙන්නෑ... බායි උංගි...?"

ෆෝන් එකේ එහා පැත්තෙන් හෝ ගාල අංජලී ඉකිගහනවා ඇහෙද්දි මං රිසීවර් එක තිබ්බා. ඇහැට ලාවට වගේ ඇවිල්ල තිබ්බ කඳුළු බිංදු දෙකක් පිහිදාන ගමන් මං රාජ් දිහා බැලුවා. උගේ මූණෙ තිබ්බෙ මහ පුදුමාකාර හැඟීම් ගොඩක්. මං ඒ එකක්වත් තේරුම් ගන්න උත්සාහ කළේ නෑ. රාජ් මං දිහා බලන් ඉන්දෙද්දිම සාලෙ සැටිය උඩට මං අපතයා වගේ ඇදන් වැටුණා.

"... හිකේ..., උඹ ඔච්චර ගිනිකෙලි සංදර්ශනයක් දානව කියල දන්නව නම් මං කීයටවත් අංජලීට ෆෝන් කරන්න දෙන්නෑ. යකෝ, මං උඹට කිව්වෙ ඒකිව මීට් වෙන්න දවසක් දාගන්න කතා කරපං කියලා... හපොයි... උඹ මොනවද බං අර කතා කළේ..."

"...මුකුත් නෑ..."

මං ඌ දිහා බලන්නැතුව කිව්වා. මං දූන් දන්නවා මූ සිරාවටමට මට බනිනවා කියලා.

"... උඹට හරි ලේසියි.. මුකුත් නෑ කියල ප්‍රශ්නෙ මග ඇරල දාන්න... මේ..! හරි.. ඔක්කොම අතෑරපං... අංජලීත් යකාට ගියාවෙ... එතකොට අර රට යන කතාවක් කොහෙන්ද ආවෙ...? උඹ ඒක බොරුවට නේද කිව්වෙ...? උඹ ඒකි බය කරන්න නේද කිව්වෙ...?"

මං ළඟටම ඇවිල්ල මගේ උරහිසට අත තියන ගමන් රාජ් ඇහුවා. පව්... උගේ ඇස්වලත් කඳුළු. අංජලී මෙගම රාජ්, උඹයි බය වෙලා ඉන්නෙ මං යාවි කියල... උඹ කොයි තරම් රත්තරං කොල්ලෙක්ද යාලුවා..

"... නෑ... රාජ්.. මං ඇත්ත කිව්වෙ... මං මේ හැමදේම දාලා යනවා. උඹ දන්නෑ මං පාස්පෝට් හැදුවා... මං තාත්තා ගාවට යනවා රාජ්... මං වගේ නිතරම රිදෙන හිතක් තියෙන පුංචි එකෙකුට මෙහේ උහුලන්න බෑ මචං... මගේ තාත්තා මාව සංතෝසෙන් තියාවි..."

මං එහෙම කිව්ව විතරයි, රාජ්ගෙ ඇස් උඩ තිබුණු කඳුළු බිංදුව බිමට කඩන් වැටුණා.

"...ඒ...ඒ ආයෙ කියපං ඒක... එතකොට යකෝ මං කවුද...? මං උඹේ කවුද විහඟ...? මට කියපං... මට කියපං... ඒ කියන්නෙ උඹ මාවත් දාලා යනවා. උඹට කියන්න නම් හරි ලේසියි. උඹට පුළුවන්ද මාව දාල යන්න...? උඹ එහෙම ගියත් මං කොහොමද උඹ නැතුව ඉන්නෙ...? පුංචි කාලෙ ඉඳලම එකට ඉඳල ඉවර වෙලා... මේ කොහෙන්දෝ ආපු කෙල්ලෙක් හින්ද උඹ මාවත් දාල යනවා කියනෙක මට හිතාගන්නවත් බෑ විහඟ..."

රාජ් කියවන් යන දේවල් වලින් හිත කෑලි කෑලි වලට කැඩිල යද්දි මං දත්මිටි කාගෙන ඉවසන් හිටියා. උඹ වගේ රත්තරං යාලුවෙක් මට ආයෙ හම්බෙන් නෑ රාජ්...!"

"කමක් නෑ... උඹට හැමදේම අතෑරල මෙහෙන් යන්න පුළුවන් නම් මටත් හැමදේම අතෑරල උඹත්තෙක්ක එන්න බැරිකමක් නෑ යාලුවා... මමත් හදනවා පාස්පෝට්...? එදා වගේම අදත් මං ෆිට්...!"

පුංචි හිනාවක් මූණට අරන් රාජ් එහෙම කියද්දි මට අඳහගන්න බැරිවුණා. ඒ එක්කම තමයි අපේ මිදුලට වාහනයක් එන සද්දෙයි, මහා සද්දෙට බ්‍රේක් ගහන සද්දෙකුයි ඇහුනෙ. මායි රාජුයි ඉස්සරහ ජනේලෙන් මිදුල දිහා බැලුවෙ එක පාරටම. දඩ බඩාස් ගාල රතු පාට කැබ් එකේ දොර ඇරන් එළියට බැස්සෙ වෙන කවුරුවත් නෙමේ...! අංජලී...!

## 55

අංජලීව දක්කහම රාජ්ගෙ මූණ පුරවල තිබ්බ දුක වාෂ්ප වෙලා ගියේ තත්පරෙන් දෙකෙන්. කොන්ඩෙත් අවුල් කරගෙන, ගෙදරට ඇඳන් ඉඳපු ෂෝට පිටින්ම ගේ දිහාට එන අංජලීව දක්කහම මට හැමදේම අමතක වෙලා ගියා.

"... මං හිතුවෙ ගිනි කෙලි සංදර්ශනේ ඉවරයි කියලා.. තප්පේ දූන්නෙ මල් වෙඩිකාරයා එන්නෙ..."

අංජලී ඉස්සරහ දොර ගාවට එද්දි රාජ් කියවනවා මට ඇහුණා. ඊට පස්සෙ තමයි ඉස්සරහ දොරට තට්ටු කරන සද්දෙ ඇහුණෙ...

"... හොඳ වෙලාවට අද ඇන්ටි නැත්තෙ... කෝකටත් දෙයියෙ බුදුන් සිහි කරගෙන දොර ඇරපං..."

රාජ් කියවද්දි මං ගිහින් දොර ඇරියා. ඇස් දෙකත් රතු කරන්, අර හුරතල් සුදු මූණත් රතු කරන්, අඬන්න වගේ මං දිහා බලන් ඉන්න අංජලීව දූකල මට රාජ්ගෙ මූණ දිහා බැලුනා. ඌ සං සං ගාල අහක බලා ගත්තා. ඒ කියන්නෙ මේ සෝයා මීට් එක මට තමයි උයන්න වෙන්නෙ.



www.sinhalaelibrary.com

"...උ...උ...ං...ගි...?"

මගෙන් එහෙම කියවෙද්දි අංජලීගෙ රෝසපාට තොල් පෙති වෙව්ලනවා මං දැක්කා. මොනවාදෝ කියන්න එයා ට්‍රයි කරත් එයාගෙන් වචන පිටවුණේ නෑ. ඒත් ඒ ඩිංග වෙලාවකට විතරයි. මං හිතුවෙ වත් නැති විදියට, අංජලී එක පාරටම මාව බදා ගත්තා.

"...අ...අනේ... මට.. මට මෙහෙම කරන්නෙපා වි..විහඟ අයියේ... ඇයි... ඇයි රත් ඔයා මට රිද්දන්නෙ... මං... මං ඔයාට වැරද්දක් කෙරුවෙ නෑ දෙයියනේ..."

ගොත ගගහ අංජලී කියවගෙන ගියා. මේ වෙනදේ මට පුදුමගන්නක් බැරිවෙලයි තිබුණෙ. මෙහෙත්, මාව බදාගෙන අංජලී හොඳටම අඩනවා. අරහෙන් ඔලුවෙ අත් දෙක ගහන් රාජ් නන්නත්තාර වෙලා බලන් ඉන්නවා.

"... ප්ලිස් ළංගි ප්ලිස්.. ඩිංගක් කුල් වෙන්න බබා...! අනේ ඔහොම අඩන්නෙපා රත්... ඔයාට හෙම්බිරිස්සාව හැදෙයි..."

කියන්න කියල මෙලෝ දෙයක් ඔලුවට ආවෙ නැති හන්ද මං එහෙම කිව්වා. රාජ්ට ඔකස්'ගාල හිනා ගිහින් ඌ අතින් කටත් වහගෙන කාමරේට පැන්නා. එච්චර වෙලා මගේ පපුවට තුරුලු වෙලා ඉඳපු අංජලී ඔලුව උස්සල මං දිහා බැලුවා. ඒ ඇස්වල තිබ්බ ආදරේ මුලු හිතෙන්ම විඳගන්න ගමන් මං ඒ මූණට එබුණා.

"... ම... ඔයා ම.. මට හම්බෙන් නෑ කියල හිතෙනකොට මාව පිච්චෙනවා ළංගි.. ඉස් ඉස්සෙල්ලම ආදරේ සතුටයි, දුකයි පෙන්නපු ඔයාව අමතක කරන්න මට බෑ... මං මං මැරෙයි ළංගි.. ම... මං මැරෙයි..."

මං එහෙම කියවන් යද්දි අංජලී මගේ බෙල්ල වටේට අත් දෙක දාලා එයාගෙ මූණ ළඟටම මගේ මූණ ළං කරගත්තා. යාන්තමට තිගැස්සෙන ඒ රෝසපාට තොල් පෙති අතරට, මගේ දෙතොල් එක්කහු කරන්න මං දෙපාරක් හිතුවෙ නෑ. අංජලී තව තවත් මාව තද කරල තුරුලු කර ගනිද්දි, මං ඒ සුදු මූණ හාදු වැස්සකින් නැවෙව්වා. තවත් විනාඩි ගානක් ගියාට පස්සෙයි අපි දෙන්නා මූණුවල් ඈත් කර ගත්තෙ. තවත් තද රෝස පාට වෙලා තිබ්බ අංජලීගෙ තොල්පෙති උඩ තිබ්බෙ ලස්සන හිනාවක්.

"... ඒ... එන්න ළංගි ගේ ඇතුළට... ම... ඔයා තාමත් හිටගෙන..."

ඩිංග ඩිංග වෙලාව යනකොට තමයි ඔලුව හරියට වැඩ කරන්න ගත්තෙ. ඉස්සරහ දොරත් හායි ගාල ඇරල දාලා, මං අංජලීව ගේ ඉස්සරහදිම කිස් කරලා.. හපොයි මොකා දැක්කද දන්නෑ... හොඳ වෙලාවට අරූ කාමරේට දිව්වෙ.



".. ඉ... ඉතිං ඔයත් හිටගෙනනෙ අයියා...?"

මගේ දිහා බලාගෙනම අංජලී කෙඳිරුවා. මං එයාගෙ අතින් අල්ලගෙන ඉස්සරහ දොර වහල සාලෙට දිව්වා. සැටියෙ මගේ ළඟින්ම අංජලීව වාඩි කර ගන්න ගමන්ම මං රාජ්ට කතා කරා.

"...රාජ්...? මෙහෙ වරෙන් බං..."

මගෙයි අංජලීගෙයි දෙන්නගෙම ඇස් තිබ්බෙ ඉස්සරහ කාමරේ දොර දිහාට. ඉස්සෙල්ලම කර්ටන් එක ඩිංගක් ඈත් වෙලා රාජ්ගෙ මූණ විතරක් සාලෙ දිහාට එබුණා. ඌ අත් දෙකෙන්ම මූණ වහගෙන, ඒත් ඇඟිලි කරු අස්සෙන් මායි අංජලියි දිහා බලන් උගේ ඇස් දෙක නලියනවා.

"උඹලගෙ වලිය ඉවරද ? ඒත් ඉතිං පිගන්, කෝප්ප එහෙට මෙහෙට වැටෙන සද්දෙවත් ඇහුණෙ නැනේ...?"

රාජ් කියන දේට අංජලීට පුංචි හිනාවක් ගියා. එයා ඒ හිනාවෙන්ම මං දිහා බැලුවා.

"... වලිය තාමත් ඉවර නැත්තං, ඉවර වෙනකන් මං ආයෙත් අර කාමරේට වෙලා ඉන්නද...?"

මගෙයි අංජලීගෙයි මූණු දිහා බලලා ඌ ඇහුවා. ෂිහ්... අම්මප, මෙච්චර වැදගත් අවස්ථාවක කතා කරන්න හොඳ දෙයක් මුගෙ ඔලුවට එන්නැති හැටි.

"...නෑ.. නෑ... උඹ ඉඳපං... මෙතන අමුතු දේවල් යන් නෑ. උඹත් හොඳට දන්න කියන දේවල් තමයි යන්නෙ..."

මං එහෙම කියල අංජලී දිහාවට හැරුණා. අර ඇස්වලට උනල තිබ්බ කඳුළු බිංදු මැකිලා ගිහිල්ලා. ඒ සුදු මූණ තවත් රෝස පාට වෙලා ගිහින්. ඇත්තටම රාජ් මෙතන හිටියෙ නැත්තම් මං තව පාරක් ඔයාව ඉඹිනවා අංජලී...! ඒක මට බුදු සුවර්.

"... ම... මට ඉස්සෙල්ලම කියන්න. ෆෝන් එකෙන් මට බැන්නෙ ඇයි කියලා...?"

ඩිංගක් වෙලා සද්ද නැතුව ඉඳලා අංජලී මගෙන් ඇහුවා. ඕං දැන් දීපංකො උත්තර...! හිතේ කේන්තියට පංඩිතයා වගේ මං කියෙව්වා. දැන් ඉතිං ඉඳපංකො ඇටිකෙහෙල් කාපු එකා වගේ.

"...ම... මං ඔයාව බැන්නෙ නෑනෙ ළංගි...!"

"නෑ, තමයි... මහා හයියෙන් සැරට කතා කරා. ඕලන්න රාජ් අයියා මට එනනදිම ඇඬුනා... මෙයා ඊට පස්සෙ තමයි රට යනවා කිව්වෙ.. ම...

WWW.SINHALAELIBRARY.COM 72

මට එකපාරටම අමතක වුණා ඒ වෙලාවෙ... ඇඳන් ඉඳපු ඇඳුම පිටින්ම මං දුවන් ආවෙ... අඩුගානෙ මං ස්ලිපර්ස් දෙකවත් දාල නෑ අයියා..."

අංජලී කියවන් යන තාලෙට මට පව් කියල හිතුණා. ටී ෂර්ට් එකටයි, ෂෝට්ටයි පුංචි ළමයෙක් වගේ.

"... වෙච්ච දේට දැන් කරන්න දෙයක් නැහැනෙ අංජලී.. ඒ හැමදේම විහඟගෙන් කියවෙන්න ඇත්තෙ ඇයි කියල ඔයාට හිතුණෙ නැද්ද ? විහඟ ඔයාට ආදරෙයි අංජලී... මූට ඔයාව නැතුව බෑ..."

මං කියන්න හිතන් ඉඳපු දේවල් කිසිම අවුලක් නැතුව රාජ් කිව්වා. අංජලී ඇස් දෙක ලොකු කරල මං දිහා බැලුවා. දැන් බලමුකෝ, ඔයා මොනවද කියන්නෙ කියල අංජලී... පපුවෙ බට්ටා, ඔර්ලෝසු බට්ටා වගේ ඩාං ඩාං ගාල පැද්දෙද්දි මං හිතුවා.

## 22

ඩිංගි වෙලාවක් මං දිහා බලන් ඉඳල අංජලී මගේ උකුලෙ මූණ ඔබා ගත්තා. පුංචි එකෙක් වගේ මගේ උණුහුමට ගුලි වෙච්ච අංජලීව මං තවත් තද කරල ගුලි කරගත්තා. ඒ කරල තමයි මං රාජ් දිහා බැලුවෙ. උගේ මූණ හොරු කඩපු ලාච්චුවක් වගේ වෙලා. ඔව් ඉතිං ඌ දන්නවයි මේකෙ තියෙන ශක්තිය.

"...විහඟ... මේ, දැන් ඇත්ත් ආවොත් ඔක්කොම ඉවරයි.. ඒක හන්ද කරන කතාවක් ඔහක් ඉක්මනට කර ගනිල්ල බං..."

රාජ්ගෙ බරබරේට අංජලී ආයෙමත් ඔලුව ඉස්සුවා. ඒ මූණෙ තිබ්බෙ පුංචි හිනාවක්. ෂික් ! මෙච්චර කල් දුක් විඳල විඳල හම්බ වෙච්ච චාන්ස් එකට මූ උඳුල්ල දාන හැටි. අම්මප මං හරක් මස් කන්නෑ... නැත්නං මූව මරාගෙන කනවා.

"... රාජ් අයියා අහපු දේට මං උත්තර දෙන්නම්...! විහඟ අයියා මට ආදරෙයි කියල මං හුඟක් කල් ඉඳන් දැනන් හිටියා. මං ගැන අහිංසක් හිතන්නෙපා අයියේ... මේ ලෝකෙ වෙන කාටවත්ම වැඩියෙන් මං විහඟ අයියට ආදරේ කරනවා... එයාව දැකපු මුල්ම දවසෙ ඉඳන් මං එයාට ආදරේ කළේ..."

අංජලීගෙන් ඒ ටික පිටවුණා විතරයි. මං ඉන්නෙ කොහෙද කියලත් මට අමතක වෙලා ගියා.

"...රාජ්... උඹට ඇහුණනේ...? ඇහුන් නැත්නම් "කොටන් බඩ්ස්"



එකක් දාල කණ සුද්ධ කර ගනිං... හුරේ... මට ජයවේවා.."

හිතට ආපු ආතල් එකට මං නෑ ගැහුවා. සද්දෙ වැඩිවුනාද කොහෙද. අංජලී එයාගෙ පුංචි අතින් මගේ කට වැහුවා.

"හපෝයි අංජලී... දැන් මූ පිස්සෙක් වෙනවා... මං මෙච්චර දවස් හිතන් හිටියෙ මට වැඩිය පිස්සෙක් කොහේවත් නෑ කියල. බැලුවහම දැන් මූනෙ පිස්සා..."

රාජ් කියන දේවල් මට ඒ තරම් ගානක් වුන් නෑ. මගේ හිත සංතෝසෙන් පිරිල ගිහින් තිබුණෙ. ඒත් ඒ සංතෝසෙ පැත්තකින්ම කඩන් වැටෙන දෙයක් මට මතක් වුණා. මතක් වුණා විතරක් නෙමේ, මගෙ හිත ගැස්සිල ගියා.

"... ඒ... විහඟ අ.. අයියා ඇයි මේ...?"

මගේ හිනාව නැතිවෙලා යනවා අංජලී දැක්කා. ඒකයි එයා එහෙම ඇහුවෙ. මෙච්චර වෙලා පිස්සු කියවපු රාජුත් අප්සට් වුණා.

".. එතකොට ක්‍රිශාන්ට මොකද වෙන්නෙ උංගි...? ක්‍රිශාන් ගැන මට කියන්නෙ නැද්ද...?"

මං අහපු දෙයින් අංජලීගෙ ඇස් දෙක ලොකු වුණා. ඒ ලොකු ඇස් වලින් මගේ හිත ඇතුලම බලනවා වගේ එයා ඩිංග වෙලාවක් මං දිහා බලන් හිටියා.

"... ම...මං ඒ ගැන ඔයාට කියන්නම් විහඟ අයියේ.. අපේ ගෙදරින් මට ක්‍රිශාන්ව 'ප්‍රපෝස්' කරල තියෙන්නෙ, හුඟක් කල් ඉඳල... ඒත් මං කවදාවත් ක්‍රිශාන්ට ආදරේ කළේ නෑ. දැක්ක ඉස්සෙල්ලම දවසෙ ඉඳල මං ඔයාටයි ආදරේ කළේ. ඒත් අම්මගෙයි, තාත්තාගෙයි හිත් බිඳින්න බැරි හන්ද මං මගේ හිත හිර කර ගත්තා. ම... මං හිතුවා ඔයාව මග හැරියම, ඔයා වෙන කාන්තෙක්ක හරි යාලුවේවි කියලා... ඒත් එහෙම වුනෙත් නෑ... ඔයා අද මට කතා කරහම මගේ හිතේ හිර කරන් ඉඳපු හැමදේම පිපිරිලා ගියා විහඟ අයියා. ඔයා රට යනවා කිව්වහම මට නැතිවෙන්න යන්නෙ, මොන තරම් ලස්සන හිතක්ද කියල මට හිතුණා..."

අංජලී කියවන් යද්දි මායි රාජුයි සයිලන්ස් එකේ අහන් හිටියා. මගේ හිතේ සංතෝසෙ අංජලී කියන හැම වචනයක් ගානෙම වැඩිවුණා මිසක අඩු වුණේ නෑ.

"... ඔය ලස්සන හිනාවයි, ඔයාවයි මං නැතිකර ගන්නෙ නෑ කියල මං හිතුවා අයියෙ..., හැමදේම දාල මං දුවන් ආවෙ ඒකයි..."

කතා කරල ඉවර වෙලා අංජලී මගේ අත බදාගත්තා. ඉඳගෙන ඉඳපු තැනින් නැගිටල රාජ්, අපි දෙන්න ළඟට ආවා.

www.sinhalaelibrary.com

"...ජයවේවා...! එළකිරි වගේ ඉඳපල්ලා..."

ලොකු හිනාවකින් මූණ පුරවන් ඌ අංජලීටයි මටයි විෂ් කරා.

"...එ... එතකොට විහඟ අයියා රට යන්නෙ නෑ නේද...?"

තප්පර ගානක් ගෙවිල ගියාට පස්සෙ හින් සද්දෙට අංජලී මගෙන් ඇහුවා. ඒත් ඒකට උත්තරේ හම්බවුණේ රාජ්ගෙන්.

"දන්නම් මූව පොල්ලකින් ගහලවත් රට පටවන්න බෑ නංගි.. ඒක බුදු සුවර්..."

අංජලීගෙ මූණෙ හිනාව අලුත් වුණා. ඒ හිනාවෙන්ම එයා මා දිහා බැලුවා.

"...මං තීරණයක් ගත්තා විහඟ අයියේ.. අද ගෙදර ගිහින් අම්මිටයි තාත්තිටයි ඔයා ගැන කියනවා.. ක්‍රිශාන්ට මැරි කරන්න බෑ කියලත් කියනවා... එහෙම හොඳයි නේද...?"

"...ඔයාලගෙ ගෙදරින් නම් කීයටවත් කැමති වෙන එකක් නෑ උංගි... මොකද ක්‍රිශාන්ට ඔයාව ප්‍රපෝස් කරලනෙ තියෙන්නෙ...?

මං කියපු දේට ඒ සුදු මූණ දුකින් වගේ බිමට හැරුණා.

"...ම.. මං මෙච්චර දවසක් එයාල කියපු හැමදේම කරා. එදා ඔයාල දෙන්න අපේ ගෙදර ආපු දවසෙ මං කොයි තරම් ඇඩුවද කියල දන්නෙ මං විතරයි... මං ඔයාව අඳුනන්නෑ කියල කියද්දි, ඔයාගෙ මූණ සුදුමැලි වෙච්ච හැටි, ඊට පස්සෙ හැමදාකම මට මැවිල පේන්න ගත්තා. මං ඒකට අදත් විඳවනවා අයියේ..."

එහෙම කියල ඉවර වෙලා, අංජලී මගේ අත අරගෙන ඉඹගත්තා.

"...ඔයා ගැන ගෙදරට කියල, මං අනිද්ද දහය වෙනකොට නුගේගොඩ රේල්වේ ස්ටේෂන් එක ගාවට එන්නම්. මාව විශ්වාස කරන්න අයියේ.. අම්මිගෙයි, තාත්තිගෙයි කැමැත්ත අරන් මං එනවා...! ගෙදරින් මාව හොයනවත් ඇති... මතකනේ... අනිද්ද දහයට.. මං යන්නම්... බායි...!"

අපි දෙන්නටම කියල, අංජලී පුංචි එකෙක් වගේ කැබ් එක දිහාට දුවන් ගියා. කැබ් එක ස්ටාර්ට් කරගෙන සං සං ගාල එහෙට මෙහෙට කපල, හරවගෙන එයා අපේ වත්තෙන් පිටවුණා. මගේ හිතේ තිබ්බෙ පුදුම සංතෝෂයක්. මේ පුංචි කෙල්ල මගේ ජීවිතේ කොයි තරම් වෙනසක් කරාද? මේ ටිංග කාලෙට මං කොයි තරම් වෙනස් වුණාද ?

"...දාපං ලොක්කා අත... වැඩේ හරිනේ..."

මගේ කරට අතක් දාන ගමන් රාජ් කිව්වා. ඌටත් හෙණට පිටි.



"ඔක තමයි කියන්නෙ, කුකුල් මස් කන්න හිතුණහම, තුන පහයි හට්ටි වලං ටිකයි අරගෙන කුකුලා ගෙදරටම එනවා කියලා. ඒත් ඉතිං පොඩි අවුලක් තියෙනවා..."

ඌ එහෙම කිව්වහම මං ඌ දිහා බැලුවා.

"...නෑං ඉතිං ඒකි වීරයා වගේ ගියාට ගෙදර ඇගෙ ඒකිව අදම බන්දලා දේවිද දන්නෙත් නෑනේ... ඒක හින්ද අද භාගයක් සංතෝස වෙයන්. ඉතිරි බාගෙ අනිද්දම සංතෝස වෙමු... ඒකි ආවහම..."

මූ කියන එකත් ඇත්ත. එහෙනම් අනිද්දම බලමුකෝ...!

## 57

හවස වෙද්දි මද්දූ අයියා එනකොට රාජ් ගෙදර යන්න ගිහින්. මං මද්දූට, අද වෙච්ච දේවල් සජීවීව දුන්නා. අප්පා, ඒ වෙලාවෙ බලන්න එපැයි මද්දූගෙ මූණෙ තිබ්බ සංතෝසෙ. කතා කරගන්න බැරුව වගේ මගේ මූණ දිහා පොර බලන් හිටියා. ඔන්න, ඊට පස්සෙ තමයි මද්දූගෙ මූණට අර කුණු හිනාව ආවෙ. මූ ඉපදෙන කොටත් මූගේ මේ කුණු හිනාවෙ මූණෙ තිබ්බලු.

"... බලන් ගියාම මූ අමු අමුවෙම තදයෙක් වෙලානෙ පාට්නර්... මං හිතුවෙ නෑ උඹට මේ තරම් ගටක් තියෙනව කියලා..."

මද්දූව කියවන්න ගත්තා. හිතේ සංතෝසෙ වැඩි කමටද මංදා ඌ කියවන ඒවට මං මුකුත් කියන්න ගියේ නෑ.

"උඹ බයික් එකෙන් වැටිල අංඩ කඩාගෙන ඉන්නකොට, අර එක දවසක් අංජලී උඹව බලන්න ආවෙ... මතකද ? උඹ ඒකිව කුලප්පු කරවලා ඒකි අඬ අඬා ගෙදර ගියේ..., මං පස්සෙන් ගිහින් ෆෝන් නම්බර් එක ඉල්ලන් ආවෙ...? එදා නම් මං කීයට වත් හිතුවේ නෑ... මේක මේ තරම් දුර දිග යන සීන් එකක් වෙයි කියල..."

මද්දූ කියවන ඒවයින් ගෙවිල ගියපු අතීතෙ ලස්සනම ලස්සන දවස් ආයෙමත් මගේ හිත ඉස්සරහට එබුණා. මද්දූ ගෙනැල්ල දුන්න ෆෝන් නම්බර් එක ඩයල් කරලා මුලින්ම අංජලීට කතා කරපු හැටි හෙම, පත්තරේකට දාන්න ෆොටෝ එකක් ගමු කිව්වහම ඒකිට මළ පැනල ටෙලිෆෝන් එක පොලේ ගහපු හැටි හෙම ෆිල්ම් එකක වගේ මට මතක් වුණා.

"...ඒ ් මද්දූ මට එක බයක් තියෙනවා...? අංජලී මට ආදරෙයි

WWW.SINHALAELIBRARY.COM 74

කිව්වා. ඒක හරි... ඒත් මං ගැන ගෙදරට කියන්න ගිහින් එයාව ඉක්මනට බන්දල දෙයිද දන්නෙත් නැතේ..."

හිත කොයි තරම් සංතෝසෙන් තිබුණත්, හිත කොණේම චකුටු වෙලා තිබුපු ඒ ප්‍රශ්නෙ මං මද්දූට දැම්මා. ඌට මල පැන්නා.

"... මුසල කතා කියන්නෙපා පොඩ්ඩ...! හැමදේම හරියයි. මං පූජනීටත් කිය කියා හිටියෙ, මේ දවස්වල උඹ මාර අප්සට් එකකින් ඉන්නෙ කියලා.., මොනව කරන්නද කියල මට තේරෙන්නෙ නෑ කියලා..., ඒ පාර තමයි පූජා කිව්වෙ, අපි ගිහින් අංජලීව හම්බ වෙමු කියලා... දූත් ඉතිං අවුලක් නෑ... උඹ තනියෙන් ගේම දීලනෙ... පූජා හරියට සංතෝස වෙයි..."

"... ඇයි මද්දූට සංතෝස නැද්ද...?"

ඉදල ඉදල මාත් ඇහුවෙ මහ හරක් ප්‍රශ්ණයක් කියල මට තේරුණා. මද්දූගෙ මූණ ඇද වෙලා ගියා. ටිකක් වෙලා යනකන් මද්දූ කතා කළේ නෑ.

"... උඹ ගැන, මටත් වැඩිය සංතෝස වෙන එකෙක් මේ ලෝකෙ කොහේවත් නෑ පොඩ්ඩ... උඹේ සංතෝසෙ කියන්නෙ ඒක මගෙත් සංතෝසෙ... උඹ හැමදාම හිනාවෙලා ඉදපං... හැමදේම හරියයි..."

මං මද්දූගෙ අතින් අල්ල ගත්තා. ඒ අත සීතල වෙලා.

"තව ටිකකින් පූජාට ෆෝන් කරල කියමු. අනිද්ද උදේට කාර් එක අරන් මෙහේට එන්න කියලා... එතකොට අපි කට්ටියම නුවරඑළිය යනැකිනෙ...! සුපර් මාකට් එක ගාව කාර් එක දාල ස්ටේෂමට වෙලා අපි බලන් ඉදිමු. උඹේ සංතෝසෙ එනකන්... එතකොට තමයි පොඩ්ඩ හැමදේම අංගසම්පූර්ණ වෙන්නෙ..."

මද්දූව බදාගෙන ඉඹගෙන ඉඹගෙන යන්න ඕන කියන හැඟීම මං අමාරුවෙන් නවත්ත ගත්තා. මූ තඩු දම්මොත් හෙම මං බාල අපරාධ කරා කියලා... කොහොම උනත් මායි රාජුයි විතරක් නුවරඑළිය යනවට වැඩිය, මූටි ඩොක්ටරුයි, මද්දූයිත් යන එක සිරාවටම නියමයි කියල මට හිතුණා. රාජ් මේ විත්තිය දන්නව නම් ඌ ෆිට් එක හැදිලා ෆිටේ ෆිට් වෙලා තව මොනව හරි කරගන්නවා.

* * *

අංජලී නුවරඑළියට එනව කියපු දවසටත් ඉර පෑව්වා. පහුවෙච්ච දවස් දෙකේම මට හරියට නින්ද ගියෙත් නෑ. ඊයෙ රෑ නම් කොහොමටත් නින්දක් නෑ. අංජලී විතරයි මගේ හිතේ හිටියෙ.

උදේ හතාමාරට විතර මං ඇස් ඇරිල බලද්දි මෙන්න රාජ් ඉන්නවා මගේ ඇඳ ගාව පුටුවෙ වාඩි වෙලා. යකෝ මූ කොයි වෙලාවෙද ආවෙ ?



වෙනද ගල්බෝර ගහලවත් නැගිට්ටවන්න බැරි එකා, උදේ පාන්දරම නැගිටලා. බලන් ගියාම මූගේ මාර උනන්දුවක්නෙ තියෙන්නෙ.

"ෂෙහ්...! අද වගේ දවසකටවත් තොට උදෙන්ම නැගිටින්න බැරිද ? ඇයි යකෝ අද නේද අංජලී එනව කිව්වෙ..?"

ඉනට අත් දෙකත් ගහන් ඌ මාව කන්නයි යන්නෙ. මං ඌ දිහා නොබල ඇඳේ වාඩිවුණා.

"ඕංගක් ඉවසපං බං...! මගේ පපුව දෙකඩවෙන්න ගැහෙනවා. බොරු නම් මෙං බලපං..."

"... පිස්සු කෙලින් නැතුව ලෑස්ති වෙයන් විගග... අපි වෙලාවට එතන ඉන්න ඕන...! හැබැයි පුතෝ අද අංජලී මොකක් හරි ජිල්මාල් එකක් දානත් හැදුවොත් මං මළ යකා තමයි..."

අම්මට හුඩු. මූ කුලප්පු වෙලා තියෙන ගතිය. කෝම වුණත් මූ ...යකා නම් මං මල් දෙකේ යකා වෙන්න එපැයි.. නැත්තං නිකං හරි නෑ හරි නෑ වගේ. දත් මදින කොට මට හිතුනා.

"...රාජ්..."

"මොකෝ බං...? නිදහසේ ඔය දත් දෙකවත් මැදගනිං... මෙහේටත් දත් බෙහෙත් විසි වෙනවා..."

ඌ කියන ඒවා මගේ ඔලුව වැටුණේ නෑ. මගෙ ඔලුවෙ තිබ්බෙ වෙන දෙයක්.

"... උඹට ෂබීව හම්බ වුණාද රාජ්...?"

මගේ ප්‍රශ්ණෙට ඌ ඇස් දෙක පුංචි කරල මං දිහා බැලුවා.

"...ඔව්... මං ගියා ඒකිව හම්බවෙන්න..."

මගේ දතේ මදින එකත් ඉබේම වගේ නැවතුණා. ඒ අහිංසක කෙල්ල මූට මොනව කිව්වද දන්නැතේ.

"....ඉතිං...?"

"... මේ වෙලාවෙ ෂබී ගැන උඹට කියනෙක හරිද මංදා බං.. කමක් නෑ උඹ දැන් තීරණයක් අරන්නෙ ඉන්නෙ... ඒක වෙනස් වෙන්නෑ කියල මං දන්නවා... මෙකයි මචං..."

ඌ එහෙම කියල කතාව නැවැත්තුවා. උගේ කටින් ඊගාවට පිටවෙන්නෙ මොන වගේ දෙයක්ද කියල හිතා ගන්න බැරුව මං ඌ දිහාම බලන් හිටියා.

## 58

"... උඹ මගෙන්නෙක්ක තරහ වෙන්නෙපා විහඟ...! වෙච්ච හැමදේම මං ඇහින්නෙක්ක කිව්වා. හුඟක් වෙලා යනකන් මට ඒකිගෙ ඇඩිල්ල නවත්තන්න බැරිවුණා... ඒත් ඇකීම අන්තිමට කිව්වා, විහඟ කියන්නෙ මට ළංවෙන්න පුළුවන් කෙනෙක් නෙමේ, මං ඈත ඉඳන් එයාගෙ සතුට දිහා බලන් ඉන්නම් කියලා... මට කියන්න දෙයක් තිබුණෙ නෑ මචං..."

රාජ් කියවන් යන ඒව මං ඔහේ අහගෙන හිටියා. ෂහනාස් ගැන මහ විශාල දුකක් මගෙ හිතේ ඇතුලෙ ඉඳන් පෙරලීගෙන ආවා. ඒත් මං ඔයා වෙනුවෙන් මොනවා කරන්නද ෂබී... මට අංජලීව ඕන... අංජලීව මට හම්බ නොවී තිබුණ නම් ඔයාට ආදරෙයි කියල කියන්න මං දෙපාරක් හිතන්නෙ නෑ. ඔයාට කවද හරි මටත් වැඩිය හොඳ කෙනෙක් හම්බවෙයි ෂබී...!

ටිකකින් මූණ කට එහෙම හෝදගෙන මං ලෑස්ති වෙන්න පටන් ගත්තා. මද්දුව අද ෆුල් ඩේ එකට නිවාඩු දාල. ලෙඩකට තියා පූජනීව හම්බ වෙන්නවත් නිවාඩු ගන්නැති එකා අද නිවාඩු දාල. පිස්සු හැදෙනවා.

"..පාට්නර්... මෙක ඇද ගනිං... අද හඩ්ඩා වගේ යන්න හොඳ නෑ..."

අම්මට හුඩු... මද්දුව උගේ අලුත්ම ටී ෂර්ට් එකක් මට දික් කරා. යකෝ, මූ අද බෝඩි සත්වයෙක් වෙලානෙ. කෝම හරි නමය විතර වෙද්දි පූජනී අපේ ගේ ගාවට ආවා. අපි හතර දෙනා ෆිල්ම් එකෙකට යනව කියල අම්මටත් බයිලයක් ගහල, මායි රාජුයි චූටි ඩොක්ටර්ගෙ කාර් එකේ පිටිපස්සෙ සීට් එකේ වාඩි වුණා. මද්දුව, කාර් එක උගේ වගේ ඉස්සරහින්ම වාඩි වුණා.

"...මගේ සුභ පැතුම්...!"

හෝමාගම හරියෙදි කාර් එක ස්ලෝ කරල පූජනී මගේ දිහාට අත දික්කරා මං 'ෂේක් හෑන්ඩ්' කරල ඉවර වෙලා මද්දූ දිහා බැලුවා. අත ඇල්ලුවට මූ මට කෙලිසිද දන්නෙත් නැනෙ.

බලාගෙන පූජා, මූ සතියකට විතර නාල නෑ..."

මාව කපන්න හිතාගෙන කුණු මද්දුව කුණු කතාවක් කිව්වා. ඕන්, අද වගේ හොඳ දවසකත් මූ මගේ අර්ශස් චෙක් කරන එකනෙ වැඩේ.

"... දවස ගානෙනම් තාත කෙනෙක් නමයි ඔය කතාව කිව්වෙ.. හෝද විහඟ..."



හප්පේ ඔය තියෙන්නෙ... මද්දුව දෙකේ කොලේටම දාල පූජනී ඇහුවා. රාජ්ටත් හිනා.

නුගේගොඩ සුපර් මාකට් එක ගාවින් කාර් එක දාල අපි හතර දෙනා ස්ටේෂන් එක ගාවට ඇවිදන් ආවා. දහයට තව විනාඩි හතරයි නැත්නම් පහයි තිබුණෙ. මගේ හිතට මොනවාදෝ මංදා වෙලා. උගුර කටත් වේලිලා ගිහින්. කාටවත් කියන්නෙ නැතුව හිනාවෙලා හිටියට අංජලී අද ඒවිද කියනෙක මගෙ හිතට වද දුන්නා. මීට කලින් සී පාරක් නම් අංජලීව හම්බවෙන්න ඇවිත් වාටර් කැවද ? විකෙන් ටික වෙලාවත් ගෙවිල ගියා. මට ඒ හැම තත්පරේම පැය ගානක් වගෙයි තේරුණේ. කොලපාට ලී බංකුවෙ වාඩිවෙලා ඉඳපු රාජ්, මද්දූ, චූටි ඩොක්ටර් මටත් වැඩිය අවුල් වෙලා කියල මට තේරුණා. උං හොඳටම දන්නවා අද අංජලී නාවොත් මං අමු පිස්සෙක් වෙනව කියල.

"...කෝ බං...?"

වෙලාව දහයාමාර විතර වෙද්දි ඉවසන් ඉනන බැරුව රාජ් ඇහුවා. නුගේගොඩ කොයි මුල්ලකින් හරි අංජලී මතු වෙනකන් මං බලන් හිටියෙ. චූටි ඩොක්ටර් මුකුත්ම නොකියා මද්දූගෙ අතකින් අල්ලන් හිටියා. මගේ හිත තත්පරෙන් තත්පරේ අවුල් වෙලා යද්දි වෙලාව ඔහේ ගලන් ගියා. ඉතිං තවත් දුරට බලන් ඉන්නෙකේ තේරුමක් නෑ කියල මට හිතුණා.

"...මද්දූ අයියා... කරන්න දෙයක් නෑ... වෙනද වගේම මං අදත් පරාදයි... දැන් ඉතිං අංජලී එන්නෑ... අපි යං..."

එකොළහයි කාල විතර වෙද්දි මං මද්දුට කිව්වා. රාජ්ගෙ මූණ බලන් ඉන්දෙද්දිම කලුවෙලා ගියා. ඌ දන්නවා දැන් මාව කොන්ට්‍රෝල් කරන්න බෑ කියලා. එදා වගේම මං අදත් රැවටුණා උංගි....!

"කලබල නොවී තව ටිංගක් බලමු පොඩී...!"

මද්දූගෙ කටහඬ ඇහුණෙ මට හීනෙක් වගේ.

"තව මොනව බලන්නද මද්දූ අයියා... මෙහෙම ඔලුව අප්සට් කරන් ගෙදර යන්නත් බෑනෙ... තව ටිංගකින් එන ට්‍රේන් එකේ මායි රාජුයි කොටුවට ගිහින් එන්නම්...! රාජ්... උඹ ගිහින් ටිකට් දෙකක් ගනිං... අපි ඩිංගක් ඇවිදල එමු..."

හිතේ ඉතිරිල යන වේදනාව හංගගෙන මං කතා කරා.

"...ඇයි විහඟ ටිකට් දෙකක් විතරක් ගන්නෙ...? හතරක්ම ගන්න... මායි මද්දූයි ඉන්නවනේ..."

මං දිහා බලාගෙන චූටි ඩොක්ටර් කිව්වා.

WWW.SINHALAELIBRARY.COM 76

"...එතකොට කාර් එක...?"

"...කාර් එක කවද ගන්න බැරිද විහඟ...! ඉන්නකො බලන්න කොටුවට යන්න ඉස්සර වෙලා තව පොඩි වැඩක් තියෙනවා... අපි අංජලීට ෆෝන් කරල බලමු... කරදරයක්ද දන්නෙත් නෑනේ..."


මට අමතක වෙලා තිබ්බ දෙයක් චූටි ඩොක්ටර් මතක් කරා. එයා අංජලීට ෆෝන් කරන්න යද්දි රාජ් ටිකට් කවුන්ටරේ ගාවට ගියා. තවත් විනාඩි දහයකට විතර පස්සෙ මූණත් හතරැස් කරන් චූටි ඩොක්ටර් මං ළඟට ආවා.

"...සොරි විහඟ... ලයින් එක එන්ගේජ්..."

චූටි ඩොක්ටර් එහෙම කියන කොටම වගේ කොටුවට යන ට්‍රේන් එක ආවා. අංජලී ගැන හැම සුන්දරම මතකයක්ව හිත පතුලටම දාලා ට්‍රේන් එකට නගින්න මං කකුල ඉස්සුවා. එතකොටම තමයි මගේ ඇස් දෙක දකින්න ආසම කරන දේ මං දැක්කෙ. පුංචි සුරාඟනාංචියක් වගේ හිනාවෙවී ට්‍රේන් එකෙන් බහින අංජලීව මං ඊළඟ තත්පරේදි දැක්කා, ඇස් පුරාම. මිනිස්සු අස්සෙන් දුවල වගේ ඇවිත් අංජලී මගේ අතේ එල්ලුනා. ඒ මූණේ උතුරල යන ආදරේ මුලු හිතෙන්ම වැළඳගන්න වගේ මං අංජලීගෙ අත් දෙකෙන්ම අල්ලගෙන තුරුලු කර ගත්තා.

නිමි.

WWW.SINHALAELIBRARY.COM 77







මං දීගා බලන් ඉඳපු අංජලීගේ නිල්
පාට ඇස් වලට තත්පර ගානකදී කඳුළු
එක්කහු වෙන හැටි මං දැක්කා.

"... අ... අනේ. ම...මට... සමාවෙන්න
අ...අයියේ... අනේ. ම...මට සමාව දෙන්න
මගේ රත්තරං අයියේ..."

අංජලී එයාගේ දකුණු අතින් මගේ අත
තද කරලා අල්ල ගත්තා. ඒ අතේ තිබ්බ
සීතල මගේ හිත හිරිවට්ටල දැම්මා,
එතම කැළලක්වත් නැති ඒ සුදු මූණ,
දිගේ කඳුලු බිංදු නිදහසේ ගලන් ගියා.

"... කියන්න බැරි දෙයක් ඔයා හිතේ
හිරකරන් ඉන්නවද කියලා මං දන්නෑ.
උංගි... ත් මං හුගක් සංතෝසෙන් ඉඳපු
... කොල්ලෙක්. මගේ ඒ සංතෝසෙ.
මගේ ඒ හිනාව අද ... ගාව නෑ. තමක්
... හිත හැමදෙයක්ම ...
... දන්නවනේ... හිත ...
... ටයි,
...

ISBN 955-97500-0-3